# විෂය නිර්දේශ

# සහ

# ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය

## දෙවන ශ්‍රේණිය

ප්‍රාථමික අධ්‍යාපන ඒකකය,
ජාතික අධ්‍යාපන ආයතනය,
මහරගම.

යුනිසෙෆ් අනුග්‍රහයෙන්

2007

| | |
|---|---|
| පළමුවන මුද්‍රණය | 1998 |
| දෙවන මුද්‍රණය | 1999 |
| තෙවන මුද්‍රණය | 2007 |

හිමිකම් ඇවිරිණි.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවුඩය

ජාතික අධ්‍යාපන ආයතනය මගින් දෙවන ශ්‍රේණිය සඳහා සකස් කරන ලද මෙම විෂය නිර්දේශ හා ගුරු අත්පොත සතුටින් ඉදිරිපත් කරමු.

නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ අරමුණු කර ගෙන ඉදිරිපත් කරන මෙම පොත මෙම ආයතනයේ විෂයමාලා සංවර්ධන 1 - ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් සකස් කරන ලදී. මේ සඳහා අධ්‍යාපන විද්‍යා පීඨ හා ගුරු විදුහල් කථිකාචාර්යවරුන්ගෙන් ද ගුරු උපදේශකවරුන් හා ගුරුවරුන්ගෙන් ද අධ්‍යාපන නිලධාරීන්ගේ ද අදහස් හා ප්‍රතිපෝෂණය ලබා ගෙන ඇත.

මෙම විෂය නිර්දේශ හා ගුරු අත්පොත මගින් ගුරුවරයාට අවශ්‍ය මග පෙන්වීම හා විෂය අන්තර්ගතය පිළිබඳ කරුණු පැහැදිලි කිරීම සිදු කෙරේ. මෙ මගින් දැක්වෙන, පන්ති කාමරයේ සහ පිටත සිදු විය යුතු යැයි අපේක්ෂිත ක්‍රියාකාරකම්, ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ අවම මට්ටම හා ප්‍රමිතීන් ආදිය සැලකිල්ලට ගත යුතු වේ. මෙවැනි උසස් විෂයමාලා පරිහරණය කරමින් ගුරු මහත්ම මහත්මීන් ප්‍රදේශයට හා ප්‍රජාවට ඵලදායී වන ලෙස මේවා වැඩි දියුණු කිරීම හා නිර්මාණශීලි ව කටයුතු කිරීමත් අපේ අපේක්ෂාවයි. ගුරුවරුන්ට මේ සඳහා නිදහස ඇත. එබැවින් ඒ සඳහා අවශ්‍ය දැනුම ලබා ගෙන වගකීමෙන් හා කැපවීමෙන් කටයුතු කළ යුතු ය. මේ සඳහා අවශ්‍ය සහාය ලබා දීමට අධ්‍යාපන නිලධාරීන්, විදුහල්පතිවරුන් හා ගුරු උපදේශකවරුන් දැනුවත් කර ඇත.

නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ තුළින් අප බලාපොරොත්තු වන්නේ ජාතියේ නිවහල් භාවය, සමගිය හා සාමය තහවුරු වන අන්දමට අප දරුවන් සකස් කර ගැනීමට පොහොසත් වන ලෙසින් අධ්‍යාපනය ලබා දීම ය.

එය ඉතා වගකීමකින් යුතු ව හා කැපවීමකින් කළ යුතු කාර්යයකි. ඒ සමග ම ගුරුවරයා විසින් අත්‍යවශ්‍යයෙන් ම කළ යුත්තේ ඒ උතුම් කාර්ය භාරය තමාගේ මුළු ශක්ති ප්‍රමාණයෙන් ම හා කැපවීමකින් කිරීමයි. මෙය පෞද්ගලික සුඛ විහරණය නොතකා ජාතියේ උන්නතියට කරන සේවයක් වශයෙන් අගය කරන බව දන්වමි.

මෙම පොත සැකසීමේ දී ඇප කැපවීමෙන් ක්‍රියාකළ විෂයමාලා සංවර්ධන 1 - ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ඇතුලු නිලධාරී පිරිසටත්, කාර්යය මණ්ඩලයටත්, විවිධ ආගමික හා අධ්‍යාපනික ආයතනවල විද්වතුන්ටත්, ආයතනයේ මුද්‍රණ කාර්ය මණ්ඩලයටත් බෙහෙවින් කෘතඥ වෙමි.

මහාචාර්ය ලක්ෂමන් ජයතිලක
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය
1998 දෙසැම්බර් මස 24 දින දී ය.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

## අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවුඩය (සංශෝධිත මුද්‍රණය සඳහා)

ප්‍රාථමික පාසල් අවධිය ළමා සංවර්ධනයේ ඉතාමත් තීරණාත්මක අවධියකි. අනාගතයේ සාර්ථක පුරවැසියකු වශයෙන් ක්‍රියා කිරීමට අවශ්‍ය ශක්තීන් රාශියක් ගොඩ නැගෙන්නේත් හැඩ ගැසෙන්නේත් මේ කාල පරිච්ඡේදය තුළ දී ය. ඒ සඳහා ළමුන්ගේ වර්ධනයට හිතකර එසේ ම ඒවාට අනුබල දෙන්නා වූ පරිසරයක් නිර්මාණය කිරීම අවශ්‍ය වේ. මෙහි දී ළමුන්ට තමා අවට පරිසරය සමඟ නිරන්තරයෙන් ගැටී අත්දැකීම් ලබා ගැනීමටත් ක්‍රියාකාරී ලෙස පරිසරය සමඟ සම්බන්ධ වීමටත් ප්‍රීතිය හා සතුට අත්විඳීමටත් තමා කරන වැඩ තුළින් සාර්ථකත්වය භුක්ති විඳීමටත් දෙමව්පියන්ගේ හා ගුරුවරුන්ගේ ආදරය හා පිළිගැනීම ලැබීමටත් ඉඩ ප්‍රස්තා සැලසිය යුතු ය. එවැනි අවස්ථා ළමයාගේ සංවර්ධනය උපරිම මට්ටමකින් සිදු කිරීමට අනුබල දෙන්නක් වෙයි.

ප්‍රාථමික ශ්‍රේණි සඳහා විෂයමාලාව සහ ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයන් පිළියෙල කිරීමේ දී ඉහත දක්වන ලද කරුණු දැඩි ලෙස සැලකිල්ලට ගෙන ඇත. එම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයක් පාසල්වල ක්‍රියාත්මක කිරීමේ දී ද එම කරුණු ඉස්මතු වන ආකාරයට ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කර ගැනීමට ගුරුවරුන් විසින් අවධානය යොමු කළ යුතු ය. එසේ ම මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයන් ගුරු මහත්ම මහත්මීන්ට තම පන්ති කාමරවල ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කර ගැනීම සඳහා කරන මග පෙන්වීමක් පමණක් බව ද අවධාරණය කරනු කැමැත්තෙමි. එහි ඇතුළත් කරුණු සැලකිල්ලට ගෙන තමාගේ ප්‍රදේශයට ගැළපෙන ආකාරයට තමාගේ ම ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියක් ගොඩ නගා ගැනීමට ගුරුවරුන් උනන්දු විය යුතු ය. නිර්මාණාත්මක ලෙස පන්ති කාමර කටයුතු ගොඩ නගා ගැනීමට මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රයෝජනයට ගත යුතු ය.

මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය අධ්‍යාපන ක්ෂේත්‍රයේ සිටින ඉතාමත් විශාල පිරිසකගේ දායකත්වයෙන් සම්පාදනය කරන ලද්දකි. ඔවුන් සියලු ම දෙනාටත් මෙම කාර්යය වෙනුවෙන් මූලිකත්වය ගෙන ක්‍රියා කළ ප්‍රාථමික අධ්‍යාපන ඒකකයේ සියලු ම නිලධාරී මහත්ම මහත්මීටත් මාගේ කෘතඥතාවය හිමි වේ.

මහාචාර්ය ජේ. ඩබ්ලිව්. වික්‍රමසිංහ
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය
2006 ජුලි 20 දින දී ය.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

## හැඳින්වීම

නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වැඩ සටහන යටතේ දෙවන ශ්‍රේණිය සඳහා හඳුන්වා දෙන මෙම විෂය නිර්දේශ හා ගුරු අත්පොත 2000 වර්ෂයේ සිට අනෙක් සියලු ම පාසල්වල ක්‍රියාත්මක කිරීමට නියමිත ය.

ජාතික අධ්‍යාපන කොමිෂම විසින් ප්‍රකාශයට පත් කර ඇති නිපුණතා පාදක කර ගෙන මෙම විෂයමාලාව ගොඩ නඟා ඇත. මෙහි දී ප්‍රාථමික අධ්‍යාපනය සම්බන්ධයෙන් පත් කරන ලද තාක්ෂණික කමිටුවේ යෝජනා කෙරෙහි විශේෂ අවධානය යොමු කර තිබේ.

ඊට අමතර ව මෙය සකස් කිරීමේ දී පහත සඳහන් කරුණු කෙරෙහි ද විශේෂ සැලකිල්ලක් දක්වා ඇත.

- ජාතික අධ්‍යාපන ආයතනය මඟින් ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ ව කර ඇති පර්යේෂණ හා අධ්‍යයන
- වෙනත් රටවල ප්‍රාථමික අධ්‍යාපන විෂයමාලා හා ඒ සම්බන්ධව කර ඇති අධ්‍යයන
- ශ්‍රී ලංකාවේ ප්‍රාථමික ගුරුවරුන් විසින් විෂයමාලාවෙහි සිදු කළ යුතු වෙනස්කම් පිළිබඳ ව ඉදිරිපත් කරන ලද යෝජනා හා අදහස්
- ආගමික නායකයන්, අධ්‍යාපනඥයන් හා ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ උනන්දුවක් දක්වන විද්වතුන්ගේ අදහස්

මව්බස, ගණිතය හා පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් යන විෂය ක්ෂේත්‍ර තුන පිළිබඳවත්, ක්‍රියාකාරකම් පාදක කර ගත් වාචික ඉංග්‍රීසි භාවිතය පිළිබඳවත් තක්සේරු කිරීම හා පළමුවන ප්‍රධාන අවධියේ අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා හා ඒවායේ ප්‍රවීනතාව තහවුරු කිරීම පිළිබඳවත් ගුරුවරුන්ට ප්‍රයෝජනවත් විය හැකි උපදෙස් හා විශේෂ කරුණු මෙහි ඇතුළත් ය.

දෙවන ශ්‍රේණියේදී, ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ විනෝදාත්මක වැඩ හා සෙල්ලම්වලටත්, ක්‍රියාකාරකම්වලටත් ප්‍රධාන ස්ථානයක් හිමි විය යුතු ය. මේ සඳහා උපදෙස් ගුරු අත්පොතෙහි යෝජනා කර තිබේ. ඒවා සුදුසු පරිදි තෝරා ගෙන, පන්ති කාමරය තුළ හා ඉන් පිටත දී ඉගෙනුම්-ඉගැන්වීම් අවස්ථාවල දී ප්‍රයෝජනයට ගන්න. මීට අමතර ව ඔබ පන්තියේ සිසුන්ට ගැළපෙන වෙනත් මෙවැනි දේ හා ජනක්‍රීඩා යොදා ගනිමින් ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය ප්‍රසන්න වූත් ඵලදායි වූත් එකක් කිරීමට සෑම පියවරක් ම ගන්න.

දරුවාගේ ඉගෙනුම් ප්‍රගතිය හා දුෂ්කරතා හඳුනා ගැනීම සඳහා නිරන්තරයෙන් තොරතුරු රැස් කිරීම හා එම තොරතුරු ඵලදායි ලෙස ප්‍රයෝජනයට ගැනීම කෙරෙහි ද ගුරුවරුන්ගේ විශේෂ අවධානය යොමු විය යුතු ය.

මෙම විෂය නිර්දේශ හා ගුරු අත්පොත් සකස් කිරීමේ දී ගුරුවරුන්, ගුරු උපදේශකවරුන්, විදුහල්පතිවරුන්, අධ්‍යාපන විද්‍යා පීඨ හා ගුරු විද්‍යාල කථිකාචාර්යවරුන්, අධ්‍යාපන නිලධාරීන් හා ප්‍රවීණ අධ්‍යාපනඥයින් රැසකගේ සහාය ලැබිණ. ඒ සියලු දෙනාටත් ප්‍රාථමික අධ්‍යාපන කටයුතු කෙරෙහි විශේෂ උපදෙස් නිරතුරු ව ලබා දුන් ජාතික අධ්‍යාපන කොමිසමේ සාමාජිකා හා ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ තාක්ෂණික කමිටුවේ සාමාජිකා කමලා පීරිස් මෙනවියටත් මෙම කෘතිය සාර්ථක කර ගැනීමට නව අධ්‍යාපන චින්තනය පිළිබඳ ව විශේෂ උපදෙස් දෙමින් අපට මඟ පෙන් වූ ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් මහාචාර්ය ලක්ෂමන් ජයතිලක මහතාටත්, ඇප කැප වී කටයුතු කළ විෂයමාලා සංවර්ධන 1 - ප්‍රාථමික අධ්‍යාපනයේ සියලු ම සහෝදර නිලධාරීන් හා කාර්ය මණ්ඩලයටත් මගේ අවංක කෘතඥතාව පිරිනමමි.

මෙම විෂය නිර්දේශය හා ගුරු අත්පොත තව දුරටත් දියුණු කිරීමට තුඩු දෙන අදහස් හා යෝජනා වෙතොත් ඒවා මා වෙත දන්වා එවන මෙන් කරුණාවෙන් ඉල්ලමි.

ආචාර්ය ජී. එල්. එස්. නානායක්කාර
අධ්‍යක්ෂ - ප්‍රාථමික අධ්‍යාපනය
1998 දෙසැම්බර් මස 24 දින දී ය.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

## හැඳින්වීම (සංශෝධිත මුද්‍රණය සඳහා)

2007 වසරේ දී දෙවන ශ්‍රේණිය සඳහා හඳුන්වා දෙන මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය 1998 අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ දෙවන ශ්‍රේණිය සඳහා හඳුන්වා දෙන ලද ගුරු අත්පොතේ නව සංස්කරණයකි. 1998 සිට වසර 8ක් පාසල්වල ක්‍රියාත්මක කිරීමේ දී ලද අත්දැකීම් සැලකිල්ලට ගෙන මෙම සංස්කරණ සිදු කර ඇත. එසේ ම 2003 වර්ෂයේ දී පළ කළ ජාතික අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව, ජාතික අධ්‍යාපන ආයතනය මඟින් ක්‍රියාත්මක කරන ලද විෂයමාලා පසුපෙවුම් වැඩ සටහන මඟින් ලබා ගත් තොරතුරු, විවිධ ආයතන මඟින් ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ ව පවත්වන ලද පර්යේෂණවලින් ලබා ගත් තොරතුරු සහ ගුරු මහත්ම මහත්මීන් හා ගුරු උපදේශක මහත්ම මහත්මීන් විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු ද මෙම සංස්කරණය සඳහා ප්‍රයෝජනයට ගන්නා ලදී.

ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය යනු ගුරු මහත්ම මහත්මීන් හට තමන්ගේ පන්තිවල ඉගෙනුම්-ඉගැන්වීම් කටයුතු සංවිධානය කර ගැනීමට මඟ පෙන්වනු ලබන උපදෙස් සංග්‍රහයකි. එම මඟ පෙන්වීම්වලට අනුව තමන්ගේ ඉගෙනුම්-ඉගැන්වීම් කටයුතු සකස් කර ගැනීම ගුරු මහත්ම මහත්මීන්ගේ වගකීම වෙයි. ප්‍රාථමික ශ්‍රේණිවල සිටින සිසුන් ඔවුන්ගේ පූර්ණ සංවර්ධනයේ ඉතාමත් තීරණාත්මක අවධියක පසු වන්නන් ය. සිසුන්ගේ නිර්මාණාත්මක චින්තනය, සමාජ කුසලතා සහ පෞරුෂ ලක්ෂණ ගොඩ නැගෙන්නේත් හැඩ ගැසෙන්නේත් මේ අවධියේ දී ය. එම නිසා සිසුන් සඳහා ඉගෙනුම් අත්දැකීම් සංවිධානය කිරීමේ දී මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ ඇති තොරතුරු මෙන් ම ඉහත සඳහන් කළ ළමා සංවර්ධනය හා සම්බන්ධ කරුණු ද සැලකිල්ලට ගත යුතු ය. සිසුන්ගේ ඉගෙනීම සම්බන්ධයෙන් ඔවුන්ගේ ආසන්න පරිසරය ඉතාම සාර්ථකව යොදා ගත හැකි ය. මෙම වයස් සීමාවේ පසුවන සිසුන්ගේ ඉගෙනීම සම්පූර්ණයෙන් ම සිදු වන්නේ පරිසරයත් සමඟ අන්තර් ක්‍රියා කිරීමෙනි. එම නිසා සිසුන් සඳහා ඉගෙනුම්-ඉගැන්වීම් කටයුතු සංවිධානය කිරීමේ දී සිසුන්ගේ ආසන්න පරිසරය අර්ථාන්විත ලෙස භාවිත කළ යුතු ය.

මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයෙහි ඇති ඉගෙනුම් ක්‍රියාකාරකම් සංවිධානය කිරීමේ දී විනෝදජනක වැඩ සහ ක්‍රීඩාවලට වැදගත් තැනක් දී තිබේ. සිසුන්ට තම ළමා කාලයේ දී ප්‍රීතිය භුක්ති විඳීමට හා සාර්ථකත්වය අත්දැකීමට අවස්ථාවන් තිබීම ඔවුන්ගේ පූර්ණ සංවර්ධනය සඳහා අතිශයින් වැදගත් වේ. එමෙන් ම ඔවුන්ගේ අනාගත ජීවිතයට අදාළ නිපුණතා සංවර්ධනය කිරීමේ පදනම ද ඇති කළ යුතු ය. ඒ සඳහා පන්ති කාමරය තුළ හැකිතාක් අවස්ථා සම්පාදනය කිරීම වැදගත් ය. තමාගේ පන්තියේ ඉගෙන ගන්නා සිසුන් ඉගෙනුම් ක්‍රියාවලිය සමඟ කොතරම් හොඳින් සම්බන්ධ වන්නේද යන්න පිළිබඳ ව නිරන්තරයෙන් සැලකිලිමත්ව සිට අවශ්‍ය පිළියම් යොදමින් කටයුතු කිරීම ගුරු මහත්ම මහත්මීන්ගේ අවධානයට ලක් විය යුතු කරුණකි. තක්සේරු කිරීම යනුවෙන් අදහස් කරන මෙම ක්‍රියාවලියෙහි අවසාන ප්‍රතිඵලය විය යුත්තේ සෑම සිසුවකුගේ ම ඉගෙනීම වැඩි දියුණු කිරීම ය.

මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය සකස් කිරීම සඳහා ගුරුවරුන්ගේ ගුරු උපදේශකවරුන්ගේ විදුහල්පතිවරුන්ගේ ගුරුවිද්‍යාල, අධ්‍යාපන විද්‍යා පීඨ, විශ්ව විද්‍යාල කථිකාචාර්යවරුන්ගෙන් හා අධ්‍යාපන නිලධාරීන් විශාල පිරිසකගේ ද සහාය ලබා ගන්නා ලදී. ඒ සියලු ම දෙනා ම දැක් වූ දායකත්වය වෙනුවෙන් මාගේ කෘතඥතාවය පළ කරමි. එසේ ම ප්‍රාථමික අධ්‍යාපන අංශයේ කටයුතුවලට නිරන්තරයෙන් සහාය දක්වන හිටපු ප්‍රාථමික අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් වන කමලා පිරිස් මෙනවිය, චිත්‍රාංගනී මල්වැන්න මිය, ආචාර්ය ජී. එල්. එස්. නානායක්කාර යන මහත්ම මහත්මීන් ලබා දී ඇති සේවය බෙහෙවින් අගය කරමි. එසේ ම නිරන්තරයෙන් අපට අවශ්‍ය මඟ පෙන්වීම් ලබා දෙන අප ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් මහාචාර්ය ජගත් වික්‍රමසිංහ මහතා කෘතඥතා පූර්වක ව සිහිපත් කරමි. මෙම කෘතිය සකස් කිරීම වෙනුවෙන් ඇප කැපවී ක්‍රියා කළ අපගේ අංශයේ සියලු ම නිලධාරී මහත්ම මහත්මීන්ගේ සේවය ඉතා ඉහළින් අගය කරමි.

විමල් සියඹලාගොඩ
සහකාර අධ්‍යක්ෂ ජනරාල්
(භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය)
ජාතික අධ්‍යාපන ආයතනය
2006 ජුලි 20 දින දී ය.

ආචාර්ය සුරනිමල ලේකම්ගේ
අංශ ප්‍රධාන
ප්‍රාථමික අධ්‍යාපන ඒකකය
ජාතික අධ්‍යාපන ආයතනය
2006 ජුලි 20 දින දී ය.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

# ජාතික අරමුණු

(i) මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පයක් මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින් ජාතික ඒකාබද්ධතාවය, ජාතික සෘජු ගුණය, ජාතික සමගිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීම තුළින් ජාතිය ගොඩ නැඟීම සහ ශ්‍රී ලාංකීය අනන්‍යතාවය තහවුරු කිරීම.

(ii) වෙනස් වන ලෝකයක අභියෝගයන්ට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැඟි දායාදයන් හඳුනා ගැනීම සහ සංරක්ෂණය කිරීම.

(iii) මානව අයිතිවාසිකම්වලට ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුවත් වීම, හෘදයාංගම බැඳීමකින් යුතුව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග ප්‍රවර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මතයන් සහ ප්‍රජාතාන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණය කිරීම සහ පවත්වා ගෙන යාමට සහාය වීම.

(iv) පුද්ගලයින්ගේ මානසික හා ශාරීරික සුව සම්පත සහ මානව අගයයන්ට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම.

(v) සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාපණ හැකියාව, ආරම්භක ශක්තිය, විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුලු වෙනත් ධනාත්මක අංගලක්ෂණ සංවර්ධනය කිරීම.

(vi) පුද්ගලයාගේ සහ ජාතියේ ජීව ගුණය වැඩි දියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායී කාර්යයන් සඳහා අධ්‍යාපනය තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම.

(vii) ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදු වන වෙනස්කම් අනුව හැඩ ගැසීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයින් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවන්ට සාර්ථක ව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම.

(viii) ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවනීය ස්ථානයක් හිමි කර ගැනීමට දායක වන යුක්තිය, සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වූ ආකල්ප හා කුසලතා පෝෂණය කිරීම.

# මූලික නිපුණතා

අධ්‍යාපනය තුළින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු මුදුන්පත් කර ගැනීමට දායක වනු ඇත.

(i) සන්නිවේදන නිපුණතා

සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය සහ තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය යන අනුකාණ්ඩ 4ක් මත සන්නිවේදන නිපුණතා පදනම් වේ.

| | | |
|---|---|---|
| සාක්ෂරතාව | : | සාවධානව ඇහුම්කන් දීම. පැහැදිලි ව කතා කිරීම. තේරුම් ගැනීම සඳහා කියවීම. නිවැරදි ව සහ නිරවුල් ව ලිවීම. ඵලදායී අයුරින් අදහස් හුවමාරු කර ගැනීම. |
| සංඛ්‍යා පිළිබඳ දැනුම | : | භාණ්ඩ, අවකාශය හා කාලය, ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය. |
| රූපක භාවිතය | : | රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති සහ වර්ණ ගලපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම. |
| තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය | : | පරිගණක දැනුම සහ ඉගෙනීමේ දී ද සේවා පරිශ්‍රයන් තුළ දී ද පෞද්ගලික ජීවිතයේ දී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගී කර ගැනීම. |

(ii) පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා

- නිර්මාණශීලී බව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තිය, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලී හා විග්‍රහාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයා ගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුසලතා
- ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම වැනි අගයයන්.
- චිත්තවේගී බුද්ධිය.

(iii) පරිසරයට අදාළ නිපුණතා

මෙම නිපුණතා සාමාජික, ජෛව සහ භෞතික පරිසරයන්ට අදාළ වේ.

| | | |
|---|---|---|
| සමාජ පරිසරය | : | ජාතික උරුමයන් පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සාමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුසලතා, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පුද්ගලික චර්යාව, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදායයන්, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම්. |
| ජෛව පරිසරය | : | සජීවී ලෝකය, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස් වැල්, වනාන්තර, මුහුදු, ජලය, වාතය සහ ජීවය - ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදී බව හා කුසලතා. |
| භෞතික පරිසරය | : | අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට ඒවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍ය, සුව පහසුව, නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මලපහ කිරීම යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදීතාව හා කුසලතාව. |

ඉගෙනීම, වැඩ කිරීම සහ ජීවත් වීම සඳහා මෙවලම් සහ තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුසලතා මෙහි අඩංගු වේ.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

(iv) වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා
ආර්ථික සංවර්ධනයට දායක වීම.
තම වෘත්තීය ලැදියා සහ අභියෝගතා හඳුනා ගැනීම.
හැකියාවන්ට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම සහ වාසිදායක හා තිරසාර ජීවනෝපායක නිරත වීම.
යන හැකියාවන් උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා.

(v) ආගම සහ ආචාර ධර්මයන්ට අදාළ නිපුණතා
පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේදී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයයන් උකහා ගැනීම හා ස්වීයකරණය.


(vi) ක්‍රීඩාව සහ විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා
සෞන්දර්යය, සාහිත්‍යය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටාවන් තුළින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්.

(vii) "ඉගෙනීමට ඉගෙනුම" පිළිබඳ නිපුණතා
ශීඝ්‍රයෙන් වෙනස් වන, සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස්වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදී ව හා සාර්ථක ව ප්‍රතිචාර දැක්වීමත් ස්වාධීනව ඉගෙන ගැනීමත් සඳහා පුද්ගලයින් හට ශක්තිය ලබා දීම.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

1 වන රූප සටහන

ප්‍රාථමික විෂයමාලා සැලැස්ම - 2007




Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

## පළමුවන මුද්‍රණය 1999

උපදේශනය :

මහාචාර්ය ලක්ෂ්මන් ජයතිලක
(අධ්‍යක්ෂ ජනරාල් - ජාතික අධ්‍යාපන ආයතනය)
ආචාර්ය ධම්මික පී. බිබිලේ
(සහකාර අධ්‍යක්ෂ ජනරාල්)

අධ්‍යක්ෂණය :

ආචාර්ය ජී. එල්. එස්. නානායක්කාර
විමල් සියඹලාගොඩ මයා

විෂයමාලා කමිටුව : (ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව)

ආචාර්ය ජී. එල්. එස්. නානායක්කාර
විමල් සියඹලාගොඩ මයා
පී. සුබ්‍රමනියම් මයා
චන්ද්‍රා සමරසිංහ මිය
එස්. එම්. විජේරත්න මයා
එම්. පී. එම්. එම්. ෂිබ්ලි මයා
කේ. එච්. පරණවිතාන මයා
ජේ. එච්. චන්ද්‍රසේන මයා
ඊ. එල්. සුරනිමල මයා
ටී. කේ. වීරතුංග මිය
අයිරින් ගජනායක මිය
කේ. ඒ. ඩී. පී. සරත්චන්ද්‍ර මයා
කේ. ඩී. ආර්. දයාවංශ මයා
කේ. ඩබ්ලිව්. ලියනගේ මිය
ඒ. අතුකෝරළ මිය
නන්දා බෙන්තරගේ මිය
එස්. අයි. එම්. එච්. කරීම් මයා
ඩී. එම්. ඩබ්ලිව්. මුණසිංහ මිය
විජායි ලක්ෂ්මී දම්මුල්ල මිය
එම්. ඒ. ජී. ඩබ්ලිව්. කුලරත්න මයා
පී. ජී. ප්‍රේමලතා ජයසිංහ මිය
එම්. ආර්. ඩබ්ලිව්. මද්දුම මයා
කේ. ආර්. පත්මසිරි මයා

සහභාගිත්වය : (ඉංග්‍රීසි අධ්‍යාපන දෙපාර්තමේන්තුව)

වී. එස්. එම්. යටවත්ත මිය
ජයසිංහ හේරත් මයා
සුධර්මා ගජධීර මිය

පරිගණක වචන යෙදුම

මොනිකා විජේකෝන් මිය

මුද්‍රණ සහාය

එච්. එච්. ප්‍රනාන්දු මයා

## සංශෝධිත මුද්‍රණය 2007

උපදේශනය :

මහාචාර්ය ජේ. ඩබ්ලිව්. වික්‍රමසිංහ
(අධ්‍යක්ෂ ජනරාල් - ජාතික අධ්‍යාපන ආයතනය)
විමල් සියඹලාගොඩ මයා
(සහකාර අධ්‍යක්ෂ ජනරාල් - භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය)

අධ්‍යක්ෂණය :

ආචාර්ය සුරනිමල ලේකම්ගේ - (ප්‍රාථමික අධ්‍යාපන ඒකකය)

සංස්කරණය හා සම්බන්ධීකරණය :

ඩී. එම්. ඩබ්ලිව්. මුණසිංහ මිය

විෂයමාලා කමිටුව : (ප්‍රාථමික අධ්‍යාපන ඒකකය)

ආචාර්ය සුරනිමල ලේකම්ගේ මයා
කේ.ඒ.ඩී.පී. සරත්චන්ද්‍ර මයා
ඩී.එම්.ඩබ්ලිව්.මුණසිංහ මිය
එම්.ඒ.ජී.ඩබ්ලිව්.කුලරත්න මයා
එස්. එම්. ආර්. සුදීන් මයා
පී.ජී.ප්‍රේමලතා ජයසිංහ මිය
එම්.ආර්.ඩබ්ලිව්.මද්දුම මයා
කේ. ආර්.පත්මසිරි මයා
එම්. එන්. චන්දන ප්‍රනාන්දු මයා
ආර්. එම්. කේ ද සිල්වා මිය
ටී. මුකුන්දන් මයා
එච්.ඩබ්ලිව්.ඩබ්ලිව්.එම්.එස්.ආර්.රඹුක්වැල්ල මිය

සහභාගිත්වය : ( ඉංග්‍රීසි අධ්‍යාපන දෙපාර්තමේන්තුව )

එච්.ආර්.එස්.කේ. අටුගොඩ මයා
එස්.ඒ.ඩී.සමරවීර මයා
ඊ. වී. ඩී.සී. පී. පෙරේරා මිය

චිත්‍ර :

ටී.ඒ. රවීන්ද්‍ර ජයසේන මයා

පිටකවරය:

අමරා අමරසිංහ මෙනවිය

පරිගණක වචන යෙදුම :

මොනිකා විජේකෝන් මිය

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

# අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හා ප්‍රතිව්‍යුහකරණ යටතේ 1999 වර්ෂයේ සිට ජාතික මට්ටමින් ක්‍රියාත්මක වන ප්‍රාථමික අධ්‍යාපන විෂයමාලාවේ විශේෂ ලක්ෂණ

* ප්‍රාථමික අධ්‍යාපනය සඳහා වෙන් කර ඇති අවුරුදු 5ක කාල සීමාව විෂයමාලා සංවර්ධන හා අනෙකුත් කටයුතුවල පහසුව තකා ප්‍රධාන අවධි තුනකට බෙදීම.

1 ප්‍රධාන අවධිය : 1 වන සහ 2 වන ශ්‍රේණි
2 ප්‍රධාන අවධිය : 3 වන සහ 4 වන ශ්‍රේණි
3 ප්‍රධාන අවධිය : 5 වන ශ්‍රේණිය

* පළමුවන ශ්‍රේණියට ඇතුළු වන දරුවන් ආරම්භයේදී ම පහසුවෙන් හඳුනා ගැනීමට ගුරුවරයාට භාවිත කළ හැකි සැලසුම්ගත සෙල්ලම් හා ක්‍රියාකාරකම් සමූහයක් හඳුන්වා දීම.

* සාමාන්‍ය අධ්‍යාපන අවධිය අවසානයේදී සිසුන් විසින් වර්ධනය කර ගත යුතු යැයි නිර්දේශිත නිපුණතා ප්‍රකාශයට පත් කර ඇත. ඒවා ගොඩනැගීමට සුදුසු පදනමක් සැපයෙන පරිදි සැකසුණු නිපුණතා පාදක විෂයමාලාවක් වීම.

* විෂය ක්ෂේත්‍ර හතරක් යටතේ සංවිධානය කර තිබීම.
- භාෂාව
- ආගම
- ගණිතය
- පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්

* දරුවකුගේ පූර්ණ වර්ධනයට භාෂාව හා ගණිත නිපුණතාවලට අමතර ව සෞන්දර්ය, නිර්මාණ, විද්‍යාව, සෞඛ්‍යය හා පෝෂණය වැනි තවත් අංශ කිහිපයකට අයත් නිපුණතා වර්ධනය වීම අවශ්‍ය ය. මෙම නිපුණතා වෙන් වෙන් ව විෂයයන් වශයෙන් ඉදිරිපත් කිරීමට වඩා සිසුනට ගැළපෙන තේමා තුළින් අවස්ථානුකූල ව මතු කර ඉගෙනීමට සැලැස්වීම වඩා යෝග්‍ය ලෙස පිළිගැනේ. මෙවැනි අංශ මතු කර ගැනීමට සමත් තේමා සමූහයකින් සමන්විත පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂයයෙහි පෙරට වඩා සමෝධානිත ලක්ෂණ පෙන්නුම් කිරීම.

* පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂයයෙහි ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ දී භාෂාව, ගණිතය සහ ආගම යන විෂය ක්ෂේත්‍රවලට සම්බන්ධ නිපුණතා වර්ධනයට ද අවස්ථාවන් සැලසෙන හෙයින් එහි විෂය සම්බන්ධීකරණ ලක්ෂණ පෙන්නුම් කිරීම.

* පළමුවන ශ්‍රේණියේ සිට ම පන්තියේ ගුරුවරයා විසින් ක්‍රියාත්මක කළ යුතු ක්‍රියාකාරකම් පාදක වාචික ඉංග්‍රීසි නම් නව අංගයක් හඳුන්වා දීම.

* දෙවන ප්‍රධාන අවධියේ සිට විධිමත් ව ඉංග්‍රීසි විෂය ද තෙවන ප්‍රධාන අවධියේ සිට දෙවන ජාතික භාෂාවක් ද (සිංහල/දෙමළ) ඇතුළත් වේ.

* පළමුවන ශ්‍රේණියේ සිට දිගට ම විෂය සමගාමී ක්‍රියාකාරකම්වලටත්, පස්වන ශ්‍රේණියේ දී සිසු ළැදියා හා අවශ්‍යතාවලට ගැළපෙන වෛකල්පිත ක්‍රියාකාරකම්වලටත් කාල සටහන තුළින් ඉඩ ප්‍රස්තා සැපයීම.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

* සමස්ත ප්‍රාථමික අධ්‍යාපන අවධිය තුළ ම ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාලියේ දී ප්‍රධාන තැනක් හිමි වනුයේ ශිෂ්‍ය කේන්ද්‍රීය දිශාවට නැඹුරු වූ ක්‍රමවේදවලට ය. එම ක්‍රමවේද ප්‍රධාන වශයෙන් තෙවැදෑරුම් වේ.

- සැලසුම්ගත සෙල්ලම් හා විනෝදජනක වැඩ
- ක්‍රියාකාරකම්
- අසුන්ගත වැඩ

* පළමුවන ප්‍රධාන අවධියේ දී සැලසුම්ගත සෙල්ලම් සහ ක්‍රියාකාරකම්වලට වැඩි අවධානයක් ද අසුන්ගත වැඩවලට අඩු අවධානයක් ද ලැබේ. දෙවන ප්‍රධාන අවධියේ දී මෙම ක්‍රමවේද තුනට ම ආසන්න වශයෙන් සමාන ව අවධානය හිමි වේ. තෙවන ප්‍රධාන අවධියේ දී ක්‍රියාකාරකම් සහ අසුන්ගත වැඩවලට වැඩි අවධානයක් ද සෙල්ලම්වලට අඩු අවධානයක් ද ලැබේ. මේ අන්දමට ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේද ස ංකලන ප්‍රධාන අවධි තුන තුළ ක්‍රම ක්‍රමයෙන් වෙනස් වීම.

* සිසු ඉගෙනුම් ප්‍රගතිය හා ඉගෙනුම් දුෂ්කරතා පිළිබඳ ව හඳුනා ගැනීම පිණිස නිරීක්ෂණය, වාචික ප්‍රශ්න කිරීම, සිසුන්ට සවන් දීම වැනි අවිධිමත් ක්‍රමවලට ප්‍රමුඛතාවය දෙන අඛණ්ඩ ව කර ගෙන යා යුතු පන්ති කාමර පාදක තක්සේරු කිරීමේ ක්‍රියාවලියක් පවත්වා ගෙන යාම.

* එක් සිසුවකුගේ ලකුණු හෝ සාධන මට්ටම් තවත් සිසුවකුගේ ලකුණු හෝ සාධන මට්ටම් හෝ සමඟ සසඳා තීරණ ගැනීමේ ක්‍රමයෙන් මිදී නිශ්චිත අරමුණක් හෝ සිසු පූර්ව සාධන මට්ටමක් සමඟ සිසු සාධනය සසඳා තීරණ ගැනීමට සමත් පිළිවෙළින් නිර්ණායක මූලික සහ පූර්ව සාධන මූලික තක්සේරු කිරීමේ ක්‍රම යොදා ගැනීමට අනුබල දීම.

* සැමට අධ්‍යාපනය තහවුරු කර ගැනීම ඉලක්ක කර ගනිමින්, ඒ සඳහා ප්‍රමිතියක් වශයෙන්, එක් එක් ප්‍රධාන අවධිය අවසානයේ දී සිසුන් විසින් අනිවාර්යයෙන් ම ප්‍රවීණතා මට්ටමට ළඟා විය යුතු අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා හඳුන්වා දීමට පියවර ගැනීම.

* එක් එක් ප්‍රධාන අවධිය අවසානයේ දී ළඟා කර ගත යුතු යැ යි අපේක්ෂිත අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා පිළිබඳ ව ප්‍රවීණතාවක් ලබා ඇත්දැ යි තක්සේරු කිරීමට පියවර ගැනීම.

* එක් එක් ප්‍රධාන අවධියක් අවසානයේ අපේක්ෂිත අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා පිළිබඳ ප්‍රවීණතාවක් සියලු ම සිසුන්ට ලබා දීම ඉලක්ක කර ගෙන එම එක් ප්‍රධාන අවධියක් එකම ගුරුවරයකුගේ යටතට පත් කිරීමට අනුබල දීම.

* පළමුවන ප්‍රධාන අවධියේ සිසුන් පරිසර ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂයයේ ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ යෙදී සිටින විට ගුරු අධීක්ෂණය යටතේ, සංවිධානාත්මක ව හයවන ශ්‍රේණියේ සිසුන් සමඟ කණ්ඩායම් වැඩවල යෙදීමට ඉඩ ප්‍රස්තා සැපයීම.

* පළමුවන ප්‍රධාන අවධියේ දී පමණක් මව්බස විෂයයට ගණිතය විෂයයට වඩා වැඩිකාලයක් ද , දෙවන හා තෙවන ප්‍රධාන අවධිවල දී විවේක කාලය සඳහා දිනකට මිනිත්තු 30ක කාලයක් ද වෙන් කිරීම.

* 2007 වර්ෂයේ සිට පළමුවන ප්‍රධාන අවධියට දෙවන ජාතික භාෂාව හඳුන්වා දීම.

* 2007 වර්ෂයේ සිට ක්‍රියාකාරකම් පාදක වාචික ඉංග්‍රීසි ගණිත විෂයය සඳහා ද භාවිත කිරීම.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

# දෙවන ශ්‍රේණිය - විෂය නිර්දේශ සහ ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය

පටුන


| | | පිටු අංකය |
|---|---|---|
| 1.0 | මව්බස (සිංහල) - හැඳින්වීම සහ විෂය නිර්දේශය | 1 - 4 |
| | මව්බස (සිංහල) - ගුරු මාර්ගෝපදේශ | |
| 1.1 | සවන් දීම | 5 - 12 |
| 1.2 | කතා කිරීම | 13 - 20 |
| 1.3 | කියවීම | 21 - 35 |
| 1.4 | ලිවීම | 36 - 43 |
| 2.0 | පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් - හැඳින්වීම සහ විෂය නිර්දේශය | 44 - 57 |
| | පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් - ගුරු මාර්ගෝපදේශ | |
| 2.1 | අපයි පාසලයි | 58 - 60 |
| 2.2 | අපේ ගෙදර | 61 - 64 |
| 2.3 | වත්තට එන සත්තු | 65 - 67 |
| 2.4 | ජලය සමඟ සෙල්ලම් | 68 - 70 |
| 2.5 | අවුරුදු කාලය | 71 - 73 |
| 2.6 | අපට පෙනෙන අහස | 74 - 76 |
| 2.7 | අප කන බොන දේ | 77 - 79 |
| 2.8 | තොරතුරු ලැබෙන හැටි | 80 - 81 |
| 2.9 | වටාපිටාවේ සිදුවන වෙනස්කම් | 82 - 83 |
| 2.10 | කැමති - අකමැති | 84 - 86 |
| 2.11 | අපට ඕනෑ දේ ලැබෙන හැටි | 87 - 88 |
| 2.12 | ගමන් බිමන් | 89 - 91 |
| 2.13 | එළිය (ආලෝකය) සමඟ සෙල්ලම් | 92 - 94 |
| 2.14 | මිනිසුන් වැඩ කරන තැන් | 95 - 97 |
| 2.15 | වටාපිටාවේ වෙනස් තැන් | 98 - 99 |
| 2.16 | අපේ උදවු ඕනෑ අය | 100 - 102 |
| 3.0 | ක්‍රියාකාරකම් පාදක වාචික ඉංග්‍රීසි - විෂය නිර්දේශය හා ගුරු මාර්ගෝපදේශ | 103 - 114 |
| 4.0 | දෙවන ජාතික භාෂාව - විෂය නිර්දේශය හා ගුරු මාර්ගෝපදේශ | 115 - 122 |
| 5.0 | සෙල්ලම් මිදුල | 123 - 126 |
| 6.0 | සිසු ප්‍රගතිය තක්සේරු කිරීම | 127 - 133 |
| 7.0 | අත්‍යාවශ්‍ය ඉගෙනුම් නිපුණතා | 134 - 135 |


ගණිතය, ආගම් සඳහා විෂය නිර්දේශ හා ගුරු අත්පොත්

වෙන වෙන ම ඉදිරිපත් කෙරේ.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

# කාලය බෙදා ගැනීම - පළමුවන ප්‍රධාන අවධිය (පළමුවන හා දෙවන ශ්‍රේණි)

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

| විෂයය | සතියකට කාලය |
|---|---|
| 1. මව්බස | පැය 5.00 |
| 2. ගණිතය | පැය 3.30 |
| 3. පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් | පැය 5.30 |
| 4. ආගම | පැය 1.15 |
| 5. දෙවන ජාතික භාෂාව | මිනිත්තු 0.30 |
| 6. උදය රැස්වීම් හා ආගමික වතාවත් | මිනිත්තු 1.15 (දිනකට මිනිත්තු 15 බැගින්) |
| 7. විවේක කාලය | පැය 1.15 (දිනකට මිනිත්තු 15 බැගින්) |
| 8. ආහාර ගැනීම සඳහා | මිනිත්තු 0.50 (දිනකට මිනිත්තු 10 බැගින්) |
| 9. ශරීර සුවතා ක්‍රියාකාරකම් | මිනිත්තු 1.40 (දිනකට මිනිත්තු 20 බැගින්) |
| 10. විෂය සමගාමී ක්‍රියාකාරකම් | මිනිත්තු 0.30 (සතියේ එක් දිනක) |
| සතියකට මුළු කාලය | පැය 21.15 |

1. හැඳින්වීම

මව්බස විෂය සවන් දීම, කතා කිරීම, කියවීම, ලිවීම වශයෙන් ක්ෂේත්‍ර හතරක් යටතේ ඉදිරිපත් කර ඇත. ගුරුවරයාට විෂය අන්තර්ගත කරුණු පැහැදිලි කර ගැනීමට පහසු වනු පිණිස එසේ ඉදිරිපත් කර ඇතත් ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කර ගැනීමේ දී මෙම ක්ෂේත්‍ර අදාළ පරිදි සමෝධානය කර ගැනීම අපේක්ෂා කෙරේ.

2007 වර්ෂයේ සිට ක්‍රියාත්මක වන නිපුණතා පාදක ප්‍රවේශයේ දී, මූලික නිපුණතාවක් ලෙස සාක්ෂරතාව සඳහන් කෙරේ. එහි දී, සාවධානව ඇහුම්කන් දීම, පැහැදිලි ව කතා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරදි ව හා නිරවුල් ව ලිවීම, ඵලදායී අයුරින් අදහස් හුවමාරු කර ගැනීම යන නිපුණතා කරා සිසුන් ළඟා කරවීම අපේක්ෂිත ය.

මෙම සන්නිවේදන නිපුණතාවලට අමතර ව පරිසරයට අදාළ නිපුණතා, වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතාව, ආචාර ධර්මවලට හා ආගමට අදාළ නිපුණතා, ක්‍රීඩා හා විවේකය ප්‍රයෝජනයට ගැනීම පිළිබඳ නිපුණතා, පෝෂණය වර්ධනයට අදාළ නිපුණතා ඉගෙනීමට ඉගෙනීම පිළිබඳ නිපුණතා යන අනෙක් නිපුණතා වර්ධනය වන ලෙසින් විෂයයට අදාළ ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කර ගැනීම අපේක්ෂා කෙරේ.

02. නිපුණතා

(අ) ප්‍රාථමික අධ්‍යාපන අවධිය සඳහා නිපුණතා

* එදිනෙදා අවශ්‍යතා සඳහා සවන් දීමේ, කතා කිරීමේ කියවීමේ හා ලිවීමේ හැකියා ප්‍රදර්ශනය කරයි.
* කවි, ගී, කතන්දර අසා සහ කියවා රස විඳියි.
* නිවැරදි උච්චාරණය සහිත ව ශබ්ද නගා කියවයි.
* ක්‍රමවත් ව පැහැදිලි ව හා නිවැරදි ව ලියයි.
* සවන්දීම, කතා කිරීම, කියවීම හා ලිවීම සම්බන්ධ හොඳ පුරුදු ප්‍රදර්ශනය කරයි.
* පොත් පත් කියවා තේරුම් ගනියි. රස විඳියි.
* තම අත්දැකීම් වාර්තා කිරීමට හා අදහස් නිර්මාණාත්මක ව ප්‍රකාශ කිරීමේ හැකියා ප්‍රදර්ශනය කරයි.
* සමූහයක් ඉදිරිපිට තම අදහස් සුහද ව, නිරවුල් ව හා ආචාරශීලී ව ඉදිරිපත් කරයි.

(ආ) දෙවන ප්‍රධාන අවධියේ අපේක්ෂිත නිපුණතා

1. ආචාරශීලී බව ප්‍රදර්ශනය කරමින් සවන් දෙයි
2. සවන් දුන් දෙයක ප්‍රධාන අදහස වෙනස් නොකර නැවත පවසයි
3. සුහද බව රැක ගනිමින් කතා බහේ යෙදෙයි
4. නිසි උච්චාරණය සහිත ව කතා කරයි
5. නිසි උච්චාරණය සහිත ව විරාම ලක්ෂණවලට අනුකූල ව කියවයි
6. කියවා අවබෝධ කරගෙන වැදගත් කරුණු ඉදිරිපත් කරයි
7. සරල ව්‍යාකරණ රීති රැක ගනිමින් වැකි ලියයි
8. සුවිශේෂී යොමු කිරීමකට අනුව නිර්මාණාත්මක ව ලියයි

3. ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය

දෙවන ශ්‍රේණිය සඳහා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සැලසුම් කිරීමේ දී සෙල්ලම් හා විනෝදජනක වැඩ වැඩි වශයෙනුත්, ක්‍රියාකාරකම් අවශ්‍ය පරිදිත්, අසුන් ගත වැඩ අඩුවෙනුත්, යොදා ගැනීම අපේක්ෂා කෙරේ. මෙහි දී කුඩා කණ්ඩායම් වැඩ, විශාල කණ්ඩායම් වැඩ, පන්තියම කණ්ඩායමක් ලෙස ගෙන කරන වැඩ සහ තනි වැඩ අදාළ පරිදි සැලසුම් කර ගැනීම අවශ්‍ය ය.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

මව්බස විෂය නිර්දේශය ක්‍රියාත්මක කිරීමේ දී ඒ හා බැඳුණු පෙළ පොත සහ වැඩ පොත යොදා ගත යුතු ය. ඒ සඳහා ද මග පෙන්වීම් ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයෙහි අන්තර්ගත වේ. පෙළ පොත භාවිතයේ දී නිර්මාණශීලී ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රම යොදා ගනිමින් සිසුන් තුළ නිර්මාණශීලී භාවය ඇති කිරීම ද අපෙක්ෂා කෙරේ.

4. පාසල් ප්‍රතිපත්ති හා වැඩසටහන්

මව්බස විෂය හා බැඳුණු වැඩසටහන් රාශියක් පාසල තුළ ක්‍රියාත්මක වේ.

* උදෑසන රැස්වීම්
* පන්ති රැස්වීම්
* විවිධ ප්‍රසංග
* ප්‍රදර්ශන
* සිහිති පොළ
* ආගමික වැඩසටහන්
* ගුරු දෙගුරු දින ඉන් සමහරකි

ඉහත දැක්වෙන පාසල් වැඩසටහන්වල දී සිසුන්ගේ භාෂා කුසලතා වර්ධනය සඳහා පහත දැක්වෙන ක්‍රියාකාරකම් නිර්මාණශීලි ව යොදා ගත හැකි වේ.

එනම් ,
* කථන ක්‍රියාකාරකම්
* සාමූහික හා තනි තනිව කෙරෙන ගායනා
* රංගන හා රූපණ ආශ්‍රිත ක්‍රියාකාරකම් ඊට උදාහරණ ලෙස දැක්විය හැකි ය

5. සිසු ප්‍රගතිය තක්සේරු කිරීම

මෙම ශ්‍රේණියේ දී මව්බස විෂය තුළ ලිඛිත පරීක්ෂණ වැනි ඇගයීම්වලට වඩා ප්‍රමුඛත්වය දිය යුතු වන්නේ සිසුන් සමඟ වැඩ කරමින් හා සිසුන්ගේ වැඩ නිරීක්ෂණය මගින් සිදු කරන ඇගයීම් විධිවලට ය. සෙල්ලම් හා විනෝදජනක වැඩ ක්‍රියාකාරකම්, පෙළ පොත හා වැඩ පොත භාවිතය වැනි අවස්ථාවල දී නිරීක්ෂණය, සාකච්ඡා, වාචික ප්‍රශ්න වැනි තක්සේරු ක්‍රම මගින් දෙවන ශ්‍රේණියට අදාළ නිපුණතා වර්ධනය වීම සිදු වන්නේ දැයි නිරතුරු ව තොරතුරු රැස් කරමින් ඇගයීමට ලක් කිරීම අපේක්ෂා කෙරේ.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

1.0 සවන් දීම

1.1 සවන් දෙමින් වින්දනය ලබයි
- සරල කවිවලට සවන් දෙමින් වින්දනය ලබයි
- කතන්දරවලට සවන් දෙමින් වින්දනය ලබයි

1.2 සන්නිවේදන අවශ්‍යතා සඳහා සවන් දෙයි
- සුහද කතා බහට සවන් දෙයි
- එදිනෙදා අවශ්‍යතා සඳහා සවන් දෙයි
- විශේෂ අවස්ථාවල දී අවධානයෙන් සවන් දෙයි

1.3 සවන් දී චින්තනයට යොමු වෙයි
- තේරවිලිවලට සවන් දී චින්තනයට යොමු වෙයි
- කතන්දර අසා චින්තනයට යොමු වෙයි
- සිදුවීම් ගැන අසා චින්තනයට යොමු වෙයි

1.4 අවධානයෙන් සවන් දී අවබෝධ කර ගනියි
- විධානවලට සවන් දී අවබෝධ කර ගනියි
- නිවේදනවලට සවන් දී අවබෝධ කර ගනියි
- සරල කතන්දරවලට සවන් දී අවබෝධ කර ගනියි
- සරල උපදෙස්වලට සවන් දී අවබෝධ කර ගනියි

2.0 කතා කිරීම

2.1 ගායන හැකියා ලබා ගනියි
- විවිධ ශෛලීන් අනුව ගායනා කළ හැකි ක්‍රීඩා කවි /ගී ගායනා කරයි
- රංගනය හා ගායනය මුසු කළ හැකි ළමා කවි /ගී ගායනා කරයි

2.2 සන්නිවේදන අවශ්‍යතා සඳහා කථනයේ යෙදෙයි
- සුහද කතා බහේ යෙදෙයි
- අත්දැකීම් පවසයි
- පණිවුඩ ගෙන යයි
- සිදුවීම් හා ආරංචි පවසයි

2.3 අවශ්‍යතා සඳහා කථනයේ යෙදෙයි
- උපදෙස් ලබා දෙයි
- ප්‍රශ්න කරයි
- තොරතුරු රැස් කරයි

2.4 නිර්මාණාත්මක කථන හැකියා ප්‍රදර්ශනය කරයි
- සාමූහික ව කතන්දර නිර්මාණය කරයි
- රූප රාමු ඇසුරෙන් සිදුවීම්/කතන්දර නිර්මාණය කරයි
- සිද්ධි සමූහයක් ඇසුරෙන් කතන්දර නිර්මාණය කරයි

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

3.0 කියවීම

3.1 වචන/වැකි/කෙටි ඡේද ශබ්ද නගා කියවයි
- ශුද්ධ සිංහල හෝඩියේ අක්ෂර හඳුනාගෙන කියවයි
- ඇලපිල්ල, අල්කිරීම, ඉස්පිල්ල, පාපිලි, ඇදය යන පිලි හ්‍රස්ව හා දීර්ඝ වශයෙන් හඳුනාගෙන නිවැරදි ව උච්චාරණය කරමින් කියවයි
- නැවතීම, ප්‍රශ්නාර්ථ ලකුණ ගැන සැලකිලිමත් ව කියවයි
- කොම්බුව හඳුනාගෙන එය යෙදුණු තැන් නිවැරදි ව උච්චාරණය කරමින් කියවයි

3.2 කියවීමේ වේගවත් බව හා ප්‍රවීණවත් බව වර්ධනය කර ගනියි
- වමේ සිට දකුණට කියවයි
- උඩ සිට පහළට නම් ලැයිස්තු කියවයි
- වේගවත් ව කියවා ප්‍රතිචාර දක්වයි
- උපදෙස් කියවා අවබෝධ කරගෙන ප්‍රතිචාර දක්වයි

3.3 නිශ්ශබ්ද ව කියවා අවබෝධ කර ගනියි
- සරල වචන නිශ්ශබ්ද ව කියවා අවබෝධ කර ගනියි
- සරල වාක්‍ය නිශ්ශබ්ද ව කියවා අවබෝධ කර ගනියි
- සරල කවි නිශ්ශබ්ද ව කියවා අවබෝධ කර ගනියි
- රූපික ප්‍රකාශන හොඳින් නිරීක්ෂණය කර අවබෝධ කර ගනියි

3.4 වාග්මාලාව පෝෂණය කර ගනියි
- සමීප පරිසරයේ දක්නට ලැබෙන දේවල නම් කියවයි
- නෑදෑකම් හඳුන්වන වචන කියවයි
- විවිධ ක්ෂේත්‍ර හා සම්බන්ධ ව එදිනෙදා භාවිත වන වචන කියවයි

4.0 ලිවීම

4.1 අකුරු නිවැරදි ව ලිවීමේ හැකියාව ලබයි
- අකුරක නියමිත අංග සහිත ව ලියයි
- අකුරක නියමිත හැඩය හා ප්‍රමාණය ගැන සැලකිලිමත් ව ලියයි
- රූල් අතර ලියයි
- වචනයක අකුරු ළං ව ලියයි
- වැකියක වචන අතර පරතරයක් සහිත ව ලියයි

4.2 අර්ථය නිවැරදි ව දැක්වෙන පරිදි ලියයි
- නිවැරදි අකුරු යොදා අර්ථවත් වචන ලියයි

4.3 සන්නිවේදනය සඳහා ලියයි
- පණිවිඩ ලියයි
- තමන්ගේ හා යහළුවන්ගේ නිවසට යන ගමන් මග ඇඳ නම් කරයි
- එදිනෙදා සිදුවීම් ලියයි
- තමා පිළිබඳ ව ලියයි

4.4 නිර්මාණාත්මක ව ලිවීමට පෙළඹෙයි
- පින්තූරයක් බලා තම අදහස් ලියයි
- දෙන ලද වැකියක් අනුව දෙවන වැකිය ගොඩ නගා ලියයි
- යම් වචනයක් හෝ ද්‍රව්‍යයක් පිළිබඳ ව වැකි ලියයි

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

## 1.0 සවන් දීම

නිපුණතාව

1.1 සවන් දෙමින් වින්දනය ලබයි.

1.1.1 සරල කවිවලට හා ළමා ගීවලට සවන් දෙමින් වින්දනය ලබයි.

1.1.2 කතන්දරවලට සවන් දෙමින් වින්දනය ලබයි.

විශේෂ සටහන්

- ඉතා සරල මෙන් ම සිසුන්ට සමීප වචනවලින් ලියැවුණු ළමා කවි/ගී තෝරා ගන්න.
- ගුරුවරයා හෝ වෙනත් ගුරුවරයකු මඟින් හෝ ඉහළ පන්තියක සිසුවකු මඟින් හෝ පහසුකම් ඇත්නම් කැසට් පටයක් මඟින් හෝ එම ගී/කවිවලට සවන් දී වින්දනය ලැබීමට ශිෂ්‍යයන්ට අවස්ථාව ලබා දෙන්න.
- මෙහි දී අත්තාල තැබීමෙන් ගායනයට සම්බන්ධ වෙමින් ර ංගනය කරමින් ආදේශ භාණ්ඩ වාදනය කරමින් ආදී වශයෙන් වින්දනය ලැබීමට සිසුනට අවස්ථාව ලබා දෙන්න.
- මේ සඳහා ළමයාට සමීප මාතෘකා යටතේ අර්ථය වඩාත් හොඳින් කුළුගැන්වෙන සේ, එකම වචනය කිහිප වරක් උච්චාරණය කිරීමට හැකි වන සේ ලියැවුණු පද මාලාවක් සහිත කවි/ගී තෝරා ගන්න.
- එබඳු කවි /ගී එකතුවක් ගොනු කර තබා ගන්න.
- ආසාවෙන් සවන් දෙන සිසුන්ගේ සිත්වලට දැනෙන වින්දනය ඔවුන්ගේ ඉරියව් මඟින් නිරීක්ෂණය කරන්න.

1.1.1 සරල කවිවලට හා ළමා ගීවලට සවන් දෙමින් වින්දනය ලබයි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය

ක්‍රියාකාරකම්

- මේ සඳහා සැලසුම්ගත සෙල්ලම් විනෝදජනක වැඩ සහ සැලසුම්ගත ක්‍රියාකාරකම් යොදා ගන්න.
- කථනය ක්ෂේත්‍රයේ 2.1 ගායන හැකියා ලබා ගනියි යන නිපුණතාව සමග සම්බන්ධ කර ගන්න.
- ජන කවි යොදාගෙන කුඩා දරුවන්ට කළ හැකි සෙල්ලම් දරුවනට ඉදිරිපත් කර සවන් දීමට යොමු කරන්න.

උදා :- අතුරු මිතුරු - දඹදිව තුරු
රාජ කපුරු හෙට්ටියෝ !

වරාගසට - ගියෙමි බොලන්
වරා මලක් - නෙළුම් බොලන්
කැන්ද ගසට - ගියෙමි බොලන්
කැන්ද කොළත් - නෙළුම් බොලන් !

අලුත ගෙනා මනමාලී
හාල් පතක් ගරාපී !
බටු කොරහක් උයාපී !
පහළ ගෙටත් - ඉහළ ගෙටත් බෙදාපී
මටත් පිඩක් නුදුන්නායි
ළිඳේ උන්නු මුට්ටි ටිකිරි
ගොඩ අරගන් හෙට්ටියෝ !

(ජන ගී මිහිර - 1990)

* සෙල්ලමක් වශයෙන් මෙම කවි පෙළ යොදා ගත හැකි එක් ආකාරයක් මෙසේ ය.

- මෙම සෙල්ලම සඳහා පන්තියේ සිටින සිසුන් කුඩා කණ්ඩායම්වලට වෙන් කරන්න.
- ඒ ඒ කණ්ඩායම් මෙහෙයවීමට එක් වරකට එක් ශිෂ්‍යයකුට ඉදිරිපත් වීමට ඉඩ සලසන්න.
- සෙල්ලමට සම්බන්ධ වන ඉතිරි අයගේ දෙඅත්ල ඉදිරියේ තිබෙන මේසය මත තැබීමට උපදෙස් දෙන්න. බිම හිඳගෙන වුව ද එසේ වටේට අත් තැබිය හැකි ය.
- අතුරු මිතුරු ගීය කියමින් එක් එක් අතට ඇඟිල්ල තබා ගෙන යන්නට මෙහෙයවන ශිෂ්‍යයාට කියන්න. ගොඩ අර ගන් හෙට්ටියෝ යන්නෙහි යෝ කියැවෙන විට දැක්වෙන අත හිමි ළමයා ඉවත් වේ.
- එක් එක් කණ්ඩායම්වලින් මෙසේ අවසානයේ ඉතිරි වන ශිෂ්‍යයන් අතර ද මෙම සෙල්ලම කරවන්න. අන්තිමටම ඉතිරි වන ශිෂ්‍යයාට සියල්ලන්ගේ ම සතුට පළ කරනු සඳහා අත් පොළසන් දීමට උපදෙස් දෙන්න.



Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

- මෙම සෙල්ලම හැකි තාක් වාර ගණනක් විවේකය ඇති පරිදි ඉදිරිපත් කිරීමට උනන්දු කරවන්න. මෙහි දී හොඳ සවන් දීමක් අවශ්‍ය වේ. එක් අයකුගේ හෝ අතක් මග හැරී යා නො දී සෙල්ලම ඉදිරිපත් කෙරේ දැයි ඔබට නිරීක්ෂණය කළ හැකි ය.
- ගීතයක් අසමින් වින්දනය ලබන අතර, විනෝදජනක අවස්ථාවකට නිතැතින් ම සිසුන් පෙළඹෙන මෙබඳු සෙල්ලම් තව තවත් සූදානම් කර ඉදිරිපත් කරන්න.

උදා :- රාහු බැලීම

පන්තියේ සියලු ම ළමයින්ට එකවර සහභාගී විය හැකි සෙල්ලමකි. මෙම සෙල්ලම සඳහා එළිමහන තෝරා ගත්තා නම් රාහු ගේ මාලිගාව ලෙස එක් ස්ථානයක් නිශ්චය වශයෙන් දැක්විය යුතු ය. එසේ ම රාහු හැටියට කෙනකු තෝරා ගත යුතු ය. රාහු ඉදිරියෙන් යයි. සෙස්සෝ ඔහුට පිටු පසින් මාලිගය දෙසට ගමන් කරති. රාහු ගී ඛණ්ඩයක් කියමින් සෙල්ලම පටන් ගනියි. සෙසු අය පිළිතුරු ගී ඛණ්ඩය ගයති.

| | | |
|---|---|---|
| රාහු | - | රන්තරු අස්සේ |
| පිරිස | - | ඉඳලද එන්නේ? |
| රාහු | - | පුන්සඳ අස්සේ |
| පිරිස | - | ඉඳලද එන්නේ? |
| රාහු | - | රන්ගිර මත්තේ |
| පිරිස | - | ඉඳලද එන්නේ? |
| රාහු | - | සමුදුර මත්තේ |
| පිරිස | - | ඉඳලද එන්නේ? |
| රාහු | - | ගුවන් තලාවේ |
| පිරිස | - | ඉඳලද එන්නේ? |
| රාහු | - | නිල්තුරු වදුලේ |
| පිරිස | - | ඉඳලද එන්නේ? |
| රාහු | - | මාගේ දරුවෝ |
| පිරිස | - | අපි වෙමු දරුවෝ |

- අපි වෙමු දරුවෝ යයි කියනවාත් සමගම රාහු හැරී බලයි. එවිට සියල්ලෝ ම බිම වාඩි වෙති. ඉඳගන්නට නොහැකි වූ ළමයා රාහුගේ දරුවකු වෙයි. රාහුගේ දරුවන් ලෙස එකම වර කීපදෙනකු අසුවිය හැකි ය. රාහුගේ අය අත් අල්ලාගෙන යළිත් පෙර සේ ගමන් ගනිති ගයති. ඉතිරි පිරිස පිළිතුරු ගී කියති. මාලිගාව ළඟ දී අසු නො වූ අය රාහුගෙන් බේරුණු අයයි. අවසානයේ රාහුගේ අය ඉතිරි අයට අත් පොළසන් දී පිළිගනිති.
- අවශ්‍ය නම් නැවත සෙල්ලම පටන් ගත හැකි ය.

(හෙළ ජන කෙළි සෙල්ලම් - රෝහිණී කුමාරි මුවන්දෙනිය)

උදා :- සඳ ඇල්ලීම

මෙම සෙල්ලමට ද පන්තියේ සියලු ම දෙනාට සහභාගි විය හැකි ය. සඳ ලෙසින් පෙනී සිටින අය රවුමේ මැද සිටිය යුතු අතර, රාහු වශයෙන් පෙනී සිටින ශිෂ්‍යයා රවුමට පිටින් සිටිය යුතු ය. ඉතිරි සියල්ලෝ ම අත්වැල් අල්ලාගෙන රවුමේ යමින් ගීතය ගායනා කරති. සඳ ඊට පිළිතුරු කියමින් ඇතුළත රවුමේ යයි. රාහු පිටින් යයි. නිතර ම රාහු බලන්නේ කෙසේ හෝ ඇතුළට පැන සඳ අල්ලා ගැනීමට ය. අත්වැල් ඇල්ලූ ළමයි ඊට ඉඩ නොදෙති.

| | | |
|---|---|---|
| පිරිස | - | සඳ සඳ මාමේ ..... |
| සඳ | - | ඇයි කිරි බෑණෝ ? |
| පිරිස | - | රන් තැටි රන් තැටි ..... |
| සඳ | - | හෙට හෙට දෙන්නේ |
| පිරිස | - | අද අද රන් තැටි |
| සඳ | - | හෙට හෙට දෙන්නේ |
| පිරිස | - | රාහු එවන්නා |
| සඳ | - | රන් තැටි දෙන්නා |
| පිරිස | - | වැහි කළු එන්නා |
| සඳ | - | රන් තැටි දෙන්නා |



Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

මෙසේ කියමින් සඳ අත් ඔසවයි. වටේ යන පිරිස බිම හිඳ ගනිති. මේ අවසරයෙන් රාහු ඇතුළට කඩා පනියි. සඳ වටේට දුවමින් බේරෙන්නට බලයි. එහෙත් අවසානයේ රාහු විසින් සඳ අල්ලා ගනු ලබයි. එතැනින් සෙල්ලම අවසන් වී වෙනත් සිසුන් දෙදෙනකු සඳ හා රාහු වශයෙන් තෝරා ගෙන යළිත් සෙල්ලම පටන් ගත හැකි ය.

රෝහිණී කුමාරි මුවන්දෙනිය

(හෙළ ජන කෙළි සෙල්ලම්)

- දරුවනට අසා රස විඳිය හැකි ළමා ගී තෝරා ගන්න. ඒවා හඳුන්වා දී සවන් දෙමින් රස විඳීමේ අවස්ථා උදා කර දෙන්න.
- අදාළ රංගනවල යෙදීම, අත්තාල තැබීම, ගායනයට සම්බන්ධ වීම ඇසුරෙන් මෙම ළමා ගී සවන් දෙමින් රස විඳීමට යොමු කරන්න.

උදා :- හඳහාමි

හඳහාමි සුදට සුදේ
අන්න පෙනෙනවා
රන් තැටියට කිරියි - පැණියි
අපට ගේනවා

කිරි බැබළෙන හඳ වට කර
තරු දිලිසෙනවා
සමන් පිච්ච මල් පිපිලා
සුවඳ දැනෙනවා

උඩයි - බිමයි - රුවට රුවයි
එළිය වෙලානේ
කවි කිය - කිය නැටුම් නටමු
මේ හඳපානේ ....

(ආනන්ද ගීතය) - සුගුණපාල සමරසේකර

පොල්පිති හරකා

පොල්පිති හරකට
පොල් කටු අං දෙක
දැම්මම හරි නපුරුයි

පොල් කොහු ලණුවෙන්
පොල් ගහෙ බැඳගෙන
පොල් ඉරටෙන් තැළුවයි

මට දුක හිතිලා
පොල් පුන්නක්කු ද
දිය කර කර පෙව්වයි

පොල් පිති හරකා
ඒ දෙස නොබලා
පොල් ගහ මුල ලැග්ගයි

(ගී සීපද) - එච්. ඩී. ජයතිලක

කවි

පුංචි අතින් ලියන අකුරු ලස්සනයි
පුංචි කටින් කියන සිංදු ලස්සනයි
පුංචි පොතුයි - පින්තූරයි ලස්සනයි
පුංචි අපේ පන්තිය හරි ලස්සනයි

කන්ද උඩින් පායන හිරු ලස්සනයි
පුංචි ගොයම් නටන කුඹුරු ලස්සනයි
නිල්ල පිරුණු ඇලේ වතුර ලස්සනයි
පුංචි අපේ රටත් හරිම ලස්සනයි

(ගී සීපද) ජයලත් මනෝරත්න

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

1.1.2 කතන්දරවලට සවන් දෙමින් වින්දනය ලබයි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය
ක්‍රියාකාරකම්

* පහසුකම් තිබේ නම් පාසල් වත්තේ එළිමහනක් තෝරා ගන්න. එසේ නොමැති නම් සිසුන්ට හොඳින් සවන් දීමට සුදුසු ලෙසට පන්ති කාමරය සකස් කර ගන්න.
* සිසුන්ගේ සිතෙහි කතා රසය හොඳින් මැවෙන ලෙස කතාව ඉදිරිපත් කරන්න.
* ඒ ඒ කතන්දරයට අනුව ඉදිරිපත් කිරීමේ රටාව හඳුනා ගන්න.
* චිත්‍ර හෝ වෙස් මුහුණු හෝ රූකඩ හෝ යොදා ගෙන දෙබස් ඇසුරෙන් කතාව සිසුනට ඉදිරිපත් කිරීමට උනන්දු වන්න.
* සිසුන්ගේ සවන් දීමේ හැකියාව හා එයට ඇති උනන්දුව හඳුනා ගැනීම සඳහා කතාව ඉදිරිපත් කරන අතරතුර හෝ අවසාන වූ පසුව හෝ සිසුන්ගේ අදහස් විමසන්න.
* පහත සඳහන් ලක්ෂණ කෙරෙහි සැලකිලිමත් වෙමින් විවිධ කතන්දර තෝරා ගන්න.
  - අඩු සිද්ධි ගණනක් පැවතීම.
  - සතුට හා විනෝදය ගෙන දීම.
  - හාස්‍ය ජනක වීම.
  - එඩිතරකම, වීරත්වය හා හොඳ ගුණ දහම් මතුවීම.

- මෙහි දී පහත දැක්වෙන වර්ගවලට අයත් කතන්දර තෝරා ගැනීම කෙරෙහි අවධානය යොමු කරන්න.
  - ජන කතා - අන්දරේ /මහදැනමුත්තා ආදී .....
  - උපමා කතා - පංචතන්ත්‍රය, හිතෝපදේශය වැනි කෘතිවල ඇති සුදුසු කතා
  - රජවරුන් හා රජකාලේ සිදු වූ රසවත් කතා
  - නූතන ළමා කතා

නිපුණතාව

1.2 සන්නිවේදන අවශ්‍යතා සඳහා සවන් දී අවබෝධ කර ගනියි.

1.2.1 සුහද කතා බහට සවන් දෙයි.
1.2.2 එදිනෙදා අවශ්‍යතා සඳහා සවන් දෙයි.
1.2.3 විශේෂ අවස්ථාවල දී අවධානයෙන් සවන් දෙයි.

1.2.1 සුහද කතා බහට සවන් දෙයි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය
ක්‍රියාකාරකම්

සුහද කතා බහට ඉඩ සැලසෙන අවස්ථා ඇති කරන්න.

උදා :- පන්ති භාර ගුරුවරයා සමග දිනපතා කරන කතා බහ
පන්තියේ තමා සමීපයේ සිටින යහළුවන්/යෙහෙළියන් කරන කතා බහ
පන්තියට එන අමුත්තන් කරන කතා බහ

- කථන ක්ෂේත්‍රයේ 2.2.1 අභිමතාර්ථය සඳහා යෝජිත ක්‍රියාකාරකම් ආදිය උපයෝගී කරගෙන මෙම අරමුණ ඉටු කර ගැනීමට ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කර ගන්න.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

1.2.2 එදිනෙදා අවශ්‍යතා සඳහා සවන් දෙයි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය
ක්‍රියාකාරකම්

- එදිනෙදා අවශ්‍යතා අසා දැන ගැනීම සඳහා සුදුසු අවස්ථා උදා කර දෙන්න.
    * විදුහල්පති උදේ රැස්වීමේ දී දෙන පණිවුඩ
    * පන්තියේ සිදුවන ක්‍රියාකාරකම්වලට අදාළ දැන්වීම් හා පණිවුඩ
    * ගුවන් විදුලියෙන් ප්‍රකාශ වන දවසේ සිදුවීම් හා කාලගුණය

1.2.3 විශේෂ අවස්ථාවලදී අවධානයෙන් සවන් දෙයි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය
ක්‍රියාකාරකම්

- සවන් දීමේ විශේෂ අවස්ථා විටින් විට උදා කර දෙන්න. මේ යටතේ මව්පියන්ගෙන්, ප්‍රදේශයේ වැඩිහිටියන්ගෙන්, ආගමික පූජ්‍ය/පූජකයන් වහන්සේලා වැනි අයගෙන් ප්‍රදේශයේ වැදගත් ස්ථාන ගැන ඇති ජනප්‍රවාද ඓතිහාසික තොරතුරු අසා දැන ගෙන ඒමට යොමු කර පන්තියේ ඉදිරිපත් කරවන්න.
- පන්ති කාමරයට විශේෂයෙන් ආරාධනා කර කැඳවූ අමුත්තකුගේ විශේෂ කතාවකට සිසුන්ගේ සවන් යොමු කරවන්න.

  උදා :-
    * වැඩිහිටි සීයා කෙනකු/ආච්චි කෙනකු/ආගමික පූජකවරයකු පන්තියට ගෙන් වීම.
    * පාරේ ගමන් කිරීම පිළිබඳ සරල උපදෙස් දීම සඳහා පොලිස් නිලධාරී මහතකු කැඳවීම.
    * පිරිසිදුකම රැක ගැනීම, නුසුදුසු පලතුරු හා ආහාරපාන ආදියෙන් පරෙස්සම්වීම ආදී උපදෙස් ලබා දීම සඳහා වෛද්‍ය නිලධාරී මහතකු මුණ ගැස්වීම.
    * පාසලේ පහසුකම් තිබේ නම් පමණක් එබඳු දේ අඩංගු විශේෂ පටිගත කළ වැඩසටහන් සිසුනට ඇසීමට සැලැස්වීම.
- කතා කිරීම ක්ෂේත්‍රයේ 2.2.3 ඉටු කර ගැනීම සඳහා පන්තියේ දී උදා කළ විශේෂ අවස්ථා ප්‍රයෝජනයට ගන්න.

නිපුණතාව
1.3 සවන් දී චින්තනයට යොමු වෙයි.
    1.3.1 තේරවිලිවලට සවන් දී චින්තනයට යොමු වෙයි.
    1.3.2 කතන්දර අසා චින්තනයට යොමු වෙයි.
    1.3.3 සිදුවීම් ගැන අසා චින්තනයට යොමු වෙයි.

1.3.1 තේරවිලිවලට සවන් දී චින්තනයට යොමු වෙයි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය
ක්‍රියාකාරකම්

- මෙහි දී ළමයාගේ වයසට සරිලන ඉතා සරල තේරවිලි තෝරා ගන්න.
- නිවසේ එදිනෙදා දකින, පාවිච්චි කරන උපකරණ, පරිසරයෙන් නිතර හමු වන ගස්වැල්, ගෙඩි, මල්, සතුන් පිළිබඳ ව යෙදෙන තේරවිලි ගැන අවධානය යොමු කරවන්න.
- සිසුනට ඉදිරිපත් කරන තේරවිලිවලට හොඳින් සවන් දී අවබෝධ කර ගත් පසුව, නිවසේ දී අසා දැන ගෙන සිසුන්-සිසුන් අතර තේරවිලි කීමේ හා ඒවාට සවන් දීමේ අවස්ථා ඔවුනට ඇති කර දෙන්න. මෙය සෙල්ලම් හා විනෝදජනක වැඩක් ලෙස කළ හැකි ය.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

උදා :- සිසුන් රවුමකට සිට ගැනීමට යොමු කරන්න. එක් සිසුවකු රවුම වටේ යමින් රවුමේ සිටින අයගෙන් මෙසේ ඇසීමට යොමු කරන්න.

ගහක් උඩ ගෙඩියක්
ගෙඩියක් උඩ ගහක්
මේ මොකක් ද දන්නවා ද?
දන්නව නම් කියනවා ද?

එය අසා වහා වටහා ගත් සිසුන් අතුරෙන් අන්නාසි යැ යි පළමුවෙන් කී සිසුවා රවුමේ වටේ යාමට තෝරා ගන්න.
ඔහු කිව යුතු තේරවිල්ල කුමක් දැයි ගුරුවරයා මෙහි දී කියා දිය යුතු ය. ඒ අනුව සෙල්ලම යළිත් පටන් ගන්න.

* මෙසේ යොදා ගත හැකි තවත් සරල තේරවිලි

අත්තක් උඩ බුම්මා ගෙන
කටුරෙද්දක් පොරවා ගෙන
ඉන්නෙ කවු ද - දන්නවා ද?
දන්නව නම් කියනවා ද?

මෙහි දී ද කොස් ගෙඩිය යයි වහා කියූ ළමයා රවුම වටේ තේරවිල්ල කියමින් යාමට තෝරා ගන්න. සැම විටම ඉවත් වන ළමයා රවුම වටේ පිළිතුරු දෙන්නන් වෙත එකතු විය යුතු ය.

ඇදල ගත්තා
දමල ගැහුවා
මලක් පිපුණා
මල පරවුණා
ඒ මොකක් ද දන්නවා ද?
දන්නව නම් කියනවා ද?
පිළිතුර - ගිනිකූර

අලියා නොයන
මඟ හොයන්න
දන්නව නං
කියල යන්න
පිළිතුර - ඉනිමඟ

1.3.2 කතන්දර අසා චින්තනයට යොමු වෙයි.

ඉගෙනුම් -ඉගැන්වීම් ක්‍රමෝපාය
ක්‍රියාකාරකම්

- ළමයාගේ විමසිලිමත් බව හා සිතිමේ හැකියාව දියුණු කිරීමට සමත් සරල කතන්දර මේ සඳහා තෝරා ගන්න.
- මෙහි දී යම් සුළු සිදුවීමක් වටා ගෙතුණු කතන්දර ද තෝරා ගත හැකි ය.
- මේ සඳහා පහත සඳහන් ක්‍රම දෙක පිළිබඳ ව ද අවධානය යොමු කරන්න.
  කතන්දරයක් කියා ගෙන ගොස් උචිත තැනකින් නතර කිරීම. ඉන්පසු සිදු වූ දේ සිසුන්ගෙන් විමසීම.
  කතන්දරය කියා ඒ ඇසුරෙන් චින්තනයට යොමු වන ප්‍රශ්න යොමු කිරීම.
- අංක 2.5 යටතේ එන නිර්මාණාත්මක කථන කුසලතා වර්ධනය පාඩමේ එන උදාහරණ ද මෙහි දී සැලකිල්ලට ගන්න.
- දරුවන් චින්තනයට යොමු වන සේ ප්‍රශ්න ඉදිරිපත් කරන්න.
- මෙම අවස්ථාවන්හි දී සිසුන්ගේ පරිකල්පනය දියුණු කිරීමට සුදුසු අවස්ථා ලබා දී ඔවුන් දිරිමත් කරන්න.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

1.3.3 සිදුවීම් ගැන අසා චින්තනයට යොමු වෙයි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය

ක්‍රියාකාරකම්

- 2.2.4 යටතේ කතා කිරීම ක්ෂේත්‍රයේ එන සිදුවීම් හා ආරංචි පැවසීම යන නිපුණතාව සඳහා ඉදිරිපත් කර ඇති කරුණු ද මෙහි දී සැලකිල්ලට ගන්න.
- දෙවන ශ්‍රේණියේ දරුවන්ට ඇසීමට සුදුසු කාලීන සිදුවීම් හඳුනා ගන්න. එම සිදුවීම් දරුවන්ට ඉදිරිපත් කරන්න. ඇතැම් විට එම සිදුවීමේ මතු පිට පෙනෙන දෙය, එහි සැබෑ ස්වරූපය නොවිය හැකි ය. තවත් විටෙක යම් සිදුවීමකට හේතුව අප්‍රකට විය හැකියි. එ බැවින් කාලීන සිදුවීම් සිසුනට ඉදිරිපත් කරමින් ඔවුන් පහත සඳහන් අංශ යටතේ චින්තනයට යොමු කළ හැකි ය.

  යම් සිදුවීමක සැබෑ ස්වරූපය ගැන සෙවීම.

  යම් සිදුවීමක නෙපෙනෙන හේතුව සෙවීම.

  උදා :-

  වැස්සක් වැස්සා
  ළිඳක වතුර බොර වුණා.
  ඒත් ළිඳ ළඟ තිබුණු
  බාල්දියේ වැහි වතුර
  බොර වෙලා තිබුණේ නැහැ.
  ළිඳේ වතුර
  වැස්සෙන් පස්සේ
  බොර වුණේ කොහොම ද?

නිපුණතාව

1.4 අවධානයෙන් සවන් දී නිවැරදි ව අවබෝධ කර ගනියි.

- 1.4.1 විධානවලට අවධානයෙන් සවන් දී අවබෝධ කර ගනියි.
- 1.4.2 නිවේදනවලට සවන් දී අවබෝධ කර ගනියි.
- 1.4.3 සරල කතන්දරවලට සවන් දී අවබෝධ කර ගනියි.
- 1.4.4 සරල උපදෙස්වලට සවන් දී අවබෝධ කර ගනියි.

1.4.1 විධානවලට අවධානයෙන් සවන් දී අවබෝධ කර ගනියි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය

ක්‍රියාකාරකම්

- අවධානයෙන් යුතු ව සවන් දීමට යොමු කෙරෙන අවස්ථාවල දී සිසුන්ගේ ඇස් විටින් විට පවසන්නා දෙසට යොමු වීමේ වැදගත්කම අවධාරණය කරන්න. එමන් ම සවන් දෙන්නා, පවසන්නා දෙසට හැරී, පහසු විවෘත ඉරියව්වක සිටිමට ද යොමු කරන්න.
- විධාන ඇතුළත් සෙල්ලම් හා විනෝදජනක වැඩ යොදා ගැනීමට සැලකිලිමත් වන්න.

  උදා :- මෙයට සවන් දී එහි සඳහන් විධානවලට අවනත වීම අභිනයෙන් නිරූපණය කිරීමට සිසුන් යොමු කරන්න.

  කං කං බූරු
  සිං සිං නෝරු
  දුවගෙන දුවගෙන
  එනව ද යාළු .... ?
  පොකුණට බැහැලා
  මලක් නෙළාලා
  මල්ලිට දීලා
  එනව ද යාළු ... ?

  කන්දට නැගලා
  පේර කඩාලා
  නංගිට දීලා
  එනව ද යාළු .... ?
  ගෙදරට දුවලා
  අම්මට කියලා
  පූසිව අරගෙන
  එනව ද යාළු ... ?



Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

ගී සීපද - ජයලත් මනෝරත්න

1.4.2 නිවේදනවලට සවන් දී අවබෝධ කර ගනියි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය

ක්‍රියාකාරකම්

- විනෝදජනක ලෙස නිවේදන ඉදිරිපත් කිරීමේ අවස්ථා ඇති කිරීම.

උදා :- එන සිකුරාදා - කොකු පණු දොස්තර
එනවලු ළමයිනි - ඩුං ඩුං ඩුං !
හොර ලෙඩ අරගෙන නැවිත් ඉන්නට
හොඳ නැහැ ළමයිනි - ඩුං ඩුං ඩුං !
බෝතල භාජන අරන් වරෙල්ලා
ඇහුණ ද ළමයිනි - ඩුං ඩුං ඩුං !
කොකු පණු බේනෙන් පාණ්ඩු පිප්පුම
සනීප වෙනවලු - ඩුං ඩුං ඩුං !
බේත් අරන් බිවු ළමයින් කාටත්
නිවාඩු දෙනවලු - ඩුං ඩුං ඩුං !
එදාට නැවිත් හිටියොත් ළමයින්
දඬුවම් දෙනවලු - ඩුං ඩුං ඩුං !
එස්. මහින්ද හිමි

- එක් ශිෂ්‍යයකු ටින් බෙරයක් බැඳගෙන ද ඔහුට සහායට තවත් කිහිප දෙනකු ද යොදා ගෙන (හැකි නම් රංගනයට සුදුසු ඇඳුම් ඇඳ ගෙන) මෙය ඉදිරිපත් කිරීමට යොමු කරන්න.
- මෙබඳු නිදසුන් ඉදිරිපත් කිරීමෙන් පසුව සිසුන් වෙත ප්‍රශ්න ඉදිරිපත් කර සවන් දීමේ හැකියාව වර්ධනය කර ගැනීමේ හැකියාව ලබා දෙන්න.

1.4.3 සරල කතන්දරවලට සවන් දී අවබෝධ කර ගනියි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය

ක්‍රියාකාරකම්

- මෙය 1.3.2 යටතේ වූ ක්‍රියාකාරකම් සමග ද කතා කිරීම ක්ෂේත්‍රය යටතේ වූ 2.4.1 නිපුණතාවයෙන් ඉදිරිපත් වන සාමූහික ව කතන්දර නිර්මාණය යටතේ ද හුරුව ලැබිය හැකි බව සලකන්න.
- අවබෝධ කර ගැනීමට පහසු වන කතන්දර එකතුවක් තබාගෙන ඉඩ ලද අවස්ථාවල සිසුන් එළිමහනට කැඳවා ගෙන ගොස් අසන්නට සලස්වන්න.
- සිසුන් විසින් ම ඉදිරිපත් කරන නාට්‍යයක දෙබස්වලට සවන් දීමට යොමු කරන්න.
- මේ සඳහා ඉහළ ශ්‍රේණියක සිසුන්ගේ ද සහාය ලබා ගත හැකි ය.
- අන්තිම වාරයට එළඹෙත් ම පන්තියේ ම සිසුන්ට මෙවැනි වෙනත් නාට්‍යයක් රඟ දැක්වීමේ අවස්ථා ඇති කරන්න.
- අවබෝධය තක්සේරු කිරීම සඳහා ඒ පිළිබඳ ව සරල, කෙටි ප්‍රශ්න අසා ප්‍රතිචාර ලබා ගන්න.

1.4.4 සරල උපදෙස්වලට සවන් දී අවබෝධ කර ගනියි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය

ක්‍රියාකාරකම්

- කතා කිරීම ක්ෂේත්‍රයේ 2.3.1 යටතේ එන, උපදෙස් ලබා ගැනීම පිළිබඳ කථන කුසලතාවය මෙයට සම්බන්ධ කර ගන්න. එම ක්‍රියාකාරකම්වල දී දෙන උපදෙස්වලට අවධානයෙන් සවන් දී අවබෝධ කර ගන්නේ දැයි නිරතුරු ව සැලකිලිමත් වන්න. උපදෙස් පිළිපැද කළ යුතු ක්‍රියාකාරකම්, සෙල්ලම් වැනි දෑ නිර්මාණය කර දරුවන්ට ඉදිරිපත් කරන්න.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

නිපුණතාව
2.1 ගායන හැකියා ලබා ගනියි.
2.1.1 විවිධ ශෛලීන් අනුව ගායනා කළ හැකි ක්‍රීඩා කවි /ගී ගායනා කරයි.
2.1.2 රංගනය හා ගායනය මුසු කළ හැකි ළමා කවි/ගී ගායනා කරයි.

2.1.1 විවිධ ශෛලීන් අනුව ගායනා කළ හැකි ක්‍රීඩා කවි /ගී ගායනා කරයි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය
ක්‍රියාකාරකම්

- ප්‍රාදේශීය වශයෙන් පවත්නා ජනක්‍රීඩා ආශ්‍රිත සෙල්ලම් හා විනෝදජනක වැඩ, ක්‍රියාකාරකම් මෙම නිපුණතාව ඉටු කර ගැනීම සඳහා ඔබට යොදා ගත හැකි ය. කවි ගී ගායනය කරමින් කළ හැකි සාමූහික ක්‍රීඩා මේ සඳහා යොදා ගන්න.

උදා :- * කොපර කොපර පිපිඤ්ඤා
* මල් නෙලීම
* එළුවන් කන්නයි මං ආවේ

මල් නෙලීම
පන්තියේ සිසුන් කණ්ඩායම් දෙකකට බෙදන්න. දෙ පිලේ මායිම් ලෙස මැදින් ඉරක් ඇඳ වෙන් කරන්න. මේ මායිම් ඉරට දෙපැත්තෙන් මදක් ඈතට වී සිටීමට දරුවන්ට උපදෙස් දෙන්න. එසේ සිටින කණ්ඩායම් දෙකෙන් එක් කණ්ඩායමක්

...... කාගෙ වත්තෙ මල් නෙළන්නෙ
මල් නෙළන්නෙ මල් නෙළන්නෙ
අද මෙ බාරෙටා ..... //

යනුවෙන් තාලයට ගයමින් තාලයට පා තබමින් මැද ඉර අසලට පැමිණෙයි. එවිට අනෙක් පිලේ අය ගී ගයන කණ්ඩායමේ කෙනෙකුගේ නමක් කියා

(නමක්) ගෙවත්තෙ මල් නෙළන්නෙ
මල් නෙළන්නෙ මල් නෙළන්නෙ
අද මෙ බාරෙටා .... යැයි කියති.

මෙසේ කියමින් අත්වැල් බැඳ ගෙන දෙපසට පද්දමින් මැද ඉර අසලට ආ යුතු ය. කණ්ඩායම් දෙක ම ඒ අයුරින් ගී ගයමින්, ඉර අසලට ඒම ද යළි ඉන් ඈත් ව යාම ද කළ යුතු ය.

මෙසේ කිහිප වතාවක් එහා මෙහා යන අතර, නම කියවුණු ළමයා උපක්‍රමශීලී ව ප්‍රතිවාදී පිලේ ළමයෙක් තම පිලට ඇද ගැනීම සඳහා ක්‍රියා කළ යුතු ය. අසුවුණු ළමයා උත්සාහ කළ යුත්තේ තමා වෙතින් අල්ලා අදින ළමයා තම පිලට ඇද ගැනීමට ය. ජයග්‍රාහකයා වන්නේ ප්‍රතිවාදියා ඇද ගෙන ම තම පිලට පැමිණි ළමයා සහ එම කණ්ඩායමයි. මෙසේ බොහෝ වේලාවක් සෙල්ලම් කළ හැකි ය. වැඩි ළමයින් සංඛ්‍යාවක් ඇද ගත් පිල ජය ලබයි.

කණ්ඩායම් දෙක විසුරුවා හැර නැවතත් කණ්ඩායම් දෙකකට ළමයින් බෙදා මෙම සෙල්ලම කළ හැකි ය.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

2.1.2 රංගනය හා ගායනය මුසු කළ හැකි ළමා කවි /ගී ගායනා කරයි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය

ක්‍රියාකාරකම්

රංගනය හෝ අභිනය හෝ මුසු කරමින් සාමූහික ව ගායනය කළ හැකි ළමා ගීත මේ සඳහා යොදා ගන්න. එම කවි රංගනය හෝ අභිනය මුසු කරමින් ගායනයට යොදා ගත හැකි අවස්ථා නිර්මාණය කිරීම විශේෂයෙන් අපේක්ෂා කෙරේ.

උදා :-

දවල් තිස්සෙ
පඳුරු අස්සෙ
හැංගෙන පොඩි හාවා
පාට දුඹුරු ඇස් වට කුරු
ලෝම තියෙන හාවා
කට දෙපැත්තෙ
කෙඳි බුරුත්ත
දිගට ඇදුණු හාවා
අතන අන්න
බතල කන්න
ඊයේ රෑ ආවා

ඇස්. මහින් ද හිමි

දෙපිල බෙදී හෝයියා
තරං වෙලා හෝයියා
කඹය අදිමු හෝයියා
හේල හෙලෙයි හෝයියා

මෙන්න මෙහෙම හෝයියා
දැනට ඇද හෝයියා
තරඟ දිනමු හෝයියා
හේල හෙලෙයි හෝයියා

පොඩි ළමුනට හෝයියා
සතුටු වෙන්න හෝයියා
හොඳ සෙල්ලම හෝයියා
හේල හෙලෙයි හෝයියා

ආනන්ද රාජකරුණා

අහසට පිඹිනා එරන් කළේයා
පොළොවට පිඹිනා බූමි කළේයා
රන්මසු දහසක් වටින කළේයා
නොබිඳින් නැනෝ මගේ කළේයා

පේළි ගැසී අහනෝ සැරසීලා
නීල වරල කුසුමෙන් ගවසාලා
කෝල නොවී සබ මැදට වැදීලා
බාල ලියෝ කළ පිඹිති සැදීලා

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

නිපුණතාව

2.2 සන්නිවේදන අවශ්‍යතා සඳහා කථනයේ යෙදෙයි.

- 2.2.1 සුහද ව කතාබහ කරයි.
- 2.2.2 තම අත්දැකීම් පවසයි.
- 2.2.3 පණිවිඩ ගෙන යයි.
- 2.2.4 සිදුවීම් හා ආරංචි පවසයි.

2.2.1 සුහද ව කතාබහ කරයි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය

ක්‍රියාකාරකම්

- පහත සඳහන් අය විශේෂයෙන් පන්තියට කැඳවා දරුවන් සමඟ කතා බහ සඳහා අවස්ථා ඇති කිරීම මෙහි දී අපේක්ෂා කෙරේ. එසේ කැඳ වූ අය සිසුන් සමඟ සමීප වීම සඳහා කතන්දර කීම, ක්‍රීඩාවක් හඳුන්වා දී කිරීම, රංගනයක් ඉදිරිපත් කිරීම, ගායනයක යෙදීම වැනි දෙයක් කළ හැකි ය. ඉන් පසු සිසුන් සමඟ සුහද කතා බහට අවස්ථා උදා කරන්න. මෙහි දී පැමිණි අමුත්තන්ගෙන් ප්‍රශ්න ඇසීමට සිසුන් යොමු කරන්න. ආචාරශීලි ව කතා කිරීම, ප්‍රශ්න කිරීම, සවන් දීමට හුරු කිරීම විශේෂයෙන් අපේක්ෂා කෙරේ.

  උදා : i ගුරුවරයා සහ සිසුන් අතර,
  ii කුඩා කණ්ඩායමක් තුළ,
  iii පන්තියට කැඳ වූ විශේෂ අමුත්තෙක් සහ සිසුන් අතර, (උදා : සීයා කෙනෙක් හෝ ආච්චි කෙනෙක්)
  iv විදුහල්පති සහ සිසුන් අතර,
  v පාසලේ ගුරුවරුන් සහ සිසුන් අතර,
  vi පන්තියේ සිසුන් සහ වෙනත් පන්තියක සිසුන් අතර,

2.2.2 තම අත්දැකීම් පවසයි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය

ක්‍රියාකාරකම්

- පාසලෙන් බාහිර ව ලබන අත්දැකීම් මෙන් ම පාසල තුළ දී ලබන අත්දැකීම් පැවසීමට අවස්ථා උදා කිරීම මේ යටතේ අපේක්ෂා කෙරේ. සිසුන්ට අත්දැකීම් ලබා දිය හැකි විවිධ වැඩ සටහන් සංවිධානය කරන්න.
  උදා : * සමීප පරිසරය තුළ නිරීක්ෂණ චාරිකාවලට සහභාගි කරවීම.
  * පන්තියේ සිසුන්ට අලුත් සෙල්ලම් හඳුන්වා දීම.
  * අලුත් අත්දැකීම් ලැබිය හැකි ක්‍රියාකාරකම් සංවිධානය කිරීම ආදිය දැක්විය හැකි ය.
- දරුවන්ට කතන්දරයක් ඉදිරිපත් කරන විට ඒ හා සම්බන්ධ තමන්ගේ අත්දැකීම් ඉදිරිපත් කිරීමට සිසුන්ට අවස්ථාව දීම.
- සතුන් විසින් වාසස්ථාන ඉදි කර ගැනීම වැනි ඔවුන් දුටු දේ පිළිබඳ ව පැවසීමට අවස්ථාව දීම.
- උත්සව වැනි විශේෂ අවස්ථාවලට සහභාගි වීමෙන් ලැබූ අත්දැකීම් ඉදිරිපත් කිරීමට අවස්ථාව දීම.
- තම අත්දැකීම් පහත සඳහන් පරිදි පැවසීමට ඉඩකඩ සලසා දීම කෙරෙහි සැලකිලිමත් වන්න.
  * සිසුන් සිසුන් අතර,
  * ගුරුවරයා සමඟ,
  * පන්තිය ඉදිරියේ

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

2.2.3 පණිවිඩ ගෙන යයි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය

ක්‍රියාකාරකම්

- පණිවිඩය පැහැදිලි ව සිසුවාට දීම, ඔහු / ඇය එම පණිවිඩය නිරවුල් ව අවබෝධ කරගෙන මතක තබා ගැනීම. යම් අයකුට එම පණිවිඩය නිවැරදි ව ලබා දීම, පිළිතුර නිරවුල් ව අවබෝධ කර ගැනීම. ආපසු රැගෙන ඒම සහ පිළිතුර නිවැරදි ව භාර දීම යන ක්‍රියාවලිය මෙහි දී සිදු වේ. මෙම ක්‍රියාවලිය තුළ සන්නිවේදනය හා සම්බන්ධ පහත සඳහන් භාෂා කාර්යයන් වර්ධනය කිරීමට සැලකිලිමත් වන්න.
  - හොඳින් සවන් දීම.
  - පැහැදිලි ව පණිවිඩය ලබා ගැනීම.
  - මතකයේ රඳවා ගැනීම.
  - පැහැදිලි ව පැවසීම.

පණිවිඩ ගෙන යාමේ ඉගෙනුම් අවස්ථා

- පණිවිඩ ගෙනයාමේ ඉගෙනුම් අවස්ථා උදා කරන්න.

උදා : 1. පාසල තුළ පණිවිඩ ගෙන යාම.

2. පාසලෙන් ගෙදරට පණිවිඩ ගෙන යාම,

මෙම අවස්ථා දෙකෙහි ම ශිෂ්‍යයා විසින් රැගෙන එන පිළිතුර ගුරුවරයා විසින් ම ලබා ගත යුතු වේ.

3. පණිවිඩ ඇතුළත් සෙල්ලම් හා විනෝදජනක වැඩ

ප්‍රතිචාරයක් දැක්විය හැකි පණිවිඩයක් සිසුන් හය දෙනෙකු (පමණ) අතර යැවීම.

උදා : 1. සිසුන් පේළියට තබන්න. සෙල්ලම් බඩු ටිකක් පේළියේ අග තබන්න. මේ සඳහා රූං පෙත්තක්, කඩදාසි රොකට්ටුවක්, පන්දුවක්, නළාවක් වැනි යමක් යොදා ගන්න. කණ්ඩායමේ අග සිටින ළමයාගේ නම යොදා අනිත් අයට නොඇසෙන සේ පණිවිඩයක් දෙන්න.

නිදසුන : තරිඳුට කියන්න, රූං පෙත්ත අරන් පන්තිය වටේ රවුමක් දුවන්න.

කණ්ඩායමේ අග සිසුවා වීමට සෑම ළමයාට ම අවස්ථාව දෙන්න.

11. සිසුන් හය දෙනකු පමණ අතර සරල ප්‍රතිචාරයක් දැක්විය හැකි පණිවිඩයක් යැවීම මෙහි දී අග සිටින දරුවාගේ නම පණිවිඩයට ඇතුළත් කරන්න.

\+ \+ \+ \+ \+ \+ තාරක

රහස් පණිවිඩය : තාරකට කියන්න හාවෙක් වගේ යන්න.

111. සිසුන් රවුම් දෙකක් මුහුණට මුහුණ ලා සිට ගැනීමට සලස්වන්න. එසේ මුහුණට මුහුණ ලා සිටින සිසුන් දෙදෙනා යහළුවෝ ලෙස හඳුන්වා දෙන්න. කුරුම්බැට්ටි මැසිමක්, නළාවක්, රූංපෙත්තක් වැනි යම් කිසි ක්‍රියාවක් කරමින් රවුම වටා යා හැකි ද්‍රව්‍ය රවුම මැද තබන්න. ඉන් පසු එම ද්‍රව්‍යයක් අතට ගෙන කළ හැකි පණිවිඩයක් එක් සිසුවකුට කියන්න. ඔහු / ඇය තමාගේ යහළුවාට එම පණිවිඩය කිය යුතුයි. යහළුවා ලවා අදාළ ළමයාට පණිවිඩය ගෙන ගොස් දීමට සලස්වන්න. ඔහු / ඇය උපකරණය ගෙන ක්‍රියාකාරී වන විට අත්පොඩි ගැසීම, ගීතයක් ගායනය වැනි දෙයක් කිරීමට අනෙක් සිසුන් යොමු කරන්න.

පණිවිඩය : රුවන්ට කියන්න රූං පෙත්ත අරන් අපි වටේ රවුම් දෙකක් දුවන්න කියලා



Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

2.2.4 සිදුවීම් හා ආරංචි පවසයි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය

ක්‍රියාකාරකම්

ගුවන් විදුලියෙන් හා රූපවාහිනියෙන් ආරංචි ලබා ගැනීමට විටින් විට සිසුන් යොමු කිරීම. යම් යම් සිදුවීම් පිළිබඳ ව විවිධ පුද්ගලයන්ගෙන් ලබා ගත් ආරංචි පැවසීමට යොමු කිරීම.

උදා : ඇස්, කන්, නාසා ආදී ඉඳුරන් සියුම් ලෙස භාවිත කරමින් ලබන අත්දැකීම් පැවසීමට වර්ෂය තුළ විටින් විට අවස්ථාව සැලසීම.

* ඒ ඒ කාලවල දී අහසේ වන සිදුවීම්
* පොළොව හා ගස්වැල් ආශ්‍රිත සිදුවීම්

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

නිපුණතාව

2.3 අවශ්‍යතා සඳහා කථනයේ යෙදෙයි.
- 2.3.1 උපදෙස් දෙයි.
- 2.3.2 ප්‍රශ්න කරයි.
- 2.3.3 තොරතුරු රැස් කරයි.

2.3.1 උපදෙස් දෙයි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය
ක්‍රියාකාරකම්
උදා : 1.

* සිසුන් කණ්ඩායම් කිහිපයකට බෙදන්න. එක් එක් කණ්ඩායමට යම් උපකරණයක් සෑදීමට උපදෙස් දෙන්න.
නිදසුන් : කඩදාසි බෝට්ටුවක්, කඩදාසි මලක්, කඩදාසිවලින් කුරුල්ලෙක්, රූං පෙත්තක් වැනි සාදන ලද උපකරණ සමඟ සෙල්ලම් කිරීමට සිසුන්ට අවස්ථාව සලසන්න.

* පසු දිනක දී එක් කණ්ඩායමක් සෑදූ උපකරණය සෑදීමට තවත් කණ්ඩායමකට උපදෙස් දීමට සිසුන් යොමු කරන්න.
සෑදූ පසු එම උපකරණ සමඟ ද සෙල්ලම් කිරීමට සිසුන් යොමු කරන්න.
නායකත්වය ගෙන උපදෙස් දෙමින් කළ හැකි සෙල්ලම්වල යොදවන්න.
නිරීක්ෂණ චාරිකාවල දී කණ්ඩායම් නායකයන් ලෙස ක්‍රියාකරමින් තම කණ්ඩායමට උපදෙස් දීමට සිසුන් යොමු කරන්න.

2.3.2 ප්‍රශ්න කරයි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය
ක්‍රියාකාරකම්

- ආචාරශීලි ව ප්‍රශ්න කරමින් අවශ්‍ය පිළිතුර ලබා ගැනීමට සිසුන් යොමු කරන්න.

උදා : i. කුඩා, හිස් කාඩ් බෝඩ් පෙට්ටියක් ගන්න. සිසුනට නොපෙනෙන සේ එයට කාසියක් / බොත්තමක් / ගල් කැටයක් වැනි යමක් දමන්න. පෙට්ටිය තුළ කුමක් හෝ ඇති බව කියන්න. එය කුමක් දැයි දැන ගැනීමට ප්‍රශ්න අසන ලෙස උපදෙස් දෙන්න. ඕනෑම සිසුවකුට ප්‍රශ්න ඇසිය හැකි ය. නිවැරදි පිළිතුර ලැබුණු විට ද්‍රව්‍යය මාරු කරන්න. මෙවැනි විනෝදජනක අවස්ථා තව තවත් නිර්මාණය කර ගැනීමට යොමු වන්න. අවශ්‍ය විට ඉඟි සැපයීමෙන් උදවු කරන්න.

උදා : ii. හිස් ලියන කඩදාසියක් ගන්න. එය සිසුන්ට පෙන්වන්න. සිසුන්ට මුහුණලා සිට තමා අත ඇති හිස් කඩදාසියේ දොඩම් ගෙඩියක් / අඹ ගෙඩියක් / හාවෙක් / මලක් / කුරුල්ලෙක් වැනි සරල යමක් අඳින්න. තමා අඳින ලද්දේ කුමක් දැයි ප්‍රශ්න කරන ලෙස සිසුන් යොමු කරන්න. නිවැරදි පිළිතුර ලැබුණු පසු තමා අඳින ලද කඩදාසිය සිසුන්ට පෙන්වන්න.

උදා : iii. කුතුහලය, සැකය ඇති වන අවස්ථාවල දී ප්‍රශ්න කරමින් අවශ්‍ය දේ දැන ගැනීමට සුදුසු වාතාවරණයක් ඇති කරන්න.
- * පෙළ පොතේ පාඩම් ඇසුරෙන්
- * නිරීක්ෂණ චාරිකාවල දී



Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

2.3.3 තොරතුරු රැස් කරයි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය
ක්‍රියාකාරකම්

තොරතුරු රැස් කිරීම සඳහා කතා බහෙහි යෙදෙන විට පහත සඳහන් කුසලතා සංවර්ධනය වන ආකාරයට මඟ පෙන්වීම ද අවශ්‍ය වේ.

* සුහද ව තොරතුරු රැස් කිරීම.
* ආචාරශීලි ඇමතීම් සහ ගරුසරු සහිත ව තොරතුරු රැස් කිරීම.

- පාසලේ වෙනත් ගුරුවරු, වැඩිහිටියන්, මව්පියන්, පූජ්‍ය / පූජකයන් වහන්සේලා වැනි අයගෙන් තොරතුරු ලබා ගැනීමට සිසුන් යොමු කරන්න. මෙහි දී ප්‍රදේශයේ වැවක්, ගොඩනැගිල්ලක්, විශේෂ ස්මාරකයක් ගමේ නම හැඳුණු හැටි වැනි දෙයක් පිළිබඳ තොරතුරු ලබා ගැනීම සඳහා සිසුන් යෙද විය හැකි ය. එසේ ලබා ගත් තොරතුරු පන්තිය ඉදිරියේ පැවසීමට අවස්ථාව ලබා දෙන්න.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

නිපුණතාව

2.4 නිර්මාණාත්මක කථන හැකියා ප්‍රදර්ශනය කරයි.

2.4.1 සාමූහික ව කතන්දර නිර්මාණය කරයි.

2.4.2 චිත්‍ර ඇසුරෙන් සිදුවීම්/කතන්දර නිර්මාණය කරයි.

2.4.1 සාමූහික ව කතන්දර නිර්මාණය කරයි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය

ක්‍රියාකාරකම්

පහත සඳහන් ආකාරයේ නිර්මාණ මතු වන ලෙසින් සාමූහික ව කතන්දර නිර්මාණය වීමේ අවස්ථා ඇති කරන්න.

උදා :

පන්තියේ සියලු සිසුන් එක් කණ්ඩායමක් ලෙස එළිමහන් ස්ථානයකට කැඳවා ගෙන යන්න. සැම දෙනා ම එකතු වී කතන්දරයක් නිර්මාණය කරමු යයි යෝජනා කරන්න. ගුරුවරයා කතාවට ආරම්භයක් දෙන්න. සැම සිසුවකු ම සහභාගි වන පරිදි වගන්තිය බැගින් එකතු කර සාමූහික කතන්දරයක් නිර්මාණය කරන්න. ඇතැම් විට පහත සඳහන් ආකාරයේ කතන්දර නිර්මාණය විය හැකි ය.

| | | |
|---|---|---|
| ගුරුවරයා | : | ඔන්න එකමත් මක රටක පුංචි කුමාරයෙක් හිටියා |
| මලින් | : | ඒ කුමාරයා හරීම ලස්සනයි. |
| චතුරංගි | : | සෙල්ලම් කරන්නත් ආසයි. |
| මිහිර | : | ඉගෙන ගන්නත් ආසයි. |
| සඳුනි | : | යාළුවොත් එක්ක රණ්ඩු කරන්නේ නැහැ. |
| සුමුදු | : | දවසක් මේ කුමාරයා ගමනක් ගියා. |
| දිනුක | : | යන කොට මග දි පොකුණක් හමුවුණා. |
| දුමිඳු | : | ඒ පොකුණෙ ලස්සන නෙළුම් මල් තිබුණා. |
| කෝලිත | : | මලක් කඩා ගන්න කුමාරයා අත දික් කළා. |
| රෝෂිනි | : | එතකොට ම පොකුණෙ හිටි රාස්සයෙක් කුමාරයගෙ අත අල්ලා ගත්තා. |
| මධූෂි | : | කුමාරයා බය වුණේ නැහැ. |
| සමන් | : | කුමාරයා කීවා මාව අතාරින්න කියලා. |
| නිර්මාණි | : | පුංචි වුණත් බය නැති එක ගැන රකුසා සතුටු වුණා. |
| ප්‍රනීධ | : | රකුසා පුංචි කුමාරයා අත හැරියා. |
| මධුපානි | : | කුමාරයා සතුටෙන් ගමන ගියා. |

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

2.4.2 චිත්‍ර ඇසුරෙන් සිදුවීම් / කතන්දර නිර්මාණය කරයි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය

ක්‍රියාකාරකම්

- සිසුන් අසා ඇති කතන්දරයක අවස්ථා කිහිපයක් චිත්‍රයට නගා ඉදිරිපත් කිරීම සඳහා සිසුන් යොමු කරන්න.
- පින්තූර හෝ චිත්‍ර කිහිපයක් නිර්මාණය කර සිසුන්ට දී ඒ දෙස බලා යම් සිදු වීමක් / කතන්දරයක් ගොඩ නැගීමට යොමු කරන්න.

## 3.0 කියවීම

කියවීම ඉගැන්වීමේ දී පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කරන්න.

- පළමුවන ශ්‍රේණිය ගුරු අත්පොතෙන් පන්ති කාමරය සැකසීමට දී ඇති උපදෙස් දෙවන ශ්‍රේණිය සඳහා ද ගළපා ගැනීම.

- පළමුවන ශ්‍රේණියේ දී කියවීමේ මට්ටම ඉහළට ගෙන ඒමට නොහැකි වූ සිසුන් සිටිනවා නම්, ඔවුන් සිටින මට්ටමෙන් පටන් ගෙන ඉදිරියට යාම.

- පළමුවන ශ්‍රේණියේ දී යොදා ගත් විනෝදජනක වැඩ, ක්‍රියාකාරකම් සහ උපකරණ ගැළපෙන අවස්ථා සඳහා දෙවන ශ්‍රේණියේ දී ද යොදා ගැනීම.

නිපුණතාව

3.1 වචන / වැකි / කෙටි ඡේද ශබ්ද නගා කියවයි.
   3.1.1 ශුද්ධ සිංහල හෝඩියේ අක්ෂර හඳුනා ගෙන කියවයි.
   3.1.2 ඇලපිල්ල, අල් කිරීම්, ඇදය, ඉස්පිල්ල, පාපිල්ල යන පිලි හඳුනාගෙන නිවැරදි ව උච්චාරණය කරමින් කියවයි.
   3.1.3 නැවතීම, ප්‍රශ්නාර්ථ ලකුණ ගැන සැලකිලිමත් ව කියවයි.
   3.1.4 කොම්බුව හඳුනාගෙන එය යෙදුණු තැන් නිවැරදි ව උච්චාරණය කරමින් කියවයි.

3.1.1 ශුද්ධ සිංහල හෝඩියේ අක්ෂර හඳුනා ගෙන කියවයි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය
ක්‍රියාකාරකම 1

- එක ම අකුරට විවිධ පිල්ලම් යෙදුණු අකුරු, මුලට යෙදුණු වචන කියවීමේ අවස්ථා ඇති කිරීම.
   i. හඳුන්වා දෙන අක්ෂරය මුලට යෙදුණු වචන ලැයිස්තු සකස් කර ගන්න.
   මෙහි දී මුලට යෙදුණු අක්ෂරය සුවිශේෂ ව දක්වන්න.

   උදා :-

| ක | හ | ද |
|---|---|---|
| කහ | හම | දර |
| කන | හය | දත |
| කද | හඳ | දහය |
| කඩය | හවස | දවස |
| කසය | හතර | දහනවය |

- මුලින් ම එක් වචන ලැයිස්තුවක් තෝරා ගන්න.
- එය සිසුන්ට පෙනෙන තැනක තබා ප්‍රදර්ශනය කරන්න.
- එහි සඳහන් වචන, වෙන වෙන ම ලියූ කුඩා කාඩ් පත්‍රිකා ගන්න.
- ඒවා අකුරු ලියූ පැත්ත නොපෙනෙන සේ එක පිට එක තබා මේසය මත තබන්න.
- එයින් එකක් ගැනීමට ශිෂ්‍යයකු යොමු කරන්න.
- තෝරා ගත් වචනය දෙස බලා, එය වචන පත්‍රිකාවේ අදාළ වචනය සමඟ ගළපා පෙන්වීමට යොමු කරන්න.
- නිවැරදි ව ගැළපූ විට අත්පොළසන් නාදයක් ලබා දෙන්න.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

- ඉන් පසු පත්‍රිකා දෙක ම වෙන වෙන ම ශබ්ද නගා කියවීමට යොමු කරන්න.
- ශිෂ්‍යයාට තනිව ම කියවීමට නොහැකි නම් උදවු කරන්න.
- ඔහු / ඇය සමග එම වචනය ශබ්ද නගා කියවීමට අනෙක් ශිෂ්‍යයන් ද යොමු කරන්න.
- මුළු පන්තිය ම යොදා ගෙන කියවීම අපහසු නම් කණ්ඩායම් වශයෙන් කියවීමේ ක්‍රීඩා සංවිධානය කරන්න.
- ගුරුවරයා එක් කණ්ඩායමක රැඳී, කියවීම ගන්නා විට අනෙක් කණ්ඩායම්වලට තනි ව කළ හැකි පැවරුම් දෙන්න.
- කණ්ඩායම් වැඩ මාරු කරමින් හැම කණ්ඩායම ම කියවීම සඳහා ද යොදා ගන්න.
- කියවූ වචන ලිවීමට ද යොමු කරන්න.
- සියලු ම අකුරු මුලට යොදා, සියලු පිල්ලම් යොදා, සැකසූ වචන පත්‍රිකා යොදා ගෙන අත්දැකීම් ලබා දෙන්න.


ii. හඳුන්වා දීමට අදහස් කරන අක්ෂරය මුලට යෙදෙන වචන හඳුනා ගන්න. එම අකුර හිස් ව තබා ඉතිරි අකුරු ලියූ වචන ලැයිස්තු සකසා ගන්න. තනි අකුරු සහිත කාඩ්පත් ද ගන්න.
හඳුන්වා දෙන්නේ **ක** අක්ෂරය නම් :

ක

. . . . . . . . . . . හ
. . . . . . . . . . . න
. . . . . . . . . . . ද
. . . . . . . . . . ඩය
. . . . . . . . . . සය

- අකුරු කාඩ්පත් ඉදිරිපත් කර වචන පත්‍රිකාවේ උඩින් ම ඇති අකුර තෝරා ගැනීමට යොමු කරන්න.
- එම අක්ෂරය නිවැරදි ව තෝරා ගත් විට අත් පොළසන් නාදයක් ලබා දෙන්න.
- ඉන් පසු එම අක්ෂරය වචන පත්‍රිකාවේ හිස් තැන්වලට තබමින් වචන ශබ්ද නගා කියවීමට යොමු කරන්න.
- පන්තියේ / කණ්ඩායමේ සියලු ම දෙනාට ද එම වචන ශබ්ද නගා කියවීමට අවස්ථාව දෙන්න.
- මේ ආකාරයට සියලු ම අක්ෂර සඳහා වචන පත්‍රිකා සකසා කියවීමේ අත්දැකීම් ලබා දෙන්න.

උදා : අකුරක් ඉවත් කළ ප්‍රහේලිකාවල හිස් තැනට අදාළ අකුර තබා කියවීම.




- අකුරු කට්ටල සමඟ ඉහත ආකාරයේ ප්‍රහේලිකා ලබා දී පිටත ඇති අකුර තෝරා ගෙන, හිස් තැනට තබා වචන දෙක කියවීමට යොමු කරන්න.
- අවශ්‍ය අයට උදවු ලබා දෙන්න.
- කියවූ වචන ලිවීමට ද යොමු කරන්න.
- ඉහත සඳහන් ක්‍රියාකාරකම්වලින් පසු දෙවැනි ශ්‍රේණියේ දී අලුතින් හඳුන්වා දෙන ලද අකුරු (පෙළ පොතේ අඟ කොටු කර ඇත.) යෙදූ වචන හා සරල වැකි කියවීමට යොමු කරන්න.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

3.1.2 ඇල පිල්ල, අල් කිරීම්, ඇදය, ඉස් පිල්ල, පා පිල්ල යන පිල්ලම් හඳුනා ගෙන නිවැරදි ව උච්චාරණය කරමින් කියවයි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය

ක්‍රියාකාරකම 1

- මෙහි දී 3.1.1 හි සඳහන් ආකාරයේ ක්‍රියාකාරකම් සංවිධානය කර ගන්න.

1. ඇලපිල්ල සහිත අකුරු යෙදුණු වචන කියවීම සඳහා සිසුන් යොමු කරන්න.

උදා :-

| ආ | කා | නා |
|---|---|---|
| ආනා | කාලය | නාසය |
| ආවා | කාමරය | නාගස |
| ආගම | කාවා | නාමල |
| ආදරය | කාලසටහන | නාදය |
| ආසනය | | නාගයා |
| ආසාව | | නානවා |

- අනෙක් අකුරු සඳහා ද මෙබඳු පත්‍රිකා සකසා ගන්න.
- ඇලපිල්ල යෙදුණු අකුරු සහිත කවි හා වැකි කියවා අන්දැකීම් ලැබීමේ අවස්ථා ඇති කිරීම.

උදා :

i. ආවා - ආවා - හාවා - ආවා
වට පිට බල බල හාවා ආවා

ii. ආනා සාමාට කතා කළා

iii. තාරාවා තාලයට නානවා

2. ඇලපිල්ල සහිත අකුරු මුල, මැද, අග යෙදුණු වචන කියවා අන්දැකීම් ලැබීමේ අවස්ථා ඇති කරන්න.

උදා :

| කා | මා | නා |
|---|---|---|
| කාලය | මාලය | නාසය |
| වරකා | සාමා | පනාව |
| ආකාරය | සමාව | නාදය |
| කාරණය | මාසය | වාසනාව |

- අකුරක් ඉවත් කළ ප්‍රහේලිකාවල හිස් තැනට අදාළ අකුර තෝරා තබා වචන කියවීමට යොමු කරන්න.

උදා :

නා

| | | |
|---|---|---|
| ප | | ව |
| | ස | |
| | ය | |

මා

| | | |
|---|---|---|
| | ස | ය |
| ල | | |
| ය | | |

පා

| | | | |
|---|---|---|---|
| තා | | ර | ර |
| | ල | | |
| | ම | | |




Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved


- මේ සඳහා වචන යොදා ගන්නා විට අදාළ පිල්ලම පමණක් යෙදුණු වචන තෝරා ගැනීමට උත්සාහ ගන්න.
- එසේ වචන තෝරා ගැනීම අපහසු වූ විට අදාළ පිල්ලම සමඟ මෙතෙක් උගත් පිල්ලම් පමණක් යෙදුණු වචන සකසා ගන්න.


3. අල් කිරීම් සහිත අකුරු යෙදුණු වචන කියවීම සඳහා අවස්ථා ඇති කරන්න.
උදා :-


| ම් | ක් | ත් |
|---|---|---|
| අම්මා | කාක්කා | තාත්තා |
| කම්මල | අක්කා | පත්තරය |
| සම්බා | මක්කම | අත්සන |
| සම්මාදම | ලක්සල | රත්මල් |

- අකුරක් ඉවත් කළ ප්‍රහේළිකාවලට, අදාළ අකුර තෝරා තබා වචන කියවීමට යොමු කරන්න.
උදා :




4. ඇදය යෙදුණු අකුරු සහිත වචන කියවීම සඳහා යොමු කරන්න.
උදා :-

| කැ | නැ | වැ | පැ |
|---|---|---|---|
| කැටය | නැව | වැට | පැළය |
| කැළය | නැන්දා | වැව | පැත්ත |
| කැත්ත | නැකත | වැස්ස | පැන්නා |
| කැස්ස නැවත | වැල්ල | පැල | |
| කැන්ද | වැල්ලවාය | පැහැය | |

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

5. දීර්ඝ ඇදය සහිත අකුරු යෙදුණු වචන කියවීමට සලස්වන්න.

උදා :

| කැ | නැ | මැ |
|---|---|---|
| කැම | නැම | මැ වැල |
| කැවා | නැයා | මැ ඇට |
| කැරලා | නැනා | මැත |
| කැගල්ල | නැදැයා | මැකරල් |
| කැදැත්තා | නැදැකම | |

- දීර්ඝ ඇදය යෙදුණු අකුරු සහිත වචන යෙදුණු කවි හා වැකි කියවීමට යොමු කරන්න.

නැනා නැමට ඇත වැවට ගියා
කැරලා ඇත කැ ගසනවා
කැල මල් කඩන්න ඇත කැලෑවට යනවා

- අකුරක් ඉවත් කරන ලද ප්‍රහේලිකාවලට අදාළ අකුර තෝරා තබා කියවයි.

උදා :-

නැ

| | | |
|---|---|---|
| ග | | |
| ල් | | |
| | දැ | යෝ |
| ව | | |

තැ

| | | |
|---|---|---|
| ප | | |
| ත් | | |
| | ග් | ග |
| යා | | |

- ඉස්පිල්ල සහිත අකුරු යෙදුණු වචන කියවීමට සලස්වන්න.

උදා:

| කි | නි | පි | බි |
|---|---|---|---|
| කිරි | නියර | පියන | බිම |
| කියත | නිකට | පිනිදිය | බිබිළි |
| කිකිළි | නියන | පිහිය | බිම්මල |
| කිණිහිර | නිවස | පිළිමය | බිත්තර |
| කියනවා | නිදහස | පිට්ටනිය | බියගම |

- ඉස්පිල්ල සහිත අකුරු යෙදුණු වචන ඇති වැකි හා කවි කියවීමට යොමු කරන්න.

උදා :-

කිරි මිහිරි රසයි
පිපිලා ඇති නිල් මල් ලස්සනයි
ටිකිරි ටිකිරි ටිකිරි ලියා

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

- අකුරක් ඉවත් කළ ප්‍රහේලිකාවල හිස් තැනට අදාළ අකුර තෝරා තබා කියවීමට යොමු කරන්න.

කි

| | |
|---|---|
| | රි |
| කි | |
| ළි | |

බි

| | | | |
|---|---|---|---|
| | ත් | ත | ර |
| හි | | | |
| රි | | | |

මෙතෙක් දැක් වූ ආදර්ශ ඇසුරු කර ගෙන දීර්ඝ ඉස්පිල්ල හා පාපිලි යෙදුණු අකුරු සහිත වචන හා වැකි කියවීමේ අවස්ථා ලබා දෙන්න.

3.1.3 නැවතීම, ප්‍රශ්නාර්ථ ලකුණ ගැන සැලකිලිමත් ව කියවයි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය
ක්‍රියාකාරකම්

- මෙතෙක් උගත් පිල්ලම් සහිත සරල කෙටි වැකි, නැවතීමේ ලකුණ හා ප්‍රශ්නාර්ථ ලකුණ යොදා සකස් කර ගන්න.
- පෙළ පොතේ වැකි ද යොදා ගන්න.
- එම වැකි නිවැරදි උච්චාරණයෙන් යුතු ව කියවද්දී, සිසුන්ට අසා සිටීමට සලස්වන්න.
- කිහිප වරක් අසා සිටීමට යොමු කළාට පසු සිසුන් ද කියවීමට යොමු කරන්න.
- මේ සඳහා යොදා ගන්න උපකරණ ශිෂ්‍ය පරිණතිය අනුව වෙනස් කරමින් වසර පුරා ම කියවීමේ අත්දැකීම් ලබා දෙන්න.

3.1.4 කොම්බුව හඳුනාගෙන එය යෙදුණු තැන් නිවැරදි ව උච්චාරණය කරමින් කියවයි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය
ක්‍රියාකාරකම්

- අදාළ අකුරු තෝරා කියවීමේ අවස්ථා ඇති කිරීම.

උදා 1 :-කොම්බුව සහිත අකුරු ඇති වචන තෝරා ගන්න.
පහත සඳහන් ආකාරයට වචන පත්‍රිකා සකස් කර ගන්න.
කොම්බුව සහිත අකුරු කාඩ්පත් වෙන ම තබන්න. හිස්තැන සහිත වචන කාඩ්පත් වෙන ම තබන්න. අදාළ අකුර තෝරා ගෙන වචනයේ හිස්තැනට තබා කියවීමට යොමු කරන්න.

| ගෙ ය | මෙ රු | හෙ ට | බෙ නය |
|---|---|---|---|
| ....... ය | ...... රු | ..........ට | ...........නය |
| දෙ ක | බෙ ලි | බෙ රය | දෙ බරු |
| ........ ක | ........ලි | ...........රය | ............බරු |

| | | | |
|---|---|---|---|
| කළ | - කෙළ | බර | - බෙර |
| තල | - තෙල | දස | - දෙස |
| සවන | - සෙවන | කන්ද | - කෙන්ද |
| මත | - මෙත | දනවා | - දෙනවා |
| වද | - වෙද | | |



Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

උදා 2 : වචනවල මුල් අකුර හිස් ව තබා ඉතිරි අකුරු සහිත වචන පත්‍රිකා සකසා ගන්න.

පෙ    දෙ    බෙ    කෙ

....ට්ටිය    ....ක    .....ලි    ......ස්

....රහැර    ....හි    ......රය    ......ටි

.....නේරය    ....නවා    .....නය    ......න්ද

....ල්    .....හෙත්    ......සෙල්

මේ වචන කළුලැල්ලේ ද ගොඩ නැගිය හැකි ය.

උදා 3 : මුලට යොදන අකුර වෙන ම කාඩ්පතක ලියා ගන්න.

පෙ    දෙ    බෙ    කෙ    ගෙ    වෙ    කේ    දේ

......රහැර    .....ල්    .....ලි    .....සෙල්    .....දර    .....හෙර    .....තලය    .....දුන්න

වචන කිහිපයක් සහිත පත්‍රිකාවක් හා එහි මුලට ගැළපෙන අකුර ශිෂ්‍යයන්ට තෝරා ගැනීමට දෙන්න.
තෝරා ගැනීම අපහසු නම් උදවු කරන්න.
තෝරා ගත් නිවැරදි අකුර හිස් තැනට තබමින් වචන කියවීමට යොමු කරන්න.
වචන කියවීම සඳහා ශිෂ්‍යයාට උදවු කරන්න.
කියවූ වචන ලිවීමට ද යොදා ගන්න.
මෙම වචන කළුලැල්ලේ වුව ද ගොඩ නැගිය හැකි ය.

නිපුණතාව

3.2 කියවීමේ වේගවත් බව හා ප්‍රවීණවත් බව වර්ධනය කර ගනියි.
- 3.2.1 වමේ සිට දකුණට කියවයි.
- 3.2.2 උඩ සිට පහළට නම් ලැයිස්තු කියවයි.
- 3.2.3 වේගවත්ව කියවා ප්‍රතිචාර දක්වයි.
- 3.2.4 උපදෙස් කියවා අවබෝධ කර ගෙන ප්‍රතිචාර දක්වයි.

3.2.1 වමේ සිට දකුණට කියවයි.
ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය
ක්‍රියාකාරකම 1
- රූප සමඟ ඇති තනි වාක්‍ය ශබ්ද නගා කියවීමේ අවස්ථා ඇති කිරීම.
- පේළි දෙකක් සහිත සරල කවි ශබ්ද නගා කියවීමට යොමු කිරීම.
- පෙළ පොතෙහි පාඩම් ශබ්ද නගා කියවීමට යොමු කිරීම. එක් ශිෂ්‍යයකු කියවන විට අනෙක් අයට ඒ අනුව නිශ්ශබ්ද ව කියවා ගැනීමට යොමු කරන්න. මේ සඳහා විවිධ පෙළඹවීම් කිරීම අවශ්‍ය වේ.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

3.2.2 උඩ සිට පහළට නම් ලැයිස්තු කියවයි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය

ක්‍රියාකාරකම 1

- මෙහි දී අපේක්ෂා කරනුයේ කියවීමේ වේගවත් බව වර්ධනයයි. මේ සඳහා විවිධාකාරයේ නම් ලැයිස්තු උඩ සිට පහළට කියවන අවස්ථා උදා කිරීම අපේක්ෂා කෙරේ.

  උදා :-

  උඩ සිට පහළට නම් ලැයිස්තු කියවා අදාළ නම ඇති ලැයිස්තුව තේරීම.

  නම් ලැයිස්තු කියවා අදාළ නම ඇති කණ්ඩායම හඳුනා ගැනීම.

  තම නම ඇති කණ්ඩායම නම් ලැයිස්තු කියවා හඳුනා ගැනීම.

ක්‍රියාකාරකම 2

- අකුර තබමින් හෝ ගෙන යමින් හෝ උඩ සිට පහළට වචන කියවීම.
- එකම අකුරකින් පටන් ගන්නා නම් කිහිපයක් තෝරා ගන්න.
- එම නම්වල මුල අකුර හිස් ව තබා ඉතිරි කොටස් කාඩ් පත්‍රිකාවක ලියන්න.
- පටන් ගන්නා අකුර වෙන ම කාඩ් පත්‍රිකාවක ලියා දෙන්න.
- එම අකුර හිස් තැනට තබමින් නම් කියවීමට යොමු කරන්න.
- මෙම අකුර ගෙන යන ආකාරයට උපකරණ සකස් කර කියවීමට ද යොමු කළ හැකි ය.

  උදා :-

| ක | ස |
|---|---|
| ......සුන් | ......ඳුන් |
| ..... ල්හාරි | ...... මන්තිකා |
| ...... ල්පනා | ..... මන් |
| ...... මල් | ...... හන් |
| | ...... පුමල් |

3.2.3 වේගවත් ව කියවා ප්‍රතිචාර දක්වයි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය

ක්‍රියාකාරකම්

- වචන පත්‍රිකා සහ එම වචනවලට අදාළ රූප පත්‍රිකා වෙන වෙන ම සකස් කර ගන්න. ඒවා මිශ්‍ර කර ශිෂ්‍යයන්ට දී රූපයට අදාළ වචන ගළපා සකස් කර පෙන්වීමට යොමු කරන්න.
- ශිෂ්‍යයාට පහසුවෙන් කර පෙන්විය හැකි ක්‍රියා අඩංගු පත්‍රිකා සකස් කර ගන්න.

  උදා :-

| | |
|---|---|
| උඩ පනින්න | සිනා සෙන්න |
| අත්පොඩි ගසන්න | හිස අතගාන්න |
| නහය අල්ලන්න | ඇස් වසා ගන්න |

ඉහත ආකාරයේ විධාන පත්‍රිකා සකස් කර ගෙන එක් එක් ශිෂ්‍යයාට දී එය කියවා ප්‍රතිචාර දැක්වීමට යොමු කරන්න.

කාඩ් පත්‍රිකාව කියවා ප්‍රතිචාර දැක්වීමට ගත වන කාලය අනුව කියවීමේ වේගය මැන ගත හැකි ය.



Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

3.2.4 උපදෙස් කියවා අවබෝධ කර ගෙන ප්‍රතිචාර දක්වයි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය

ක්‍රියාකාරකම්

- සතුන්ගේ රූප, ඇඳුම් වර්ගවල රූප ආදී ලෙස හැම දෙනාට ම රූපය බැගින් දීමට අවශ්‍ය රූප පත්‍රිකා සකස් කර ගන්න.
- එම රූප, කඩඉරිවලින් කොටස්වලට වෙන් කර එම කොටස්වලට අංක යොදන්න.
- ඉන් පසු ඒ ඒ අංකය සහිත කොටස පාට කළ යුතු විවිධ වර්ණ පිළිබඳ උපදෙස් කළුලෑල්ලේ ලියන්න.

  උදා :-

  1 කොටස - රතු පාටින් පාට කරන්න

  2 කොටස - කොළ පාටින් පාට කරන්න ආදී ලෙස
- එම උපදෙස් කියවා රූපය පාට කිරීමට සිසුන් යොමු කරන්න.

- යම් දෙයක්/කෙනෙක්/තැනක් ගැන ලියන ලද සරල වැකි කිහිපයක් අතරට එම දෙයට/තැනට නොගැළපෙන වැකියක් ද ලියන ලද වැකි පත්‍රිකා සකසා ගන්න.

  උදා :-

  | |
  |---|
  | ගිරවා ලස්සනයි<br>හොට රතු පාටයි. වකුටුයි<br>මාළුවා වතුරේ පීනනවා<br>ගිරවාගේ බෙල්ලේ මාලයක් තියෙනවා |

- එම වැකි පත්‍රිකා සිසුන් අතර බෙදා දෙන්න.
- එම පත්‍රිකා කියවා එහි ඇති නොගැළපෙන වගන්තිය තේරීමට සිසුන් යොමු කරන්න.

  මෙය කළුලෑල්ලේ ලියා වුව ද ඉදිරිපත් කළ හැකි ය.

නිපුණතාව

3.3 නිශ්ශබ්ද ව කියවා අවබෝධ කර ගනියි.

- 3.3.1 සරල වචන නිශ්ශබ්ද ව කියවා අවබෝධ කර ගනියි.
- 3.3.2 සරල වාක්‍ය නිශ්ශබ්දව කියවා අවබෝධ කර ගනියි.
- 3.3.3 සරල කවි නිශ්ශබ්දව කියවා අවබෝධ කර ගනියි.
- 3.3.4 රූපික ප්‍රකාශන හොඳින් නිරීක්ෂණය කර අවබෝධ කර ගනියි.

3.3.1 සරල වචන නිශ්ශබ්ද ව කියවා අවබෝධ කර ගනියි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය

ක්‍රියාකාරකම් 1

- පන්තියේ හෝ ඒ අසල ඇති ද්‍රව්‍ය/ස්ථාන ආදියේ නම් ලියූ පත්‍රිකා සකස් කර ගන්න.

  පහත සඳහන් උපදෙස් සිසු කණ්ඩායමකට දෙන්න.
  - සිසුන්ට බෙදන දේ ඇස් පියාගෙන ලබා ගත යුතු බව
  - ඇස් ඇරිය යුත්තේ සංඥාවක් දුන් පසු බව
  - සංඥාව දුන් පසු අතේ ඇති පත්‍රිකාවේ සඳහන් දේ නිශ්ශබ්ද ව කියවා එයට ගැළපෙන දේ අසලට දුව ගොස් එම පත්‍රිකාව එතැන තැබිය යුතු බව
- පසුව තවත් සිසු කණ්ඩායමක් තෝරා ගෙන මෙම ක්‍රියාකාරකමෙහි යොදවන්න.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

ක්‍රියාකාරකම 2

- අකුරක් අඩුවෙන් ලියූ වචන පත්‍රිකා සකස් කර ගන්න.

  එම අඩු අකුරු අඩංගු අකුරු පෙට්ටියක් සමග එම වචන පත්‍රිකා සිසුන්ට දෙන්න.

  වචනය සම්පූර්ණ වීම සඳහා අඩු අකුර, වචන පෙට්ටියෙන් තෝරා ගෙන අදාළ තැන තබා එම වචනය කියවීමට සිසුන් යොමු කරන්න.

  උදා :-

| | |
|---|---|
| බෝත .... ය | පෙ .... ටිය |
| රෝ ..... ය | ජ .... ලය |
| කෝච් .... ය | අල් .... රිය |
| කෝ ..... පය | පෝ .....විය |
| පු .... ව | ප .... තරය |
| මේ .... ය | පැ .... සල |

ක්‍රියාකාරකම 3

- රූප පත්‍රිකා 10ක් පමණ සපයා ගන්න.
- එම රූප 10ට ගැළපෙන වචන 10ක් හා නොගැළපෙන වචන 20ක් කාඩ් පත්‍රිකාවල ලියා ශිෂ්‍යයාට සපයන්න.
- රූපයට අදාළ වචනය හා රූපය එක ළඟ තැබීමට උපදෙස් දෙන්න.

ක්‍රියාකාරකම 4

- රූප පත්‍රිකා කට්ටලයක් හා එම රූපවලට අදාළ වචන සෑදීමට අවශ්‍ය අකුරු ශිෂ්‍යයන් වෙත සපයන්න.
- රූප පත්‍රිකාවට යටින් එහි ඇති රූපය අදාළ වචනය සකස් කර තැබීමට සිසුන් යොමු කරන්න.
- සාදන ලද වචන කියවා පොතේ ලියා ගැනීමට සලස්වන්න.

ක්‍රියාකාරකම 5

- ඒ ඒ රූපය වෙන් වෙන් ව හඳුනා ගත හැකි ලෙස අඳින ලද ප්‍රකාශන චිත්‍රයක් හා එහි ඇඳ ඇති රූපවලට අදාළ වචන ලියූ වචන පත්‍රිකා සිසුන්ට සපයන්න. එම චිත්‍රයේ ඇති ඒ ඒ රූප අසල ඊට අදාළ වචනය තැබීමට යොමු කරන්න. (වචනය රැඳවීමට ක්‍රමයක් හිතන්න)

3.3.2 සරල වාක්‍ය නිශ්ශබ්ද ව කියවා අවබෝධ කර ගනියි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය

ක්‍රියාකාරකම 1

- පින්තූර පත්‍රිකා කට්ටල කිහිපයක් සකස් කර ගන්න.

  සකස් කර ගන්නා පින්තූර ඉතා සරල ඒවා විය යුතු ය.

  එක් කට්ටලයකට පින්තූර පත්‍රිකා පහක් පමණ යොදා ගන්න.

  එම රූප පත්‍රිකාවලට ගැළපෙන සරල වැකියක් හා නොගැළපෙන වැකිය බැගින් යුත් වැකි 10ක් වෙන වෙන ම ලියා සකස් කර ගන්න.

  රූප පත්‍රිකා පහ සහ වැකි 10 සිසුන්ට දී ගැළපෙන වැකිය හා රූපය තෝරා යුගල සෑදීමට යොමු කරන්න.

  කට්ටල කිහිපයක් පන්තියේ සිසු කණ්ඩායම් ගණනට සරිලන සේ සකස් කර ගන්න. හැම කණ්ඩායමට ම හැම කට්ටලයක් ම ලැබෙන සේ එම කට්ටල කණ්ඩායම් අතර මාරු කරමින් වැකි හා පින්තූර යුගල් කිරීමට යොමු කරන්න.

  උදා :- ගස්වල මල් පිපිලා
  මාළු රංචුවක් පීනනවා
  කුරුල්ලෝ ඉගිලෙනවා
  ළමයි සෙල්ලම් කරනවා
  අහසේ ඉර පායලා

  ඉහත සඳහන් ආකාරයේ වැකි හා එම වැකිවලට ගැළපෙන පින්තූර සකස් කර ගන්න.

  පින්තූරයෙන් පිළිබිඹු විය යුත්තේ නිවැරදි වැකියේ අදහස පමණක් ම විය යුතු ය.



Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

ක්‍රියාකාරකම 2

- නාම පද 5ක් පමණ හා එම නාම පදවලට ගැළපෙන ක්‍රියා පද සහිත වැකි කොටස් පහක් පමණ වෙන වෙන ම කාඩ්පත්වල ලියා ඉදිරිපත් කරන්න.
  එම නාම පද හා ක්‍රියා පද සහිත කොටස් ගළපමින් වැකි සකස් කර කියවීමට යොමු කරන්න. නාම පද හෝ ක්‍රියා පද හෝ පිළිබඳ පාඩමක් කිරීම අවශ්‍ය නොවේ.
  උදා :-
  නාම පද

| සමනලයා | බල්ලා | ළමයි | කුරුල්ලෝ | වසු පැටියා |
|---|---|---|---|---|

ක්‍රියා පද අඩංගු කොටස්

| අහසේ පියාඹනවා | මල් පැණි බොනවා |
|---|---|
| උම්බෑ කියනවා | හයියෙන් බුරනවා |
| පාසලට යනවා | |

- මේ ආකාරයේ කාඩ් පත් කට්ටල, සිසු කණ්ඩායම් ගණනට ගැළපෙන සේ සකස් කර, පැවරුම් දෙන්න.
- ඉන් පසු කණ්ඩායම් අතර කාඩ් පත් කට්ටල මාරු කරමින් හැම කණ්ඩායමකට ම හැම කට්ටලයක් සමග ම වැඩ කිරීමට අවස්ථාව දෙන්න.
- කියවූ වැකි ලිවීමට ද යොමු කරන්න. (මෙය ලිවීම ක්ෂේත්‍රයේ 4.2.2 සුවිශේෂ අභිමතාර්ථය සමග සම්බන්ධ කර ගන්න)

ක්‍රියාකාරකම 3

- ක්‍රියා පදයට හිස් තැනක් තබා ලියූ වැකි පත්‍රිකා කට්ටලයක් සහ එම හිස් තැනට ගැළපෙන ක්‍රියා පද පත්‍රිකා සකස් කර ගන්න.
  උදා :
  වැකි

1. මල්ලි බත් .........
2. ගිරවා අහසේ ............
3. මාළුවා වතුරේ ...........
4. අක්කා පොත ..............
5. අයියා අකුරු ..............

ක්‍රියා පද

| පියාඹනවා | පීනනවා | කනවා | කියවනවා | ලියනවා |
|---|---|---|---|---|

- මෙබඳු කට්ටල, පන්තියේ කණ්ඩායම් ගණනට ගැළපෙන සේ සකස් කර ගන්න.
- එම පත්‍රිකා ශිෂ්‍ය කණ්ඩායම්වලට දී හිස් තැනට ගැළපෙන පත්‍රිකාව තෝරා තබා වැකි කියවීමට යොමු කරන්න. පැවරුම් කණ්ඩායම් අතර මාරු කරන්න.
- කියවා අවසන් කළ වචන හා වැකි ලිවීමට ද යොමු කරන්න.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

ක්‍රියාකාරකම 4

- නාම පදවලට හිස් තැනක් තබා ලියූ වැකි පත්‍රිකා සකස් කර ගන්න.
- එම වැකිවලට ගැළපෙන නාම පද වෙන ම ලියූ පත්‍රිකා සකස් කර ගන්න.

උදා :-

අම්මා ........................... සෝදනවා

අක්කා ............................ කියවනවා

අයියා ............................. හදනවා

ගිරවා ....................... කනවා

කාක් කාක් කියා ................ කෑ ගසනවා

නාම පද

| සරුංගලය | පොත | රෙදි | අඹ | කපුටා |
| --- | --- | --- | --- | --- |

- එබඳු කට්ටල සිසු කණ්ඩායම්වලට ගැළපෙන සේ සකස් කර ගෙන සිසුන්ට කියවීමේ පැවරුම් ඉදිරිපත් කරන්න.
- හිස් තැනට ගැළපෙන නාම පදය, දෙන ලද වචන පත්‍රිකා අතරෙන් තෝරා තබා කියවීමට යොමු කරන්න.
- කණ්ඩායම් අතර පැවරුම් මාරු කරන්න.

ක්‍රියාකාරකම 5

- සරල වැකි තුනකින්/හතරකින් පමණ යුත් කුඩා ඡේද ලියා ඉදිරිපත් කර කියවීමට යොමු කරන්න.

උදා :-

උදේට ඉර පායනවා<br>
ගස්වල මල් පිපිලා<br>
ළමයි පාසල් යනවා

අඹ ගහේ ගෙඩි පිරිලා<br>
සමහර අඹ ඉදිලා<br>
ඉදුණු අඹ කහ පාටයි

අපේ මිදුලේ මල්ගස් තියෙනවා<br>
ඒ ගස්වල මල් පිපිලා<br>
සමනල්ලු මල් පැණි බොනවා

- සරල වැකි තුනක් කළුලෑල්ලේ ලියන්න.
- එම වැකි තුන ම නිශ්ශබ්ද ව කියවීමට සිසුන් යොමු කරන්න.
- එක් ශිෂ්‍යයකු කළුලෑල්ල අසලට කැඳවන්න.
- ලියන ලද වැකි තුනෙන් වඩාත් කැමති වැකිය හිතා ගන්නා ලෙස කියන්න.
- ඔහු හිතා ගත් වැකිය කුමක් දැයි අනුමාන කර හිතා ගන්නා ලෙස අනෙක් සිසුන්ට පවසන්න.
- වැකිය හිතා ගත් පසු අත් ඔසවන ලෙසට උපදෙස් දෙන්න. (සියලු දෙනා ම වැකිය හිතා අවසන් වූ බව අත් එසවීමෙන් දැන ගන්න)
- ඉන් පසු තමා හිතූ වැකිය ශබ්ද නගා කියවන ලෙස තෝරා ගත් ශිෂ්‍යයාට පවසන්න.
- එම වැකිය ම තෝරා ගත් අයට නැවත අත් ඔසවන ලෙස කියන්න.
- එම අයට අත් පොළසන් නාදයක් ලබා දෙන්න.
- එම වැකිය සියලු දෙනා ලවා ශබ්ද නගා කියවන්න.
- මේ ආකාරයට කිහිප දෙනකු කැඳවා මෙය කරන්න.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

3.3.3 සරල කවි නිශ්ශබ්ද ව කියවා අවබෝධ කර ගනියි.

ඉගෙනුම් -ඉගැන්වීම් ක්‍රමෝපාය
ක්‍රියාකාරකම්

- සිසුන්ගේ අවබෝධ මට්ටමට ගැළපෙන කවි කිහිපයක් කළුලැල්ලේ ලියා ඉදිරිපත් කරන්න. එය නිශ්ශබ්ද ව කියවා ගැනීමට කාලය දෙන්න.
- ඉන් පසු වාචික ප්‍රශ්න අසමින් ඒවාට ශිෂ්‍ය ප්‍රතිචාර ලබා ගනිමින් ඒ කවි ගැන ශිෂ්‍යයා සමග කතා කරන්න.
- සිංහල පෙළ පොතෙහි කවි පන්ති ද නිශ්ශබ්ද ව කියවා අවබෝධ කර ගැනීමට අවස්ථා ඇති කිරීම සුදුසු ය.
- සතකුගේ හෝ දෙයක හෝ ස්වභාවය සරල ව කවියට නගා සිසුන්ට ඉදිරිපත් කරන්න. එය කියවා ඒ කවු ද? කුමක් ද? සිතා පැවසීමේ අවස්ථා ඇති කරන්න.

3.3.4 රූපික ප්‍රකාශන හොඳින් නිරීක්ෂණය කර අවබෝධ කර ගනියි.

- පහත සඳහන් අරමුණු ඉටු කර ගත හැකි ලෙසින්, මෙම භාෂා ක්‍රියාකාරකම් සංවිධානය කිරීම අපේක්ෂා කෙරේ.
- තමා දුටු දේ පිළිබඳ ව දිගු වේලාවක් සිත යොමු කිරීම.
- රූපික ප්‍රකාශනවලට නිවැරදි ව ප්‍රතිචාර දැක්වීම.

ඉගෙනුම් -ඉගැන්වීම් ක්‍රමෝපාය
ක්‍රියාකාරකම්

1. ප්‍රකාශන චිත්‍රයක් තෝරා ගන්න.
   එය හොඳින් බැලූ පසු ඒ ගැන ප්‍රශ්න අසන බව කියන්න.
   ටික වේලාවක් චිත්‍රය දෙස හොඳින් බැලීමට අවස්ථාව දෙන්න.
   ඉන් පසු එම චිත්‍රය පිළිබඳ ව ප්‍රශ්න අසන්න.
   ඒ ගැන කතා බහ කරන්න.
2. සරල රසවත් කතන්දර චිත්‍රයෙන් ඉදිරිපත් කර ශිෂ්‍යයාට එම චිත්‍ර හොඳින් බැලීමට අවස්ථාව දෙන්න.
   ඉන් පසු එම කතන්දරය කීමට යොමු කරන්න.
3. රූපික ප්‍රකාශනවලට නිවැරදි ව ප්‍රතිචාර දක්වමින් ක්‍රියාකාරී වන සෙල්ලම් හඳුන්වා දෙන්න. එම සෙල්ලම්වල යෙදීමේ අවස්ථා ලබා දෙන්න.
4. සිසුන්ට කියා දුන් කතන්දරයක් තෝරා ගන්න.
   එහි අවස්ථා රංගනයෙන් ඉදිරිපත් කිරීමට යොමු කරන්න.
   එම රංගන අවස්ථා දැක්වෙන චිත්‍ර කිහිපයක් සකස් කර ගන්න.
   එම චිත්‍රවලට ගැළපෙන වැකි සහ නොගැළපෙන වැකි පත්‍රිකා කිහිපයක් සකස් කර ගන්න.
   චිත්‍ර සහ වැකි සියල්ල ම සිසු කණ්ඩායමක් වෙත සපයන්න.
   දෙන ලද වැකි පත්‍රිකා කියවා චිත්‍රවලට ගැළපෙන වැකි තෝරා චිත්‍රය අසල තැබීමට යොමු කරන්න.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

නිපුණතාව

3.4 වාග්මාලාව පෝෂණය කර ගැනීම සඳහා කියවයි.

3.4.1 සමීප පරිසරයේ දක්නට ලැබෙන දේවල නම් කියවයි.

3.4.2 නෑදෑකම් හඳුන්වන වචන කියවයි.

3.4.3 විවිධ ක්ෂේත්‍ර සම්බන්ධ ව එදිනෙදා භාවිත වන වචන කියවයි.

3.4.1 සමීප පරිසරයේ දක්නට ලැබෙන දේවල නම් කියවයි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය

ක්‍රියාකාරකම්

- මෙහි දී ශිෂ්‍යයා ජීවත් වන හා ඉගෙන ගන්නා පරිසරයට ගැළපෙන ලෙස කියවීමට යොදා ගන්නා වචන පිළියෙල කර ගන්න. ඒවා ඉදිරිපත් කර කියවීමට යොමු කරන්න.

  උදා :-

  * පාසලේ හා පන්තියේ ඇති ද්‍රව්‍යවල නම්
  * පාසල් වත්තේ ඇති ගස්වල නම්
  * ප්‍රදේශයට අදාළ ව වැවෙන විවිධ පලතුරු හා එළවළුවල නම්
  * ආසන්න ගම්වල හා නගරවල නම්

3.4.2 නෑදෑකම් හඳුන්වන වචන කියවයි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය

ක්‍රියාකාරකම්

1. පවුලේ විවිධ සාමාජිකයන් අතර පවතින ඥාති සම්බන්ධතා අනුව යෙදෙන නෑකම් හඳුන්වන වචන පත්‍රිකා සකස් කර ගන්න.
   එම පත්‍රිකාවල පිටුපස ඒ ඒ පත්‍රිකාවට හිමි අංකයක් ලියා තබන්න. වචනය යටට සිටින සේ එම පත්‍රිකා පෙට්ටියක දමා තබන්න.
   ඉන් පසු එම පත්‍රිකාවල සඳහන් අංක ලියූ තුණ්ඩු කැබලි රෝල් කර ශිෂ්‍ය කණ්ඩායම ඉදිරියේ බිම දමා ශිෂ්‍යයන්ට ඒවා අහුලා ගන්නා ලෙස කියන්න.
   තුණ්ඩු ලබා ගත් එක් ශිෂ්‍යයකු ඉදිරියට කැඳවන්න.
   ඔහු ලබා ගත් තුණ්ඩුව දිග හැර එහි සඳහන් අංකය බලා එම අංකය සහිත වචන පත්‍රිකාව තෝරා ගැනීමට වචන පත්‍රිකා පෙට්ටිය ඔහුට දෙන්න.
   වචන පත්‍රිකාව නිවැරදි ව තෝරා ගත් පසු අත් පොළසන් නාදයක් ලබා දෙන්න.
   ඉන් පසු එම කාඩ් පතේ අනෙක් පැත්තේ සඳහන් වචනය ශබ්ද නගා කියවීමට යොමු කරන්න.
   ශිෂ්‍යයාට නිවැරදි ව කියවිය නොහැකි නම් උදවු කරන්න.
   ඉන් පසු සියලු ම ශිෂ්‍යයන් වෙත එම වචනය ඉදිරිපත් කර ශබ්ද නගා කියවීමට යොමු කරන්න.

2. සිංහල පෙළ පොතෙහි පාඩම්වල ඇති නෑදෑකම් හඳුන්වන වචන සෙවීමට යොමු කරන්න. එම වචන ලියා ඉදිරිපත් කිරීමට ද උපදෙස් දෙන්න.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

3.4.3 විවිධ ක්ෂේත්‍ර හා සම්බන්ධ ව එදිනෙදා භාවිත වන වචන කියවයි.

ඉගෙනුම් -ඉගැන්වීම් ක්‍රමෝපාය
ක්‍රියාකාරකම්

- කුඹුරු වැඩ, වඩු වැඩ, මේසන් වැඩ හා වෙනත් ශිල්පීය ක්ෂේත්‍රවල භාවිත කරන විවිධ උපකරණ හා විවිධ අවස්ථා සම්බන්ධ වචන ලැයිස්තු සකස් කර ගන්න.
  එම පත්‍රිකාවල පිටුපස යම් අංකයක් සඳහන් කරන්න.
  එම අංක කුඩා කාඩ් බෝඩ් කැබලිවල ලියා ගන්න.
  එම අංක ලියූ කාඩ් බෝඩ් කැබලි දැමීමට කුඩා කවර සකස් කර ගන්න.
  එම කවරවලට අංක ලියූ කාඩ් බෝඩ් කැබලි දමා කවරයේ කට අලවන්න.
  කාඩ් බෝඩ් කැල්ලක් ගෙන එම කවර පේළි කිහිපයක් සිටින සේ එහි අලවා ගන්න.

- ලොතරැයි දිනුම් ඇදීමේ සෙල්ලමකට සිසුන්ට ආරාධනා කරන්න.
  ඒ සඳහා කාඩ් බෝඩ් කැල්ලේ අලවා ඇති කවරයක් තෝරා ගෙන ගලවා ගැනීමට ශිෂ්‍යයකුට අවස්ථාව දෙන්න.
  දැන් කවරය විවර කර කාඩ් බෝඩ් කැල්ලේ ඇති අංකය පෙන්වන ලෙස කියන්න.
  කවරය තුළ ඇති අංකය පෙන් වූ පසු වචන පත්‍රිකා ඉදිරිපත් කර අංකයට හිමි වචන පත්‍රිකාව තෝරා ගත් පසු අත් පොසලන් දී එහි ඇති වචනය කියවීමට යොමු කරන්න.
  වචනය කියවීමට නොහැකි නම් උදවු කරන්න.
  ඉන් පසු එම වචනය මුළු පන්තියට ම පෙන්වා ශබ්ද නගා කියවීමට යොමු කරන්න.

ඉහත ආකාරයේ සෙල්ලම් හා විනෝද ජනක වැඩ යොදා ගනිමින් ශිෂ්‍යයින්ට වසර පුරා ම ඉගෙනුම් අත්දැකීම් ලබා දෙන්න.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

නිපුණතාව

4.1 අකුරු නිවැරදි ව ලිවීමේ හැකියාව ලබයි.
- 4.1.1 අකුරක නියමිත අංග සහිත ව ලියයි.
- 4.1.2 අකුරක නියමිත හැඩය හා ප්‍රමාණය ගැන සැලකිලිමත් ව ලියයි.
- 4.1.3 රූල් අතර ලියයි.
- 4.1.4 වචනයක අකුරු ළංව ලියයි.
- 4.1.5 වැකියක වචන අතර නියමිත පරතරයක් සහිත ව ලියයි.

4.1.1 අකුරක නියමිත අංග සහිත ව ලියයි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය
ක්‍රියාකාරකම්
- අකුරක නියමිත අංග සහිත ව ලියා ඇති ශුද්ධ සිංහල හෝඩිය ඇසුරෙන් අකුරු ආදර්ශයක් පන්ති කාමරය තුළ සුදුසු පරිදි ප්‍රදර්ශනය කරන්න.

ශුද්ධ සිංහල හෝඩියේ අකුරු ආදර්ශයක්

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

- සවන් දීම හා කථනයට සම්බන්ධ වන ලෙසින් පහත ගී පෙළ ගායනය සඳහා යොදා ගන්න. එසේ ගායනය කිරීමට හුරු වීමෙන් පසුව අකුරු ආදර්ශයේ අදාළ අකුරු දක්වමින් ගීතය ගායනයට අවස්ථා ඇති කරන්න.

| | |
|---|---|
| අ - ආ - ඉ - ඊ | තනි අකුරුත් |
| උ - ඌ - එ - ඒ | බැඳි අකුරුත් |
| කොයිවත් මට | කොයිවත් මට |
| මල් වගෙයි | මල් වගෙයි |
| | |
| ක - ග - ජ - ට - ඩ - ණ | හෝඩි පොතේ |
| ත - ද - න - ප - බ - ම | තිබෙන අකුරු |
| කොයිවත් මට | කොයිවත් මට |
| මල් වගෙයි | මල් වගෙයි |
| | - ආනන්ද රාජකරුණා - |

මෙම කවි පෙළ බලා ලිවීම අසා ලිවීම වැනි ඉගෙනුම් අවස්ථා ඇති කිරීම.

4.1.2 අකුරක නියමිත හැඩය හා ප්‍රමාණය ගැන සැලකිලිමත් ව ලියයි.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

ඉගෙනුම් -ඉගැන්වීම් ක්‍රමෝපාය
ක්‍රියාකාරකම්

- අකුරක නියමිත අංග සහිත ව නියමිත හැඩය හා ප්‍රමාණය ගැන සැලකිලිමත් ව ලිවීම සඳහා විනෝදජනක ක්‍රියාකාරකම් සංවිධානය කරන්න.

උදා :-

| | | | | |
|---|---|---|---|---|
| අ , ඇ, ඉ | මා ලියාපු | ආ, ඈ, ඊ | ඔබටත් එහෙම | ඉ යන්න - ඉර |
| උ, එ, ඔ | අ යන්න මේ | ඌ, ඒ, ඕ | පුළුවන් නම් | උ යන්න - උඩ |
| මේ ටික නම් | බලන්න හරි | මේවා නම් | ආ යන්නක් | ඔ යන්න - ඔරු |
| බොහොම කොටයි | ලස්සනයි | බෝම දිගයි | ලියා පන්කො | ඉර - උඩ - ඔරු |

-එස්. මහින්ද හිමි -

මෙම ගී පෙළ සිංහල වර්ණමාලාවේ ආදර්ශය ද සම්බන්ධ කර ගනිමින් අදාළ නිපුණතාවයට උචිත පරිදි ක්‍රියාකාරකම් සංවිධානය කර ගන්න.


- සිංහල හෝඩියේ ඇති ග - හ, ච - ම, ක - ත, ප - ජ, ර - ඊ වැනි සමාන ලක්ෂණ ඇති එහෙත් සියුම් වෙනස්කම් ඇති අකුරු හඳුනා ගන්න. එම අකුරු යුගල යොදා ගෙන අකුරකට නියමිත අංග සංජානනය කරවීමේ ක්‍රියාකාරකම් සංවිධානය කරන්න.

  උදා :- ච - ම අකුරු දෙක

  ආදළ අකුරු දෙක ම යෙදෙන වචන හඳුනා ගන්න. එම වචනවලින් කියවෙන අදහස රූපයකින් ද දැක්විය හැකි විය යුතු ය.

- එම රූපය ඇද අදාළ වචනයේ නියමිත අකුරු දෙක හිස් ව තබා වචනය ලියන්න.

  නිදසුන :

| | |
|---|---|
|  | ...... ද ......ල |

- ච , ම අකුරු දෙක අකුරු අතුරෙන් තෝරා මලෙහි නම සෑදීමට සිසුන් යොමු කරන්න.
- පන්තියේ සිසුන් දෙදෙනෙක් යම් ක්‍රමයකට තෝරා ගෙන හෝ සිසු කණ්ඩායම් වශයෙන් හෝ සාමූහික වශයෙන් හෝ මෙම ක්‍රියාකාරකම සංවිධානය කළ හැකි ය.
- අදාළ අකුරු අතරින් නියමිත අකුරු තෝරා වචන සෑදීමෙන් පසුව අදාළ චිත්‍රය අභ්‍යාස පොත්වල ඇඳ පාට කර නියමිත වචනය ලිවීමට යොමු කරන්න.
- වචන යොදා ලිවීමෙන් පසුව ගීත ගායනය කරමින් තබා ලියූ වචන කියවීමට යොමු කළ හැකි ය.

  උදා :-

| ග - හ සඳහා | ච - ම සඳහා | ද - ල | ප - ජ |
|---|---|---|---|
| මෙන්න ග | මෙන්න ච | | අන්න ප |
| මෙන්න හ | මෙන්න ම | | අර පනාව |
| මේ බලන්න | මේ බලන්න | | මෙන්න ජ |
| මේ ගහ ක් | චදමලක් | | මෙතන ජම්බු |

- සමානව ශබ්ද වන ඉ - යි, උ - වූ, අකුරු සහිත වචන නිවැරදි ව ලිවීමේ ක්‍රියාකාරකම් සංවිධානය කරන්න.

  උදා :- වරහන් තුළ ඇති අකුරුවලින් සුදුසු අකුරු යොදා වචනවල හිස්තැන් පුරවා ලියන්න.

| | | |
|---|---|---|
| ì | ම ..... නා | (යි, ඉ) |
| ìi | ... ද ල | (යි, ඉ) |
| ìii | ර .... ම | (වු, උ) |
| ìv | කැ ... ම | (වු, උ) |
| v | ... දැල්ල | (වු, උ) |
| vì | ග ... ම | (වු, උ) |

- නිවැරදි ව අවශ්‍ය පිල්ලම් යොදා වචන ලිවීම සඳහා විශේෂ අවධානයක් යොමු කිරීම අවශ්‍ය වේ. මේ සඳහා කියවීමේ ක්ෂේත්‍රයේ දී පිල්ලම් හඳුන්වා දීමට යොදා ගත් ප්‍රහේළිකා ක්‍රමය ද උදවු කර ගන්න.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

4.1.3 රූල් අතර ලියයි.
4.1.4 වචනයක අකුරු ළං ව ලියයි.
4.1.5 වැකියක වචන අතර පරතරයක් සහිත ව ලියයි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය
ක්‍රියාකාරකම්

- දෙවන ශ්‍රේණිය සිංහල වැඩ පොතෙහි රූල් අතර ලිවීම සඳහා වන අභ්‍යාසවල සිසුන් යෙදවීම. මෙබඳු බොහෝ අභ්‍යාස සකස් කර දී අභ්‍යාස පොත්වල ලිවීමට යොමු කරන්න.
- තනි තනි ව හෝ කණ්ඩායම් වශයෙන් හෝ සකස් කළ /සොයා ගත් යම් යම් දේ වැකි ලෙසින් ලේබල් කිරීමට යොමු කරන්න.

  උදා :- මල් පෝච්චිය
  කිරිවානා ගල් කැට
  මදටිය ඇට
- ආගමික වදන්, ආදර්ශ වාක්‍ය සිසුනට පෙනෙන සේ ඉහත සුවිශේෂ ව දැක්වෙන සේ සිසුන් බලා සිටිය දී කළුලෑල්ලේ ලිවීම. ඉන් පසුව එම ආදර්ශයට අනුව අදාළ වාක්‍ය අභ්‍යාස පොත්වල ලිවීමට යොමු කරන්න.
- සිංහල 2 පෙළ පොතෙහි තෝරා ගත් කොටස් බලාගෙන ලිවීමේ අභ්‍යාසවල යොදවන්න.

නිපුණතාව

4.2 අර්ථය නිවැරදි ව දැක්වෙන පරිදි ලියයි.
 4.2.1 නිවැරදි අකුරු යොදා අර්ථවත් වචන ලියයි.
 4.2.2 නිවැරදි වචන යොදා අර්ථවත් වැකි ලියයි.

4.2.1 නිවැරදි අකුරු යොදා අර්ථවත් වචන ලියයි.
ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය
ක්‍රියාකාරකම්

- රූපයට අදාළ වචනයේ අඩු අකුර ලිවීම. කල් ඇති ව සකස් කර සිසුනට ඉදිරිපත් කිරීමෙන් හෝ කළුලෑල්ලේ ලියා හෝ මේවා ඉදිරිපත් කළ හැකි ය.

  රූපයට අදාළ වචන ලිවීම.

  වචන ප්‍රහේලිකාවක හිස් තැනට අදාළ අකුර ලිවීම.

  අඳින ලද රූපයට නම් ලිවීම.

  සිසු කණ්ඩායම්වලට අකුරු කට්ටල දී (පිල්ලම් සහිත අකුරු ද මේ සමග තිබිය හැකි ය) අර්ථවත් වචන හැකි තාක් සෑදීම. ඒවා අභ්‍යාස පොත්වල ලිවීම.

  මල්, පලතුරු, සතුන්, එළවළු, ප්‍රදේශයේ ගම් වැනි මේවායින් නම් පහක් පමණ සෑදිය හැකි අකුරු කට්ටල සිසු කණ්ඩායම්වලට ලබා දීම. එම අකුරුවලින් අදාළ වචන සාදා අභ්‍යාස පොත්වල ලිවීම. පලතුරු, සතුන්, එළවළු ආදිය සඳහා අදාළ රූප ද ඇඳ නම් ලිවීමට ද යොමු කිරීම සුදුසු ය.

- දෙන ලද වචනයකට තවත් අකුරක් එක් කර අර්ථවත් වචන ලිවීමේ අභ්‍යාසවල යෙදීමට යොමු කරන්න.

  උදා :-

  රාබු ⟶ කරාබු
  මල් ⟶ විමල්, කමල්, නිමල්, අමල්
  රාල ⟶ පරාල
  වතු ⟶ ගෙවතු

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

- වචන කිහිපයක් තෝරා ගන්න.
පත්‍රිකාවේ හැඩය අනුව ගළපා වචන සෑදීමට සිසුන්ට ඉඩ දෙන්න.
සෑදූ වචන ශබ්ද නගා කියවා ලිවීමට යොමු කරන්න.
මෙය ක්‍රීඩාවක් ලෙස කණ්ඩායම් අතර ක්‍රියාත්මක කළ හැකි ය
උදා :-

| | | |
|---|---|---|
| අර | ලිය | අර\|ලිය |
| රට | කජු | රට\|කජු |
| කතර | ගම | කතර\|ගම |

- මෙය සෙල්ලමක් හා විනෝදජනක වැඩක් ලෙස කළ හැකි ය.
නිදසුන :-
නම් විස්සක් සෑදිය හැකි වන ලෙසට පත්‍රිකා සකස් කර ගන්න. සිසුන් කණ්ඩායම් කිහිපයකට බෙදන්න. මිශ්‍ර කර ඇති වචන කාඩ්පත් අතරෙන් එක බැගින් තෝරා ගැනීමට සිසුන් යොමු කරන්න. කාඩ්පත් එක් කර සෑදිය හැකි වැඩිම වචන සංඛ්‍යාව සෑදීමට යොමු කරන්න. සෑදූ වචන ලිවීමට අවස්ථාව දෙන්න. වැඩිම වචන සංඛ්‍යාවක් සාදා ලියා ඇති කණ්ඩායමට ජය ලැබේ. මෙම ක්‍රියාකාරකම් නැවත නැවත කළ හැකි ය.
- එකම පිල්ලම් යෙදූ විවිධ අකුරුවලින් පටන් ගන්නා වචන තැනීම ද ඉහත කණ්ඩායම් ක්‍රීඩාව ස්වරූපයෙන් ක්‍රියාත්මක කළ හැකි ය.
උදා :- කොම්බුව මුලට යෙදුණු වචන
ගෙදර, කෙක්ක, නෙල්ලි, බෙල්ල, රෙද්ද
- එක අකුරට විවිධ පිල්ලම් යෙදා එම අකුර මුලට යෙදූ වචන සෑදීම ද ඉහත ආකාරයට කළ හැකි ය.
උදා :- කට, කාසිය, කිරි, කීර, කුඩය, කූඩය, කැටය, කෑරලා, කෙල්ල, කේතලය, කොස්, කෝවිල කියවීම ක්ෂේත්‍රයේ අදාළ අභ්‍යාස ද මේ සඳහා යොදා ගත හැකි ය.
- සිංහල 2 පෙළ පොතෙහි හාවාගේ වග කවි පෙළ ඇසුරෙන් හ, ක යන අකුරුවල විවිධ ස්වරූප දැකීමට හා ලිවීමට අවස්ථාව ඇති කිරීම.

4.2.2 නිවැරදි වචන යොදා අර්ථවත් වැකි ලියයි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය
ක්‍රියාකාරකම්
- අර්ථවත් වැකි ලිවීමේ විනෝදජනක වැඩ සංවිධානය කරන්න.
උදා :-
i. කොඩි පෙරහැර
පන්තියේ සිසුන් කණ්ඩායම්වලට වෙන් කරන්න. වචනයක් ලිවිය හැකි සේ සකස් කළ කොඩි කීපය බැගින් සිසුන්ට සපයන්න. නැති නම් සකස් කරවන්න.
ගුරුවරයා ලියා දැක්වූ වගන්තියට අයත් වචනය බැගින් තම කොඩියේ ලියන ලෙස සිසුන්ට උපදෙස් දෙන්න.
කණ්ඩායම් වශයෙන් වගන්තිය ලියා ඉදිරිපත් වීමට යොමු කරවන්න.
ඒ අනුව සෑම කණ්ඩායමකින් ම වගන්තිය බැගින් ලියා ඉදිරිපත් කිරීම අවශ්‍ය ය.
නිදසුන් : අපි පන්සල් යමු
මෙසේ වචන සහිත කොඩි සාදා ඒවායින් වැකි සාදා පෙරහැර යවන්න.

ii වචන කෝච්චිය
සරල වැකි කීපයකට අයත් වදන් පත්‍රිකා එක බැගින් හිස් ගිනිපෙට්ටි මතු පිට අලවන්න. මේ ආකාරයේ කට්ටල කීපයක් සකස් කරන්න. එක් එක් කට්ටලය කණ්ඩායම්වලට ඉදිරිපත් කරන්න. ඒවා පේළියට ගළපා අර්ථවත් වැකි ඇති කෝච්චියක් සෑදීමට උපදෙස් දෙන්න. ඉක්මනින් වැකි ගැළපූ කණ්ඩායම ජයග්‍රහණය කරයි. ගැළපූ වැකි ලිවීමට යොමු කරන්න.



Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

iii උරවලට දමන ලද ද්‍රව්‍ය එක එකක් සඳහා උදවු සහිත වැකිය බැගින් දෙන්න. ඒ අනුව තවත් වාක්‍යයක් ගොඩ නැඟීමට සිසුන් යොමු කරන්න.

උදා :- ද්‍රව්‍ය - පැන්සල

පැන්සල රතු පාටයි

මෙම ක්‍රියාකාරකම නැවත කිරීමෙන් විවිධ ද්‍රව්‍ය පිළිබඳ ව වාක්‍ය සිසුන් අතින් ගොඩ නැංවේ.

iv ගුරු අත්පොතෙහි කියවීම ක්ෂේත්‍රයේ 3.3.2 සුවිශේෂ අභිමතාර්ථය යටතේ එන ක්‍රියාකාරකම් බලන්න. එහි ගොඩ නැගෙන වැකි ලිවීමට යොමු කරන්න. මෙහි දී නැවතීම ලකුණ යෙදීම හුරු කිරීම කෙරෙහි ද අවධානය යොමු කරන්න.

v දී ඇති වගන්ති කියවා සිසුන්ට කැමති පරිදි වගන්ති සම්පූර්ණ කර ලිවීමට යොමු කරන්න.

| | | |
|---|---|---|
| උදා :- | වැස්ස වහිනවා | ඉර බැස .................... |
| | වතුර ගලනවා | හඳ නැග .................... |
| | අගල් පිරෙනවා | තරු .......................... |
| | ළමයි දුවනවා | අපි ........................... |

vi දී ඇති වගන්ති අනුව ඒ සමග ඇති වචනයට සුදුසු වචන යොදා අර්ථවත් වැකි ලිවීම.

| | | | |
|---|---|---|---|
| උදා :- | 1. | හකුරු පැණි රසයි | දෙහි ..................... |
| | 2. | අහස උඩයි | පොළොව ............. |
| | 3. | අව්වට වේලෙනවා | වැස්සට ............... |
| | 4. | නයා බඩ ගානවා | කුරුල්ලා ............ |

vii ගුරුවරයා හෝ සිසුවකු කළ දෑ බලා සිට එකින් එක ලිවීම.

උදා :- පුටුවෙන් නැගිට්ටා

අකුරු ලිව්වා

කතා කළා

සිනාසුණා

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

නිපුණතාව

4.3 සන්නිවේදනය සඳහා ලියයි.

- 4.3.1 පණිවිඩ ලියයි.
- 4.3.2 තමන්ගේ හා යහළුවන්ගේ නිවසට යන ගමන් මග ඇඳ නම් කරයි.
- 4.3.3 එදිනෙදා සිදුවීම් ලියයි.
- 4.3.4 තමා පිළිබඳ ව ලියයි.

4.3.1 පණිවිඩ ලියයි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය

ක්‍රියාකාරකම්

- පණිවිඩ ලිවීමේ විශේෂ අවස්ථා වසර තුළ විටින් විට ඇති කරන්න.

උදා :-

i පන්තියේ සිසුන් ප්‍රමාණය අනුව එක් අයකුට එක ලියන කඩදාසියක් බැගින් සපයන්න. තමන් කැමති පණිවිඩයක් පින්තූරයක් ඇඳ එහි ලියන ලෙස සිසුන්ට කියන්න. මේ සඳහා ප්‍රමාණවත් කාලයක් සපයන්න. සියලු දෙනා ම තමන්ට රුචි පරිදි එම පණිවිඩ ලිවීම අවසන් කළ පසු පන්තියේ සිසුන් දෙදෙනා බැගින් කාණ්ඩ කරන්න. ලියූ පණිවිඩය තම යහළුවාට කියන්නට ඉඩ දෙන්න. පන්තියේ රවුම් දෙකකට සිටුවා වට දෙකේ ළමයි පණිවිඩ එකිනෙක මාරු වෙමින් කීමට ද අවස්ථාව සැලසිය හැකි ය.

ii ගෙදරට යවන පණිවිඩ ලිවීමට යොමු කරන්න. ලිවීමෙන් පසු ව නිවැරදි ව ලියා ඇත්දැයි බලන්න.

4.3.2 තමන්ගේ හා යහළුවන්ගේ නිවසට යන ගමන් මග ඇඳ නම් කරයි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය

ක්‍රියාකාරකම්

- පන්තියේ සිසුන්ට වෙන වෙන ම කඩදාසි සපයන්න.
- තම ගෙදරට යන ගමන් මග ඇඳීමට හා එක් එක් තැන් නම් කිරීමට යොමු කරන්න. මේ සඳහා ගුරුවරයාගේ මග පෙන්වීම අවශ්‍ය වේ.
- මේ සඳහා පාට කූරු, පාට පැන්සල්, යනාදිය ද යොදා ගත හැකි ය.
- ගමන් මග අඳින ලද පත්‍රිකා පන්තියේ අලවා හෝ කිසියම් ආකාරයකට ප්‍රදර්ශනය කරවන්න.
- එක් එක් ශිෂ්‍යයාට ගමන් මග විස්තර කිරීමට අවස්ථාව සපයන්න.

4.3.3 එදිනෙදා සිදුවීම් ලියයි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය

ක්‍රියාකාරකම්

- මේ සඳහා සකස් කර ගත් පොතක් යොදා ගැනීමට සිසුන් යොමු කරවන්න.
- පාට කඩදාසිවලින් වෙනස් හැඩයේ පොතක් වුවහොත් එය සිසුන්ගේ මනාපයට හේතු වනු ඇත.
- එක් එක් දිනය සටහන් කර යම් සිදුවීමක් ලිවීමට සිසුන් යොමු කරවන්න.
- නිදහසේ අදහස් ප්‍රකාශ වන පරිදි යමක් ලිවීමට මෙම ක්‍රියාකාරකම යොදා ගත හැකි ය.
- සිසුන් ලියූ දේ කියවා බැලීමට ඔවුන් උනන්දු කරවන්න. ලියූ දේවල් විටින් විට අගය කරන්න.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

4.3.4 තමා පිළිබඳ ව ලියයි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය

ක්‍රියාකාරකම්

- තමා පිළිබඳ ව යමක් දිනපතා ලිවීමට සිසුන් යොමු කරවන්න. මේ සඳහා ද සිදුවීම් ලියන ආකාරයේ පොතක් යොදා ගත හැකි ය.

  උදා :- තමන් කළ හොඳ දෙයක් ලිවීමට අවස්ථාව සැලසීම.

නිපුණතාව

4.4 නිර්මාණාත්මක ව ලිවීමට පෙළඹෙයි.

- 4.4.1 පින්තූරයක් බලා තම අදහස් ලියයි.
- 4.4.2 දෙන ලද වැකියක් අනුව දෙවන වැකිය ගොඩ නගා ලියයි.
- 4.4.3 යම් වචනයක් හෝ ද්‍රව්‍යක් පිළිබඳ ව වැකි ලියයි.

4.4.1 පින්තූරයක් බලා තම අදහස් ලියයි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය

ක්‍රියාකාරකම්

- පැහැදිලි රූප ඇතුළත් ප්‍රකාශන චිත්‍රයක් තෝරා ගන්න. තම පින්තූරය පන්තියට ප්‍රදර්ශනය කර ඒ ගැන සාකච්ඡා කරන්න. මෙහි දී සිසුන්ට අදහස් ඉදිරිපත් කිරීමට ඉඩ දෙන්න. ඒවා ලෑල්ලේ ලියන්න. ඉන්පසු ඒ ගැන වැකි ලිවීමට යොමු කරන්න.

4.4.2 දෙන ලද වැකියක් අනුව දෙවන වැකිය ගොඩ නගා ලියයි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය

ක්‍රියාකාරකම්

- සිද්ධියක ඇරඹුමක් ලෙස ඉදිරිපත් කළ හැකි වැකියක් ලෑල්ලේ ලියන්න. ඉන්පසු සිදුවිය හැකි දේවල් සාකච්ඡා කරන්න. ඒ අනුව වැකි, වාචිකව ඉදිරිපත් කිරීමට සිසුන් යොමු කරන්න. ඉන්පසු ඒවා ලිවීමට අවස්ථාව දෙන්න.

  උදා :- අහස කළු වළාකුළුවලින් පිරුණා

  ............................................

4.4.3 යම් වචනයක් හෝ ද්‍රව්‍යයක් පිළිබඳ ව වැකි ලියයි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය

ක්‍රියාකාරකම්

උදා :- පොත, පැන්සල, බෝතලය, මල් පෝච්චිය වැනි ද්‍රව්‍යවල නම් ඉදිරිපත් කර, ඒ පිළිබඳ වැකි ලිවීමට යොමු කරන්න.

වැස්ස, ගංවතුර, අහස, මුහුද වැනි වචන ඉදිරිපත් කර ඒ ගැන ලිවීමට යොමු කරන්න.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

## 1 හැඳින්වීම

පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් නමින් හැඳින්වෙන මෙම ඉගෙනුම් ක්ෂේත්‍රය මිනිසා සහ මිනිස් ප්‍රජාව කෙරෙහි විවිධ අයුරින් බලපෑම් කළා වූ හෝ කරන්නා වූ හෝ භෞතික, සමාජයීය සහ ජෛව පද්ධතීන් පිළිබඳ ව හා ඒවා පදනම් කරගෙන සිදු විය යුතු ඉගෙනුම් ක්‍රියාවලියකට යොමු කරන්නකි.

ළදරු වියේ සිට ම ස්වභාවයෙන් ම මිනිසා සිය වටාපිටාව කෙරෙහි කුතුහලයකින් පසු වන අතර ක්‍රම ක්‍රමයෙන් එම වටාපිටාව සමග සාර්ථක ව අන්තර්ක්‍රියා කිරීමට අවශ්‍ය නිපුණතා ළඟා කර ගැනීමට උත්සාහ දරයි. මෙම ක්‍රියාවලියේදී සිය සංවේදී ඉන්ද්‍රියයන් ප්‍රයෝජනයට ගන්නා අතර ම ඒවායේ සංවේදී බවත්, වර්ගීකරණය හා තර්කනය වැනි බුද්ධිමය හැකියාවනුත් වර්ධනය කර ගනියි. එසේ ම ඒ ඔස්සේ සිය වාග්මාලාව සහ සන්නිවේදන කුසලතා ද වර්ධනය කර ගනියි. තමා ජීවත් වන වටාපිටාව පිළිබඳ ව තොරතුරු සොයා බැලීම, රැස් කිරීම හා නැවත ප්‍රකාශ කිරීම දරුවාගේ ජීවිත ක්‍රියාවලියේ ම අංගයකි. මෙය නිරායාසයෙන් ම ඕනෑ ම ජීවියකු තුළ සිදු වන්නකි. දරුවාගේ එම නැඹුරුව පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් ගොඩ නැගීමේ පදනම විය.

එදිනෙදා ජීවිතයේ දී හමු වන අභියෝගවලට සාර්ථක ව මුහුණ දිය හැකි හා රටේ සංවර්ධන ක්‍රියාවලියට දායක විය හැකි සමබර පෞරුෂයකින් හෙබි පුද්ගලයකුට විවිධ නිපුණතා වර්ධනය වීම අවශ්‍ය ය. පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් මෙම කාර්යයට බෙහෙවින් දායක වේ. මීට පෙර ක්‍රියාත්මක වූ ප්‍රාථමික අධ්‍යාපන විෂයමාලාවන් හි සෞන්දර්ය අධ්‍යාපනය, නිර්මාණාත්මක ක්‍රියාකාරකම්, ශාරීරික අධ්‍යාපනය හා ආරම්භක විද්‍යාව වැනි විෂයයන් එම කාර්යයට දායක විය. නව විෂයමාලාවේ පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් නම් වූ පුළුල් විෂය ක්ෂේත්‍රය යටතේ එම විවිධ ක්ෂේත්‍රවලට අයත් නිපුණතා අවස්ථානුකූල ව මතු කර ගැනීමට ඉඩ සලසා ඇත. එබැවින් මෙය සමෝධානික විෂයයකි.

පළමුවන ප්‍රධාන අවධිය සඳහා තේමා 16ක් මත විෂය නිර්දේශය ගොඩ නගා ඇත. පළමුවන ශ්‍රේණියේ දී ඉදිරිපත් කළ වත්තට එන සත්තු යන තේමාව හැර අනෙක් තේමා සියල්ල ඒ නමින් ම දෙවන ශ්‍රේණිය සඳහා ඉදිරිපත් කෙරේ. පළමුවන ශ්‍රේණියට වඩා පුළුල් පරාසයක් ආවරණය කිරීමට හැකි වන පරිදි එම තේමාව අප අවට සිටින සතුන් ලෙස වෙනස් කොට ඇත. සෞන්දර්ය, නිර්මාණ හා ශාරීරික අධ්‍යාපන ක්ෂේත්‍රවලට අදාළ නිපුණතා මතු කර ගැනීම මෙන් ම ආගම, මව්බස හා ගණිතය යන ප්‍රධාන විෂයයන් පෝෂණය සඳහා ද පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් යොදා ගත හැකි ය. දෙවන ශ්‍රේණියේ සිසුන්ගේ කතාබහට ගැළපෙන සරල ඉංග්‍රීසි වදන් මෙම ක්‍රියාකාරකම් මගින් මතු කර ගත හැකි ය.

විෂය නිර්දේශයේ ඇතුළත් සියලු කොටස් ඒ ආකාරයෙන් ම ශ්‍රී ලංකාවේ සෑම පාසලක ම කළ යුතු යැ යි අදහස් නො කෙරේ. මෙම අවධියේ දී දරුවන්ගේ පරිසරය සීමිත ය. එම සීමා ව තුළ ඇති දේ සහ සිදු වන දේ සියල්ල සෑම පාසලකට ම පොදු නොවේ. එහෙයින් සිසුන් සඳහා ක්‍රියාකාරකම් තෝරා ගැනීමේ දී සිය පාරිසරික සම්පත්වලට සරිලන සේ ඒවා තෝරා ගැනීමේ නිදහස හා වගකීම ගුරුවරයා සතු ය.

## 2. ප්‍රාථමික අධ්‍යාපන අවධිය සඳහා නිපුණතා

පළමුවන ශ්‍රේණිය සිට පස්වන ශ්‍රේණිය තෙක් මෙම ඉගෙනුම් ක්ෂේත්‍රය පරිශීලනය කිරීමෙන් සිසුන් තුළ පහත දැක්වෙන නිපුණතා සංවර්ධනය සඳහා අවස්ථා සම්පාදනය කිරීමට අපේක්ෂා කෙරේ.

- සිය වටාපිටාවේ චමත්කාරය හඳුනා ගෙන ඒ තුළින් වින්දනයක් ලබයි.
- ක්‍රීඩාව, විවේකය, විනෝදය සිය ජීවිතයට අවශ්‍ය අංග ලෙස සලකා උචිත අයුරින් ඒවා සිය දින චර්යාවට මුසු කර ක්‍රියා කරයි.
- සෞන්දර්යාත්මක දේ අගය කරමින් ඒවා සිය ප්‍රකාශන කාර්යයන්හි දී භාවිත කරයි.
- නිරෝගිමත් දිවි පැවැත්මකට අවශ්‍ය මූලික හුරුකම් ප්‍රදර්ශනය කරයි.

- මිනිස් නිර්මාණ අගය කරයි.
- සිය වටාපිටාවේ සිටින ජීවීන් හා ඔවුන්ගේ ක්‍රියාකාරකම් පිළිබඳ ව අවබෝධයෙන් යුතු ව කටයුතු කරයි.
- මිනිස් සමාජය, මිනිස් හැසිරීම් හා මිනිසා කෙරෙහි ඒවායේ බලපෑම පිළිබඳ ව අවබෝධයෙන් යුතු ව කටයුතු කරයි.
- පෘථිවිය, එහි සම්පත් හා අවකාශය මිනිසා කෙරෙහි බලපාන අයුරු ගවේෂණය කරයි.
- පාරිසරික සංරක්ෂණ ක්‍රියාවලියේ සිය වගකීම අවබෝධ කර ගෙන ඒ අනුව කටයුතු කරයි.
- සිය වටාපිටාවේ ශක්තිය සහ බලය යෙදීම ප්‍රජාවේ ඉදිරි ගමනට බලපාන අයුරු විමර්ශනාත්මක ව අගය කරයි.
- අනාගත වැඩ ලෝකයට අවශ්‍ය හුරුව ලබා ගනිමින් තම පරිහරණයේ ඇති භාණ්ඩ හා උපකරණ අවශ්‍ය පරිදි හසුරුවයි.

3. පළමුවන ප්‍රධාන අවධියේ පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂයයට අදාළ ඉගෙනුම් නිපුණතා

- පාසල් පරිසරයට අනුගතව කටයුතු කරයි.
- නිවසේ දී සතුටින් හා ඵලදායි ලෙස පුද්ගලයන් අතර අන්තර් සම්බන්ධතාවල නියැලෙයි.
- තොරතුරු රැස් කිරීම සඳහා නිරීක්ෂණ කරයි.
- අත්දැකීම් තුළින් සරල ක්‍රියාකාරකම්වල නියැලෙයි.
- සිරිත් විරිත්වලට අනුකූල ව ක්‍රියාකරයි.
- පාසල හා සම්බන්ධ අතීත තොරතුරු විමසා බලයි.
- සෞඛ්‍යවත් දිවිපෙවතක් සඳහා යහපත් පුරුදු අනුගමනය කරයි.
- සුහද කතා බහ ඔස්සේ නිවැරදි ව තොරතුරු හුවමාරු කර ගනියි.
- අවට පරිසරයේ සිදුවන වෙනස්කම් පිළිබඳ සංවේදී ව කටයුතු කරයි.
- තමා හා තම අවට පරිසරය පිරිසිදු ව ක්‍රමවත් ව පවත්වා ගැනීමට දායක වෙයි.
- අන් අයට ප්‍රියජනක අන්දමින් තම ගති පැවතුම් පවත්වා ගනියි.
- මූලික ඉරියව් නිවැරදි ව පවත්වා ගනියි.
- එදිනෙදා කටයුතුවල දී සිය ආරක්ෂාව පිළිබඳ ව සැලකිලිමත් ව කටයුතු කරයි.
- අවකාශය උචිත ලෙස භාවිත කරමින් ක්‍රීඩා හා ක්‍රියාකාරකම්වල නිරත වෙයි.
- අරමුණු ගත කාර්යයන් සඳහා සාමූහික ව වගකීමෙන් වැඩ කරයි.
- පරිසර විවිධත්වය කෙරෙහි සංවේදී ව ක්‍රියා කරයි.
- අවශ්‍ය අවස්ථාවල දී අන් අයට උදව් කිරීමට ඉදිරිපත් වෙයි.
- රූප සංකේත හා ලිඛිත පුවරු මගින් දැක්වෙන තොරතුරු ලබා ගනියි.
- තම අත්දැකීම් චිත්‍ර හා ඇඹීම් මගින් ප්‍රකාශ කරයි.
- පරිසරයේ ශබ්ද, නාද, චලන සහ චරිත නිරූපණය කරයි.
- අභිනය දක්වමින් රංගනයේ හා ගායනයේ නිරත වෙයි.
- විවිධ කටයුතුවල දී සමායෝජනයෙන් යුතු ව චලන දක්වයි.
- විවිධ ද්‍රව්‍ය භාවිතයෙන් විවිධ දේ නිර්මාණය කරයි.
- ලබාගත් අත්දැකීම් හා රැස් කරන ලද තොරතුරු තනි ව හෝ සාමූහික ව හෝ පිරිසකට ඉදිරිපත් කරයි.
- නිවසේ දී හා පාසලේ දී සිය යුතුකම් හා වගකීම් පිළිබඳ ව සංවේදී ව කටයුතු කරයි.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

4. පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂය නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා යෝමුවක්

* මෙම විෂය නිර්දේශයේ දී දරුවාගේ වටාපිටාව තේමා 16ක් ඔස්සේ විකාශ කර ඇත.
* සියලු දැ තෘප්තිමත් අත්දැකීම් වශයෙන් ලබා ගැනීමට සිසුනට ඉඩ සැපයිය යුතු මෙන් ම ඒ සඳහා ප්‍රමණවත් සැලැස්මක් හා සූදානමක් අවශ්‍ය වනු ඇත.
* මෙහි ඇති අදහස්වලට අනුකූල ව ඉගෙනුම්-ඉගැන්වීමේ ක්‍රම යොදා පාඩම් සැලසුම් කර ගත යුතු ය. තොරතුරු වාර්තා කිරීම, තොරතුරු සොයා ගැනීම තරම් ම වැදගත් ය. මුල් අවධියේ දී වාචික ව හා කටු සටහන් මඟින් සිය අත්දැකීම් ප්‍රකාශ කිරීමට සිසුන් පොළඹවන්න. ක්‍රමයෙන් වචන ද වාක්‍ය ද තරමක් සවිස්තරාත්මක රූප සටහන් ද යොදා ගැනීමට සිසුන් යොමු කරන්න.
* සිසුන්ගේ වැඩ මෙන් ම උත්සාහය ද අගය කළ යුතු ය.
* හැකි සෑම මොහොතක ම සිසුන් කණ්ඩායම් වශයෙන් වැඩෙහි යොදවන්න. එහෙත් මුල් අවස්ථාවල දී කණ්ඩායමක සාමාජිකයකු වශයෙන් වැඩ කළ යුතු ආකාරය පිළිබඳ ව සිසුන්ට පුහුණු කළ යුතු ය.
* යම් තේමාවකට සම්බන්ධ ව ඉගෙනුම්-ඉගැන්වීම් කටයුතු කර ගෙන යන අතර ක්‍රම ක්‍රමයෙන් එක් රැස් වන තොරතුරු හා ද්‍රව්‍ය තේමාවක් අවසානයේ පැවැත්වෙන ප්‍රදර්ශනයක් හෝ සම්මන්ත්‍රණයකින් හෝ කෙළවර කරන්න.
* තේමා ඉදිරිපත් කර ඇත්තේ නිශ්චිත අනුපිළිවෙළකට නොවේ. අවස්ථාවට උචිත ලෙස තේමාවන් තෝරා ගැනීමට ගුරුවරයාට නිදහසක් ඇත.
* සැමවිට ම සිසුන්ගේ ආරක්ෂාව පිළිබඳ ව සැලකිලිමත් වීම වැදගත් ය.

5. ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය

පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් ඉගැන්වීමට වඩා, ඉගෙනුමට මුල් තැනක් දෙන ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියකි. කණ්ඩායම් හා තනි තනි ව ද වරෙක මුළු පන්තිය ම ද ඉගෙනුම් කාර්යවල යෙදවිය හැකි ය.

ගුරුවරයා මේ සඳහා කල් ඇති ව සැලසුම් කර ගත යුතු ය. එක ම මොහොතක විවිධ කණ්ඩායම් එකිනෙකට වෙනස් වැඩවලට යෑමට හැකි ය. ඒ මඟින් පුළුල් ක්ෂේත්‍රයක් ආවරණය කර ගැනීමට හැකි ය.

සිසුන් සඳහා සැලසුම් කරන වැඩ අතර නිරීක්ෂණ, ක්ෂේත්‍ර චාරිකා, අත්හදා බැලීම්, කෙටි ව්‍යාපෘති, රැස් කිරීම්, භූමිකා රංගන, වැනි විවිධ ඉගෙනුම් ක්‍රමෝපායන් ද පුද්ගලයන්ගෙන්, පොත්පත් වැනි මුද්‍රිත මාධ්‍යවලින් ද විද්‍යුත් මාධ්‍යවලින් ද තොරතුරු රැස් කිරීම් අඩංගු විය හැකි ය.

6. පාසල් ප්‍රතිපත්ති හා වැඩසටහන්

නිර්මාණාත්මක, සෞන්දර්යාත්මක හා ශාරීරික නිපුණතා සාක්ෂාත් කර ගැනීම සඳහා වූ පුළුල් පරාසයක ඉගෙනුම්-ඉගැන්වීම් අත්දැකීම් සපුරාලීමේ අවශ්‍යතාව නව විෂය නිර්දේශයෙහි දක්නට ලැබෙන පැහැදිලි වෙනසකි. එවැනි වෙනසක් සඳහා පන්ති කාමරය පමණක් නොව සම්පූර්ණ පාසල් පරිසරය ද, එවැනි සිසුන් දෙස බලන දෘෂ්ටි කෝණය ද වෙනස් විය යුතු ය.

එබැවින් පාසල් ප්‍රතිපත්ති හා වැඩසටහන් සංවිධානය විය යුත්තේ දවස පුරා මේසය අසල පුටුවක වාඩි වී සිටීම වෙනුවට විවිධ ඉරියව්වෙන් හා සතුටෙන් නොයෙකුත් ක්‍රියාකාරකම්වල නිරත වන දරුවන් දැකිය හැකි වන පරිදි ය.

මේ සඳහා සැලසුම් කරනු ලබන පන්තියක තිබිය යුතු ලක්ෂණ

* පාසල් කාලය තුළ දී මෙම සිසුන්ට ප්‍රධාන වශයෙන් සෙල්ලම් ස්වරූපයක් ගත් ක්‍රියාකාරකම්වල නිරත වීමට අවශ්‍ය පරිසරය
* එළිමහනේ ඉගෙනුම් අවස්ථා සඳහා පහසුකම්
* පාසලේ ක්‍රීඩා, සෞන්දර්යාත්මක කටයුතු හා වෙනත් විෂය සමගාමී කටයුතු කෙරෙහි ද අවධානය



Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

7. සිසු ප්‍රගතිය තක්සේරු කිරීම

පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂයය හා සම්බන්ධ තක්සේරු කිරීමේ දී එම ඉගෙනුම් කාර්යය තුළින් සිසුනට ලබා දීමට බලාපොරොත්තු වන දැනුම, කුසලතා හා ආකල්ප සහ පුරුදු සැලකිල්ලට ගත යුතු ය. එසේ ම සමාජයීය දක්ෂතා කෙරෙහි ද විශේෂ අවධානයක් යොමු කළ යුතු ය.

ඒ ඒ සිසුන් කණ්ඩායම් හෝ තනි තනි සිසුන් තුළ ඇති ඌනතා, මතු ඉගෙනුම් කටයුතුවල දී මගහරවා ගැනීමේ අරමුණෙන් මෙම තක්සේරු කිරීම් කළ යුතු ය.

මෙහි දී බොහෝ විට විධිමත් ඇගයීම් ක්‍රමවලට පරිබාහිර ක්‍රම අනුගමනය කිරීමට සිදු වේ. සිසුන් වැඩෙහි යෙදී සිටින අවස්ථාවල ඔවුන් නිරීක්ෂණයෙන්, සවන් දීමෙන් සහ ඔවුන් සමග සාකච්ඡා කිරීමෙන් මෙම අවස්ථා මතු කර ගත හැකි වනු ඇත. ඒවා ක්‍රමවත් ව වාර්තා කර ගැනීමට ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයෙහි අවසානයේ ඇතුළත් තක්සේරු වාර්තා සටහන් භාවිත කළ හැකි ය.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

තේමාව :- 1.0 අපයි පාසලයි

නිපුණතා :-
- පාසල තුළ කටයුතු කරන විවිධ පුද්ගලයන්ගේ භූමිකා හඳුනාගෙන නිසි අයුරින් ප්‍රතිචාර දක්වයි.
- අන් අය සුහද ව පිළිගෙන අවස්ථානුකූල ව කටයුතු කරයි.
- ආචාරශීලී ව හැසිරීම් ප්‍රදර්ශනය කරයි.
- එකමුතු බව සාර්ථකත්වයට හේතු වන බව පිළිගනිමින් ඒ අනුව ක්‍රියා කරයි.
- පාසල් වත්තේ සහ ඒ අවට ඇති සුවිශේෂී මෙන් ම වැදගත් ශාක, ස්ථාන හා ලක්ෂණ හඳුනාගෙන ඒවා සුරක්ෂිතව පවත්වා ගැනීමට දායක වෙයි.
- ගමෙන් පාසලට හා පාසලෙන් ගමට ඉටුවන සේවා හඳුනාගෙන තමාට හැකි මට්ටමෙන් එම සේවාවන්ට දායක වෙයි.
- පාසල තමාට සුරක්ෂිත ස්ථානයක් මෙන් ම ප්‍රියජනක හා ප්‍රයෝජනවත් ස්ථානයක් ලෙස හඳුනාගෙන කටයුතු කරයි.
- ක්‍රීඩා පිටිය ඉතා ප්‍රයෝජනවත් ස්ථානයක් ලෙස පිළිගෙන එය හොඳින් පවත්වා ගැනීමට දායක වෙයි.

අන්තර්ගතය :-
- ප්‍රාථමික ශ්‍රේණිවල උගන්වන ගුරුවරුන් පිළිබඳ තොරතුරු
- පාසලට සුවිශේෂ වූ ශාක/ස්ථාන/ලක්ෂණ පිළිබඳ ව තොරතුරු
- පාසල අවට පිහිටි සුවිශේෂ ස්ථාන සහ ස්වාභාවික දේ
- ප්‍රජාවෙන් පාසලටත් පාසලින් ප්‍රජාවටත් කෙරෙන සේවාවන්
- විවිධ මාධ්‍ය භාවිත කරමින් අවට පරිසරයේ තමන් සිත්ගත් ස්ථාන දැක්වෙන නිර්මාණ
- ප්‍රජාව තුළින් හඳුනා ගන්නා සුවිශේෂ චරිත අනුකරණය
- පාසල් ගීය ගායනය
- "අපේ පාසල" සිත්ගත් නිර්මාණ ප්‍රදර්ශන

ක්‍රමවේදය හා ක්‍රියාකාරකම් :-
- උදෑසන රැස්වීමක දී විදුහල්පති හා ප්‍රාථමික ශ්‍රේණිවල ගුරුවරුන් හඳුනා ගැනීම සඳහා වැඩ සටහනක් සැලසුම් කිරීම. ප්‍රාථමික ශ්‍රේණිවල ගුරුවරුන් සිටින ස්ථාන නිරීක්ෂණය හා විවිධ අයුරින් වාර්තා කිරීම.
- පාසල් වත්ත නිරීක්ෂණයට යොමු කරමින් ශාක, පාසලට සුවිශේෂ ස්ථාන පිළිබඳ තොරතුරු රැස් කිරීම. තොරතුරු විවිධ ක්‍රමවලින් වාර්තා කිරීම (වාචික, චිත්‍ර, ආකෘති, ශාක කොටස් ඇසුරින් මෝස්තර නිර්මාණ, ගායන හා රංගන)
- ප්‍රජාවෙන් පාසලටත්, පාසලෙන් ප්‍රජාවටත් කෙරෙන විවිධ සේවා පිළිබඳ සාකච්ඡා කිරීම හා එවැනි අවස්ථාවලට සහභාගි වීමට ඉඩ සැලැස්වීම. එවැනි වැඩ සටහන් පිළිබඳ ව දැනුවත් කිරීම පෙරහැරවල් සංවිධානය කිරීම. (උදා : ඩෙංගු මර්ධනය, රුක්රෝපණය, පෝෂණ වැඩ සටහන්, පෙරහැරවල් සංවිධානය කිරීම.)
- පාසල් කොඩිය ඔසවා පාසල් ගීය සාමූහික ව ගායනා කිරීම.
- තේමාව අවසානයේ පන්ති මට්ටමින් ප්‍රදර්ශන පැවැත්වීම.
- සෙල්ලම් මිදුල හා ක්‍රීඩා පිටිය තුළ දී විවිධ කණ්ඩායම් ක්‍රීඩා සඳහා සහභාගි වීම.

තේමාව :- 2.0 අපේ ගෙදර

නිපුණතා :-
- විවිධ ස්ථානවලට සාපේක්ෂ ව තම නිවසේ පිහිටීම ප්‍රකාශ කරයි.
- පවුලේ සමීපතම නෑදෑයින් හා නෑදෑ සබඳතා පිළිබඳ තොරතුරු සොයා බලා ප්‍රකාශ කරයි.
- තම නිවසට පැමිණෙන නෑදෑයින්, හිතමිතුරන්, අමුත්තන් කෙරෙහි යහපත් ආකල්පයකින් යුතු ව කටයුතු කරයි.
- නිවසේ මූලික අවශ්‍යතා හා ඒවා ලැබෙන ක්‍රම වාර්තා කරයි.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

- නිවසට අවශ්‍ය විවිධ ආහාර ද්‍රව්‍ය ගෙවත්තෙන් ලබා ගැනීමට දායක වෙයි.
- නිවසේ පරිසරය පිරිසිදු ව, අලංකාර ව හා ආරක්ෂා සහිත ව තබා ගැනීමට දායක වෙයි.
- නිවසට විවිධ ද්‍රව්‍ය සපයන අයගේ චරිත භූමිකා රංගන ඇසුරින් ඉදිරිපත් කරයි.
- නිවසේ කටයුතු පහසු කර ගැනීමට සහ අලංකාරය සඳහා යොදා ගත හැකි දේ නිර්මාණය කරයි.
- වින්දනාත්මක ව හා සාමූහික වශයෙන් ගෘහස්ත ක්‍රීඩාවල නියැලෙයි.

අන්තර්ගතය :-
- තම නිවසෙහි සාපේක්ෂ පිහිටීම වාචික ව හා රූපික ව
- සිය පවුලේ සමීපතම නෑදැයන්ගේ නෑ සබඳතා හා මූලික තොරතුරු
- තම නිවසට අවශ්‍ය මූලික දේවල් සැපයෙන ක්‍රම හා ස්ථාන
- තම නිවස හා අවට අලංකාරය සහ ආරක්ෂාව සඳහා ගෙන ඇති පියවර
- නිවසට හිරු එළිය හා වාතය ලැබෙන ආකාරය
- නිවසේ සාමාජිකයන් කරනු ලබන විවිධ කාර්යයන් අනුකරණය හා භූමිකා රංගන
- නිවස අලංකරණය කළ හැකි නිර්මාණ
- ගෘහස්ත ක්‍රීඩා

ක්‍රමවේදය හා ක්‍රියාකාරකම් :-
- තම නිවසේ පිහිටීම පිළිබඳ අන් අයට ප්‍රකාශ කිරීම සඳහා ප්‍රායෝගික ක්‍රියාකාරකම්හි (සෙල්ලම් ගෙවල්) නිරත වීම.
- නිවසේ ආකෘති තැනීම හා කණ්ඩායම් වශයෙන් ආකෘති එකතු කර ගමක් නිර්මාණය කිරීම
- නෑදැයන් හා නිවෙසට පැමිණෙන අය පිළිගැනීම් හා සංග්‍රහ කිරීම් පිළිබඳ දැනුවත් වීම් සඳහා භූමිකා රංගනවල යෙදීම හා පවුලේ සාමාජිකයන් දැක්වෙන චිත්‍ර නිර්මාණය කිරීම
- නිවසට අවශ්‍ය ද්‍රව්‍ය සපයන්නේ කවු ද, කොහෙන් ද යන්න සාකච්ඡා කිරීම සහ ගායන රංගන මෙන් ම විවිධ ද්‍රව්‍යවල ආකෘති නිර්මාණ වැනි ක්‍රියාකාරකම් මගින් තොරතුරු වාර්තා කිරීම
- නිවසේ අලංකාරය හා පවිත්‍රතාවය ආරක්ෂා කර ගැනීමට සහ වාතාශ්‍රය ලැබීමේ අවශ්‍යතාවය පැහැදිලි කිරීම සහ සිසු අත්දැකීම් ඇසුරින් සාකච්ඡා කිරීම
- පාසලේ මෙම ලක්ෂණ කෙතෙක් දුරට තිබේ ද යන්න පිළිබඳ නිරීක්ෂණවල නිරත වීම හා විවිධ අයුරින් වාර්තා කිරීම (දෙබස්, ගායන රංගන)
- නිවසේ දී කළ හැකි විවිධ ක්‍රීඩාවලට සහභාගි වීම

තේමාව :- 3.0 අප අවට සතුන්

නිපුණතා :-
- විවිධ ලක්ෂණ අනුව අවට පරිසරයේ සිටින සතුන් කාණ්ඩ වාර්තා කරයි.
- සතුන්ගේ පැමිණීම හා හැසිරීම ආදී ක්‍රියාවන්ට දවසේ කාලය අතර සම්බන්ධතාවක් ඇත් දැයි විමර්ශනය කර වාර්තා කරයි.
- සතුන් හා ගස්වැල් අතර ඇති අන්තර් සම්බන්ධතාවය පිළිබඳ ව විමසිලිමත් ව තොරතුරු රැස් කරයි.
- සතුන්ට ආවේණික චර්යා ඇසුරෙන් දෛනික ජීවිතයේ දී මිනිසාට ප්‍රයෝජනවත් වන චර්යා විමසා බලා අදහස් ඉදිරිපත් කරයි.
- නිර්මාණාත්මක ව සත්ත්ව චර්යා නිරූපණය කරයි.
- විවිධ ද්‍රව්‍ය භාවිත කරමින් සත්ත්ව ආකෘති නිර්මාණය කරයි.
- සතුන් හා සම්බන්ධ නිර්මාණාත්මක ක්‍රීඩාවල නියැලෙමින් වින්දනයක් ලබයි.

අන්තර්ගතය :-
- සමීප පරිසරයේ හැසිරෙන සතුන්ගේ අන්‍යෝන්‍ය සම්බන්ධතා
- සතුන් සහ වත්තේ ගස්වැල් අතර ඇති සම්බන්ධතාව
- සතුන්ගේ චර්යා හා හඬ අනුකරණය
- සත්ත්ව ආකෘති නිර්මාණය
- සතුන් හා සම්බන්ධ නිර්මාණාත්මක ක්‍රීඩා
- මිනිසා විවිධ ප්‍රයෝජන සඳහා ඇති කරන සතුන් තුළ පවත්නා හොඳ පුරුදු පිළිබඳ තොරතුරු සහ අත් දැකීම්



Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

ක්‍රමවේදය හා ක්‍රියාකාරකම් :-

- පාසල් වත්තේ/ආසන්න පරිසරයේ ගැවසෙන සතුන් නිරීක්ෂණයට යොමු කිරීම හා සතුන් කාණ්ඩ කළ හැකි ආකාර පිළිබඳ ව සාකච්ඡා කිරීම
- සතුන්ගේ හඬ හා හැසිරීම අනුකරණය කිරීම හා සතුන් පිළිබඳ ගායනා හා රංගනවල යෙදීම
- සත්ත්ව ආකෘති නිර්මාණය කිරීම
- සතුන් හා ගස්වැල් අතර සම්බන්ධතාවය හඳුනා ගැනීමට නිරීක්ෂණවල යෙදීම සහ විවිධ අයුරින් වාර්තා කිරීම
- සතුන්ගෙන් ගස්වැල්වලට සිදුවන ප්‍රයෝජන හා හානි පිළිබඳ අත්දැකීම් කතා බහ කිරීම
- සතුන්ගේ හොඳ පුරුදු ඇතුළත් කෙටි නාට්‍ය රඟ දැක්වීම, කවි ගී ගායනා, රංගන හා ක්‍රීඩාවල යෙදීම

තේමාව :- 4.0 ජලය සමඟ සෙල්ලම්

නිපුණතා :-

- ගලායන ජලයේ ක්‍රියාකාරීත්වය පිළිබඳ ව විමර්ශනය කර වාර්තා කරයි.
- ජලයෙන් ගත හැකි ප්‍රයෝජන අත්හදා බලමින් ඒ පිළිබඳ අදහස් ප්‍රකාශ කරයි.
- තම ආරක්ෂාව පිළිබඳ සැලකිලිමත් වෙමින් තැනකින් ජලය ඉවත් කිරීමේ විවිධ ක්‍රම ආදර්ශනය කරයි.
- ගලායන ජලයෙන් ක්‍රියාකරවිය හැකි විවිධ උපකරණ සාදයි.
- වින්දනය සඳහා ජලය ඇසුරින් ශබ්ද හා නාද නිර්මාණය කරයි.
- ජලය භාවිත කරමින් කළ හැකි ක්‍රීඩා කිහිපයක නියැලෙයි.

අන්තර්ගතය :-

- ගලායන ජලයෙන් සිදුවන හා සිදු කර ගත හැකි දේවල්
- බොහෝ දේවල් ඉවත් කර ගැනීමට ජලය යොදා ගන්නා බව
- ජලය ඉවත් කර ගැනීමට යෙදිය හැකි ක්‍රම උපයෝගී කර ගනිමින් ජලයෙන් සෝදා ඉවත් කළ හා කළ නොහැකි දේ.
- ජලය උපයෝගී කර ගනිමින් ශබ්ද හා නාද නිර්මාණ
- ජලය උපයෝගී කර ගනිමින් භාවිත කළ හැකි නිර්මාණ
- ජලය මගින් සිදුවන අනතුරුවලින් ආරක්ෂා වන ආකාරය
- ජලය භාවිතයෙන් කෙරෙන ක්‍රීඩා

ක්‍රමවේදය හා ක්‍රියාකාරකම් :-

- ජලය ගලා යාම සහ ගලා යන ජලයට ද්‍රව්‍ය දැමීමෙන් සිදුවන දේ නිරීක්ෂණය හා වාර්තා කිරීම.
- ජලය උපයෝගී කර ගනිමින් භාවිත කළ හැකි නිර්මාණ කිරීම.
- ගලා යන ජලයෙන් ඇති ප්‍රයෝජන පිළිබඳ ව සාකච්ඡා කිරීම.
- බොහෝ දේ ඉවත් කිරීමට ජලය යොදා ගන්නා බව පෙන්නුම් කෙරෙන ප්‍රායෝගික ක්‍රියාකාරකම් කිරීම
- තැනකින් ජලය ඉවත් කර ගැනීමට යෙදිය හැකි ක්‍රම අත්හදා බැලීම
- ජලය ඇසුරින් ශබ්ද හා නාද නිර්මාණ හා ජලය පිළිබඳ කවි ගී ගායනා හා රංගන කිරීම
- ජලය හා සම්බන්ධ නිර්මාණාත්මක ක්‍රීඩාවල යෙදීම

තේමාව :- 5.0 අවුරුදු කාලය

නිපුණතා :

- අවුරුදු සමයේ අවට පරිසරයේ සහ තමන් ජීවත් වන සමාජ පරිසරයේ සිදුවන වෙනස්කම් පිළිබඳ අත්දැකීම් බෙදා හදා ගනියි.
- අලුත් අවුරුදු චාරිත්‍ර වාරිත්‍ර ඉටු කරමින් උත්සවයක් පැවැත්වීමට දායක වෙයි.
- අවුරුදු සමයේ අවට පරිසරයේ දක්නට ලැබෙන සුන්දරත්වය අර්ථවත් වන ගායන, වාදන සහ රංගන ඉදිරිපත් කරයි.
- අන් ආගමිකයන්ගේ අවුරුදු චාරිත්‍ර වාරිත්‍රවලට ගරුත්වයෙන් යුතු ව කටයුතු කරයි.
- අවුරුදු දිනවල සිදුවිය හැකි පොදු අනතුරු හඳුනාගෙන ආරක්ෂාකාරී ව ක්‍රියා කරයි.
- අවුරුදු කාලයේ සිදුවන ජන ක්‍රීඩා කිහිපයක සාමූහික ව නියැලෙයි.
- අවුරුදු කාලවල දී පිළියෙල කෙරෙන කැවිලිවල ආකෘති නිර්මාණය හා අවුරුදු අසිරිය දැක්වෙන චිත්‍ර නිර්මාණය කර ප්‍රදර්ශනය කරයි.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

අන්තර්ගතය :-

- සිංහල හා හින්දු අලුත් අවුරුද්ද කාලයේ ප්‍රදේශයේ කාලගුණික, ආර්ථික සහ සමාජයීය වශයෙන් සිදුවන වෙනස්කම්
- සිංහල හා හින්දු අලුත් අවුරුද්දේ නැකත් සහ ඒ හා බැඳුනු සිරිත් විරිත් පිළිබඳ ව තොරතුරු
- අපේ සහ අපේ පැරැන්නන්ගේ අවුරුදු සිරිත් විරිත් හා කෙළි සෙල්ලම් අතර සමානකම් හා වෙනස්කම් පිළිබඳ ව දැන ගැනීම හා ඉන් කිහිපයක් අනුකරණය
- වෙනත් ආගමිකයන්ට අයත් අවුරුදු සිරිත් පිළිබඳ තොරතුරු
- අවුරුදු සමයේ ප්‍රදේශයේ සිදුවන යහපත්/අයහපත් සිදුවීම් පිළිබඳ තොරතුරු
- අවුරුදු සම්බන්ධ ක්‍රීඩා
- අවුරුදු කාලයට සුවිශේෂ වූ කවි, ගීත ගායනය හා රංගන (ආදේශක භාණ්ඩ භාවිත කරමින්)
- අවුරුදු කාලවල දී පිළියෙල කෙරෙන කැවිලිවල ආකෘති, චිත්‍ර, නිර්මාණ හා ප්‍රදර්ශන

ක්‍රමවේදය හා ක්‍රියාකාරකම් :-

- අවුරුදු කාලවල දී සිදුවන චාරිත්‍ර වාරිත්‍ර හා සෙල්ලම් පිළිබඳ ව අවුරුදු උත්සව ඇසුරින් අත්දැකීම් ලැබීම
- පාසලේ හෝ ප්‍රදේශයේ වැඩිහිටියකුගෙන් උත්සව චාරිත්‍ර පිළිබඳ ව දැනුවත් වීම
- අවුරුදු සමයේ දැකිය හැකි වෙනස්කම් පිළිබඳ ව සාකච්ඡා කිරීම
- අවුරුදු සමයේ කෙරෙන ක්‍රීඩාවන්හි නියැලීම
- අවුරුදු කාලයේ දී සිදුවිය හැකි අනතුරු පිළිබඳ ව දැනුවත් වීම සඳහා ආසන්න අත්දැකීම්, පුවත් පත් තොරතුරු, පින්තූර ඇසුරින් සාකච්ඡා කිරීම
- අවුරුදු කාලවල සිදු කෙරෙන විවිධ කාර්යයන් අතුරින් කැමති අවස්ථා චිත්‍රයට නැගීම සහ අවුරුදු කාලවල පිළියෙල කෙරෙන කැවිලිවල ආකෘති නිර්මාණය

තේමාව :- 6.0 අපට පෙනෙන අහස

නිපුණතා :-

- දවසේ විවිධ අවස්ථාවල දී අහසේ හා අවට පරිසරයේ සිදුවන වෙනස්කම් විමර්ශනය කර වාර්තා කරයි.
- වින්දනාත්මක ව අත්හදා බලමින් සුළභ උපයෝගී කර ගෙන ද්‍රව්‍ය අහසේ පා කරයි.
- හිරු එළිය එදිනෙදා කටයුතු සඳහා ප්‍රයෝජනවත් වන ආකාරය විමසා බලා වාර්තා කරයි.
- අධික හිරු එළිය නිසා වන පීඩාවලින් මිදීමේ ක්‍රියාමාර්ග අනුගමනය කරයි.
- අහසේ චමත්කාරය අගයමින් කවි, ගී ගායනා, රංගන හා කතන්දර ඉදිරිපත් කරයි.
- විවිධ මාධ්‍ය භාවිත කරමින් අහසේ චමත්කාරය දැක්වෙන නිර්මාණ කරයි.
- අවකාශය භාවිත කරමින් ක්‍රීඩාවල නිරත වෙයි.

අන්තර්ගතය :-

- රාත්‍රිය ළඟා වන හා නිමා වන අවස්ථාවල අහසේ සහ අවට සිදු වන දේ
- දහවල් අහසේ ලක්ෂණ, හිරු එළියෙන් ඇති ප්‍රයෝජන හා අධික හිරු එළියෙන් විය හැකි පීඩාවලින් මිදිය හැකි මාර්ග
- අහසේ යමක් පා කර යැවීමට යෙදිය යුතු උපක්‍රම
- අහසේ චමත්කාරය දනවන කවි ගී, කතන්දර
- විවිධ මාධ්‍ය භාවිත කරමින් අහසේ චමත්කාරය නිර්මාණය
- අවකාශ භාවිතය තුළින් ක්‍රීඩා

ක්‍රමවේදය හා ක්‍රියාකාරකම් :-

- රාත්‍රිය ළඟා වන විට හා නිමා වන විට අවට පරිසරයේ සිදුවන වෙනස්කම් නිරීක්ෂණය කිරීම හා වාර්තා කිරීම
- ස්වභාවික වස්තූන් පිළිබඳ කවි, ගීත ගායනා, රංගන හා කතන්දර ඉදිරිපත් කිරීම
- අහසේ චමත්කාරය නිරීක්ෂණය කර චිත්‍රයට නැගීම හා වෙනත් නිර්මාණ කිරීම
- දහවල් කාලයේ අහසේ ස්වභාවය නිරීක්ෂණය කර හඳුනා ගත් ලක්ෂණ විවිධ අයුරින් වාර්තා කිරීම
- අහසේ යමක් පාකර හැරීමට යෙදිය හැකි උපක්‍රම අත්හදා බැලීම
- අවකාශ භාවිතයට අදාළ ව ක්‍රීඩාවල නියැලීම

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

තේමාව :- 7.0 අප කන බොන දේ

නිපුණතා :

- ආහාර වේලක අඩංගු දෑ සොයා බලා එහි වැඩිපුරම ඇත්තේ මොනවා දැ යි ප්‍රකාශ කරයි.
- ආහාර වේලක් පිළියෙල කර ගැනීමට ශාකවලින් හා සතුන්ගෙන් ලබා ගන්නා දෑ විමර්ශනය කර වාර්තා කරයි.
- ආහාරවලින් අපගේ ශරීරයේ වර්ධනයට හා ආරක්ෂාවට ලැබෙන විවිධ ප්‍රයෝජන අගය යි.
- ආහාරයක් ලෙසට පලාවර්ගවල ඇති වටිනාකම් පිළිබඳ ව අවබෝධයකින් යුතු ව දෛනික ආහාර වේල් සඳහා පලා වර්ග එකතු කර ගනියි.
- රෝගවලින් වැලකී සිටීමට අවශ්‍ය කරන ආහාර රටා අනුගමනය කරයි.
- ආහාර මෙන් ම සුදුසු පාන වර්ග ද ප්‍රමාණවත් ව ගැනීම පුරුද්දක් කර ගනියි.
- ආහාරවල වැදගත්කම හා යහපුරුදු සෞන්දර්යාත්මක ව ඉදිරිපත් කරයි.
- මනා ශරීර වර්ධනයක් සඳහා යෝග්‍ය ක්‍රියාකාරකම්වල නිරත වෙයි.

අන්තර්ගතය :-

- අපේ ආහාර වේලෙහි ප්‍රධාන ආහාරය වශයෙන් පිටි බහුල (පිෂ්ඨය බහුල) ද්‍රව්‍යයක් අඩංගු වන බව
- අපේ ආහාරයට එකතු වන දේවල් ප්‍රධාන වශයෙන් ගස්වලින් හා සතුන්ගෙන් ලබා ගන්නා බව
- ශරීර වර්ධනයට මෙන් ම ආරක්ෂාවට සුදුසු අහාර හා පාන වර්ග
- ප්‍රධාන ආහාරයට එකතු වන වෙනත් ආහාරවලින් අපේ වැඩීමට අවශ්‍ය දෑ
- සිය සිරුරේ වැඩීම හා නීරෝගී බව
- ආහාර පිළියෙල කරන විවිධ ආකාර
- අහාරවල වැදගත්කම හා යහපුරුදු මතු වන ගායන, රංගන හා කෙටි නාට්‍ය
- ශරීර වර්ධනයට යෝග්‍ය ක්‍රියාකාරකම්

ක්‍රමවේදය හා ක්‍රියාකාරකම් :-

- ආහාර වේලක් ශාක හා සතුන්ගෙන් ලබා ගන්නා දේවල්වලින් සමන්විත වන බව හා ආහාර වේලක ප්‍රධාන වශයෙන් පිටි බහුල බව පිළිබඳ අත්දැකීම් ලබා ගැනීම සඳහා ආහාර කොටස් නිරීක්ෂණය කිරීම
- සිය සිරුරේ වැඩීම පිළිබඳ අත්දැකීම් සාකච්ඡා කිරීම
- පලතුරු සලාදයක් හෝ පලතුරු බීමක් වැනි පානයක් හෝ වෙනත් ආහාරයක් පන්ති මට්ටමින් පිළියෙල කිරීම
- ආහාරවල ගුණාංග හෝ ආහාර පුරුදුවල වැදගත්කම පිළිබඳ තවදුරටත් දැනුවත් වීම සඳහා සෞන්දර්යාත්මක ක්‍රියාකාරකම්වල යෙදීම
- කායික වර්ධනයට අදාළ ක්‍රීඩාවල යෙදීම
- විවිධ ද්‍රව්‍ය භාවිත කරමින් ආහාර වර්ගවල ආකෘති සකස් කිරීම

තේමාව :- 8.0 තොරතුරු ලැබෙන හැටි

නිපුණතා :-

- අදහස් හා හැඟීම් නිවැරදි ව ප්‍රකාශ කිරීම සඳහා කටහඬ සහ ඉන්ද්‍රියයන් අදාළ පරිදි යොදා ගනියි.
- තොරතුරු සන්නිවේදනය කිරීම පහසු මෙන් ම වින්දනාත්මක වීම සඳහා කාටූන් චිත්‍ර, ඡායාරූප හා පෝස්ටර් යොදා ගනියි.
- බිත්ති පුවත්පතක් සඳහා තම දායකත්වය ලබා දෙමින් ආශ්වාදයක් ලබයි.
- නිවැරදි තොරතුරු ලබා ගැනීමේ හා ලබා දීමේ හැකියා ප්‍රදර්ශනය කරයි.

අන්තර්ගතය :-

- අදහස් සහ හැඟීම් ප්‍රකාශ කිරීමට ඉන්ද්‍රිය භාවිතය
- ඡායාරූප, කාටූන් පෝස්ටර් සහ චිත්‍ර මඟින් ප්‍රකාශ වන තොරතුරු වඩා නිවැරදි ව අවබෝධ කර ගැනීමේ හා ප්‍රකාශ කිරීමේ හැකියා වර්ධනය
- විවිධ ප්‍රචාර කටයුතු සඳහා මුද්‍රිත මාධ්‍ය භාවිත කරන අවස්ථා
- බිත්ති පුවත්පත් නිර්මාණය
- තොරතුරු ලබා දීමේ හා ලබා ගැනීමේ වින්දනාත්මක ක්‍රීඩා



Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

ක්‍රමවේදය හා ක්‍රියාකාරකම් :-

- අදහස් හා හැඟීම් ප්‍රකාශ කිරීම සඳහා ඉන්ද්‍රිය යොදා ගන්නා ආකාරය පිළිබඳ ව අත්දැකීම් ලැබීමට ප්‍රායෝගික ක්‍රියාකාරකම්වල යෙදීම. මේ සඳහා සිසුන් යුගල හා කුඩා කණ්ඩායම් කරමින් කතා බහ කිරීම සහ මුහුණුවලින් හැඟීම් ප්‍රකාශ කිරීම.
- ඡායාරූප, කාටූන්, පෝස්ටර්, පුවත් පත් මගින් රැස් කර ගන්නා තොරතුරු පිළිබඳ ව සාකච්ඡා කිරීම.
- නිවැරදි තොරතුරු ලබා දීමේ හා ලබා ගැනීමේ යෙදිය හැකි කණ්ඩායම් ක්‍රීඩාවල නියැලීම.

තේමාව :- 9.0 වටාපිටාවේ සිදු වන වෙනස්කම්

නිපුණතා :-

- දෛනික ක්‍රියාකාරීත්වය නිසා ආසන්න පරිසරයේ සිදුවන වෙනස්කම්වලට සංවේදී ව ප්‍රතිචාර දක්වයි.
- ස්වාභාවික හේතු නිසා පරිසරයේ සිදුවන වෙනස්කම්වලට අනුව සංවේදී ව කටයුතු කරයි.
- ආසන්න පරිසරයේ සිදුවන වෙනස්කම් අතුරින් අහිතකර වෙනස්කම් හිතකර බවට පත් කර ගැනීමට දායක වෙයි.
- පරිසරයේ සිදුවන වෙනස්කම් රංගන, ගායන හා වාදන මගින් ඉදිරිපත් කරයි.
- පරිසරයේ වෙනස්කම් දැක්වෙන නිර්මාණ විවිධ මාධ්‍ය භාවිතයෙන් ඉදිරිපත් කරයි.

අන්තර්ගතය :-

- සිය සමීප පරිසරයේ සිදුවන වෙනස්කම්
- මෑත කාලයේ (වසරක් තුළ පමණ) සුළඟ, වැස්ස, ඉඩෝරය වැනි ස්වභාවික හේතූන් නිසා ගමට/නගරයට/වීදියට සිදු වී ඇති අහිතකර බලපෑම් සහ ඒවාට මුහුණ දෙන ආකාර.
- ස්වාභාවික පරිසරයේ වෙනස්වීම් නිරූපණය

ක්‍රමවේදය හා ක්‍රියාකාරකම් :-

- සමීප පරිසරයේ සිදුවන වෙනස්කම් (පාසල ආරම්භය, පාසල් කාලය තුළ, පාසල් ඇරෙන වේලාව... වැනි) නිරීක්ෂණය කිරීම හා පරිසරයට අහිතකර විය හැකි වෙනස්කම් හිතකර බවට පත් කර ගැනීමට කළ හැකි කාර්යයන් පිළිබඳ සාකච්ඡා කිරීම හා ප්‍රායෝගික අත්දැකීම් ලබා ගැනීම.
- ස්වාභාවික පරිසරයේ (සුළඟ, වැස්ස, ඉඩෝරය වැනි) සිදුවන වෙනස්කම් පිළිබඳ අත්දැකීම් සාකච්ඡා කිරීම. එවැනි අවස්ථාවලට ලක් වූ ස්ථාන තිබේ නම් නිරීක්ෂණය හා වාර්තා කිරීම.
- පරිසරයේ සිදුවන වෙනස්කම් රංගන, වාදන, ගායන හා නාට්‍ය ඇසුරින් ඉදිරිපත් කිරීම.
- පරිසරයේ සිදු වූ වෙනස්කම් දැක්වෙන අවස්ථාවක් චිත්‍රයට නැගීම.

තේමාව :- 10.0 කැමති - අකමැති

නිපුණතා :-

- පාසලේ දී මුහුණ දීමට සිදුවන සිදුවීම්වලින් තමා කැමති හා අකමැති අවස්ථා පිළිබඳ අත්දැකීම් අන් අය සමඟ හුවමාරු කර ගනියි.
- පාසලේ දී සිදුවන අකමැති සිදුවීම්වලට හේතු සොයා බලා ඒවා කැමති සිදුවීම් බවට පත් කර ගැනීමට කළ හැකි යෝජනා ඉදිරිපත් කරයි.
- ආසන්න පරිසරයේ ඇති අනතුරුදායක හා අවදානම් සහිත ස්ථාන හා අවස්ථා සොයා බලා ආරක්ෂා වීමට පියවර ගනියි.
- වැඩිදෙනකුගේ කැමැත්ත ඇති ව තෝරා ගත් ක්‍රීඩාවක්, ගායනයක්, රංගනයක් කිරීමට ඉදිරිපත් වෙයි.
- තම අභිමතය පරිදි තෝරා ගන්නා ලද නිර්මාණයක් තුළින් තම හැකියා ප්‍රදර්ශනය කරයි.

අන්තර්ගතය :-

- වටාපිටාවේ එදිනෙදා සිදුවන සිද්ධි ඇසුරින් තමන් කැමති සිදුවීම් හා අකමැති සිදුවීම්
- අකමැති සිදුවීම්වලට අනුමාන හේතු හා වැළැක්වීමට ගත යුතු ක්‍රියාමාර්ග
- පරිසරයේ සතුන් හා ගහකොළ සම්බන්ධ ව සිදුවන තමන් කැමති හා අකමැති සිදුවීම්

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

- එම අකමැති සිදුවීම් කැමති සිදුවීම් බවට පත් කිරීමට කළ හැකි දේ
- විවිධ ජන කොට්ඨාස හා බැඳුණු සමහර පුරුදු හා හැසිරීම් පිළිබඳ සංවේදී බව
- සිසුන් කැමති එළිමහන් ක්‍රීඩා, ගායනා, රංගන, නිර්මාණ
- සිත්ගත් චරිත අනුකරණ

ක්‍රමවේදය හා ක්‍රියාකාරකම් :-

- පාසල තුළ සිදුවන කැමති අකමැති සිද්ධි පිළිබඳ අදහස් ඉදිරිපත් කිරීම. රංගන මගින් ද ප්‍රකාශ කිරීම.
- හඳුනා ගන්නා සිද්ධි කැමති හෝ අකමැති වීමට හේතු සාකච්ඡා කිරීම.
- පරිසරයේ ඇති ගහකොළ හා සතුන් සම්බන්ධයෙන් සිදුවන කැමති හා අකමැති සිදුවීම් පිළිබඳ ව සොයා බැලීම. ඒ පිළිබඳ අත්දැකීම් හා රැස් කර ගත් තොරතුරු පිළිබඳ ව සාකච්ඡා කිරීම.
- ගහකොළ මෙන් ම සතුන්ගෙන් සිදුවිය හැකි අනතුරු පිළිබඳ අත්දැකීම් කතා බහ කිරීම හා ඒවායින් වැළැක්වීමට ගත හැකි ක්‍රියාමාර්ග යෝජනා කිරීම.
- තමන් කැමති ක්‍රීඩා, නිර්මාණ, ගායන, රංගන සහ සිත්ගත් චරිත අනුකරණවල යෙදීම.

තේමාව :- 11.0 අපට ඕනෑ දේ ලැබෙන හැටි

නිපුණතා :-

- පාසල් පරිසරයෙන් හා නිවසින් අවශ්‍ය උදව් ලබා ගනිමින් ඉගෙනුම් කටයුතුවල සාර්ථක ව නියැලෙයි.
- සිය ඉගෙනුම් කටයුතුවලට පාසලින් හා නිවසින් උදව් දෙන අය අගය කරයි.
- භාණ්ඩ හා උපකරණ ක්‍රමවත් ව පවිත්‍ර ව හා ආරක්ෂාකාරී ව භාවිත කරයි.
- පාසලේ පොදු වස්තු හා පොදු දේපල ආරක්ෂා කිරීමට දායක වෙයි.
- විවිධ කාර්යයන් සඳහා උදව් වන පුද්ගලයින් හා උපකරණවල ලක්ෂණ සුවිශේෂි කර ගනිමින් සෞන්දර්යාත්මක ක්‍රියාකාරකම්වල නිරත වෙයි.
- විවිධ ද්‍රව්‍ය භාවිත කරමින් පරිහරණය කළ හැකි භාණ්ඩ හා උපකරණවල ආකෘති නිර්මාණය කරයි.

අන්තර්ගතය :-

- සිය ඉගෙනුම් අවශ්‍යතා සපයන ස්ථාන වශයෙන් පාසල හා නිවස
- සිය ඉගෙනුම් වැඩට අවශ්‍ය දේවල් අතරින් පාසලින් සැපයෙන දේවල් (පුද්ගලයින්, බඩු බාහිරාදිය හා ඉඩකඩ) භාණ්ඩ හා උපකරණ පිරිසිදු ව හා ආරක්ෂාකාරී ව පරිහරණය කර ගන්නා ආකාරය
- පාසලින් සැපයෙන ඉගෙනුම් පහසුකම්
- සිය ඉගෙනුම් වැඩට ගෙදරින් සපයා දෙන උදව්
- පාසලේ පොදු වස්තුන්ට ආරෝපිත කතා හා චිත්‍ර නිර්මාණය
- භාණ්ඩ හා උපකරණවලින් ලැබෙන ප්‍රයෝජන පිළිබඳ ගායන හා රංගන
- විවිධ ද්‍රව්‍ය භාවිත කරමින් පාසලේ දී පරිහරණය කරන භාණ්ඩ හා උපකරණවල ආකෘති නිර්මාණය

ක්‍රමවේදය හා ක්‍රියාකාරකම් :-

- ඉගෙනුම් කටයුතුවලට පාසලෙන්, පාසල් පරිසරයෙන් හා නිවසින් ලැබෙන උදව් පිළිබඳ සාකච්ඡා කිරීම හා අගය කිරීම.
- පන්ති කාමරය තුළ බඩු බාහිරාදිය ක්‍රමවත් ව හා පවිත්‍ර ව තබා ගැනීමේත්, ආරක්ෂා කිරීමේත් හුරුකම් ලබා ගැනීම.
- පන්ති කාමරවල භාවිත කරන උපකරණවල ආකෘති කිහිපයක් සකස් කිරීම.
- භාණ්ඩ හා උපකරණවල ක්‍රියාකාරිත්වය මතුවන කවි ගීත ගායන හා රංගනවල නිරත වීම.
- පාසලේ පොදු දේපල ආරක්ෂා කිරීමේ වැදගත්කම පිළිබඳ සාකච්ඡා කිරීම හා පොදු වස්තු ආරක්ෂා කිරීමට දායක වීමේ වැදගත්කම මතු කිරීම. පාසලේ පොදු ස්ථාන නිරීක්ෂණය කරමින් හානි සිදුවී තිබේ ද යන්න සොයා බැලීම. ඒවා නිසි පරිදි පවත්වා ගැනීමට කළ හැකි යෝජනා ඉදිරිපත් කිරීම.
- පාසල් වත්ත නිරීක්ෂණ ඇසුරින් තමන් සිත් ගත් අවස්ථාවක් චිත්‍රයට නැගීම හා කිසියම් වස්තුවකට ආරෝපිතව කතා කිරීම.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

තේමාව :- 12.0 ගමන් බිමන්

නිපුණතා :-
- නිවසට යන එන අයගේ ගමන් බිමන් පිළිබඳ තොරතුරු රැස් කර වාර්තා කරයි.
- නිවැරදි ඉරියව් අනුගමනය කරමින් ඇවිදියි.
- ඇවිදීම, වාඩිවීම සහ බරක් එසවීම වැනි කාර්යයන්හි දී සමබරතාවය රැක ගනියි.
- බාධාකාරී සහ දුෂ්කරතාවන්ගෙන් ආරක්ෂා වෙමින් ගමන් කරයි.
- සමබරතාවය රැක ගනිමින් නිවැරදි ඉරිව්වලට අනුව ක්‍රීඩාවන්හි නිරත වෙයි.
- ශරීරයේ සමබරතාවය රැකෙන විවිධ ඉරියව් නිරූපණය කරයි.

අන්තර්ගතය :-
- සිය නිවසේ අය හා නිවසට පැමිණෙන අයගේ ගමන් බිමන් පිළිබඳ ව තොරතුරු
- නිවැරදි ඉරියව් අනුගමනය කරමින් ඇවිදීම
- පාරේ ගමන් කරන විට ආරක්ෂාකාරී බව
- සමබර ව ඇවිදීම
- බහුල ව භාවිත වන වාහනවල ආකෘති
- සමබරතාව රැකෙන නිවැරදි ඉරියව් අනුගමන කරමින් කළ හැකි ක්‍රීඩා

ක්‍රමවේදය හා ක්‍රියාකාරකම් :-
- නිවැරදි ඉරියව් අනුගමනය කරමින් ඇවිදීමේ නිවැරදි ක්‍රමය පිළිබඳ අත්දැකීම් ලබා ගැනීමේ ප්‍රායෝගික ක්‍රියාකාරකම්වල නිරත වීම.
- සෙල්ලම් මිදුල ප්‍රයෝජනයට ගනිමින් සමබර ව ඇවිදීමේ ක්‍රියාකාරකම්වල නිරත වීම.
- පාරේ ගමන් කරන විට පිළිපැදිය යුතු නිවැරදි ක්‍රම හා ආරක්ෂාකාරී ව ගමන් කළ යුතු ආකාරය පිළිබඳ සාකච්ඡා කිරීම හා අදාළ ක්‍රියාකාරකම්වල නිරත වීම.
- බරක් එසවීම, ඉඳ ගැනීම හා ඇවිදීම වැනි ඉරියව් ආදර්ශනය කිරීම හා ගායනය සහිත භූමිකා රංගනවල යෙදීම.
- සමබරතාව රැක ගනිමින් කළ හැකි නිර්මාණාත්මක ක්‍රීඩාවල නිරත වීම.

තේමාව :- 13.0 එළිය සමඟ සෙල්ලම්

නිපුණතා :-
- ස්වාභාවික ව එළිය අඩුවැඩි වීම හා ඒ අනුව පරිසරයේ සිදුවන වෙනස්කම් ගවේෂණය කරයි.
- එළිය විහිදීම අඩු කිරීමේ, වැඩි කිරීම් සහ එහි දිශාව වෙනස් කළ හැකි අයුරු අත්හදා බලයි.
- එළියේ වෙනස්වීම අනුව සෙවනැලිවල දිග වෙනස්වීම් නිරීක්ෂණය කරමින් ඒ ආශ්‍රිත ක්‍රීඩාවල යෙදෙයි.
- එළිය විහිදීම අඩු වැඩි වන සහ එළියේ විවිධ වර්ණ මතු වන නිර්මාණ ගොඩනගයි.
- එළිය අඩු වැඩි වන අවස්ථාවල පරිසරයේ සිදුවන වෙනස්කම් ආශ්‍රිත කවි ගී ගායන හා රංගනවල නිරත වෙයි.

අන්තර්ගතය :-
- ස්වාභාවික ව පරිසරයේ එළිය අඩු, වැඩි වන අවස්ථා
- එළිය අඩු වීම සමඟ පරිසරයේ සිදුවන වෙනස්කම්
- යම් ස්ථානයකට ලැබෙන හිරු එළිය අඩු කිරීමේ සහ වැඩි කිරීමේ සරල ක්‍රම
- එළිය ගමන් කරන දිශාව වෙනස් කළ හැකි ක්‍රම
- සෙවනැලි ආශ්‍රිත ක්‍රීඩා
- විවිධ වර්ණ යොදා ගනිමින් කෙරෙන නිර්මාණ හා විවිධ වර්ණ මතු කෙරෙන නිර්මාණ

ක්‍රමවේදය හා ක්‍රියාකාරකම් :-
- ස්වාභාවික එළිය අඩු වැඩිවන අවස්ථා පිළිබඳ අත්දැකීම් ප්‍රකාශ කිරීම.
- එළිය අඩු වැඩිවීමත් සමග පරිසරයේ සිදුවන වෙනස්කම් (ශාක හා සතුන්) පිළිබඳ ව නිරීක්ෂණය කිරීම හා අත්දැකීම් ප්‍රකාශ කිරීම හා විවිධ අයුරින් වාර්තා කිරීම.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

- සෙවනැලි ආශ්‍රිත ක්‍රීඩා කිහිපයක නිරත වීම.
- එළිය විහිදීම අඩු වැඩි කිරීමේ හා එළිය ගමන් කරන දිශාව වෙනස් කිරීමේ ක්‍රම පිළිබඳ ප්‍රායෝගික අත්දැකීම් ලබා ගැනීම.
- විවිධ වර්ණ යොදා ගනිමින් හා විවිධ වර්ණ මතුවන පරිදි විවිධ නිර්මාණ කිරීම.

තේමාව :- 14.0 මිනිසුන් වැඩ කරන තැන්

නිපුණතා :-
- ආසන්න පරිසරයේ පුද්ගලයින් ජීවිකාව සඳහා වැඩ කරන ස්ථාන හා ඒ අශ්‍රිත තොරතුරු ගවේෂණය කර තොරතුරු වාර්තා කරයි.
- තාක්ෂණික වෙනස්වීම් අනුව වැඩ කරන අයුරු වෙනස් වී ඇති ආකාරය විමර්ශනය කර වාර්තා කරයි.
- වැඩබිම්වල විවිධ අවස්ථා නිරූපණය කරන භූමිකා රංගන ගැයෙන කවි ගී ඇසීම හා ගැයීම ආශ්‍රිත සෞන්දර්යාත්මක අංගවල යෙදෙමින් වින්දනයක් ලබයි.
- ජීවිකාව සඳහා කරන විවිධ වැඩවලින් සිදුවන සේවය අගය කරයි.
- විවිධ වැඩබිම්වල භාවිත කරන මෙවලම් හා උපකරණවල ආකෘති නිර්මාණය කර ඒවා ඇසුරු කර ගනිමින් ජන ක්‍රීඩාවල යෙදෙයි.

අන්තර්ගතය :-
- ගමේ හා ගමෙන් පිට ප්‍රදේශවල මිනිසුන් වැඩ කරන විවිධ තැන්
- ගමේ වැඩිදෙනකු කරන වැඩ හා සම්බන්ධ තොරතුරු
- වැඩපලවල දී වැඩට බාධා කෙරෙන මිනිස් හැසිරීම් හා වෙනත් කරුණු
- කලින් කලට වැඩ කිරීමේ ක්‍රමවල සිදු වී ඇති වෙනස්කම් පිළිබඳ ව විමසිලිමත් බව
- විවිධ වැඩ කටයුතු හා සම්බන්ධ අතීතයේ සිට භාවිත වන කවි, ගී හා නැටුම්
- වැඩබිම්වල භාවිත කරන උපකරණ කිහිපයක ආකෘති නිර්මාණ

ක්‍රමවේදය හා ක්‍රියාකාරකම් :-
- තම පාසලට ආසන්න ප්‍රදේශයේ වැඩ බිමක් නිරීක්ෂණය කිරීම. (වැඩ බිමේ විවිධ අවස්ථා,පැරණි ක්‍රම, නව ක්‍රම, ඇඳුම් පැළඳුම්) නිරීක්ෂණ පිළිබඳ අත්දැකීම් කතා බහ කිරීම.
- වැඩ බිමක අවස්ථා දැක්වෙන භූමිකා රංගනවල නිරත වීම.
- තමන් දුටු හෝ අවස්ථාවට ගැළපෙන හෝ අසා ඇති වැඩ බිම් හා සම්බන්ධ ජන ගී, කවි, ගීත ගායනය හා රංගනය.
- තමන් සිත් ගත් අවස්ථා චිත්‍රයට නැගීම.
- නිරීක්ෂණය කළ වැඩ බිමේ භාවිත කළ උපකරණ හෝ තමන් කළ වැඩ බිමක භාවිත කළ උපකරණ නිර්මාණය හා ඒවා භාවිත කරමින් රංගනවල යෙදීම.

තේමාව :- 15.0 වටාපිටාවේ වෙනස් තැන්

නිපුණතා :-
- තම ප්‍රයෝජනය පිණිස මිනිසා විසින් පරිසරයේ කර ඇති වෙනස්කම් විමර්ශනය කර වාර්තා කරයි.
- මිනිසාට ජීවත් වීම සඳහා මූලික වශයෙන් ආහාර නිපදවා ගන්නා ස්ථාන හඳුනා ගෙන වාර්තා කරයි.
- පස රැක ගැනීමේ විවිධ උපායමාර්ග අත්හදා බලයි.
- පරිසර විවිධත්වය තමන් කැමති මාධ්‍යයක් භාවිත කරමින් නිර්මාණය කරයි.
- ශාරීරික වර්ධනයට අදාළ මිනිසා විසින් සකස් කර ගත් ස්ථානයක් ලෙස සෙල්ලම් මිදුල හඳුනාගෙන ශරීර වර්ධනයට අදාළ ක්‍රියාකාරකම් කිහිපයක නියුක්ත වෙයි.
- වටාපිටාවේ සුන්දරත්වය අගයමින් කවි, ගී, ගායනා හා රංගනවල නිරත වෙයි.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

අන්තර්ගතය :-

- ගොවිපල/කුඹුර මිනිසා විසින් සකස් කරන ලද පරිසරයක් ලෙස
- වගාව පවත්වා ගැනීමට, පස රැක ගැනීමට ගෙන ඇති උපාය මාර්ග
- විවිධ මාධ්‍ය භාවිත නිර්මාණ ගායන හා රංගන ඇසුරින් පරිසර විවිධත්වය ඉදිරිපත් කිරීම
- විවිධ කාර්යයන් සඳහා භූමිය යොදා ගෙන ඇති ආකාරය
- සුදුසු පරිදි භූමිය සකසාගෙන කරන ක්‍රීඩා

ක්‍රමවේදය හා ක්‍රියාකාරකම් :-

- පාසල් වත්තේ හෝ ආසන්න පරිසරයේ හෝ මිනිසා විසින් සකස් කර ඇති වගා බිමක් නිරීක්ෂණය කිරීම.
- රැස් කරන තොරතුරු, රූප සටහන් හෝ චිත්‍ර, ආකෘති හෝ භූමිකා රංගන මඟින් ඉදිරිපත් කිරීම.
- පස ආරක්ෂා කර ගැනීමේ ක්‍රම පිළිබඳ සාකච්ඡා කිරීම හා ඊට දායක විය හැකි ප්‍රායෝගික ක්‍රියාකාරකම්වල නිරත වීම.
- පරිසර විවිධත්වය ගළපා ගනිමින් ශාරීරික ව්‍යායාම සඳහා ක්‍රීඩාවල නිරත වීම.
- විවිධ මාධ්‍ය භාවිත කරමින් පරිසර විවිධත්වය දැක්වෙන නිර්මාණ ඉදිරිපත් කිරීම.

තේමාව :- 16.0 අපේ උදවු ඕනෑ අය

නිපුණතා :-

- උදව් අවශ්‍ය අය සඳහා උදව් කිරීමට ස්ව කැමැත්තෙන් ඉදිරිපත් වෙයි.
- උදව් කළ අවස්ථා හා සිද්ධි පිළිබඳ අත්දැකීම් අන් අය සමඟ හුවමාරු කර ගනියි.
- එදිනෙදා ජීවිත කාර්යයන්වල දී සෑම කෙනෙකුගේ ම උදව් අවශ්‍ය වන බව හා අවශ්‍ය අවස්ථාවල කෙනෙකුට උදව් දීම තම යුතුකමක් සේ පිළිගනිමින් ක්‍රියා කරයි.
- සාමූහික ව වැඩ කිරීමෙන් වැඩි ඵලයක් ලබා ගැනීමට හැකියාවක් ලැබෙන බව පිළිගනියි.
- කෙනෙකුගේ සහාය ලබා ගනිමින් ක්‍රියාත්මක වන ක්‍රීඩාවල නිරත වෙයි.

අන්තර්ගතය :-

- පාසල් වටපිටාවේ/ගමේ හමුවන උදව් ඕනෑ කරන අය
- පන්තියේ එකිනෙකාට උදව් කෙරෙන ආකාර
- උදව් කිරීම හා සම්බන්ධ සිද්ධි හා අත්දැකීම්
- කෙනෙකුගේ උදව්වක අවශ්‍යතාව හඳුනා ගැනීමේ හැකියාව වර්ධනය
- සෑම අයෙකුට ම අන්‍යයන්ගේ උදව් අවශ්‍ය වන බව
- සාමූහික ව වැඩ කිරීමෙහි අගය දැක්වෙන ගී / කවි ගායනය
- කෙනකුගේ සහාය ලබා ගනිමින් කළ හැකි ක්‍රීඩා

ක්‍රමවේදය හා ක්‍රියාකාරකම් :-

- උදව් ඕනෑ අය කවුද යන්න සාකච්ඡා මඟින් දැනුවත් වීම.
- පන්ති කාමරයේ හෝ පාසලේ දී එකිනෙකා උදව් කර ගන්නා ආකාරය කෙසේ ද යන්න සාකච්ඡා කිරීම.
- අන්‍යෝන්‍ය උදව් ලබා ගන්නා ආකාරය නිරූපණය වන අවස්ථා ඉදිරිපත් කිරීම. උදව් කිරීම හොඳ පුරුද්දක් ලෙස අගය කිරීම.
- උදව් කිරීම හා සම්බන්ධ සිද්ධි හා අත්දැකීම් කැමති අයුරින් ඉදිරිපත් කිරීම.
- උදව් කළ යුතු අයට උදව් කිරීමේ අවස්ථාවක් ප්‍රායෝගික ව ඉටු කිරීම.
- සතුන් පිළිබඳ ව කියැවෙන කවි ගී තාලානුකූල ව ගායනා කරයි. රංගනයේ යෙදෙයි කතන්දර ඉදිරිපත් කරයි. තවත් කෙනකුගේ සහාය ලබා ගනිමින් කළ හැකි නිර්මාණාත්මක ක්‍රීඩාවල නිරත වීම.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

## 1.0 අපයි පාසලයි

නිපුණතා :-

- පාසල තුළ කටයුතු කරන විවිධ පුද්ගලයන්ගේ භූමිකා හඳුනාගෙන නිසි අයුරින් ප්‍රතිචාර දක්වයි.
- අන් අය සුහද ව පිළිගෙන අවස්ථානුකූල ව කටයුතු කරයි.
- ආචාරශීලී ව හැසිරීම් ප්‍රදර්ශනය කරයි.
- එකමුතු බව සාර්ථකත්වයට හේතු වන බව පිළිගනිමින් ඒ අනුව ක්‍රියා කරයි.
- පාසල් වත්තේ සහ ඒ අවට ඇති සුවිශේෂී මෙන් ම වැදගත් ශාක, ස්ථාන හා ලක්ෂණ හඳුනාගෙන ඒවා සුරක්ෂිතව පවත්වා ගැනීමට දායක වෙයි.
- ගමෙන් පාසලට හා පාසලෙන් ගමට ඉටුවන සේවා හඳුනාගෙන තමාට හැකි මට්ටමෙන් එම සේවාවන්ට දායක වෙයි.
- පාසල තමාට සුරක්ෂිත ස්ථානයක් මෙන් ම ප්‍රියජනක හා ප්‍රයෝජනවත් ස්ථානයක් ලෙස හඳුනාගෙන කටයුතු කරයි.
- ක්‍රීඩා පිටිය ඉතා ප්‍රයෝජනවත් ස්ථානයක් ලෙස පිළිගෙන එය හොඳින් පවත්වා ගැනීමට දායක වෙයි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය

ක්‍රියාකාරකම් 1

- විදුහල්පති/පතිනියගේ කාර්යභාරය තව දුරටත් හඳුනා ගැනීමට අවස්ථාව සලසන්න.
- උදේ රැස්වීමක් සංවිධානය කරන්න.
- පාසල් කොඩිය ඔසවා, පාසල් ගීය ගායනා කිරීමට සිසුන් යොමු කරන්න.
- එදින සිසුන් අමතා උපදේශාත්මක කතාවක් (මිනිත්තු තුනක පමණ) කිරීමට විදුහල්පතිට ඇරයුම් කරන්න.
- විදුහල්පති, ගුරුවරුන් හා වෙනත් වැඩිහිටියන් ඉදිරියේ සිසුන් හැසිරිය යුතු ආකාරය පිළිබඳ ව දැනුවත් කරන්න.
- හැකිනම් සිසුවකු ලවා ස්තුති කරවන්න.
- පන්ති භාර ගුරුවරයාගේ නම, ගම, තමා විවේක කාලයේ දී කිරීමට වඩාත් කැමති දේ වැනි මූලික තොරතුරු කිහිපයක් දැන ගැනීමට සලස්වන්න.
- සිසුන් සමඟ සුහදතාවය වැඩි වන අන්දමින් ඔවුන් සමඟ කතා බහ කරන්න.
- ගුරුවරයාව චිත්‍රයට නැඟීමට අවස්ථාව ලබා දෙන්න.
- ප්‍රාථමික ශ්‍රේණිවල ගුරු මහත්ම මහත්මීන් කිහිපදෙනකු පන්තියට කැඳවන්න. ඒ අය සාදරයෙන් පිළිගැනීමට සලස්වන්න. ඒ අයට තමා කවුරු දැ යි (නම, උගන්වන පන්තිය, ගම වැනි මූලික තොරතුරු) පැවසීමට කියන්න.
- හඳුන්වා දෙන ගුරුවරයාගේ දක්ෂතා/කුසලතා අනුව ඔහු/ඇය ලවා සිසුන්ට තේරවිල්ලක් /කුඩා කවියක්/රබන් පදයක්/ ගීයක්/කතන්දරයක්/(උපදේශාත්මක) කාලීන පුවතක් ඉදිරිපත් කිරීමට සලස්වන්න. අවසානයේ දී හැකිනම් සිසුවකු ලවා ස්තුති කරවන්න.
- සිසුන් කණ්ඩායම් කර, ඔවුන්ගේ හැකියා (ගායන රංගන ... වැනි) ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාව ලබා දෙන්න.

ක්‍රියාකාරකම් 2

- පාසල් වත්ත නැරඹීමට සිසුන් කැටුව යන්න.
- තෝරා ගත් ගස් කිහිපයක් නිරීක්ෂණයට යොමු කරන්න.

  මෙහි දී : සුළඟට ගස් සෙලවෙන අයුරු
  ගස් කීපයක අතු විහිදී ගිය අයුරු
  තනි ගස් හා පඳුරු වශයෙන් සැදී තිබෙන අයුරු ... යනාදී වශයෙන් නිරීක්ෂණයට යොමු කරන්න.
- ස්වාභාවික ගහකොළ සහ වගාවන් ද ඉස්මතු වන සේ පාසල් වත්තේ ආකෘතියක් සැලසුම් කිරීමට යොමු කරන්න.
- සිසුන් නිරීක්ෂණය කළ දෑ චලන ක්‍රියාකාරකම් වැනි විවිධ ක්‍රම මගින් ඉදිරිපත් කිරීමට යොමු කරන්න.

  එසේ ඉදිරිපත් කිරීමේ දී :

  තනි ගස්/පඳුරක් ලෙස වැඩුණු ගස් නිරූපණය කිරීම
  සුළඟට ගස්වල අතු සෙලවෙන ආකාරය නිරූපණය කිරීම
  සුළඟේ වේගය අඩු වැඩි වීම අනුව ගස් චලනය වන ආකාරය නිරූපණය කිරීම
  සුළඟේ වේගය අඩු වැඩි බව දැක්වීමට මුවින් ශබ්ද නිකුත් කිරීම ..... වැනි අවස්ථා සඳහා යොමු කරන්න.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

- පාසල් වත්තේ තෝරා ගත් ගසක් සමීපයට යන්න. ගස ගැන තොරතුරු සෙවීමට යොමු කරන්න.

  මෙහි දී :

  ගසෙන් ලබන ප්‍රයෝජන කතා බහ කිරීම

  කඳෙහි මහත සෙවීමට ක්‍රම සෙවීම

  පොත්ත නිරීක්ෂණය කිරීම, පොත්තක් ස්පර්ශ කරන විට දැනෙන රළු හෝ සිනිඳු ස්වභාවය අත්විඳීම

  ගසේ කොටස් තවත් ගසක කොටස් සමඟ සමානකම් අසමානකම් සොයා බැලීම (කොළ, මුල්, දලු, මල්, ගෙඩි .... වැනි ) ආදියට යොමු කරන්න.
- පාසල් වත්තේ ඇති ගහකොළ සහ වගාවන් නම් කිරීමට සලස්වන්න.
- ගස්වලින් පාසලට ලැබෙන ප්‍රයෝජන කතා බහ කරන්න.

  උදා :- හෙවන → එළිමහන් පන්තියක් සේ ගැනීම

  අලංකාරය → ගස් වටා මල් පාත්ති සකස් කිරීම මල්, කොළ, ගෙඩි හටගෙන ඇති විට විචිත්‍රවත් බව
- පාසල් වත්තේ ඇති ගස්වල කොළ හෝ ඒවායේ හැඩ ඇසුරු කර ගනිමින් නිර්මාණ කිරීමට යොමු කරන්න.

  උදා :- විවිධ හැඩ සහිත කොළ ඇලවීමෙන් මෝස්තර රටා නිර්මාණය

  පාසල් වත්තේ ඇති ගස්වල ස්වාභාවික වර්ණ සහිත ද්‍රව්‍ය යොදා ගනිමින් පාසල් වත්ත චිත්‍රයට නැගීම
- සිසුන් කරන ලද විවිධ නිර්මාණ ප්‍රදර්ශනය කිරීමට සලස්වන්න.

ක්‍රියාකාරකම් 3

- පාසල අවට නැරඹීමට සිසුන් කැඳවා ගෙන යන්න. පාසලට ආසන්නයේ ඇති විශේෂ වූ ගොඩනැගිලි හෝ ස්වභාවික වස්තූන් (කන්දක්, දිය පාරක්, පොකුණක්, පැරණි ගසක්) හෝ කිහිපයක් නරඹමින් සතුටක් වින්දනයක් ලැබීමට සලස්වන්න. ඒ පිළිබඳ ව කතා බහ කරන්න. තොරතුරු රැස් කිරීමට යොමු කරන්න. රැස් කර ගත් තොරතුරු වාචිකව, චිත්‍ර, ගායන, රංගන හා ආකෘති මගින් ඉදිරිපත් කිරීමට සලස්වන්න. (මෙහි දී බලාපොරොත්තු වන්නේ නරඹන ස්ථාන පිළිබඳ ව මූලික තොරතුරු කිහිපයක් සරල ව දැන ගැනීමයි. උදා :- පැරණි ගසක් නම් එහි නම, ඊට අදාළ සුවිශේෂ ලක්ෂණ හා වැදගත්කම)

ක්‍රියාකාරකම් 4

- පසුගිය අවුරුද්දේ පළමුවන ශ්‍රේණිය පන්ති කාමරයට වැඩිහිටියන් කළ උදවු පිළිබඳ ව කතා බහ කරන්න.
- ගමේ අයගෙන් පාසල් වත්තේ වැඩකට ලැබුණු උදවු සොයා බැලීමට යොමු කරන්න.

  මෙහි දී කර ඇති වැඩය, වැඩ කළ පුද්ගලයන්, වැඩට ගත් උපකරණ සහ ඒවා සපයා ගත් ආකාරය මතු කරමින් කතා බහ කරන්න.
- කොළ කැඳ පානයක්/ආහාර වේලක් පන්තියේ සිසුන්ට එක් දිනක දී ලබා දීමට සංවිධානය කරන්න. පිළියෙල කර ගත් පානය හෝ ආහාර වේල හෝ භුක්ති විඳීමට සලස්වන්න. හැකිනම් ශිෂ්‍යයකු ලවා සහභාගි වූ වැඩිහිටියන්ට ස්තූති කරවන්න.
- මෙම අවස්ථාව උදවු කර ගෙන කතා බහක යෙදෙන්න. මෙහි දී :

  ගත් ද්‍රව්‍ය, ඒවා සපයා ගත් ආකාරය, සහභාගි වූ අය පිළිබඳ ව ද එවැනි කාර්යයක දී තනි පුද්ගලයකු වැඩෙහි යෙදීම වෙනුවට කණ්ඩායමක් එකමුතු වී නිරත වීමෙන් කාලය හා ශ්‍රමය අඩුවෙන් වැය වන බව ද මතු කර දක්වන්න.
- මෙවැනි අවස්ථාවක් මුල් කොට ගෙන චිත්‍රයක් ඇඳීමට යොමු කරන්න.
- පාසලෙන් ගමට කෙරෙන එක් වැඩ සටහනක් හඳුනා ගැනීමට සලස්වන්න. ඒ පිළිබඳ ව කතා බහ කරන්න. එවැනි වැඩ සටහනක් ක්‍රියාත්මක වීමේ දී මෙම සිසුනට දැක බලා ගැනීමට හා හැකිනම් සහාය වීමට අවස්ථාව සලස්වන්න.

  උදා :- පෝය දිනට පන්සලට මල් සැපයීම.

  රෝහලක ප්‍රතිකාර ලබන ගිලනුන්ට වියළි ආහාර ද්‍රව්‍ය සැපයීම.

  වැඩිහිටි නිවාසයකට ආහාර/උපකරණ සැපයීම.

  පාසල පිටත පරිසරය පවිත්‍ර ව තබා ගැනීමේ වැඩසටහන්

  රුක්රෝපණ දිනයේ ගමට පැළ බෙදා දීම.

  පාසල මගින් මෙහෙයවන සායන වැඩසටහන්

  පාසල මගින් සෞඛ්‍ය හා පෝෂණය පිළිබඳ ව ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන්



Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

- පාසල්වල දැනටමත් ක්‍රියාත්මක වන එවැනි වැඩසටහන් ඔබේ පාසලේ ද ක්‍රියාත්මක වේ නම් ඒ පිළිබඳ ව පාසලේ ඒ ඒ කමිටු නිලධාරීන් කැඳවා වැඩසටහන ගැන සරල ව කරුණු ඉදිරිපත් කිරීමට කටයුතු සැලසුම් කරන්න.

ක්‍රියාකාරකම් 5

- සෙල්ලම් මිදුලට සිසුන් කැටුව යන්න. සෙල්ලම් මිදුලෙහි කළ හැකි ක්‍රීඩා කිහිපයක නිරත වීමට සලස්වන්න. එම ස්ථානයෙහි ප්‍රයෝජනවත් බව සිසුනට පැහැදිලි කරන්න. එම ස්ථානය රැක ගැනීම අපේ යුතුකමක් ලෙස පෙන්වා දෙන්න.
- ක්‍රීඩා පිටියට සිසුන් රැගෙන යන්න. ක්‍රීඩා පිටිය භාවිතය තුළින් අපට ලැබෙන ප්‍රයෝජන පැහැදිලි කරන්න. එය ද රැක ගත යුතු බව පහදා දෙන්න.
- ක්‍රීඩා පිටියේ දී කළ හැකි ක්‍රියාකාරකමක නිරත වීමට සලස්වන්න.
- මේ සඳහා පන්දු භාවිත කරමින් කෙරෙන ක්‍රීඩා කිහිපයක නිරත වීමට අවස්ථාව ලබා දෙන්න. (මධ්‍යම ප්‍රමාණයේ රබර් බෝල වඩාත් උචිතයි)
  1. අතින් බිම දිගේ පන්දුව පෙරළීම සහ නැවැත්වීම. (සහායකයෙකු සමඟ)
  2. තමා ඉදිරියේ සිට ගෙන සිටින සහායකයාට පන්දුව යැවීම සහ ඇල්ලීම.
  3. පන්දුව ඉලක්කයට විසි කිරීම.
  4. පන්දුවට පයින් ගසා ඉදිරියට යැවීම.

  (ක්‍රීඩා පිටියේ ඉහත ක්‍රියාකාරකම් එක ම දිනයේ නොව, දින කිහිපයක දී කිරීමට අවස්ථාව දෙන්න.)

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

ළමා ගී කැසට් පටයේ හරි ලස්සන තාර පැටව් ගීතය උදවු කර ගන්න.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

නිපුණතා :-
- විවිධ ස්ථානවලට සාපේක්ෂ ව තම නිවසේ පිහිටීම ප්‍රකාශ කරයි.
- පවුලේ සමීපතම නෑදැයින් හා නෑදෑ සබඳතා පිළිබඳ තොරතුරු සොයා බලා ප්‍රකාශ කරයි.
- තම නිවසට පැමිණෙන නෑදැයින්, හිතමිතුරන්, අමුත්තන් කෙරෙහි යහපත් ආකල්පයකින් යුතු ව කටයුතු කරයි.
- නිවසේ මූලික අවශ්‍යතා හා ඒවා ලැබෙන ක්‍රම වාර්තා කරයි.
- නිවසට අවශ්‍ය විවිධ ආහාර ද්‍රව්‍ය ගෙවත්තෙන් ලබා ගැනීමට දායක වෙයි.
- නිවසේ පරිසරය පිරිසිදු ව, අලංකාර ව හා ආරක්ෂා සහිත ව තබා ගැනීමට දායක වෙයි.
- නිවසට විවිධ ද්‍රව්‍ය සැපයෙන අයගේ චරිත භූමිකා රංගන ඇසුරින් ඉදිරිපත් කරයි.
- නිවසේ කටයුතු පහසු කර ගැනීමට සහ අලංකාරය සඳහා යොදා ගත හැකි දේ නිර්මාණය කරයි.
- වින්දනාත්මක ව හා සාමූහික වශයෙන් ගෘහස්ත ක්‍රීඩාවල නියැලෙයි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය

ක්‍රියාකාරකම් 1


- සිසුන් පදිංචි නිවාස පිහිටි ස්ථාන පිළිබඳ තොරතුරු එකිනෙකාගෙන් විමසන්න.
- සිසුන්ගේ නිවෙස්වලට ඉදිරියෙන්, පිටුපසින්, දෙපසින් ඇති සුවිශේෂ දේවල් පිළිබඳ ව (ගෙවල්, ගස් වැනි) කතා බහට යොමු කරන්න.
- පාසල අවට පහසුවෙන් දැක ගත හැකි නිවෙස් කිහිපයක වහළය, පොළව සකස් කර ඇති ආකාරය, බිත්තිවල ස්වභාවය, ජනෙල් දොරවල් සකස් කර ඇති ආකාරය පිළිබඳ නිරීක්ෂණයට යොමු කරන්න. තොරතුරු රැස් කිරීමට උපදෙස් දෙන්න. රැස් කර ගත් තොරතුරු සම්බන්ධ ව කතා බහ කරන්න. එහි දී පාසලේ පිහිටීම එහි වටා පිහිටි අනෙකුත් නිවාස/ගස් ..... වැනි දෑ සම්බන්ධ කරමින් ද කතා කරන්න.
  උදා :- අපේ පාසලට ඉදිරියෙන් තැපැල් කන්තෝරුව, පිටුපසින් ගොවිපොළ .... ආදී වශයෙන්
- සිසුන්ට පහසුවෙන් සපයා ගත හැකි විවිධ ද්‍රව්‍ය භාවිත කරමින් කැමැති පරිදි නිවෙස් ආකෘති සකස් කිරීමට සලස්වන්න. නිර්මාණය කරන ලද ආකෘති එකතු කොට කණ්ඩායම් වශයෙන් ගමක ආදර්ශනයක් සකස් කරන්න.
- නිවෙස් ආශ්‍රිත ව කියැවෙන දන්නා හෝ නිර්මාණය කරන ලද කවි, ගී ගායනය කරවන්න.
  ගුවන්විදුලියෙන් ප්‍රචාරය වන ගීත :

  ගුම් ගුම් හඬ දීලා
  හොඳම තැනක් බලලා
  මුං ඇට තරමේ මැටි ගුළි ගෙනල්ල - එකපිට එක තබලා
  රං කුඹලා උළුවස්සේ ඉඳගෙන
  පුංචි ගෙයක් හැදුවා //
  (ගායනය - ශිරෝමාලා ප්‍රනාන්දු)

  බෝල බෝල මැටි එක එක ගෙනෙනවා
  ගුවන් යානයක් වාගේ පියඹා
  උළුවස්සේ පොඩි ගෙයක් හදනවා//
  කා කැන්දන් එන්න ද කුඹලෝ //
  (ගායනය - එම්. එස්. ප්‍රනාන්දු)

ක්‍රියාකාරකම් 2

- තම පවුලේ සිටින අය වාචික ව නම් කිරීමට අවස්ථාව සලස්වන්න.
- පවුලේ සිටින සාමාජිකයන් පිළිබඳ ව තොරතුරු කතා බහ කරන්න. පවුලේ සාමාජිකයන් චිත්‍ර මගින් නිරූපණයට අවස්ථාව සලස්වන්න.
- පවුලේ සාමාජිකයන් අතර ඇති නෑ සබඳතා දැක්වෙන දළ සටහනක් ඉදිරිපත් කරන්න.
  උදා :- මගේ තාත්තාගේ තාත්තා මගේ සීයා. සීයාට මං මුණුපුරා වැනි සබඳතා පහත සටහන මගින් මතු කළ හැකි ය.




ක්‍රියාකාරකම් 3

- නිවෙස්වල කෙරෙන විවිධ වැඩ ඉස්මතු කරන්න. මෙම වැඩ අතුරෙන් එකිනෙකා කරන වැඩ වෙන් ව ඉදිරිපත් කිරීමට සලස්වන්න.
  මෙහි දී තමන් කරන වැඩ ඉදිරිපත් කිරීම කෙරෙහි විශේෂ අවධානය යොමු කරන්න.
- තම තමන්ගේ නිවෙස්වල එකිනෙකා සිදු කරන කාර්යයන් මෙසේ ඉදිරිපත් කිරීමට සලස්වන්න. හැකි හැම අවස්ථාවක දී ම අනික් වැඩවලටත් උදවු කළ යුතු බව ද දැනුවත් කරන්න. සිසුන් පවසන එවැනි අවස්ථා අගයන්න.
- ගෙදර සාමාජිකයකු වැඩ කරන අවස්ථාවක් චිත්‍රයට නැගීමට සලස්වන්න.
- ඉහත වැඩ ආශ්‍රිත ව ගෙදරක කරන වැඩ පිළිබඳ ව කවි, ගී ගායනා කරන්න.
- තම ගෙදරට යන එන අය පිළිබඳ ව විමසන්න. නෑදැයන්, මිතුරන්, අමුත්තන් හා වෙනත් පුද්ගලයන් පිළිබඳ ව කතා බහ කරමින් ඒ ඒ අවස්ථාවල දී පිළිගත් ආකාරය පිළිබඳ ව විමසන්න. මෙහි දී ඔවුන් පිළිගැනීමට වඩාත් සුදුසු ආකාරයන් පිළිබඳ ව ද දැනුවත් කරන්න.
- සෙල්ලම් ගෙයක පසුබිමක් සකස් කර ගෙන ගෙදර සාමාජිකයන් වශයෙන් චරිත නිරූපණය කිරීමට සලස්වන්න. පහත අවස්ථා නිරූපණයන්හි දැක්වෙන පරිදි නිවසට විවිධ පුද්ගලයන් පැමිණි විට ඔවුන් පිළිගන්නා ආකාරය, කතා බහ කරන ආකාරය, සංග්‍රහ කරන ආකාරය පිළිබඳ ව කතා බහේ යෙදෙමින් රංගනයක් කිරීමට යොමු කරන්න.

  උදා :-

  කාලයකට පසු ලොකු මාමා ගෙදර ඇවිල්ලා
  නිවාඩු කාලයේ මිතුරකු මා බලන්න ඇවිල්ලා
  අසනීපයෙන් සිටින තාත්තා බලන්න වැඩපොළෙන් තාත්තාගේ යාළුවන් ඇවිල්ලා
  ආගමික පූජ්‍ය/පූජකවරයෙක් ගෙදර පැමිණිලා

ක්‍රියාකාරකම් 4

- ගෙදරට අවශ්‍ය මූලික දේවල් සහ ඒවා සපයා ගන්නා ස්ථාන පිළිබඳ තොරතුරු ගොනු කිරීමට යොමු කරන්න.

  උදා :

| ගෙදරකට අවශ්‍ය බඩු | සපයා ගන්නා ස්ථාන |
|---|---|
| සහල් | කඩෙන් |
| පොල් | |
| එළවළු | වත්තෙන් |
| පලා වර්ග | |
| දර | කුඹුරෙන් |



Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

- මෙම සටහන සිසුනට ඉදිරිපත් කරමින් ඒ ඇසුරෙන් පහත දැක්වෙන ආකාරයේ ප්‍රශ්න විමසමින් සාකච්ඡා කරන්න.

  වැඩිපුර අවශ්‍ය දේවල් සැපයෙන්නේ කොහෙන් ද?
  කඩෙන් වැඩිපුරම මුදල් දී ගන්නේ මොනවා ද?
  ගෙවත්තෙන් සැපයෙන්නේ මොනවා ද?
  වැඩිපුර මුදල් වැය වන්නේ මොනවාට ද?
  පොළෙන්/කඩෙන් ගෙනෙන සමහර දේවල් අපට ලබා ගත හැකි වෙනත් ක්‍රම ලෙස ඔබ සිතන්නේ මොනවා ද?
  ගෙවත්තේ වවාගත හැකි දේවල් මොනවා ද?

- ගෙදරකට අවශ්‍ය මූලික දේවල් හා ඒවා සැපයෙන ස්ථාන ගැන කියැවෙන කවි, ගී දෙබස් අඩංගු භූමිකා රංගනයක යෙදෙන්න.
- විවිධ ද්‍රව්‍ය යොදා ගනිමින් (මැටි/රෙදි/බ්‍රිස්ටල් බෝඩ්) එළවළු හා පලතුරු වර්ග කිහිපයක් නිර්මාණය කිරීමට සලස්වන්න. එමෙන් ම එළවලු හෝ පලතුරු කෝලාජ් මගින් නිර්මාණය කිරීමට ද යොමු කළ හැකි ය.

ක්‍රියාකාරකම් 5

- තම තමන්ගේ නිවෙස්වල සිදුවෙන වැඩ පිළිබඳ පහත සඳහන් කරුණු ඔස්සේ තොරතුරු සොයා බැලීමට යොමු කරන්න.

  පවිත්‍රතාවය රැක ගැනීම
  කුණු බැහැරලීමට යොදා ඇති ක්‍රම
  මිදුල සහ වත්ත අලංකරණය සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග
  නිවසට ආරක්ෂාව සඳහා යොදා ඇති ක්‍රම (වැටක්/තාප්පයක්/ගේට්ටුවක්, යතුරු යෙදූ දොරවල්)
  නිවස තුළට හිරු එළිය හා වාතාශ්‍රය හොඳින් ලැබීමට දොරවල්, ජනෙල් යොදා ගැනීම


- රැස් කර ගත් තොරතුරු ආශ්‍රයෙන් එක් එක් කරුණෙහි හොඳ/නරක විමසීමට ලක් කරන්න. පාසල සම්බන්ධයෙන් ද මෙවැනි දේ හඳුනා ගැනීමට පාසල් වත්ත නිරීක්ෂණයට අවස්ථාව සලස්වන්න. දුටු හොඳ ලක්ෂණ පවත්වා ගෙන යාමටත් අලුත් හොඳ වැඩ ආරම්භ කිරීමටත් උනන්දු කරවන්න.
- තම නිවෙසට මෙන් ම තම පාසල තුළ ද කළ හැකි කාර්යයන් හඳුනා ගෙන එම කාර්යයන්හි නිරත කරවන්න. හැකිතාක් දෛනික වශයෙන් එම පුරුදුවල යොදවන්න.

  උදා :- කුණු කසල කුණු වළකට දැමීම, මල් පාත්තියක්/එළවළු පාත්තියක් පවත්වා ගැනීම

- මගේ හොඳ වැඩ පොත හි ගෙදර දී මෙන් ම පාසලේ දී කළ හොඳ වැඩක් බැගින් ලිවීමට සලස්වන්න.
- පවිත්‍රතාව හා අලංකාරය ගැන කියැවෙන කතන්දර, දෙබස්, කවි, ගී ගායනයට සහ රංගනයට යොදවන්න.
- අපි හොඳ පුරුදු ඇති කර ගනිමු යන මාතෘකාව යටතේ විවිධ නිර්මාණ සඳහා යොමු කොට ඒවා ඇතුළත් ප්‍රදර්ශනයක් තේමාව අවසානයේ ඉදිරිපත් කිරීමට සැලසුම් කරන්න.

ක්‍රියාකාරකම් 6

- බ්‍රිස්ටල් බෝඩ්, වාර්නිෂ් කඩදාසි (වර්ණ) මගින් නිවසේ අලංකාරයට තැබිය හැකි නිර්මාණයක් කිරීමට අවස්ථාව ලබා දෙන්න. කඩදාසි 2 cm පළල තීරුවලට කපා මෙම රූපයේ දැක්වෙන පරිදි නිර්මාණය කිරීමට උපදෙස් දෙන්න.




Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

- මැහුම් මැසීම සඳහා අවශ්‍ය මූලික අවබෝධයක් ලබා දීමට පහත සඳහන් ක්‍රියාකාරකමෙහි යෙදීමට සලස්වන්න.
- ඉරටු කැබැල්ලක් හෝ ඒහා සමාන වෙනත් ද්‍රව්‍යයක් ගෙන කඩදාසි කොලයක ඉඳි කටුවකින් නූල් අදින ආකාරයෙන් සිදුරු කරන්න.
- තුඩ මොට්ට ඉඳි කටුවක් ගෙන (ටැපැස්ට්‍රි නීඩ්ල්) ඒ ආකාරයෙන් ම කඩදාසි කොළයක නූල් අදින්න.
- ගෝනි කැබැල්ලක් හෝ ඒහා සමාන ව නූල් තරමක් දුරින් පිහිටා ඇති රෙදි කැබැල්ලක් ගෙන තුඩ මොට්ට ඉඳිකටු යොදා ගනිමින් නූල් අදින්න.

ක්‍රියාකාරකම් 7

- පළමුවන ශ්‍රේණියේ දී ද නිවසේ දී කළ හැකි ක්‍රීඩාවන්හි නිරත වූ බව සිසුන්ට මතක් කර දෙන්න. ඒවා නැවත කළ හැකි නම් අවස්ථාව සලස්වන්න. කළ හැකි වෙනත් ක්‍රීඩා පිළිබඳ ව ද විමසන්න.

උදා :- කොටු 9 ක් සහිත පෙතක් සකස් කර ගන්න. වර්ණ දෙකක හෝ වර්ග දෙකක ඇට වර්ග (ඉත්තන්) භාවිත කර, සිසුන් යුගල කර ක්‍රීඩා කිරීමට අවස්ථාව සලස්වන්න. එක් සිසුවෙක්ට වරකට එක් අවස්ථාව බැගින් ලබා ගනිමින් පෙතෙහි ඉත්තන් ඇඳීමට උපදෙස් දෙන්න. සිසුන් දෙදෙනා මාරුවෙන් මාරුවට ඉත්තන් තබා අවසන් වූ පසු තම ඉත්තන් එක් පේළියට සිටින සේ පෙළ ගැසෙන තුරු යා බද කොටුවලට අදිමින් ක්‍රීඩාවේ යෙදීමට උපදෙස් දෙන්න. මුලින් ම ඉත්තන් එක් පෙළකට අදින සිසුවා ජයග්‍රාහකයා වේ.



මෙහි ඉදිරිපත් වන්නේ පෙතෙහි තබන ලද වර්ග දෙකෙකින් යුක්ත ද්‍රව්‍ය වේ. එහි ඕනෑම දිශාවකට එකම ද්‍රව්‍ය පේළියට තැබීම ජයග්‍රහණය ලෙස පිළිගැනේ. මෙවැනි තවත් ක්‍රීඩා නිර්මාණය කර සිසුන් ඒ සඳහා යොමු කරන්න.

ළමා ගීත කැසට් පටයේ පාට පාට මල් ,
මගේ පුංචි බලු පැටියා, හරි ලස්සන තාර පැටව්,
පාතිමායි තංගමනියි මායි යන ගීත උදවු කර ගන්න.



Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

නිපුණතා :-

- විවිධ ලක්ෂණ අනුව අවට පරිසරයේ සිටින සතුන් කාණ්ඩ කර වාර්තා කරයි.
- සතුන්ගේ පැමිණීම හා හැසිරීම ආදි ක්‍රියාවන්ට දවසේ කාලය අතර සම්බන්ධතාවක් ඇත් දැයි විමර්ශනය කර වාර්තා කරයි.
- සතුන් හා ගස්වැල් අතර ඇති අන්තර් සම්බන්ධතාවය පිළිබඳ ව විමසිලිමත් ව තොරතුරු රැස් කරයි.
- සතුන්ට ආවේණික චර්යා ඇසුරෙන් දෛනික ජීවිතයේ දී මිනිසාට ප්‍රයෝජනවත් වන චර්යා විමසා බලා අදහස් ඉදිරිපත් කරයි.
- නිර්මාණාත්මක ව සත්ත්ව චර්යා නිරූපණය කරයි.
- විවිධ ද්‍රව්‍ය භාවිත කරමින් සත්ත්ව ආකෘති නිර්මාණය කරයි.
- සතුන් හා සම්බන්ධ නිර්මාණාත්මක ක්‍රීඩාවල නියැලෙමින් වින්දනයක් ලබයි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය

ක්‍රියාකාරකම් 1

- සතුන්ගේ හැසිරීම් පහසුවෙන් නිරීක්ෂණය කළ හැකි පිට්ටනියක්, ගෙවත්තක්, ලඳු කැලෑවක්, කුඹුරක් වැනි ස්ථානයකට සිසුන් කැටුව යන්න. ඔවුන් කණ්ඩායම් කිහිපයකට බෙදන්න. කණ්ඩායම් නායකයකු බැගින් පත් කරන්න. පන්තියෙන් පිටතට යාමට පෙර ඒ ඒ කණ්ඩායම විසින් නිරීක්ෂණය කළ යුතු දේ සරල ව පැහැදිලි කරන්න.
- නියමිත වේලාවක් තුළ තෝරා ගත් භූමියේ හැසිරෙන හා එහි පැමිණෙන සතුන් පිළිබඳ තොරතුරු නිරීක්ෂණ ඇසුරෙන් රැස් කිරීමට යොමු කරන්න.

  උදා :-

  පැමිණෙන සත්ත්ව වර්ග
  එක් එක් වර්ගයෙන් දක්නට ලැබෙන සතුන් සංඛ්‍යා
  ඔවුන්ගේ ශරීරවල පාට
  තනි වශයෙන් හෝ ජෝඩු වශයෙන් හැසිරෙන සතුන්
  කණ්ඩායම් වශයෙන් හැසිරෙන සතුන්
  පැටවු සමඟ හැසිරෙන සතුන්
  ඔවුන් නගන විවිධ ශබ්ද
  එක් සත්ත්ව වර්ගයක් තවත් සත්ත්ව වර්ගයකින් ප්‍රයෝජන ගන්නා අවස්ථා (උදා: ගවයින්ගේ ශරීරවල සිටින කිනිතුල්ලන් ආහාරයට ගන්නා කුරුල්ලන්)
  එක් සත්ත්ව වර්ගයක් තවත් සත්ත්ව වර්ගයක් හමු වූ විට දක්වන ප්‍රතිචාර (උදා : කැමැත්තක් පෙන්වයි ද, අකමැත්තක් පෙන්වයි ද? ප්‍රතිචාරයක් නොදක්වයි ද ආදී වශයෙන්)
  එසේ ප්‍රතිචාර දක්වන ක්‍රම සහ එසේ ප්‍රතිචාර දැක්වීමට හේතු
  ආහාර ගැනීමේ ක්‍රම

- රැස් කර ගත් තොරතුරු වාචික ව, අභිනය, ශබ්ද අනුකරණ, චලන ක්‍රියාකාරකම් ආදිය මඟින් පන්තියට ඉදිරිපත් කිරීමට සලස්වන්න.
- සතුන්ගේ හැසිරීම් රටා අනුකරණය කරමින් කවි, ගී, සින්දු ගායනය කිරීමට සලස්වන්න.
- තමන් දුටු සතුන්ගේ රූප ඇඳීමට හා පාට කිරීමට සලස්වන්න.
- දකින ලද සතුන් කිහිප දෙනකුගේ ආකෘති නිර්මාණයට යොමු කරන්න. කඩදාසි, මැටි.... වැනි දේ මේ සඳහා භාවිත කළ හැකි ය.
- පාසල් කාලයෙන් පසු නිවසේ දී පහත කරුණු නිරීක්ෂණයට උපදෙස් දෙන්න.

  වර්ෂාව, අධික හිරුඑළිය ආදී විවිධ දේශගුණික වෙනස්වීම්වල දී සතුන් හැසිරෙන ආකාරය
  ගිනි ගොඩක් ගැසූ විට අවට සිටින සතුන්ගේ හැසිරීම
  දවසේ සවස් භාගයේ, රාත්‍රියේ සහ පාන්දර එළිමහනට එන සතුන්
  පැටවුන් සමග හැසිරෙන ආකාරය

- නිරීක්ෂණය කළ කරුණු පසු දිනක පන්තියට විවිධ අයුරින් වාර්තා කිරීමට යොමු කරන්න.



Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

ක්‍රියාකාරකම් 2

- පෙර සඳහන් කර ඇති ස්ථානවලට අමතර ව ගොවිපොළකට ද සිසුන් කැඳවා ගෙන යා හැකි නම් වඩාත් සුදුසු ය.
  තම ප්‍රදේශයේ සිටින සතුන් වර්ග කිහිපයක් ආහාර ගන්නා ආකාරය නිරීක්ෂණය කිරීමට යොමු කරන්න.
  උදා :
  ගවයා/එළුවා/මී ගවයා
  සමනලයා/මී මැස්සා
  බට්ටිච්චා/ පැණි කුරුල්ලා/ලේනා/ගිරවා/රිලවා/වඳුරා
  මසුන්
- මොවුන් ආහාරය සඳහා සොයා එන ගස්වැල් සහ ආහාරයට ගන්නා ගස්වැල්වල කොටස් (උදා : පත්‍රය/මල) හඳුනා ගැනීමට යොමු කරන්න.
- ඔවුන් ආහාර ගැනීම නිසා ගස්වැල්වලට හානියක් වේ ද? යහපතක් වේ ද? යන වග සොයා බැලීමට උනන්දු කරවන්න.
- ගස්වැල්වල නිවාස තනන සතුන් පිළිබඳ තොරතුරු රැස් කිරීමට උපදෙස් දෙන්න. (උදා :- මී වද, ලේන් කූඩු, දිම් ගොටු, කුරුලු කූඩු ආදිය)
- පන්තියට සත්ත්ව කූඩු රැගෙන ඒම හෝ අවදානම් ස්ථානවල සාදා ඇති සත්ත්ව කූඩු නිරීක්ෂණය කිරීම හෝ අපේක්ෂා නොකෙරේ.
- ගස් බෙනවල ජීවත් වන සහ ගස්වැල් මත ලැගුම් ගන්නා සතුන් නිරීක්ෂණය කිරීමට සලස්වන්න. ඒ ඒ සතුන් තෝරා ගන්නා විශේෂ ගස් පිළිබඳ ව කතා බහ කරන්න.
- සමහර සතුන් ආරක්ෂාව සඳහා ගස්වැල් සොයා ගෙන එන අවස්ථා පිළිබඳ ව සොයා බැලීමට සලස්වන්න. (උදා :- බල්ලෙක් පූසෙකු ලුහුබඳින විට)
- සමහර සතුන් ගස්වැල්වල වර්ණය හා හැඩය ගෙන සතුරන්ගෙන් බේරීමට සැඟවෙන ආකාරය (උදා :- කටුස්සා/ දෙහි කොළයා) සොයා බැලීමට සලස්වන්න.
- ගස්වැල්වලට සතුන්ගෙන් ලැබෙන ප්‍රයෝජන පිළිබඳ ව සොයා බැලීමට යොමු කරන්න.
  උදා :- පොහොර ලබා දීම (ගවයා)
  ගස්වැල්වලට හානි කරන සතුන් අල්ලාගෙන කෑම (බත්කූරා, ගෙම්බා)
- සතුන්ගෙන් ගස්වැල්වලට හානි සිදු වන අවස්ථා හඳුනා ගැනීමට සලස්වන්න.
  උදා :- ගෙඩි කොළ හා මල් ආදිය කා දැමීම
  ගස්වැල් කඩා බිඳ දා විනාශ කිරීම (වඳුරා/අලියා)
- හානියට ලක් වී ඇති ගස්වැල් වර්ග, හානි කළ සත්ත්ව වර්ගය පිළිබඳ තොරතුරු කතා බහ කරන්න. සතුන්ගෙන් හානි වූ ගස්වැල්වල කොටස් රැස් කරවන්න. හානි වැළැක්වීමට වැඩිහිටියන් කරන දේවල් සොයා බැලීමට යොමු කරන්න.
- එක් එක් කණ්ඩායම රැස් කර ගත් තොරතුරු පන්තියට ඉදිරිපත් කරවන්න. මේ සඳහා විස්තර කිරීම්, ප්‍රදර්ශන, සාකච්ඡා, පැන විසඳුම්, අභිරූපණ හා චිත්‍ර යොදා ගත හැකි ය. එකතු කර ගෙන ආ සතුන් කා දැමූ ගස්වැල්වල කොටස් ආදිය මෙහි දී ප්‍රයෝජනයට ගත හැකි ය.
- සමනලයන්, මී මැස්සන් හා මල් අතර දෙබසක් නිර්මාණය කරවන්න. මෙය රංගනයක ආකාරයට ඉදිරිපත් කළ හැකි ය.

ක්‍රියාකාරකම් 3

- සිසුන්ගේ අත්දැකීම් ඇසුරු කර ගෙන පරිසරයේ සතුන් තුළ දක්නට ලැබෙන යහ පුරුදු මොනවා දැ යි මතු කර ගැනීමට සාකච්ඡාවක් මෙහෙයවන්න.
- පළමු ව සතා ගැන සිහිපත් නොකොට, සමහර සතුන්ට සුවිශේෂ වූ හොඳ පුරුද්දක් පැවසීමට අවස්ථාව ලබා දෙන්න. එම පුරුද්ද ඇති සතුන් කවුරුන් ද යන්න සිසුන්ගෙන් විමසන්න.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

උදා :-

| හොඳ පුරුද්ද | සතා |
|---|---|
| උදෑසන අවදිවීම | කුකුළා |
| පිරිසිදුකම | බළලා |
| නායකයකු අනුගමනය කිරීම | ගවයා |
| කණ්ඩායමක් හැටියට හැසිරීම | කුඹියා |
| අවශ්‍ය ද්‍රව්‍ය රැස් කර ගැනීම | මී මැස්සා |

- සතුන්ගේ යහ පුරුදු මතු කෙරෙන අන්දමේ කතන්දර සිසුන්ට කියා දෙන්න. මේවා අතීත කතා හෝ වර්තමාන සමාජයේ අත්දැකීම් මත සකස් කර ගත් සිද්ධි හෝ විය හැකි ය.
- සතුන් තුළ දක්නට ලැබෙන හොඳ පුරුදු අගය කිරීමට යොමු කරන්න.

  උදා :- පිරිසිදුකම
  එකමුතුකම
  උදෑසන අවදි වීම
  දරු සෙනෙහස
  ඉවසීම
  නායකත්වය
  කීකරුකම ආදී හොඳ පුරුදු පිළිබඳ ව කතා බහ කරන්න.
- අප තුළ ඇති හොඳ පුරුදු මොනවා දැ යි සිසුන්ගෙන් විමසන්න.
- එම ගුණාංග අතුරෙන් ඔබ තුළ තිබෙන ඒවා මොනවා ද? ඔබ විසින් තව දුරටත් දියුණු කර ගත යුතු ඒවා මොනවා ද? වශයෙන් යහපුරුදු වර්ධනය සඳහා උනන්දු කරවන්න.
- සතුන්ගේ හොඳ පුරුදු කියවෙන කවි ගී ඉදිරිපත් කරන්න.
- හොඳ පුරුදු දැක්වෙන කතන්දරයක් රඟ දැක්වීමට යොමු කරන්න.
- සතුන් ආශ්‍රිත ව නිර්මාණය කර ගත් ක්‍රීඩාවකට යොමු කරන්න.
  මේ සඳහා සිසුන් කණ්ඩායම් දෙකකට බෙදන්න. ඉන් එක් පිරිසක් නරි ලෙස ද (අඩු සංඛ්‍යාවක්) අනෙක් කොටස කුකුළන් ලෙස ද නම් කරන්න. කුකුළන් ලෙස ළමුන් වැඩි පිරිසක් යොදා ගෙන ක්‍රීඩාව මෙසේ අරඹන්න. කුකුළන් ලෙස නම් කරන ලද සිසුන් කෑම සොයා ගෙන නැවත වාසස්ථානයට යන අයුරු අනුකරණයට උපදෙස් දෙන්න. එහෙත් අතර මග නරි සැඟ වී සිටිය හැකි බවත් ඔවුන්ගෙන් බේරී කෙසේ හෝ වාසස්ථානයට පැමිණිය යුතු බවත් පවසන්න. වාසස්ථානය ලෙස තරමක් ඈතින් අඳින ලද කොටුවක් වෙන් කරන්න. නරීන්ට එම සීමාව තෙක් පමණක් පැමිණිය හැකි බවත් එම සීමාවෙන් (කොටු කරන ලද සීමාව) පිටත දී පමණක් කුකුළන් අල්ලා ගත හැකි බවත් නරින් ලෙස ක්‍රීඩාවෙහි යෙදෙන සිසුන්ට උපදෙස් දෙන්න. අල්ලා ගන්නා සෑම කුකුළෙක් ම ඊළඟ අවස්ථාවේ නරින් බවට පත් විය යුතු ය.
- සෑම ශිෂ්‍යයකුම මෙම අවස්ථා දෙකට ම ඉදිරිපත් කරවන්න. ක්‍රීඩාවෙහි නිරත වන අතර එම සතුන්ගේ හඬවල් ද අනුකරණය කිරීමට උපදෙස් දෙන්න.

ළමා ගීත කැසට් පටයේ කුඹි යාළුවෝ,
සමනලයෝ මේ අහන්න, අන්න ඇවිල්ලා නීල කොබෙයියා
සිරිපා වඳින්න යමු ගීත උදවු කර ගන්න

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

නිපුණතා :-

- ගලායන ජලයේ ක්‍රියාකාරීත්වය පිළිබඳ විමර්ශනය කර වාර්තා කරයි.
- ජලයෙන් ගත හැකි ප්‍රයෝජන අත්හදා බලමින් ඒ පිළිබඳ අදහස් ප්‍රකාශ කරයි.
- තම ආරක්ෂාව පිළිබඳ සැලකිලිමත් වෙමින් තැනකින් ජලය ඉවත් කිරීමේ විවිධ ක්‍රම ආදර්ශනය කරයි.
- ගලායන ජලයෙන් ක්‍රියාකරවිය හැකි විවිධ උපකරණ සාදයි.
- වින්දනය සඳහා ජලය ඇසුරින් ශබ්ද හා නාද නිර්මාණය කරයි.
- ජලය භාවිත කරමින් කළ හැකි ක්‍රීඩා කිහිපයක නියැලෙයි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය

ක්‍රියාකාරකම් 1

- කෙසෙල් කඳකින් වෙන් කර ගන්නා කෙසෙල් පතුරු වැනි වතුර පහසුවෙන් ගලා යැවිය හැකි දෙයක් හෝ වැහිපීලි, ප්ලාස්ටික් බට, තරමක් ලොකු වතුර බඳුන් කිහිපයක් හා හිස් බඳුන් කිහිපයක් ද සොයා ගන්න.
- ආරක්ෂිත එළිමහන් තැනකට මෙම ද්‍රව්‍ය ද සමඟ සිසුන් කැටුව යන්න.
- කණ්ඩායම්වලට පීලි ද වතුර ද හිස් බඳුන් ද දී ස්ථාන කිහිපයක වැඩ කිරීමට සලස්වන්න.
- පීලිවලට වතුර දැමූ විට සිදු වන දේ නිරීක්ෂණය කර වාචිකව හා චිත්‍ර මගින් වාර්තා කිරීමට සලස්වන්න.
- පීල්ලේ එක කෙළවරකින් මදක් ඔසවා සිදු වන දේ නිරීක්ෂණය කර ප්‍රකාශ කිරීමට සලස්වන්න.
- ජල බඳුනක් තුළට පා වෙන ද්‍රව්‍යයක් (කඩදාසි ගුළි/රිජිෆෝම් කැලි වැනි) දමා සිදු වන දේ වාර්තා කිරීමට සලස්වන්න.
- බර, හැඩය වැනි විවිධ ගුණාංග වෙනස් කරමින් ද්‍රව්‍ය දැමීමටත් සිදු වන දේ වාර්තා කිරීමටත් සලස්වන්න.
- උස් තැනක සිට පහත් තැනකට ජලය ගලා යන බව නිරීක්ෂණය කර ඒ පිළිබඳ සාකච්ඡා කරන්න.
- ජලය ගලා යන මග තිබෙන දේවල්වලට සිදු වන දේ කෙරෙහි ද අවධානය යොමු කරන්න.
- ගලා යන ජලයට විවිධ දේවල් දමා සිදු වන දේ නිරීක්ෂණය කර වාර්තා කිරීමට සලස්වන්න.
- අලුත් යමක් සොයා ගත් කණ්ඩායම් කරා සෙසු කණ්ඩායම්වල සිසුන් ද කැඳවා නිරීක්ෂණය කිරීමටත්, නැවත එම දේ, සිය කණ්ඩායම තුළ අත්හදා බැලීමටත් අවස්ථාව සපයන්න.
- ගලා යන ජලයේ දිය බඹරයක් කරකවා බැලීමට සලස්වන්න. දිය බඹර (දිය රෝද) විවිධ ක්‍රමවලට සැදිය හැකි ය. ඒ සඳහා අවස්ථා සපයන්න.
- ගලා යන ජලයෙන් ගන්නා ප්‍රයෝජන පිළිබඳ ව සොයා බැලීමට යොමු කරන්න. සෘජු අත්දැකීම්, රූපවාහිනී, ගුවන්විදුලි, පොත් පත් වැනි මාධ්‍යයන්ගෙන් හා වැඩිහිටියන්ගේ අත්දැකීම් ඇසුරෙන් ද තොරතුරු රැස් කිරීමට උපදෙස් දෙන්න. දින කීපයක දී සොයා ගත් තොරතුරු ප්‍රකාශ කිරීමට අවස්ථාව දෙන්න.
- බිත්ති පුවත් පතක් හෝ පුවරුවක් සකසා පින්තූර, චිත්‍ර, රූප, අසා ලියා ගත් තොරතුරු වැනි දෑ ප්‍රදර්ශනය කරන්න.

ක්‍රියාකාරකම් 2

- පිරිසිදු සුදු රෙදි කැබලි කිහිපයක් ගෙන විවිධ දේවල් (අත්වල කුණු, හුණු, නිල්, විවිධ තීන්ත වර්ග, පිටි, පොල් තෙල්, භූමිතෙල්, සබන්, කහට වර්ග, කොහොල්ලෑ, ගස්වල කිරි වර්ග, දැලි, දූවිලි) එක් එක් රෙදි කැබැල්ලක තවරන්න.
- විනිවිද පෙනෙන සුදු ප්ලාස්ටික් බඳුන් හෝ හිස් බෝතල් කිහිපයකට වතුර ගෙන ඉහත රෙදි කැබලි එක් එක් බඳුනට වෙන වෙන ම දමා සිදු වන දේ නිරීක්ෂණය කර වාර්තා කිරීමට සලස්වන්න.
- ජලය කලතන්න. බෝතලයක නම් කට වසා බෝතලය සෙලවිය හැකි ය. සිදු වන දෑ නිරීක්ෂණය කිරීමට සලස්වන්න.
- නැවතත් රෙදි කැබලි වෙනුවට කඩදාසි කැබලි සමඟ මෙම ක්‍රියාකාරකම කර බැලීමට සලස්වන්න.
  සිදු වන දේ නිරීක්ෂණය කිරීමට සිසුන් යොමු කරන්න.
  බඳුන් ටික වෙලාවක් නිශ්චල ව තබා වරින් වර දකින දේ වාර්තා කිරීමට යොමු කරන්න. පැය කිහිපයකට පසු දකින දේ කුමක් දැයි වාර්තා කිරීමට සිසුනට උදවු කරන්න.
- පහත ආකාර ප්‍රශ්න සිසුන්ට යොමු කරන්න.
  - රෙදි හා කඩදාසි වෙන වෙන ම භාවිත කරමින් ඉහත ක්‍රියාකාරකම කිරීමේ දී දක්නට ලැබෙන වෙනස්කම් මොනවා ද?
  - ජලය මගින් වඩා හොඳින් ඉවත් කළ හැකි දේවල් මොනවා ද?
  - ඉක්මනින්, වඩා හොඳින් ඉවත් කිරීමට කළ හැකි දේ මොනවා ද?



Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

- සබන් කැල්ලක් ජලයේ දිය කර සබන් මිශ්‍ර ජලය සමග එම ක්‍රියාකාරකම නැවත කරන්න. සබන් දිය කරන ප්‍රමාණ පිළිබඳ ව විමසිලිමත් වන්න.
- ද්‍රව්‍ය වෙන් කිරීමේ දී සබන් මිශ්‍ර ජලය හා පිරිසිදු ජලය හැසිරෙන ආකාරය පිළිබඳ ව නිරීක්ෂණ වාර්තා කිරීමට උදවු වන්න.
- ක්‍රියාකාරකම්වලින් පසුව රෙදි කැබලි ජලයෙන් ඉවත් කර, ජලය සහිත බඳුන් දවසක් පමණ නිශ්චල ව තබන්න. නැවත නිරීක්ෂණය කර දකින දෑ වාර්තා කරවන්න.
- කල් තැබීමෙන් පසුව හෝ වෙන් නොවන දේවල් වෙන් කර ගැනීමට ක්‍රම යෝජනා කරන්න. ක්‍රම අත්හදා බැලීමට අවස්ථා සලස්වන්න. පෙරීම මගින් සමහර දෑ වෙන් කර ගත හැකි ය. (පුනීලයකට පුළුන් ටිකක් දමා පෙරීම කළ හැකි ය)
- වෙන් කර ගත හැකි දේවල් හඳුනා ගැනීමට සලස්වන්න.
- දිය වන වර්ණවලින් ඇති ප්‍රයෝජන පිළිබඳ ව අත්දැකීම් ඇසුරෙන් කතා බහ කරන්න.
  ජලයේ දිය වන දේ අපට ප්‍රයෝජනවත් වන අවස්ථා සෙවීමට සලස්වන්න. (පිරිසිදු කිරීම, චිත්‍ර ඇඳීම, බිත්ති පාට කිරීම වැනි)
- චිත්‍ර වර්ණ කිරීම සඳහා විවිධ වර්ණ නිර්මාණය කර ගැනීමට යොමු කරන්න.
  උදා :- කොළ මිරිකාගත් යුෂ, කෙසෙල් පට්ට, ගල් වර්ග, දැව, අඟුරු, පාට හුණු, කහ කුඩු, නිල් කුඩු, කිරිමැටි, බීට්, කැරට් ආදී ශාක කොටස්, පස් වර්ග
- පාට දෙකක් මිශ්‍ර කර, වෙනත් පාටක් සාදා ගැනීමට පහත ආකාරයේ වර්ණ මිශ්‍ර කර බැලීමට යොමු කරන්න.

  රතු + කළු ➔ දුඹුරු          කහ + නිල් ➔ කොළ

  රතු + නිල් ➔ දම්          තද වර්ණ + සුදු ➔ ලා වර්ණ

ක්‍රියාකාරකම් 3


- මේසයක් මත/සිමෙන්ති දැමූ බිමක් මත ස්ථාන දෙකකට ජලය ස්වල්පය බැගින් (තේ හැන්දක ප්‍රමාණයක්) හලන්න. එක ස්ථානයක හැලූ ජලය විසුරුවා ගලා යාමට සලස්වන්න. මෙම අවස්ථා දෙක ටික වේලාවක් නිරීක්ෂණය කිරීමට යොමු කරන්න. පහත ප්‍රශ්න අසමින් ඒ පිළිබඳ ව සාකච්ඡා කරන්න.
    විසිරුණු ජලයට සිදු වූයේ කුමක් ද?
    විසිරුණු නැති ජලයට කුමක් සිදු වේ ද?

  ජලය ගලා යාම, පැතිරී යාම සහ සුළඟේ බලපෑම නිසා ජලය ඉවත් වීම ඉක්මන් වූ ආකාරය හා වේලීම ප්‍රමාද වීමට හේතු කතා බහ කරන්න.
- රෙදිකැබැල්ලක් විවිධ ආකාරයට භාවිත කරමින් කිසියම් තැනක රැඳුණු ජලය ඉවත් කිරීමට යොමු කරන්න. (රෙදිකැබැල්ලෙන් පිස දැමීම, වතුර පොඟවා ඉවතට මිරිකීම, ජලය විසිරුණ තැන රෙදිකැබැල්ල දිග හැර එලා ඇදගෙන යාම ... වැනි)
- සුළඟින් ජලය ඉවත් කිරීමේ සෘජු ක්‍රියාකාරකම් හා ඒ පිළිබඳ නිරීක්ෂණ හා අත්දැකීම් පිළිබඳ ව කතා බහ කරන්න.
      තෙත පා සටහනක් පවන් සලා වේලා ගැනීම.
      තෙත සායම් චිත්‍රයක් ඉක්මනින් වේලා ගැනීමට එහා මෙහා වැනීම
      ලේන්සුවක් සෝදා, පන්ති කාමරයේ එල්ලා තබා සුළඟේ වේලීම.... වැනි

ක්‍රියාකාරකම් 4

- අනුක්‍රමයෙන් අඩුවන හෝ වැඩිවන ලෙසට වතුර දමන ලද සමාන වීදුරු කිහිපයකට ලී කෝටුවකින් තට්ටු කරමින් එකිනෙකට වෙනස් නාද ඇති වීම ආදර්ශනය කර පෙන්වන්න. වීදුරුවල විවිධ ස්ථානවලට තට්ටු කරමින් (උදා : කට, බඳෙහි වතුර ඇති/නැති කොටස්..) නාදය වෙනස් වන අයුරු හඳුනා ගැනීමට යොමු කරන්න.

අනුක්‍රමයෙන් අඩුවන



අනුක්‍රමයෙන් වැඩිවන



6 හෝ 5 ශ්‍රේණියේ සිසුන් මේ සඳහා සහභාගී කර ගත හැකි ය.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

- සිසුන් කණ්ඩායම් කරන්න.

  අනුක්‍රමයෙන් අඩු/වැඩි ජල ප්‍රමාණවලින් යුත් සමාන වීදුරු තුනක් හෝ වැඩි ගණනක් ගෙන ඒවායේ විවිධ ස්ථානවලට ලී කෝටුවකින් තට්ටු කර නැගෙන ශබ්ද හා නාද නිරීක්ෂණයට යොමු කරන්න.

    ලී කෝටුවක් වෙනුවට වෙනත් දෙයකින් (ලෝහ හැන්දක්, ප්ලාස්ටික් පටියක්) තට්ටු කිරීමට සලස්වා වෙනස්කම් හඳුනා ගැනීමට සලස්වන්න.

    අඩු වේගයක සිට  වැඩි වේගයකටත්, වැඩි වේගයක සිට අඩු වේගයකටත් තාලයකට තට්ටු කිරීමට යොමු කරන්න.

  මෙම ශබ්ද හා නාද ඇසුරෙන් තාල තබමින් කවි, ගී ගායනා කිරීමට යොමු කරන්න.

- වීදුරු වෙනුවට සමාන බෝතල් කිහිපයක් භාවිත කර, මෙම ක්‍රියාකාරකම නැවත කිරීමට සිසුන් යොමු කරන්න.
- කට කුඩා බෝතලයකට විවිධ මට්ටමින් ජලය පුරවා, කටට කිට්ටු කර පිඹීමෙන් විවිධ ශබ්ද නිර්මාණය කිරීමට යොමු කරන්න. ඒවා තාලයකට පිඹිමින් වින්දනයක් ලැබීමට සලස්වන්න.
- හැඩය, උස යනාදිය වෙනස් බෝතල්වලට විවිධ උසට ජලය පුරවා, පිඹීමට සිසුන්ට අවස්ථාව දෙන්න. එවිට නිකුත් වන නාදවල වෙනස්කම් හඳුනා ගැනීමට යොමු කරන්න.
- පැන් බටයක්/බීම බටයක් වැනි දෙයක් ගෙන වතුර භාජනයකට ඔබා, කටින් පිඹීමට සලස්වන්න. බුබුළු නැගීම නිරීක්ෂණය කිරීමටත් ඉන් නැගෙන ශබ්දවලට සවන් දීමටත් යොමු කරන්න.

ක්‍රියාකාරකම් 5

- සිසුන් කණ්ඩායම් කිහිපයකට බෙදන්න.
- සෑම කණ්ඩායමකට ම ජලය පිර වූ (එකම ප්‍රමාණයේ) තරමක් විශාල කට කුඩා බෝතලයක් (කණ්ඩායමේ සියලු ම සිසුන්ගේ එකතුවෙන් ජලය පිරවිය හැකි විය යුතුයි) බැගින් ලබා දෙන්න.
- එක් එක් කණ්ඩායමට කුඩා බේසමක්/භාජනයක් ද ලබා දී බෝතලයේ ජලය එයට දැමීමට කියන්න.
- කණ්ඩායම් කරන ලද සිසුන් පේළි වශයෙන් සිටීමට සලස්වන්න.
- එක් එක් පේළියට ඉදිරියෙන් ජලය සහිත බේසම සහ බෝතලය බැගින් තබන්න.
- කුඩා භාජනයක් බැගින් ලබා දී, වරකට එක් සිසුවකු බැගින් දුව විත් තමාගේ කණ්ඩායමට අදාළ ජල බේසමෙන් කුඩා භාජනයට ජලය ගෙන බෝතලය පිරවීමට යොමු කරන්න.
- මෙහිදී කණ්ඩායමේ සියලු ම සාමාජිකයන්ට අවස්ථාව ලබා දෙන්න.
- බේසමේ ඇති ජලයෙන් බෝතලය සම්පූර්ණයෙන් පිරවිය හැකි බැවින් ජලය අපතේ නොයන ආකාරයට ක්‍රීඩාවෙහි යෙදීමට උපදෙස් දෙන්න.
- සම්පූර්ණයෙන් ම බෝතලය පිරවීමට හැකි වූ කණ්ඩායම් ජයග්‍රහණය කරන ලද කණ්ඩායම් වේ.

ළමා ගී කැසට් පටයේ
හරි ලස්සන තාර පැටව්
ගීතය හා පුංචි පුංචි මාළුවෝ
යොදා ගන්න.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

නිපුණතා :

- අවුරුදු සමයේ අවට පරිසරයේ සහ තමන් ජීවත් වන සමාජ පරිසරයේ සිදුවන වෙනස්කම් පිළිබඳ අත්දැකීම් බෙදා හදා ගනියි.
- අලුත් අවුරුදු චාරිත්‍ර වාරිත්‍ර ඉටු කරමින් උත්සවයක් පැවැත්වීමට දායක වෙයි.
- අවුරුදු සමයේ අවට පරිසරයේ දක්නට ලැබෙන සුන්දරත්වය අර්ථවත් වන ගායන, වාදන සහ රංගන ඉදිරිපත් කරයි.
- අන් ආගමිකයන්ගේ අවුරුදු චාරිත්‍ර වාරිත්‍රවලට ගරුත්වයෙන් යුතු ව කටයුතු කරයි.
- අවුරුදු දිනවල සිදුවිය හැකි පොදු අනතුරු හඳුනාගෙන ආරක්ෂාකාරී ව ක්‍රියා කරයි.
- අවුරුදු කාලයේ සිදුවන ජන ක්‍රීඩා කිහිපයක සාමූහික ව නියැලෙයි.
- අවුරුදු කාලවල දී පිළියෙල කෙරෙන කැවිලිවල ආකෘති නිර්මාණය හා අවුරුදු අසිරිය දැක්වෙන චිත්‍ර නිර්මාණය කර ප්‍රදර්ශනය කරයි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය

ක්‍රියාකාරකම් 1

- අවුරුදු සමයේ කාලගුණික ස්වභාවය නිසා තම වටාපිටාවේ හා ප්‍රදේශයේ පෙනෙන වෙනස්කම් සොයා බැලීමටත් නිරීක්ෂණය කිරීමටත් සලස්වන්න. තොරතුරු සාකච්ඡා කරන්න.
    - ගස්වැල්වල මල් පිපීම, පලබර වීම
    - අවුරුදු කාලයේ විශේෂයෙන් දක්නට ලැබෙන මල් හා පලතුරු
    - අවුරුදු කාලයේ දක්නට ලැබෙන පක්ෂීන්
- අවුරුදු සමයේ පාරිසරික ප්‍රබෝධය අලලා රචිත කවි ගී සහ සින්දුවලට සවන් දීමට යොමු කරන්න. සවන් දුන් සමහර ගී කොටස් සිසුන්ට ගායනා කිරීමට ද ඉඩ සලසන්න.

  උදා :- "එරබදු මල් පොට්ටු පොට්ටු
  අවුරුද්දත් කිට්ටු කිට්ටු"
- අවුරුදු සමයේ මුදල් ගනුදෙනු වැඩියෙන් සිදු වන ආකාරය පිළිබඳ ව කතා බහ කර, වටාපිටාවේ ඒ පිළිබඳ ව දක්නට ලැබෙන තොරතුරු රැස් කිරීමට උනන්දු කරවන්න.
    - කුඹුරු වැඩ අවසන් වීම. අස්වනු කපා විකිණීම. වෙනත් බෝග සරුවීම හා ඒවා වෙළෙඳාම. ගොවීන්ගේ අතමිට සරුවීම.
    - මේ කාලයේ අලුත් වෙළෙඳ පොළවල් ඇරඹෙන බව. උදා :- අවුරුදු පොළවල් ඇරඹීම.
    - වෙළෙඳ පොළවල හා වේදිකාවල බඩුමුට්ටු පිරී ඉතිරී තිබෙන බව.
    - අවුරුදු කිට්ටු වන විට මංමාවත් ජනාකීර්ණ වන බව.
- එක් එක් සිසුන්ට එක් වර්ගයක භාණ්ඩ විකුණන වෙළෙන්දෙක් බැගින් ඇඳීමට සලස්වන්න. සිසුන් අඳින ලද චිත්‍ර වර්ණ කර කපා, ලොකු කඩදාසි පසුබිමක උචිත ලෙස අලවා "අවුරුදු පොළ" කණ්ඩායම් චිත්‍ර ගොඩ නැගීමට සලස්වන්න.

  උදා :- රෙදිපිළි වෙළෙන්දෝ/ වළං වෙළෙන්දෝ/ මාළු වෙළෙන්දෝ/පලතුරු වෙළෙන්දෝ/එළවළු වෙළෙන්දෝ/ බැලුන් වෙළෙන්දෝ වැනි චිත්‍ර
- අවුරුදු සමයේ ගෙදර දොර සිදු වන සිදුවීම් අලලා අත්දැකීම් ප්‍රකාශ කිරීමට අවස්ථා සලසන්න. පහත කරුණු මතු වන ලෙස සාකච්ඡාව මෙහෙයවන්න.
    - අවුරුදු සූදානමට ගෙවල්වල සිදු වන වෙනස්කම් පිළිබඳ තොරතුරු

      උදා : ගෙවල් අලුත්වැඩියා කිරීම හා පිරිසිදු කිරීම
      අලුත් ගෘහ භාණ්ඩ ගැනීම
      ආහාර රැස් කිරීම
      රස කැවිලි පිසීම
      අලුත් ඇඳුම් මැසීම
    - අවුරුදු කිට්ටු වන විට පිට පළාත්වල රැකියාවල යෙදෙන අය තෑගි බෝග රැගෙන ගම්බිම්වලට පැමිණීම
    - ඥාති සම්බන්ධතා අලුත් වීම.
- මෙහි සඳහන් අවස්ථාවක් හෝ අවස්ථා කිහිපයක් රංගනයෙන් ඉදිරිපත් කිරීමට යොමු කරන්න.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

ක්‍රියාකාරකම් 2

- පහත සඳහන් කරුණු මතු කරමින් ප්‍රදේශයට අදාළ ව අවුරුදු චාරිත්‍ර වාරිත්‍ර පිළිබඳ ව පිළිසඳරක යෙදෙන්න. මේ සඳහා පාසලට ගමේ වැඩිහිටියකු කැඳවා, සිසුන් ලවා ප්‍රශ්න විචාරමින් කරුණු විමසීමකට අවස්ථාව සලසා දෙන්න.

  මෙහි දී මතු කළ යුතු කරුණු :

  අලුත් ඇඳුම් ඇඳීම
  පුණ්‍ය කාලයේ ආගමික සිරිත් විරිත්
  ලිපගිනි මෙළවීම
  අවුරුදු මේසය හා ආහාර අනුභවය
  ගනුදෙනු කිරීම හා වැඩ ඇල්ලීම
  වැඩිහිටියන්ට බුලත් දී වැඳීම
  හිසතෙල් ගෑම
  විශේෂ අවුරුදු කෑම බීම
  නැගම් යාම (සමහර ප්‍රදේශවල අවුරුදු උදාවට පෙර නැගම් යනු ලැබේ)

- සෙල්ලම් ගෙයක් ආශ්‍රිත ව සිරිත් විරිත් හුරුව ලබා දීමට වැඩ සටහනක් සැලසුම් කරන්න. ඒ සඳහා පළමු ව සූදානම් වීමට කණ්ඩායම්වලට වැඩ කොටස් බෙදා දෙන්න. වැඩ කොටස් කිහිපයක් පහත දැක්වේ.

  තාවකාලික සෙල්ලම් ගෙයක් ගොඩ නැගීම
  සෙල්ලම් ගෙය සැරසීම
  මැටිවලින් අවුරුදු කැවිලි, කෙසෙල් ගෙඩි වැනි දේ නිර්මාණය කිරීම හා කෑම මේසයක් පිළියෙල කිරීම
  චරිතවලට ගැළපෙන ඇඳුම් පැළඳුම් සපයා ගැනීම

- කලින් දැනුවත් වූ කරුණු ඇසුරෙන් සෙල්ලම් ගෙදර අවුරුදු උත්සවය පවත්වන්න. අවශ්‍ය තැන්වල දී යොමු කිරීම් කරන්න.

  පුණ්‍ය කාලය හා ආගමික සිරිත් විරිත්
  අවුරුදු කෑම මේසය
  නැකත් අනුව වැඩ කිරීම

  (මේ කාර්යවල දී 5/6 වන ශ්‍රේණිවල සිසුන්ගේ සහයෝගය ලබා ගත හැකි ය)

- පන්තියේ සිසුන් ගණන වැඩි නම් සෙල්ලම් ගෙවල් කීපයක් වුව ද මේ සඳහා යොදා ගත හැකි ය. සමාන්තර පන්ති කිහිපයක් නම් මෙම වැඩ සටහන තව දුරටත් වර්ණවත් කර ගත හැකි ය.

ක්‍රියාකාරකම් 3

- අවුරුදු සිරිත් විරිත්, කෙළි සෙල්ලම් පිළිබඳ ව සිසුන් සමඟ කතා බහ කරන්න. මේ සඳහා ගුරුවරයා විසින් හෝ පාසලේ වෙනත් ගුරුවරයකු ලවා හෝ එම කාර්යය කිරීමට ඉඩකඩ සලසා ගන්න.
- සිසුන් විසින් ඇසිය යුතු කරුණු හා ආචාරශීලී ව ඒවා විමසන අයුරු පිළිබඳ ව කලින් දැනුවත් කරන්න. හැකි නම් ස්තුති කිරීමට යොමු කරන්න.

  පැරණි සිරිත් විරිත් කිහිපයක්

  ගනුදෙනු කිරීමේ දී - ළිඳ සමඟ කරන ගනුදෙනු
  (නැකතට ධාන්‍ය/කුළුබඩු/අගුරු/මල්/ආදිය ළිඳට දමා පැන් කළයක් ගැනීම)
  වැඩ ඇල්ලීම - කිරි ගහකට පිහියකින් කොටා වත්තේ පිටියේ වැඩක් ඇරඹීම
  හිසතෙල් ගෑම - දීර්ඝායුෂ පාඨ කීම
  කළු කපුටා සුදුවන තුරු - මෝල් ගහේ දලු ලන තුරු
  ගැරඬියාට අං එනතුරු - එකසිය විස්සට දෙසිය විස්සක් ආයුබෝවේවා!

  අනුභවයේ දී ගෙදර ප්‍රධානියා පවුලේ අයට කිරිබත් කැබැල්ලක් කවමින් අවුරුදු කෑම මේසය ඉඳුල් කිරීම.

  ප්‍රධාන අවුරුදු කෑම වේලට හත්මාළුව එකතු කිරීම.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

- අවුරුදු කාලයේ කරනු ලබන පැරණි ක්‍රීඩා කිහිපයක යෙදීමට අවශ්‍ය උපකරණ හා උපදෙස් ලබා දෙන්න.
  උදා :- වළකපු ගැසීම.
  පංච දැමීම.
  එළුවන් කැම.
  - පළමු වන ශ්‍රේණිය හා දෙවන ශ්‍රේණිවල සිසුන්ගේ සහභාගිත්වය ඇති ව, දිනක අවුරුදු ක්‍රීඩා උත්සවයක් සංවිධානය කරන්න. මෙහි දී සිසුන්ට කළ හැකි ක්‍රීඩා හැකිතාක් යොදා ගන්න. අවශ්‍ය නම් දෙමාපියන්ගේ සහාය ලබා ගත හැකි ය.

ක්‍රියාකාරකම් 4

- අවුරුදු දිනවල සිදු වන අනතුරු පිළිබඳ ව තොරතුරු රැස් කිරීමට සිසුන් උනන්දු කරවන්න. අවුරුදු සමයේ යෙදෙන ක්‍රීඩාවල දී සහ විශේෂයෙන් රතිඤ්ඤා පත්තු කිරීම නිසා සිදු වන අනතුරු ගැන අවධාරණය කරන්න. ගුවන්විදුලිය, රූපවාහිනිය මගින් දෙන තොරතුරු හා උපදෙස්ද, දෙමව්පියන්ගෙන් හා අසල්වැසියන්ගෙන් ප්‍රදේශයේ සිදු වන අනතුරු සම්බන්ධ සිද්ධිද, අසා පන්තියේ දී ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න. ඒවා පිළිබඳ ව කතා බහ කරන්න. අනතුරුවලින් වැළකීමට කළ යුත්තේ කුමක් ද යන්න ද කතා බහ කරන්න.
- එවැනි අවස්ථා/සිද්ධි චිත්‍ර මගින් ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දෙන්න.

ක්‍රිස්තියානි, කතෝලික හා මුස්ලිම් සිසුන් ඉගෙන ගන්නා පාසල් සඳහා මෙම $අවුරුදු කාලය තේමාව වෙනුවට එහි දී අපේක්ෂා කරන නිපුණතා ලබා දිය හැකි වන අයුරින් එම ආගමික හා සංස්කෘතීන්ට අනුකූල වූ උත්සවයක් අලලා ක්‍රියාකාරකම් සංවිධානය කරගන්න.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

ළමා ගී කැසට් පටයේ
අවුරුද්දට හැන්ද නටයි
ගීතය උදවු කර ගන්න.

නිපුණතා :-

- දවසේ විවිධ අවස්ථාවල දී අහසේ හා අවට පරිසරයේ සිදුවන වෙනස්කම් විමර්ශනය කර වාර්තා කරයි.
- වින්දනාත්මක ව අත්හදා බලමින් සුළඟ උපයෝගී කර ගෙන ද්‍රව්‍ය අහසේ පා කරයි.
- හිරු එළිය එදිනෙදා කටයුතු සඳහා ප්‍රයෝජනවත් වන ආකාරය විමසා බලා වාර්තා කරයි.
- අධික හිරු එළිය නිසා වන පීඩාවලින් මිදීමේ ක්‍රියාමාර්ග අනුගමනය කරයි.
- අහසේ චමත්කාරය අගයමින් කවි, ගී ගායනා, රංගන හා කතන්දර ඉදිරිපත් කරයි.
- විවිධ මාධ්‍ය භාවිත කරමින් අහසේ චමත්කාරය දැක්වෙන නිර්මාණ කරයි.
- අවකාශය භාවිත කරමින් ක්‍රීඩාවල නිරත වෙයි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය

ක්‍රියාකාරකම් 1

- අහස, ඉර, සඳ, තරු ආදිය පිළිබඳ තමන් දන්නා කවි, ගීත ඉදිරිපත් කිරීමට සිසුන් යොමු කරන්න. වින්දනාත්මක ව ගායනා කිරීමට සලස්වන්න. ඔබ විසින් තෝරා ගත් කවි,ගීත ද ඉදිරිපත් කරන්න.

  උදා :-

  සමන් පිච්ච මල් ඉහිරුණු
  නිල් තණ කොළ පිට්ටනියක්
  වගෙයි අහස අන්න බලනු
  කොච්චර ලස්සන ද රෑට
  (එස්. මහින්ද හිමි)

- රාත්‍රිය ළඟා වන හා නිමා වන අවස්ථාවල දී අහසේ හා අවට පරිසරයේ සිදු වන දේ සොයා බැලීමට සිසුන්ට උපදෙස් දෙන්න. පැහැදිලි අහසක් ඇති රැයක අහස බැලීමට යොමු කරන්න. මෙහි දී දෙමාපියන්ගේ සහාය අවශ්‍ය අවස්ථාවලදී ලබා ගැනීමට උපදෙස් දෙන්න. පහත කරුණු කෙරෙහි සිසු අවධානය යොමු කරන්න.

  තරු විසිරී තිබූ අයුරු
  තරුවල ස්වභාවය
  වළාකුළු පාවී යන අයුරු
  වළාකුළු හැඩතල හා ස්වභාවය
  අහසේ පියාසර කරන පක්ෂීන් (වවුලෝ, කපුටන්, ලිහිණි, කොක්කු ආදී)

- නිරීක්ෂණ වාර්තා කිරීමට පසු දින අවස්ථාව සලසන්න.
- රාත්‍රී කාලයේ හැසිරෙන සතුන් ගැන සොයා බලා, එම සතුන් නාද කරන ආකාරය පිළිබඳ ව විමසිලිමත් වීමට උපදෙස් දෙන්න. එම නාද අනුකරණය කිරීමට යොමු කරන්න. එම නාද අනුකරණය කරමින් කරන ක්‍රීඩාවලට යොමු කරන්න.
- සැන්දෑ අහසේ චමත්කාරය චිත්‍රයට නැගීමට යොමු කරන්න.
- රාත්‍රිය නිමා වන හිමිදිරි පාන්දර අහසේ හා අවට පරිසරයේ සිදු වන දේ සොයා බැලීමට යොමු කරන්න.

  මෙහි දී

  ඇඟට දැනෙන සිසිල
  අහසේ පැහැය
  අඳුර යටපත් කරමින් එළිය වැටීම
  පිනි බිඳු වැටීම
  පක්ෂීන්ගේ හැසිරීම සහ කෑගැසීම
  මිනිසුන්ගේ හැසිරීම් රටා

  ආදිය නිරීක්ෂණය කිරීමට උපදෙස් දෙන්න.

  මේ සඳහා ද දෙමාපිය සහාය ලබා ගැනීමට උපදෙස් දෙන්න.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

- සිසුන් රැස් කර ගත් අත්දැකීම් විවිධ අයුරෙන් පන්තියට ඉදිරිපත් කිරීමට සලස්වන්න. මේ පිළිබඳ ව සිසුන් සමඟ කතා බහ කරන්න. සිසුන් දුටු උදේ අසිරිය චිත්‍රයකට නැගීමට යොමු කරන්න. උදේ අසිරිය රංගනයකින් දැක්වීමට යොමු කරන්න. මේ සඳහා වෙස්මුහුණු සාදා ගෙන භාවිතයට ගන්න.
- දහවල් අහසේ ස්වභාවය නිරීක්ෂණය කිරීමට සිසුන් යොමු කරන්න. නිරීක්ෂණය කළ අත්දැකීම් පන්තියට වාර්තා කිරීමට සලස්වන්න. ඒ ඇසුරෙන් සාකච්ඡාවක් කරන්න.
- දහවල් කාලයේ දී හිරු රශ්මිය විවිධ අයුරින් සිරුරට දැනෙන ආකාරය පිළිබඳ ව සාකච්ඡා කරන්න.

  උදා :-

  දැඩි හිරු රැස්
  හිරු වළාකුළට වැසුණ විට
  වැසි අවස්ථාවක
  සුළඟ සමඟ
  ගස් සෙවණක
  ජලාශයක් අසල දී
- ඉහත දක්වා ඇති අවස්ථාවන්ට සිසුන් මුහුණ දෙන අයුරු රංගනයෙන් ඉදිරිපත් කිරීමට යොමු කරන්න.

ක්‍රියාකාරකම් 2

- පාසල් වත්තේ එළිමහන් ස්ථානයකට සිසුන් කැටුව යන්න. අහස දෙස මඳ වේලාවක් බලා සිටීමට යොමු කරන්න. පෙනෙන දේවල් පිළිබඳ ව කතා බහ කරන්න.
- අහසේ පා වී යන/පා කළ හැකි තමන් කැමති දෙයක් සෑදීමට/නිර්මාණය කිරීමට සිසුන්ට නිදහස දෙන්න. අවශ්‍ය දේ පරිසරයෙන් සපයා ගැනීමටත් ඉඩ දෙන්න. ඔවුනට අවශ්‍ය ය යි අනුමාන කරන ද්‍රව්‍ය කීපයක් ඔබත් පසෙකින් තබා ගන්න.

  උදා :- ටිෂූ කඩදාසි/පුළුන්/රබර් පටි/පොල් කොළ/ වෙනත් කඩදාසි/බ්‍රිස්ටල්බෝඩ්
- සිසුන් විසින් සාදන ලද නිර්මාණ අහසේ පා කර යැවීමට ඉඩ දෙන්න. වැඩි කාලයක් අහසේ රැඳුණු දේ ගැන විමසන්න. ඔවුනොවුන්ට ඒ ඒ නිර්මාණ අගය කර ගැනීමට ඉඩ දෙන්න.
- මේ හැරෙන්නට පහත සඳහන් ක්‍රියාකාරකම්වල සිසුන් යොදවන්න.

  සිසුන් දෙදෙනා බැගින් කණ්ඩායම් කර දෙදෙනකුට පුළුන් ස්වල්පයක් බැගින් දී, එය අහසේ පා කිරීමට, කටින් පිඹ හෝ යමකින් පවන් සලා වැඩි වේලාවක් අහසේ රඳවා ගෙන සිටීමට සලස්වන්න.

  සිසු කණ්ඩායම්වලට තුනී පොලිතින් කොළයක් දී, එහි හතර කෙළවර නූල් පොටවල් හතරකට ගැට ගසා එකතු කොට, බරුවක් එල්ලා ගුළි කොට, අහසට විසි කොට පැරෂුට් එකක් ලෙස පා වී යාමට සලස්වන්න.
- පරිසරයේ ඇතැම් ගස්වල කොටස් අහසේ පා වී ගොස් ඈත වැටෙන බව වැනි අත්දැකීම් කතා බහ කරන්න. සුළඟේ පා වී යන ශාක කොටස් පරිසරයෙන් සොයා බැලීමට යොමු කරන්න. සිසුන් රැගෙන එන එවැනි දේ නිරීක්ෂණය කර, අහසේ පා කර යැවීමට ඉඩ දෙන්න.

  උදා :- හොර ගස්වල ගෙඩි
  මොණර කුඩුම්බිය ඇට
  වේළුණු ඉපිල් ඉපිල් කරල්
  ඉද්ද ඇට
  වරා මල්
  ඉලුක් මල් වැනි දෑ
- 6 හෝ 5 ශ්‍රේණිවල සිසුන්ගේ උදවු ඇති ව කණ්ඩායම් වශයෙන් සරුංගල් කිහිපයක් සෑදීමට සලස්වන්න. සෑදූ සරුංගල් අහසේ පා කර යැවීමට උනන්දු කරවන්න.
- සරුංගල් යවන දර්ශනයක් චිත්‍රයට නැඟීමට අවස්ථාව දෙන්න.
- සරුංගලයක් යැවීම, කටින් පිඹිමින් පුළුන් කැල්ලක් බිම නොවැටී අහසේ රඳවා ගැනීම. දෙදෙනෙක් එකතුව බැලුන් බෝලයක් අතින් ගසමින් අහසේ රඳවා ගෙන සිටීම වැනි ක්‍රියාකාරකම් කිහිපයක් අභිරූපණය කිරීමට සිසුන් යොමු කරන්න.
- සිසුන්ට එක තැන සිට යමක් (රබර් බෝල) අහසට (ඉහළට) විසි කිරීමට අවස්ථාව ලබා දෙන්න. වඩා ඉහළ විසි කරන්නේ කවු ද? පියවර කිහිපයක් දිව විත් අත දිග හැර වේගයෙන් අහසට විසි කිරීමට කියන්න.

  බෝලය වඩාත් ඉහළ ගියේ කුමන අවස්ථාවේ දැයි විමසන්න. හේතු අනුමාන කිරීමට යොමු කරන්න.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

- දහවල් සහ රාත්‍රි අහසේ ස්වභාවය/චමත්කාරය/ප්‍රයෝජන අලලා දෙබස් ආශ්‍රිත රංගනයක් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න. මේ සඳහා පන්තියේ සිසුන් දහවල් හා රාත්‍රිය යනුවෙන් කොටස් දෙකකට වෙන් කර තම රංගන ගායනා ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න.

ක්‍රියාකාරකම් 3

- ඉර නොපෑව්වොත් සිදු වන දේ පිළිබඳ ව විවිධ අදහස් ඉදිරිපත් කිරීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- කතා බහ තුළින් අනාවරණය වූ කරුණු ඇසුරෙන් හිරු එළියෙන් අප ලබන ප්‍රයෝජන ඉස්මතු කර ගැනීමට සලස්වන්න.
- හිරු එළියෙන් යම් යම් දේවල් වියළා ගැනීමට ඇති හැකියාව පිළිබඳ ව අවස්ථා කිහිපයක් නිරීක්ෂණය කිරීමට සලස්වන්න. ඒවා වරින් වර නිරීක්ෂණය කර සිදු වන දේ බැලීමට යොමු කරන්න. වාර්තා කිරීමට සලස්වන්න.

  උදා :

  රෙදි කඩක් වතුරේ පොඟවා මිරිකා හැර හිරු එළියේ වේළීම
  කඩදාසි පිටුවක් වතුරේ පොඟවා හිරු එළියේ වේළීම
  ලුණු වතුර ස්වල්පයක් පියනක තබා තද හිරු අව්වේ තැබීම
  පාන් කැබැල්ලක් අව්වේ තබා වේළීම
  කරවිල සිහින් පෙති කීපයක් කපා හිරු එළියේ තැබීම

- මීට අමතර ව පෝෂ්‍ය පදාර්ථ ලැබෙන කාරකයක් ලෙසත්, විෂ බීජ නසන මගක් ලෙසත් හිරුගෙන් ලැබෙන ප්‍රයෝජන සාකච්ඡා කරන්න.
- හිරු එළියෙන් ආවරණය වීමට යොදා ගන්නා ක්‍රම පිළිබඳ ව සාකච්ඡා කරන්න.

  හිරු එළිය තදින් ඇති වේලාවක පයින් ගමන් යෑමේ දී විශේෂයෙන් භාවිතයට ගන්නා දේවල් හා ඒවායින් ඇති ප්‍රයෝජන කතා බහ කරන්න.

  උදා : කුඩ/තොප්පි/වෙනත් ආවරණ

  ඒ සඳහා පැරණි කාලයේ භාවිත කළ දේවල් කතා බහ කරන්න. හැකිනම් පින්තූර යොදා ගන්න.

  උදා : තල් අත්ත, කුඩය, හබරල කොළය, කෙසෙල් අත්ත

  ගස් යට සිටීමෙන් සැර අව්වෙන් වන පීඩා වලක්වා ගැනීමට හැකි බව සාකච්ඡා කරන්න. මෙහි දී සිසුන්ගේ අත්දැකීම් ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න.

- අපතේ යන ද්‍රව්‍ය භාවිත කරමින් පැළඳිය හැකි තොප්පියක් නිර්මාණය කරන්න.

  උදා :

  කොස් කොළ තොප්පිය
  කඩදාසි භාවිත කරමින් සකස් කෙරෙන කාඩ්බෝඩ් තොප්පිය
  කාඩ්බෝඩ් තොප්පිය
  රෙදි තොප්පිය
  පොල් කොළ තොප්පිය

- එය අලංකාර කිරීමට යොමු කරන්න.

ක්‍රියාකාරකම් 4

- සිසුන් එළිමහනට රැගෙන යන්න. රවුමට සිට ගැනීමට උපදෙස් දෙන්න. නැවතීමට සංඥාවක් දෙනතුරු රවුමේ කිහිප වරක් දිවීමට කියන්න. සංඥාවක් දුන් පසු එකතැන උඩ පනින්නට කියන්න. එය කිහිප වතාවක් කළ පසු නැවතීමට සංඥාවක් දෙන්න. නැවත සංඥාවක් දුන් පසු උඩ පනිමින් දෑත් සහ දෙපා එකවර විහිදවීමට කියන්න (තාරකා පිම්ම). එය කිහිප වතාවක් කළ පසු සංඥාවක් දී ක්‍රීඩාව නතර කිරීමට උපදෙස් දෙන්න.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

නිපුණතා :
- ආහාර වේලක අඩංගු දෑ සොයා බලා එහි වැඩිපුරම ඇත්තේ මොනවා දැ යි ප්‍රකාශ කරයි.
- ආහාර වේලක් පිළියෙල කර ගැනීමට ශාකවලින් හා සතුන්ගෙන් ලබා ගන්නා දෑ විමර්ශනය කර වාර්තා කරයි.
- ආහාරවලින් අපගේ ශරීරයේ වර්ධනයට හා ආරක්ෂාවට ලැබෙන විවිධ ප්‍රයෝජන අගය යි.
- ආහාරයක් ලෙසට පලාවර්ගවල ඇති වටිනාකම් පිළිබඳ ව අවබෝධයකින් යුතු ව දෛනික ආහාර වේල් සඳහා පලා වර්ග එකතු කර ගනියි.
- රෝගවලින් වැලකී සිටීමට අවශ්‍ය කරන ආහාර රටා අනුගමනය කරයි.
- ආහාර මෙන් ම සුදුසු පාන වර්ග ද ප්‍රමාණවත් ව ගැනීම පුරුද්දක් කර ගනියි.
- ආහාරවල වැදගත්කම හා යහපුරුදු සෞන්දර්යාත්මක ව ඉදිරිපත් කරයි.
- මනා ශරීර වර්ධනයක් සඳහා යෝග්‍ය ක්‍රියාකාරකම්වල නිරත වෙයි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය

ක්‍රියාකාරකම් 1
- අපේ ආහාර සඳහා ගන්නා දේ අතරින් වැඩි ප්‍රමාණයක අන්තර්ගත වන්නේ පිටි සහිත ආහාර බව ඒත්තු ගැන්වීමට මූලික සාකච්ඡාවක් කරන්න. මේ සඳහා සරල ක්‍රියාකාරකමක යොදවන්න.
  උදා :- ආහාරයට ගන්නා ඇට වර්ග රැස් කර ගන්න. ඒවා පොඩි කර/තළා දැකිය හැකි දේ පිළිබඳ ව විමසන්න.
- අප ආහාරයට ගන්නා ගස්වල විවිධ කොටස් කොටා/පොඩි කර, පිටි නැති හෝ ඇති හෝ බව දැකීමට සලස්වන්න. මෙම අන්දැකීම් පිළිබඳ ව කතා බහ කරන්න.
- අප ආහාර වේලකට සතුන්ගෙන් ලබා ගන්නා දේවල් පිළිබඳ තොරතුරු රැස් කරන්න.
- වෙළෙඳ පොළෙහි ඇති සකස් කළ ආහාර, සතුන්ගෙන් හෝ ගස්වැල්වලින් හෝ ලබා ගන්නා ලද දේවල්වලින් සමන්විත වන බව දැකීමට සලස්වන්න. ආහාර වෙනුවට ඒවායේ ඇසුරුම්/ලේබල් භාවිත කළ හැකි ය.
- ආහාර වේලක් නිරීක්ෂණය කිරීමට යොමු කරන්න. සිසුන් ගෙදරින් ගෙන එන ලද කෑම වේලක් හෝ පාසලේ දී පිළියෙල කරනු ලබන ආහාර වේලක් යොදා ගන්න. ආහාර වේලක අන්තර්ගතය තුළ ප්‍රධාන වශයෙන් පිටි බහුල දෙයක්, ගස්වලින් ගන්නා කොටස් හා සමහර විට මස්, මාළු, කරවල හෝ බිත්තර වැනි දේ ද අඩංගු බව කතා බහෙන් මතු කර ගන්න.
- ආහාර වේලකට ඇතුළත් කළ හැකි පහසුවෙන් වගා කර ගත හැකි දේ පිළිබඳ ව කතා බහ කරන්න.
- ගොටුකොළ, මුකුණුවැන්න, කංකුං වැනි පලා වර්ග පාසල් වත්තේ වැවීමට යොමු කරන්න. ගෙවත්තෙහි ද වගා කිරීමට උනන්දු කරන්න.
- අපගේ ප්‍රධාන ආහාරය වන බත් අපට ලැබෙන ආකාරය පිළිබඳ ව සාකච්ඡා කරන්න. ඒ අනුව බතේ උපත යන්න තේමා කොට ගනිමින් අභිරූපණ රංගනයක් කරන්න. (කුඹුරු කෙටීම, වී ඉසීම, ගොයම් කැපීම, ගොයම් පෑගීම, වී කෙටීම, වී වේලීම, හාල් ගැරීම, බත් පිසීම සහ ආහාරයට ගැනීම දක්වා වූ විශේෂ අවස්ථා මෙහි දී අවධාරණය කරන්න.)


ක්‍රියාකාරකම් 2
- සිසුන්ගේ විවිධ වර්ධන අවස්ථාවල දී ගත් ඡායාරූප තිබේ නම් පන්තියට ගෙන්වා ගන්න. නැතහොත් ඒ සඳහා ළදරු, ළමා, තුරුණු වැනි අවධි දැක්වෙන වෙනත් ඡායාරූප රැස් කර ගන්න. ඒවා නිරීක්ෂණ කරමින් ළමයින් ක්‍රමයෙන් වැඩෙන බව අවබෝධ කර ගැනීමට සිසුන් යොමු කරන්න. පින්තූර ඇසුරෙන් උස හා බර වැඩිවීම පිළිබඳව අදහස් මතු කරන්න.
- පහත සඳහන් ක්‍රියාකාරකම්හි නිරත වීම සඳහා ඇඳීමට උචිත ඇඳුමක් රැගෙන එන ලෙස සිසුන්ට පෙර දිනයේ දී උපදෙස් දෙන්න.
- ඩිමයි කඩදාසි දෙකක් එකට අලවා සකස් කර ගත් විශාල කඩදාසියක් එක් එක් ශිෂ්‍යයා/ශිෂ්‍යයාව සඳහා සපයා ගැනීමට උපදෙස් දෙන්න.
- ගැහැනු ළමුන් හා පිරිමි ළමුන් වෙන වෙනම කණ්ඩායම් කරන්න. මේසයක්/එකතු කළ ඩෙස්ක් කීපයක් හෝ හොඳින් පිරිසිදු කරගත් බිම මත ඩිමයි යුගල කඩදාසිය එලා, වරකට එක් කණ්ඩායමකින් සිසුවෙක් බැගින් ඒ මත උඩු කුරු අතට දිගා කරවන්න. (පාවහන් ඉවත් කිරීම අවශ්‍යයි)



Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

- ශිෂ්‍යයකු කැඳවා බිම එළන ලද කඩදාසිය මත වැතිරී පහත රූපයේ දැක්වෙන පරිදි අත් දෙපසට තබා ඇඟිලි විහිදුවන්නට සලස්වන්න. පා දෙපසට විහිදුවන්නට ද හිස සෘජුව තබා ගන්නට ද උපදෙස් දෙන්න.
- කණ්ඩායමේ අනෙකුත් ශිෂ්‍යයන්ට ඔහුගේ/ඇයගේ ශරීර හැඩය කඩදාසිය මත පැන්සල්වලින් අඳින ලෙස කියන්න.
- මුළු ශරීරයේ ම හැඩය ඇන් ද පසු ශිෂ්‍යයා/ශිෂ්‍යාව කඩදාසිය මතින් ඉවත් කරන්න.
- ශරීරයේ කොටස්වල නම් රූපයේ පසෙකින් ලියන්නට සලස්වන්න.
- අඳින ලද සටහන් පන්ති කාමරයේ ප්‍රදර්ශනය කරන්න. එම රූප සටහන් ඇසුරින් දක්නට ලැබෙන ලක්ෂණ කතා බහ කරන්න.

  උදා :- උස, මහත .... වැනි
- රූප සටහන්වලට පෙනී සිටි සිසුන් පන්තියේ ඉදිරියට කැඳවන්න. ඔවුන්ගෙන් පෙනෙන ලක්ෂණ හා රූප සටහන් පිළිබඳ සිසුන් දැක් වූ අදහස් අතර සමානතා අසමානතා පිළිබඳ ව කතා බහ කරන්න.



- රූප සටහන් ඇසුරින් එක් එක් ශිෂ්‍යයාගේ/ශිෂ්‍යාවගේ ශරීරය වැඩී ඇති ප්‍රමාණය වෙනස් බව පෙන්වා දෙන්න.

ක්‍රියාකාරකම් 3
- පෝස්ටර්, පින්තූර වැනි දේ යොදා ගනිමින් නිතර වැළඳෙන රෝගවලින් වැළකී සිටීමට අනුගමනය කළ යුතු සෞඛ්‍ය පුරුදු හා ඒවායේ වැදගත්කම මතු වන සේ සාකච්ඡාවක් කරන්න. එමෙන් ම සෞඛ්‍ය නිලධාරියෙක් සහභාගී කර ගැනීමෙන් සිසුන් දැනුවත් කිරීමට හැකි නම් ඒ සඳහා අවස්ථාව සලසාගන්න.
- පලතුරු සෝදා කෑම, කෑමට පෙර අත් හොඳින් සෝදා ගැනීම, දත් මැදීම, නෑම, පරිහරණය කරන බඳුන් සුරක්ෂිතව හා පිරිසිදු ව තබා ගැනීම වැනි සෞඛ්‍ය පුරුදු එදිනෙදා ප්‍රායෝගික ව කිරීමට උනන්දු කරවන්න.
- පිරිසිදු අලුත් එළවළු, පලතුරු, පලා වර්ග, කිරි, ආහාරයට ගැනීම නිරෝගී දිවියකට හේතු වන බව පැහැදිලි කර දෙන්න.
- නියමිත වේලාවට ආහාර ගැනීමේ වැදගත්කම මෙන් ම, ප්‍රමාණවත් ලෙස ආහාර හා පාන වර්ග ගැනීම පිළිබඳ ව ද අවධාරණය කරන්න. එමගින් රෝගී වීමෙන් වැළකීමට හැකි වන බව ද පෙන්වා දෙන්න.
- පලා, පලතුරු වර්ග වැනි දෑ අමුවෙන් ආහාරයට ගැනීමෙන් පෝෂණ ගුණය රැක ගත හැකි බව දැනුවත් කරන්න.
- තෝරා ගත් එළවළු සහ පලතුරු කීපයක් නිරූපණය කිරීම සඳහා ආකෘති/වෙස්මුහුණු නිර්මාණය කරන්න. ඒවා යොදා ගනිමින් එහි ගුණය පිළිබිඹු වන සේ සංවාද සහිත රංගනයක යොදවන්න. මේ සඳහා ආහාරවල වැදගත්කම හා ආහාර ගැනීමේ දී පිළිපැදිය යුතු යහ පුරුදු ඇතුළත් කෙටි නාට්‍යයක් නිර්මාණය කර රඟ දැක්වීමට අවස්ථාව ලබා දෙන්න. මේ සඳහා 6/5 ශ්‍රේණිවල සිසුන් ද සහාය කර ගන්න.
- ආහාර වර්ග හා ආහාර පුරුදු පිළිබඳ කියැවෙන කවි, ගී ගායනා කරන්න.

ක්‍රියාකාරකම් 4
- මෙම තේමාව කරන අතරතුර හැකි නම් එක් දිනෙක දිවා ආහාර වේලක් සැපයීමට සැලසුම් කරන්න. කොස් දෙල් වැනි ගෙඩි වර්ග, අල වර්ග සහ පලා වර්ග සපයාගෙන දෙමව්පියන්ගේ/වැඩිහිටියන්ගේ සහාය ඇති ව විවිධ ක්‍රමයට ආහාර වේල පිළියෙල කර ගන්න. කෑමට පෙර ඒවායේ පෝෂණ ගුණය පහදා දෙන්න. පසුව කෑම වේල ගැනීමට සලස්වන්න. දෙමව්පියන් කෑම වේල සකස් කරන තුරු එම කෑම වේලට යොදා ගත් දේවල පෝෂණ ගුණය දැක්වෙන කවි, ගී ගායනා සමඟ රංගන ඉදිරිපත් කිරීමට යොමු කරන්න.



Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

ක්‍රියාකාරකම් 5

- තමන් කැමති මාධ්‍යයක් භාවිත කරමින් (පැස්ටල්/දිය සායම්/කොලාජ්) පලතුරු වෙළෙන්දෙක්/එළවලු වෙළෙන්දෙක්/එළවලු හෝ පලතුරු සහිත ගෙවත්තක් චිත්‍රයට නැගීමට අවස්ථාව සලසන්න. සිසුන් කණ්ඩායම් කිහිපයකට බෙදා එක් කණ්ඩායමකට එක් මාධ්‍යයක් බැගින් භාවිත කරමින් චිත්‍ර ඇඳීමට සැලැස්වීම ද කළ හැකි ය.
- පලතුරු හෝ එළවලු හෝ හැඩ ඇසුරින් මෝස්තර රටා නිර්මාණයට අවස්ථාව ලබා දෙන්න. මේ සඳහා ඝන කඩදාසියකින් පලතුරු/එළවලු හැඩ කපා ගෙන ඒවායේ දාර වටා පැස්ටල් තැවරීමට සලස්වන්න. පසුව එය වෙනත් කඩදාසියක් මත තබා දාරයේ සිට කඩදාසිය මතට ඇඟිල්ලෙන් තෙරපා රටා නිර්මාණයට අවස්ථාව දෙන්න. (ප්ලේට් ක්‍රමය)

ක්‍රියාකාරකම් 6

- මනා ශරීර වර්ධනයක් සඳහා උචිත, ක්‍රීඩා හා ව්‍යායාම් සඳහා අවස්ථා ලබා දෙන්න. පළමුවන ශ්‍රේණියේ දී ව්‍යායාම්වල යෙදුණු ආකාරය මතක් කරමින් නැවත එම ව්‍යායාමවල නිරත වීමට සලස්වන්න. මේ සඳහා සිසුන් එළිමහනේ සුදුසු ස්ථානයකට හෝ ක්‍රීඩා පිටියට රැගෙන යන්න.
- පහත සඳහන් ආකාරයේ ව්‍යායාම්වල ද නිරත වීමට සලස්වන්න.

එකතැන දිවීම (සෙමෙන් හා වේගයෙන්)

රේඛාවක් ඇඳ ඒ මත දිවීම


මිනිත්තු දෙකක කාලයක් නොනවත්වා දිවීම.

උදා :- පිටියේ සලකුණු කරන ලද විවිධ හැඩතලවල දිවීම.

වේගය අඩුවැඩි කරමින් දිවීම.

දෑත්, අත්ල සහ දෙදණ බිම තබා දණ ගසා, ඉදිරියට හා පසුපසට ශරීරය පැද්දීම.

දෙදෙනා බැගින් මුහුණට මුහුණලා වාඩි වී දෑත් අල්ලා සීසෝ ආකාරයෙන් පැද්දීම.



උඩු අතට වැතිරී දෑත් එක්කර පැදුරක් එතෙන්නාසේ පෙරලීම.



මේ ව්‍යායාම් දින කිහිපයක දී කිරීමට සලස්වන්න.



Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

නිපුණතා :-

- අදහස් හා හැඟීම් නිවැරදි ව ප්‍රකාශ කිරීම සඳහා කටහඬ සහ ඉන්ද්‍රියයන් අදාළ පරිදි යොදා ගනියි.
- තොරතුරු සන්නිවේදනය කිරීම පහසු මෙන් ම වින්දනාත්මක වීම සඳහා කාටූන් චිත්‍ර, ඡායාරූප හා පෝස්ටර් යොදා ගනියි.
- බිත්ති පුවත්පතක් සඳහා තම දායකත්වය ලබා දෙමින් ආශ්වාදයක් ලබයි.
- නිවැරදි තොරතුරු ලබා ගැනීමේ හා ලබා දීමේ හැකියා ප්‍රදර්ශනය කරයි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය

ක්‍රියාකාරකම් 1

- පහත දැක්වෙන ක්‍රියාකාරකම සඳහා සිසුන් නිදහස් තැනකට කැටුව යන්න.
- සිසු කණ්ඩායමේ කැමති සිසුවකු ඉදිරියට කැඳවා, අනෙක් සිසුන් අසනු ලබන ප්‍රශ්නවලට පිළිතුරු දිය යුතු බව පවසන්න. ප්‍රශ්න ඇසීමට අනෙක් සිසුන් යොමු කරන්න.
- පහත දැක්වෙන ආකාරයේ ප්‍රශ්න මෙහි දී විමසිය හැකි ය.

  උදා :- නම මොකක් ද?
  ගම කොහේ ද?
  කෑමට/බීමට වඩාත් ආසා දේ කුමක් ද?
  හැකිනම් වඩාත් කැමති සිංදුවක්/කවියක්/කතාවක්/අත්දැකීමක් ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න.
- සෑම සිසුවකුට ම ප්‍රශ්න ඇසීමටත් පිළිතුරු දීමටත් හැකි වන ලෙස අවස්ථා සලස්වන්න.
- සිසුන්ගේ මුහුණුවලින් හැඟීම් ප්‍රකාශ කිරීමට සුදුසු අවස්ථා සහ අත්දැකීම්, පහත සඳහන් කරුණු යටතේ යොමු කරන්න.

  මේ සඳහා

  දුක හිතුන සිද්ධියක්
  බය දැනුණු සිද්ධියක්
  මිහිරි රසැති කෑමක් කෑ අවස්ථාවක්
  ඇඹුල් සහිත කෑමක් කෑ අවස්ථාවක් ..... වැනි
- එක් එක් අවස්ථාව ඇතුළත් වන පරිදි සැබෑ අත්දැකීම් හෝ නිර්මාණාත්මක ව ගොඩ නගා හෝ එම තොරතුරු මුහුණෙන් හැඟීම් ප්‍රකාශ කෙරෙන පරිදි ඉදිරිපත් කිරීමට සලස්වන්න. අවශ්‍ය තැන ශරීරයේ වෙනත් අංග ද උපයෝගී කර ගැනීමට හැකි නම් වඩාත් උචිත වේ. පසුව සිසුන් කණ්ඩායම් කර මෙවැනි හැඟීම් ප්‍රකාශ වන අත්දැකීම් ඉදිරිපත් කිරීමට එක් එක් කණ්ඩායමක සිටින එක් එක් ශිෂ්‍යයාට පවරන්න.

ක්‍රියාකාරකම් 2

- 6 හෝ 5 ශ්‍රේණියක සිසුන්ගේ චිත්‍ර දැක්වෙන ප්‍රදර්ශනයක් සංවිධානය කරන්න. එම චිත්‍ර නරඹා ආස්වාදයක් ලැබීමට දෙවන ශ්‍රේණියේ සිසුන් යොමු කරන්න. ඒ පිළිබඳ අත්දැකීම් ලැබීමට අවස්ථාව දෙන්න.
- මේ සඳහා උචිත පුවරුවක හෝ සුදුසු බිත්තියක හෝ චිත්‍ර එල්ලා හෝ අලවා හෝ තබන්න. (දෙවන ශ්‍රේණියේ සිසුන්ගේ උස මට්ටමට සරිලන සේ ඒවා එල්ලීම හෝ ඇලවීම කරන්න)
- දෙවන ශ්‍රේණියේ සිසුවාට එම චිත්‍ර නිදහසේ නැරඹීමට අවස්ථාව සලසන්න. කුඩා කණ්ඩායම් වශයෙන් චිත්‍ර නිරීක්ෂණය කිරීමට යොමු කරන්න. ඒ පිළිබඳ ව කතා බහ කිරීමටත් ඉඩ දෙන්න.
- එක් එක් සිසුන්ට තමා කැමති චිත්‍රයක් තෝරා ගෙන එහි දැක්වෙන තොරතුරු ගලපා කීමට යොමු කරන්න. චිත්‍රය ගැන සිය අදහස් ද දැක්වීමට ඉඩ දෙන්න.
- පන්තියේ භාවිත කරන පෙළ පොත්වල දක්නට ලැබෙන පින්තූර ආශ්‍රයෙන් ද සිද්ධි හඳුනා ගැනීමට සලස්වන්න.
- අනෙක් සිසුන් අතුරින් සිසුන් තිදෙනකුට ප්‍රශ්න ඇසීමේ අවස්ථා ලබා දෙන්න. ප්‍රශ්න ඇසීමේ දී සෙමෙන්, සාමාන්‍යයෙන් හා උස් හඬින් හඬ හසුරුවන ආකාරයේන් එම සිසුන් සිටිය යුතු ස්ථාන පිළිබඳවත් සිසුන්ට අවබෝධයක් ලබා දෙන්න. (පිළිතුරු දෙන සිසුවා ආසන්න ව තරමක් දුරින් සහ දුරින් ම වන විය යුතු ය.)

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

ක්‍රියාකාරකම් 3

- තමා දන්නා කතන්දරයක කිසියම් සිද්ධියක් චිත්‍රයට නැඟීමට සලස්වන්න. එම චිත්‍ර පන්තියේ ප්‍රදර්ශනය කොට අනෙක් සිසුන් දක්වන අදහස්වලට සවන් දීමට යොමු කරන්න.
- කිසියම් උත්සවයක අවස්ථා ඇසුරෙන් ලබා ගෙන ඇති ඡායාරූප ඇතුළත් පින්තූර කට්ටලයක් කණ්ඩායම් වශයෙන් නිරීක්ෂණය කොට ඒ ඒ අවස්ථාවල තොරතුරු ප්‍රකාශ කිරීමට අවස්ථා සලසන්න.
  මේ සඳහා
  - පාසලේ යම් උත්සවයක දී ගත් ඡායාරූප
  - (මව්පිය සහාය ඇති ව නිවෙස්වලින් ගෙන්වා ගන්නා ලද) උත්සව අවස්ථාවල ගත් ඡායාරූප
  - චාරිකාවල දී ගත් විවිධ ඡායාරූප .... වැනි දේ සපයා ගැනීමට කටයුතු කරන්න.
- රටේ පැවැත් වූ කිසියම් උත්සවයක් අලලා හෝ වෙනත් වැදගත් කාලීන තොරතුරක් අලලා හෝ පළ කරන ලද පුවත් පත්වල ඇතුළත් කාටූන් හෝ විවිධ පණිවිඩ රැගත් පෝස්ටර් හෝ ඡායාරූප හෝ සපයා ගෙන ඒවා ප්‍රදර්ශනය කර ඒවා පිළිබඳ ව කතා බහ කරන්න.
  උදා :- නිදහස් උත්සවයේ පින්තූර
  විශේෂ ක්‍රීඩා උත්සවවල පින්තූර .... වැනි
- මෙම අවස්ථා යටතේ කතා බහ කිරීමේ දී පින්තූරවල දැක්වෙන පුද්ගලයන් පිළිබඳ ව නම්, ගම්, ආදී පෞද්ගලික තොරතුරු නොව, සිද්ධියේ අවස්ථා පමණක් ඉස්මතු කරන්න.
  සැ: යු : සිසු මට්ටමට යෝග්‍ය ඡායාරූප, කාටූන්, චිත්‍ර, පෝස්ටර් පමණක් භාවිත කරන්න.

ක්‍රියාකාරකම් 4

- බිත්ති පුවත් පතක් සකස් කිරීම සඳහා බිත්ති පුවරුවක් සකස් කර ගන්න. මෙම තේමාව යටතේ කරන ලද ක්‍රියාකාරකම් ඇසුරින් බිත්ති පුවත් පතක් නිර්මාණය කිරීමට සලස්වන්න. සිසුන් අඳින ලද චිත්‍ර, කවි, පුවත් පත්වලින් උපුටා ගත් ඡායාරූප හෝ අදහස් සහිත ලිපි (සිසුනට උචිත විය යුතුයි) මෙම පුවත් පතෙහි ඉදිරිපත් කිරීමට යොමු කරන්න. සරල කවි, කතන්දර, චිත්‍ර, ඡායාරූප, පණිවිඩයක් රැගත් අදහස් සිසුන්ට දිනපතා ගෙන ඒමට කියන්න. එය සිසුන් විසින් ම කළ යුතු වේ. බිත්ති පුවරුවෙහි වඩාත් යෝග්‍ය දේ පමණක් ඉදිරිපත් කරන්න. සෑම ශිෂ්‍යයකුට ම මේ සඳහා අවස්ථා දෙන්න.
- සිසුන් සඳහා උපදෙස්/පණිවිඩ රැගත් පාඨ කිහිපයක් සකස් කර ගන්න.
  උදා :- ආහාර ගැනීමෙන් පසු දත් මදිමු.
  කියවීමෙන් දැනුම ලැබේ.
  වැඩිහිටියන්ට උදව් කිරීම උතුම් දෙයකි.
  අසරණයන්ට පිහිට වෙමු.
- ඔබ විසින් සකස් කර ගන්නා ලද එක් එක් පණිවිඩ/උපදෙස් ඇතුළත් වචන වෙන් කර කපා ගන්න.
- එක් එක් උපදේශයක්/පණිවිඩයක් අයත් වචන ලියූ කඩදාසි වෙන වෙන ම භාජනයකට /පෙට්ටියකට දමන්න.
- සිසුන් කණ්ඩායම්වලට බෙදන්න. මිශ්‍ර කළ වචන කාණ්ඩ සහිත භාජනයක්/පෙට්ටියක් කණ්ඩායමට ලබා දෙන්න.
- එහි අඩංගු වචන එකතු කරමින් නිවැරදි ලෙස වගන්තිය සකස් කිරීමට කියන්න. උපදේශය/පණිවිඩය නිවැරදිව ගලපා ගැනීමට අවශ්‍ය වේ නම් උදව් කරන්න. (උපදේශයක්/පණිවිඩයක් ඇතුළත් රූප කට්ටල ගැළපීමෙන් වුව ද ක්‍රීඩාව සැලසුම් කළ හැකි ය.)

ළමා ගී කැසට් පටයේ
ලියුම් මාමෙ මටත් එකක්
ගීතය සහ සම්බුදු පෙරහැර
ගීතය උදවු කර ගන්න.



Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

## 9.0 වටාපිටාවේ සිදුවන වෙනස්කම්

නිපුණතා :-

- දෛනික ක්‍රියාකාරීත්වය නිසා ආසන්න පරිසරයේ සිදුවන වෙනස්කම්වලට සංවේදී ව ප්‍රතිචාර දක්වයි.
- ස්වාභාවික හේතු නිසා පරිසරයේ සිදුවන වෙනස්කම්වලට අනුව සංවේදී ව කටයුතු කරයි.
- ආසන්න පරිසරයේ සිදුවන වෙනස්කම් අතරින් අහිතකර වෙනස්කම් හිතකර බවට පත් කර ගැනීමට දායක වෙයි.
- පරිසරයේ සිදුවන වෙනස්කම් රංගන, ගායන හා වාදන මගින් ඉදිරිපත් කරයි.
- පරිසරයේ වෙනස්කම් දැක්වෙන නිර්මාණ විවිධ මාධ්‍ය භාවිතයෙන් ඉදිරිපත් කරයි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය

ක්‍රියාකාරකම් 1

- පන්ති කාමරයේ සහ එහි අවට සිදුවන වෙනස්කම් පිළිබඳ ව නිරීක්ෂණය කිරීමටත් තොරතුරු සෙවීමටත් සිසු කණ්ඩායම්වලට පවරන්න.

  උදා :

  පාසල ඇරුණු වේලාවේ සිට පසුදින උදය පාසල ආරම්භ වන වේලාව දක්වා පන්තියේ හා පන්තිය අවට මිදුල්වල සිදු වී ඇති වෙනස්කම්

  උදා :

  ගෙබිම, ලී බඩු දූවිලිවලින් වැසී යාම
  ගස්වල කොළ වැටීම
  ගස්වල මල් පර වී වැටීම/මල් පිපීම

- උදය පාසල් ආරම්භ කරන වේලාවේ සිට සවස පන්තිය අවසන් වන මොහොත දක්වා සිදුවන වෙනස්කම් (අපිරිසිදු වීම, පිළිවෙළ වෙනස් වීම වැනි) සිදුවන ආකාරය පිළිබඳ ව සොයා බැලීමට සලස්වන්න. අහිතකර වෙනස්වීමක් හිතකර තත්ත්වයකට පත් කිරීමට කළ හැකි දේ මොනවා දැ යි සොයා බැලීමට යොමු කරන්න.
- අහිතකර දේ වලක්වා ගැනීමට කළ යුතු දේ යෝජනා කර, ඒවා ක්‍රියාත්මක කිරීමට සලස්වන්න.
- ඉහත ආකාරයට ම මිදුල, පුටු, බිත්ති, වහළ, දැන්වීම් පුවරු, ප්‍රදර්ශන පුවරු, පොත්පත් වැනි දෑ පිළිබඳ ව ද සොයා බැලීමට යොමු කරන්න.

ක්‍රියාකාරකම් 2

- වැසි කාල ගුණයක් සහිත දිනවල පහත දැක්වෙන ක්‍රියාකාරකම් අරඹන්න.
- වැස්සකට පෙර අහසේ හා පරිසරයේ දක්නට ලැබෙන ලක්ෂණ නිරීක්ෂණය කිරීමට සලස්වන්න.

  මෙහි දී,

  වළාකුළුවල ස්වභාවය (වළාකුළු පිරී ඇති බව, පැහැය, වැහිවළාවක හා සාමාන්‍ය වළාවක වෙනස්කම්)
  හිරුගේ ස්වභාවය (වළාකුළු නිසා නොපෙනීයාම)
  සුළං හැමීම (දිශාව)
  කුරුල්ලන්ගේ හා සතුන්ගේ හැසිරීම්වල ස්වභාවය (වැහිලිහිණි වැනි කුරුල්ලන්, මෙරුවන් වැනි කුඩා සතුන්) නිරීක්ෂණය කිරීමට යොමු කරන්න.

- වැස්ස සහිත අවස්ථාවක පන්ති කාමරයේ රැඳී සිටිමින් වහින ආකාරය නිරීක්ෂණය කිරීමට හා පසුව වාර්තා කිරීමට සලස්වන්න.

  මෙහි දී පහත දැක්වෙන කරුණු කෙරෙහි අවධානය යොමු කරන්න.

  වැහි බිංදු වැටෙන දිශාව
  වැහි බිංදුවල හැඩය
  බිම පතිත වන විට ඇති වන වෙනස්කම්
  බිම වැටෙන පැහැදිලි වතුර පසට වැටෙන විට පැහැය වෙනස් වීම හා ඊට හේතු සොයා බැලීම

- හතරැස් කඩදාසි විවිධ ප්‍රමාණයෙන් සපයා දී, කඩදාසි බෝට්ටු සාදා, ඒවා පා කර යැවීමට සලස්වා, වින්දනයක් ලැබීමට අවස්ථා සලසන්න.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

- නිරීක්ෂණවල දී දුටු ලක්ෂණ ඇසුරෙන් කවි නිර්මාණයට සිසුන් උනන්දු කරවන්න. ඒවා තාලයට ගයමින් රංගනයට යොමු කරන්න. මෙහි දී ආදේශන භාණ්ඩ වාදනයට අවස්ථාව දෙන්න.

  උදා :-

| | |
|---|---|
| සුළං හමනවා | වතුර ගලනවා |
| ගස් සෙලවෙනවා | පහළ බසිනවා |
| විදුලි කොටනවා | ගඟක් හැදෙනවා |
| වැස්ස වහිනවා | මුහුදට යනවා |

- 'වැස්ස වහිනවා' මාතෘකාව මුල් කොට චිත්‍රයක් ඇඳීමට යොමු කරන්න. ඒවා ප්‍රදර්ශනය කරමින් අගයන්න.

ක්‍රියාකාරකම් 3

- පාසලට ආසන්නයේ ගංවතුරක්, සුළඟක්, ඉඩෝරයක් හා නාය යෑමක්, වෙනත් හදිසි තත්ත්වයන්

  උදා :- භූමිකම්පා, සුනාමි වැනි සිද්ධියක් නිසා සිදු වී ඇති හානියක් පිළිබඳ ව තොරතුරු සොයා බැලීමට යොමු කරන්න. පින්තූර හෝ ඇඳින ලද චිත්‍ර ආශ්‍රිත ව හෝ ඒ පිළිබඳ තොරතුරු කතා බහ කරන්න. එවැනි අවස්ථාවක් චිත්‍රයට නැඟීමට සලස්වන්න. චිත්‍ර මගින් හෝ කොලාජ් මගින් හෝ මෙය සකස් කළ හැකි ය.
- සිදු වී ඇති හානි පිළිබඳ තොරතුරු කතා බහ කිරීමට අවස්ථාව සලසන්න.
- වැඩිහිටියන්ගෙන් විමසා අතීතයේ සිදු වී ඇති තොරතුරු පන්තියේ ඉදිරිපත් කිරීමට ඉඩ සලසන්න.
- ස්වභාවික හේතු නිසා වන සිදුවීමක් ඇසුරෙන් රංගන, ගායන, වාදන ඉදිරිපත් කිරීමට සිසුන් යොමු කරන්න.

  උදා :- වැසි වසින අවස්ථාවක් ආදේශ භාණ්ඩවලින් වාදනය කිරීම, ඉඩෝරය නිසා ඇති වන හානියක්, වැස්ස ලැබීම නිසා ඇති වන ප්‍රබෝධයත් නාටකයකින් හා ගායන වාදන සහිත රංගනවලින් ඉදිරිපත් කිරීමට සලස්වන්න.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

ළමා ගීත කැසට් පටයේ අල්ලන්නට බැරි අහස,
සිරිපා වඳින්න යමු යන ගීත උදවු කර ගන්න

නිපුණතා :-

- පාසලේ දී මුහුණ දීමට සිදුවන සිදුවීම්වලින් තමා කැමති හා අකමැති අවස්ථා පිළිබඳ අත්දැකීම් අන් අය සමඟ හුවමාරු කර ගනියි.
- පාසලේ දී සිදුවන අකමැති සිදුවීම්වලට හේතු සොයා බලා ඒවා කැමති සිදුවීම් බවට පත් කර ගැනීමට කළ හැකි යෝජනා ඉදිරිපත් කරයි.
- ආසන්න පරිසරයේ ඇති අනතුරුදායක හා අවදානම් සහිත ස්ථාන හා අවස්ථා සොයා බලා ආරක්ෂාවීමට පියවර ගනියි.
- වැඩිදෙනකුගේ කැමැත්ත ඇති ව තෝරා ගත් ක්‍රීඩාවක්, ගායනයක්, රංගනයක් කිරීමට ඉදිරිපත් වෙයි.
- තම අභිමතය පරිදි තෝරා ගන්නා ලද නිර්මාණයක් තුළින් තම හැකියා ප්‍රදර්ශනය කරයි.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය

ක්‍රියාකාරකම් 1

- පාසලේ සිදු වූ සිද්ධියක් හෝ ඔබට ම සිදු වූ අත්දැකීමක් මගින් පාඩමට ප්‍රවේශ විය හැකි ය. මේ සඳහා සිසුන් කැමති විය හැකි සහ අකමැති විය හැකි අවස්ථා ඇතුළත් චිත්‍ර ඉදිරිපත් කරමින් සිසු අදහස් ප්‍රකාශනයට අවස්ථා ලබා දිය හැකි ය. එසේ නැතිනම් වාචික ව ඔබේ අත්දැකීම් ප්‍රකාශ කළ හැකි ය.

  උදා :-

  පාසලේ දී සිසුවකුට අසනීප වූ අවස්ථාවක දී යහළුවන් උදව් කළ/නොකළ අවස්ථාවක්
- ඉහත සිද්ධීන්වලට තමා කැමැති හෝ අකැමැති වීමට හේතු කතා බහ කරන්න. එහි ඇති යහපත් සිද්ධීන් අගය කරන්න.
- සිසුන්ට ද තම අත්දැකීම් ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න. මෙහි දී පාසල තුළ පහත දැක්වෙන සිදුවීම් සම්බන්ධ අත්දැකීම් ඉදිරිපත් කිරීමට යොමු කරන්න.

  උදා :- සිසුවකු තවත් සිසුවකුට එදිනෙදා ඉගෙනුම් අවස්ථාවක දී කළ උදව්වක්
  ක්‍රීඩා කරන අවස්ථාවක දී සුළු අනතුරකට භාජනය වූ අවස්ථාවක කළ උදව්වක්
  සිසුවකු වෙනත් කරදර අවස්ථාවකට පත් වූ විට කළ උදව්වක්
- සිසුන් කැමති ආකාරයට කුඩා කණ්ඩායම් වීමට සලස්වන්න. කැමති හෝ අකමැති පුංචි සිද්ධි ඇසුරෙන් රංගනයකට සූදානම් වීමට කියන්න. එක් එක් කණ්ඩායමක් තෝරා ගත් සිද්ධි විමසා අවශ්‍ය උදවු හා උපදෙස් දෙන්න. අවසානයේ පන්තිය ඉදිරියේ රඟ දැක්වීමට අවස්ථා දී ඔවුන්ගේ දක්ෂතා අගය කරන්න. එසේ ම සිද්ධි ඇසුරෙන් චරිත සංවර්ධනයට අවශ්‍ය මග පෙන්වීම් ඉස්මතු කරන්න.

ක්‍රියාකාරකම් 2

- පාසල් වත්තට සිසුන් කැඳවා ගෙන යන්න.

  අනවශ්‍ය ලෙස පැළෑටි වැඩී ඇති තැන්, ගොඩනැගිලිවලට හානි කරමින් වැඩී ඇති ගස් හා පැළෑටි, කැඩුණු ඩෙස් පුටු හා බිත්ති අපිරිසිදු කර තිබේ නම් ඒවා ද නිරීක්ෂණය කිරීමට සලස්වන්න.
- ඒවා නිසා සිදු වී ඇති හිරිහැර හා හානි පිළිබඳ ව කතා බහ කරන්න. ඒවා ඉවත් කිරීමට කළ හැකි දෑ පිළිබඳවත් විමසන්න.
- පාසල් වත්තේ පාරවල්වල වැවී ඇති තණකොළ ඉවත් කිරීමට කළ යුතු දේ කතා බහ කොට එම කාර්යයෙ හි නිරත වීමට සලස්වන්න.
- පන්තිය අවට මිදුල ප්‍රසන්නව තබා ගැනීමට කළ හැකි දෑ විමසන්න. පැළ සිටුවීමට යොමු කරන්න.
- කොළ වැටීම නිසා කාණු පද්ධති අවහිර වී ඇත්නම් එවැනි තැන් පිරිසිදු කිරීමට යොමු කරන්න.
- ගස් නිසා පුද්ගලයන්ට අනතුරු සිදුවන අවස්ථා ඇතුළත් සිද්ධියක් ඉදිරිපත් කරන්න.

  උදා :- පොල් ගසකින් පොල් ගෙඩියක්, පොල් අත්තක් වැටීමක් නිසා සිදු වූ අනතුරක් පිළිබඳ පුවතක්
  පොල් ගෙඩියක්/කොස් ගෙඩියක් හිස මත වැටීම නිසා සිදුවන අනතුරක්
- සිසුන් අසා ඇති හෝ නිවසේ හෝ අසල්වැසියන්ට හෝ ගස් නිසා සිදු වූ අනතුරක් පිළිබඳ ව පුවතක් ඉදිරිපත් කිරීමට සලස්වන්න.

- මෙවැනි කතා බහ තුළින් ගස් නිසා අනතුරු විය හැකි අවස්ථා පිළිබඳ දැනුවත් වීම් කරන්න. එයින් වැලකීමට ගත යුතු ක්‍රියාමාර්ග සාකච්ඡා කරන්න.

  උදා :- වේළුණු පොල් අතු, වේළුණු පොල්වලු තිබේ නම් ගස් යට සෙල්ලම් නොකිරීම.
  තද සුළං ඇති අවස්ථාවල ගස් යටට යාමෙන් වැළකීම.
  අවදානම් සහිත ගස්වලට නැගීමෙන් වැළකීම.
- අනතුරුවලින් වැලකී සිටීම මෙන් ම අවට පිරිසිදුව හා අලංකාර ව තබා ගැනීමට කළ හැකි යෝජනා/පණිවිඩ රැගත් පෙරහැරක් පන්ති මට්ටමින් සංවිධානය කරන්න.

ක්‍රියාකාරකම් 3

- පාසල් පරිසරයේ සිටින සතුන් නිරීක්ෂණය කිරීම සඳහා කුඩා කණ්ඩායම් සකස් කර ගන්න.
  (6 වන ශ්‍රේණියේ හෝ 5 වන ශ්‍රේණියේ සිසුන්ගේ සහාය ඇති ව කණ්ඩායම් මෙහෙයවීමට කටයුතු කළ හැකි ය)
- දකින සතුන්ගේ නම් ලියා ගැනීමට උපදෙස් දෙන්න.
- පදම් කර ගත් මැටි සපයා දී ඒවායින් තමන් පාසල් වත්තේ දී දුටු හෝ වෙනත් කැමති සතකු නිර්මාණය කිරීමට උපදෙස් දෙන්න. නිර්මාණය කළ දේ ප්‍රදර්ශනය කරමින් අගය කරන්න.
- කුරුල්ලන්, ලේනුන්, වැනි සතුන් පාසල් වත්තට කැඳවීමට කළ යුතු ක්‍රම හා උපායයන් පිළිබඳ ව කතා බහ කරන්න. ඒ සඳහා සාදා ගත හැකි දේ පිළිබඳ ව විමසන්න.

  උදා :- ලේනුන් සඳහා කෑම පුවරුවක් ගසක රැඳවීම
  කුරුල්ලන්ට නෑමට හා බීමට සුදුසුවන පරිදි දිය බඳුනක් සකස් කිරීම
- සතුන්ට ආදරය කිරීම පිළිබඳ අත්දැකීම් කතා බහ කරන්න.
- ආදරය කරන සතුන් සම්බන්ධ සිද්ධි ඇසුරෙන් කවි/ගී ගායනය කිරීමට සලස්වන්න.

  උදාහරණ :-

  අපේ ගෙදර පූසා - තොප්පිය අරගත්තා
  නංගි ඒක දැක්කා - අයියට අඬ ගැවා //

  අයියා දුව ආවා - අම්මත් දුවා ආවා
  ගෙදර හිටිය බූලා - ඒකත් දුව ආවා //

  පූසී බූල දැක්කා - තොප්පිය බිම දැම්මා
  බයේ පැනලා දිව්වා - මේසෙ උඩට නැංගා //

  (මූලාශ්‍රය - ගී සීපද : ගිරාගම ප්‍රායෝගික පාසලේ සිසුන්)

- සතුන්ට උදවු කිරීම හා සතුන් මිනිසුන්ට කළ උදවු හෙළිදරව් වන කතාන්දර ඉදිරිපත් කරන්න. ඒ ඇසුරෙන් සතුන්ට කරුණාව දැක්විය යුතු බව පෙන්වා දෙන්න. මෙවැනි කතන්දරයක් රංගනයකින් ඉදිරිපත් කිරීමට හැකි නම් වඩාත් යෝග්‍ය වේ. සත්ත්ව රූප වෙස් මුහුණු පන්ති කාමරයේ දී සකස් කර ඒවා පැළඳීමෙන් මෙම රංගන ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- ඇතැම් සතුන්ගෙන් සිදු වන හානි පිළිබඳ ව කතා බහ කරන්න.
- හානි සිදු කරන සතුන් වසන තැන් හා ඔවුන්ගෙන් සිදු වන හානි, ලෙඩ රෝග ඇතුළත් සිද්ධි ඉදිරිපත් කිරීමට සිසුන්ට අවස්ථාව සලසන්න.
- මැසි, මදුරු, මකුණු, වැනි සතුන්ගේ බෝ වීම වැලැක්වීමට පුංචි අපට ගත හැකි ක්‍රියාමාර්ග මොනවා දැ යි සාකච්ඡා කරන්න. පාසල් වත්තේ එවැනි ස්ථාන ඇති දැ යි සොයා බලා අවශ්‍ය කටයුතු හැකි පමණකින් කිරීමට උනන්දු කරවන්න.
- විසකුරු සතුන්ගෙන් සිදු වන හානි පිළිබඳ ව අසා ඇති අත්දැකීම් ප්‍රකාශ කිරීමට අවස්ථාව සලස්වන්න. එවැනි සතුන්ගෙන් ප්‍රවේසම් වීමට ගත යුතු පියවරවල් මොනවා දැයි සාකච්ඡා කරන්න.

  උදා :- පදුරු, කැළෑ සහිත හා තුඹස් වැනි ආරක්ෂාකාරී නොවන තැනකට යාමෙන් හෝ එවැනි ස්ථානයක් අසල සෙල්ලම් කිරීමෙන් වැලකීම.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

ක්‍රියාකාරකම් 4

- සිසුන් කැමති ඕනෑම නිර්මාණයක් කිරීමට මෙම තේමාව තුළ දිනයක් වෙන් කරගන්න.
- වර්ණ කඩදාසි පොල් කුඩු, හැඩ තල, විවිධ හැඩ ඇති ලී කොට, ඩීමයි, වාර්නිෂ් කඩදාසි, වියලා ගන්නා ලද ශාක පත්‍ර, දිය සායම්, පැස්ටල් .. වැනි විවිධ දෑ කල් තබා රැස් කර ගන්න.
- මෙම ඕනෑම ද්‍රව්‍යයක්/ද්‍රව්‍ය භාවිත කරමින් කැමැති නිර්මාණයක් කිරීමට පවසන්න. සිසුන් කැමැති නම් කණ්ඩායම් ලෙස වුව ද කළ හැකි ය.
- සියල්ල නිම කළ පසු ප්‍රදර්ශනයට තැබීමට සුදුසු වන පරිදි අලංකාර කර ගන්න.
- එදින ම හෝ වෙනත් දිනයක මෙම නිර්මාණ තුළින් පන්ති මට්ටමේ ප්‍රදර්ශනයක් පවත්වන්න. හැකි නම් දෙමාපියනට ද නිර්මාණය නැරඹීමට අවස්ථාව ලබා දෙන්න.

ක්‍රියාකාරකම් 5

- සිසුන් සෙල්ලම් මිදුලට රැගෙන යන්න. ඔවුනට කැමති උපකරණ භාවිත කරමින් සෙල්ලම් කිරීමට පවසන්න.
- පළමුවන ශ්‍රේණියේ දී සිසුන් කැමැති විවිධ ක්‍රීඩාවල නිරත වූ බව මතක් කරන්න.
- සෙල්ලම් මිදුලේ උපකරණ ඇසුරින් කරන ලද ක්‍රීඩා හැරෙන්නට වෙනත් සිසුන් කැමැති ක්‍රීඩා විමසන්න. සිසුන් යෝජනා කෙරෙන ක්‍රීඩාවලට උචිත ස්ථානයක් තෝරා ගෙන අවශ්‍ය පරිදි කණ්ඩායම් කර එම ක්‍රීඩා කිරීමට අවස්ථාව සලස්වන්න. මෙම ක්‍රීඩා සඳහා දින කිහිපයක් යොදා ගන්න.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

ළමා ගී කැසට් පටයේ සම්බුදු පෙරහැර මේ එන්නේ,
සමනලයෝ මේ අහන්න ගීත උදවු කර ගන්න.

නිපුණතා :-

- පාසල් පරිසරයෙන් හා නිවසින් අවශ්‍ය උදව් ලබා ගනිමින් ඉගෙනුම් කටයුතුවල සාර්ථක ව නියැලෙයි.
- සිය ඉගෙනුම් කටයුතුවලට පාසලින් හා නිවසින් උදව් දෙන අය අගය කරයි.
- භාණ්ඩ හා උපකරණ ක්‍රමවත් ව පවිත්‍ර ව හා ආරක්ෂාකාරී ව භාවිත කරයි.
- පාසලේ පොදු වස්තු හා පොදු දේපල ආරක්ෂා කිරීමට දායක වෙයි.
- විවිධ කාර්යයන් සඳහා උදව් වන පුද්ගලයින් හා උපකරණවල ලක්ෂණ සුවිශේෂී කර ගනිමින් සෞන්දර්යාත්මක ක්‍රියාකාරකම්වල නිරත වෙයි.
- විවිධ ද්‍රව්‍ය භාවිත කරමින් පරිහරණය කළ හැකි භාණ්ඩ හා උපකරණවල ආකෘති නිර්මාණය කරයි.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය

ක්‍රියාකාරකම් 1

- පාසලේ දී ඉගෙනුම් වැඩවලට උදවු දෙන අය පිළිබඳ ව සිසුන් සමග තොරතුරු කතා බහ කරන්න. උදව් දෙන අය අගයන්න.
- ඉගෙනුම් කටයුතුවලට අවශ්‍ය පන්ති කාමරයේ ඇති උපකරණ හා ඒවායින් ලබන ප්‍රයෝජන පිළිබඳ ව සිසුන් සමඟ කතා බහ කරන්න.
- පන්ති කාමරය භාණ්ඩ හා උපකරණ ක්‍රමවත් ව මෙන් ම පිරිසිදු ව තබා ගැනීමට යොමු කරන්න.
- භාණ්ඩ හා උපකරණ පිළිබඳ ව මෙන් ම ඒවායේ ප්‍රයෝජන ගැන කියවෙන කවි, ගී නිර්මාණය කර ගායනය කරවන්න. රංගනයෙහි යොදවන්න.

  උදා : මෙන්න අපේ කළුලෑල්ල<br>
  කළුම කළුයි කළුලෑල්ල<br>
  අකුරු ලියන හුණු කෑල්ල<br>
  සුදුම සුදුයි හුණු කෑල්ල

- පාසලේ උපකරණ හා සම්බන්ධ තේරවිලි ඉදිරිපත් කරන්න.

  උදා :

  මම මේ පුංචි දූල පුතාලට පොත් තබා ගන්න උදවු කරනවා. මට හිටගෙන ඉන්න කකුල් හතරක් තියනවා. ඔයාල කැමතියි මාව ලස්සනට ඉන්නව දකින්න. ඔයාලා මාව කිලුටු කළොත් මට දුක හිතේවි. මාව ලස්සනට තියාගන්න ඔයාලට පුළුවන්. දැන් මම කවුද කියන්න?

- සිසුන් කුඩා කණ්ඩායම්වලට බෙදා පන්ති කාමරයේ හෝ පාසලේ හෝ විවිධ උපකරණවල ආකෘති නිර්මාණය කිරීමට ඉඩ සලසන්න.

  (මේ සඳහා කාඩ්බෝඩ් කෑලි, ඇසුරුම් පෙට්ටි, ආදී ඉවත ලන විවිධ දේ ද, ඉරටු, කෝටු, මැටි වැනි පරිසරයෙන් ලබා ගත හැකි විවිධ දේ ද යොදා ගැනීමට උපදෙස් දෙන්න)

ක්‍රියාකාරකම් 2

- අධ්‍යාපන කටයුතු කර ගෙන යාමට නිවසේ උදවු කරන අය හා එක් එක් අය කරන උදවු මොනවා ද යන්න ඉදිරිපත් කිරීමට එක් එක් සිසුවාට අවස්ථාව දෙන්න. ඒ පිළිබඳ ව කතා බහ කරන්න.
- මෙම වයසේ දරුවන්ට තනිව ම කළ හැකි වැඩ කිරීමට දිරි ගැන්වීම සඳහා කතා බහ කරන්න.
- පාසලේ දී හෝ නිවසේ දී හෝ ලැබෙන ඉගෙනුම් උදව් හා ඒවා අගයන දෙබස් ඇතුළත් කතාවක් නිර්මාණය කර රඟ දැක්වීමට අවස්ථාව දෙන්න. මේ සඳහා 6 / 5 ශ්‍රේණිවල සිසුන් සම්බන්ධ කර ගන්න.

ක්‍රියාකාරකම් 3

- පාසලේ ඇති පොදු ස්ථාන හා එම ස්ථානවලින් ලැබෙන ප්‍රයෝජන පිළිබඳ ව සිසුන් සමග කතා බහ කරන්න.

  උදා :- ගොඩනැගිලි<br>
  වැසිකිළි/කැසිකිළි<br>
  පිට්ටනිය<br>
  ජල නළය

- එම ස්ථානවලට ගොස් සිසුන්ගේ නොසැලකිලිමත්කම නිසා සිදු වී ඇති හානි සොයා බැලීමට කණ්ඩායම් පැවරුම්වල යොදවන්න.
- කණ්ඩායම් සොයා ගෙන ආ තොරතුරු පන්ති කාමරයේ දී සාකච්ඡා කරන්න.
- එම ස්ථාන පවිත්‍රව හා ආරක්ෂා කර ගැනීමට සිසුන්ට කළ හැකි දේ විමසන්න. සිසුන්ගේ අදහස් හා යෝජනා ක්‍රියාත්මක කිරීමට ද උනන්දු කරවන්න.
- පොදු වස්තු ආරක්ෂා කිරීම මතු කිරීමට කිසියම් වස්තුවකට ආරෝපිතව කතා බහ කිරීමට අවස්ථාව ලබා දෙන්න.

  උදා : කැඩිච්ච පුටුවක් කතා කරයි.
  ඉරී ඇඳි අවලස්සන වූ බිත්තියක් දුක් වෙයි.
  ජල කරාමයක් කැඩීමෙන් අපතේ යන ජලය දුක් වෙයි.
- ඉහත අවස්ථා අතරින් සිසුන් කැමති එක් අවස්ථාවක් චිත්‍රයට නැගීමට සලස්වන්න.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

ළමා ගී කැසට් පටයේ
දන්නවාද ඔක්කොම කී දෙනා ද කියලා
ගීතය උදවු කර ගන්න.

නිපුණතා :-

- නිවසට යන එන අයගේ ගමන් බිමන් පිළිබඳ තොරතුරු රැස් කර වාර්තා කරයි.
- නිවැරදි ඉරියව් අනුගමනය කරමින් ඇවිදියි.
- ඇවිදීම, වාඩිවීම සහ බරක් එසවීම වැනි කාර්යයන්හි දී සමබරතාවය රැක ගනියි.
- බාධාකාරී සහ දුෂ්කරතාවන්ගෙන් ආරක්ෂා වෙමින් ගමන් කරයි.
- සමබරතාවය රැක ගනිමින් නිවැරදි ඉදිරිච්චලට අනුව ක්‍රීඩාවන්හි නිරත වෙයි.
- ශරීරයේ සමබරතාවය රැකෙන විවිධ ඉරියව් නිරූපණය කරයි.


ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය

ක්‍රියාකාරකම් 1

- සිය නිවෙස්වල අය එදිනෙදා යෙදෙන ගමන් බිමන් පිළිබඳ ව සිසුන්ගෙන් විමසන්න.
  උදා : රැකියාවලට යාම, පාසල් යාම, පොළට හෝ වෙළෙඳ පොළට යාම
- මිනිසුන් ගමන් බිමන් යෙදෙන ආකාරය නිරූපණය කිරීමට අවස්ථාවක් ලබා දෙන්න.
- ගමන් බිමන්වල යෙදෙන ආකාරයන් පිළිබඳ ව කතා බහ කරන්න.
- ගමනක් යන අවස්ථාවක් දැක්වෙන චිත්‍රයක් ඇඳීමට යොමු කරන්න.

ක්‍රියාකාරකම් 2

- පිට්ටනියට හෝ එළිමහන් ස්ථානයකට සිසුන් කැටුව යන්න.
- නිශ්චිත තැනක සිට තවත් තැනකට සරල රේඛා දෙකකින් සීමා වූ පටු තීරුවක් ලකුණු කරන්න.
- එක් එක් සිසුවකුට තීරුව දිගේ නිදහසේ ගමන් කිරීමට පවසන්න.
  (වැරදි ක්‍රමයට පා තබන අය හා නිවැරදි ව පාතබන අය මේ අතර සිටිය හැකි ය)
- නිවැරදි ලෙස ගමන් කරන අයගේ ගමන් විලාසය අවධානයට ගැනීම සඳහා පහත සඳහන් රූප සටහන ප්‍රයෝජනයට ගන්න.
- නිවැරදි අයුරින් ගමන් කරන විට පා තබන ආකාරය පිළිබඳ ව සිසුන් දැනුවත් කරන්න.
  මෙහි දී පළමුව විලුඹ
  දෙවනුව පතුල
  තෙවනුව ඇඟිලි තුඩු තබමින් ඇවිදීමට යොමු කරන්න.



- දෙපාවලට ශරීරයේ බර මාරු කරමින් සෙමෙන් ඇවිදීමට සලස්වන්න.



Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

උදා :- ආදේශක භාණ්ඩ උපයෝගී කරගෙන සපයන ලද තාලයකට ඇවිදීම.

- දෙපාවලට ශරීරයේ බර මාරු කරමින් වේගයෙන් ඇවිදීමට සලස්වන්න.

උදා :- ආදේශ භාණ්ඩ උපයෝගී කරගෙන සැපයූ තාලය වේගවත් කරමින් වේගයෙන් ඇවිදීම.

ක්‍රියාකාරකම් 3


- ක්‍රියාකාරකම් ආරම්භ කිරීමට පෙර පාසල් වත්තේ ඇති පාරවල්වල බාධාකාරී දේවල් කිහිපයක් තැන තැන තබන්න. පාසල් වත්තේ පාරවල් නොමැති නම් ඒ වෙනුවට එළිමහන් තැනක පාරවල් ඇඳ බාධක යොදා ගත හැකි ය.
- සිසුන් එළිමහනට කැඳවා ගෙන යන්න. සිසුන් කුඩා කණ්ඩායම් (3ක් හෝ 4ක් හෝ පමණ) වෙන් කර ගන්න.
- බාධාකාරී දේ දමා කලින් සූදානම් කළ පාර දිගේ ගමන් කිරීමට එම කණ්ඩායම් යොමු කරන්න.
- ඔවුන් පාර දිගේ ගමන් කරන විට බාධක දේවල් කෙරෙහි අවධානය යොමු කොට, ඒවා ඉවත් කිරීමට පෙළඹුණේ දැයි ඔබ විමසිලිමත් වන්න.
- ඒවා ඉවත් කරමින් ගමන් කළේ නම් එය අගයමින් තව දුරටත් ඒ පිළිබඳ ව පැහැදිලි කරන්න.
- සිසුන් කණ්ඩායම් පාරේ තිබූ බාධක දේවල් ගැන නොසැලකිලිමත් වී නම් සියලු දෙනා කැටුව ගොස් ඒවා දැකීමට සලස්වා බාධක දේවල් ඉවත් කරන්න. මේ අවස්ථාවේ ඒවායින් විය හැකි අනතුරු පෙන්වා දෙන්න.
- පාරේ එවැනි දේ දුටුවොත් ඉවත් කිරීමේ වැදගත්කම ද සිසුන්ගේ එවැනි අත්දැකීම් ඇතොත් ඒවා ඉදිරිපත් කිරීමටත් ඉඩ දෙන්න. ඒ පිළිබඳ කතා බහ කරන්න.
- අත්දැකීම් ඇසුරෙන් මෙවැනි අවස්ථා නිරූපණය කිරීමට සිසු කණ්ඩායම්වලට පැවරුම් දෙන්න.
- බාධාකාරී දේවල් නිසා අනතුරක් සිදුවීම, යහපත් ළමයකු වශයෙන් එවැනි දේ ඉවත් කරමින් අන්‍යයන්ටත් උපදෙස් දීම වැනි කරුණු මෙහි දී ඉස්මතු කිරීමට යොමු කරන්න.

ක්‍රියාකාරකම් 4

- සමබරතා ව රැකෙන ගමන් විලාස සහිත ක්‍රීඩා කිහිපයකට සිසුන් යොමු කරන්න.

උදා : තනි කකුලෙන් ඇල්ලීම
අඹ ඇට පැනීම
අම්බිලි පැනීම
ඒදණ්ඩ මත ඇවිදීම
පොල් කටු ආශ්‍රයෙන් බොරු කකුල් නිර්මාණය කර ඒ මත සමබරව ඇවිදීම.

- මෙහි දී සෙල්ලම් මිදුලේ ඇති 10 cm පමණ පළල, 3 m පමණ දිග, 20 cm උසකින් පිහිටි සමබර දණ්ඩක් ඒදණ්ඩ ලෙස යොදා ගන්න.



- ඒදණ්ඩ මත ඇවිදීම අවස්ථාව කර ගත හැකි ක්‍රීඩාවක් සංවිධානය කර ගන්න.
- පහත දැක්වෙන ක්‍රියාකාරකම් සඳහා උචිත ස්ථානයක් තෝරා ගන්න.
- සිසුන්ගේ මට්ටමට ගැළපෙන විවිධ බර ඇති ද්‍රව්‍ය කිහිපයක් තෝරා ගන්න.
- එවැනි බරක් එකිනෙක, සිසුන් ඔසවන ආකාරයන් නිරීක්ෂණය කිරීමට සලස්වන්න.
- බිම ඇති බරක් කොන්ද නමා එසවීම කොඳු ඇට පෙළට අහිත කර වීමට ඉඩ ඇති බව දැනුවත් කරන්න.
- බරක් එසවීමේ දී කොන්ද නොනමා ශරීරය (කඳ) කෙළින් නබා ගෙන පහත් වී දණහිස් දිග හරිමින් බර එසවීම වඩා උචිත බව පහත දැක්වෙන රූප සටහන්වලට අනුව ආදර්ශනය කොට පෙන්වන්න.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved



- එසේ ම එක් අතකින් පමණක් බරක් උසුලාගෙන වැඩිවෙලාවක් ගමන් කිරීම නුසුදුසු බව ද, වරින් වර අත් දෙකට බර මාරු කිරීම උචිත බව ද ආදර්ශනය කොට පෙන්වන්න.
- පහත සඳහන් අවස්ථා භූමිකා රංගනවල යොදවන්න. කණ්ඩායම් වශයෙන් මෙම ක්‍රියාවන් හි යෙදීමට සිසුන්ට අවස්ථාව දෙන්න. සෑම කණ්ඩායමකට ම සෑම අවස්ථාවක් ම ඉදිරිපත් කිරීමට යොමු කරන්න.

  උදා : එළවළු කූඩයක් ඔසවා ගෙන යාම
  කදක් ගෙන යාම
  බයිසිකලය පැදගෙන යාම
  විල්බැරොව රුගෙන යාම
  තේ කූඩය රුගෙන යාම
- කැමති මාධ්‍යයක් භාවිත කරමින් මින් කැමති අවස්ථාවක් චිත්‍ර මගින් නිරූපණය කිරීමට සලස්වන්න.

ළමා ගී කැසට් පටයේ
අලුත් ම පාරක් අපේ ගමට
ගීතය උපයෝගී කර ගත හැකි ය



Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

නිපුණතා :-

- ස්වාභාවික ව එළිය අඩුවැඩි වීම හා ඒ අනුව පරිසරයේ සිදුවන වෙනස්කම් ගවේෂණය කරයි.
- එළිය විහිදීම අඩු කිරීම් වැඩි කිරීම් සහ එහි දිශාව වෙනස් කළ හැකි අයුරු අත්හදා බලයි.
- එළියේ වෙනස්වීම අනුව සෙවනැලිවල දිග වෙනස්වීම් නිරීක්ෂණය කර වාර්තා කරයි. ක්‍රීඩාවල යෙදෙයි.
- එළියේ අඩුවැඩි වීම් අනුව සිදුවන සෙවනැලිවල වෙනස්වීම් ආශ්‍රිත ක්‍රීඩාවල යෙදෙයි.
- එළිය විහිදීම අඩු වැඩි වන සහ එළියේ විවිධ වර්ණ මතු වන නිර්මාණ ගොඩනගයි.
- එළිය අඩු වැඩි වන අවස්ථාවල පරිසරයේ සිදුවන වෙනස්කම් ආශ්‍රිත කවි, ගී, ගායන හා රංගනවල නිරත වෙයි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය

ක්‍රියාකාරකම් 1

- පහත සඳහන් ආකාරයේ ක්‍රීඩා හා ක්‍රියාකාරකම් මේ සඳහා යොදා ගත හැකි ය.
- පළමුවන ශ්‍රේණියේ ගුරු අත්පොතේ දක්වා ඇති සෙවනැලි පැගීමේ ක්‍රීඩාවෙහි සිසුන් නැවත යොදවන්න. ක්‍රීඩාවේ යෙදෙන අතර සෙවනැලි වඩාත් පැහැදිලි වන හා පැහැදිලි නොවන අවස්ථා පිළිබඳ ව අවධානයෙන් සිටීමට සිසුන් උනන්දු කරන්න. ක්‍රීඩාවෙන් පසු එළිමහනේ හිරු එළිය අඩු වැඩි වන හැටි නිරීක්ෂණයට යොමු කරන්න.
- සෙවනැලි පැගීමේ ක්‍රීඩාවෙන් පසු සිසුන් සමග එළිය අඩු වැඩිවන විට සෙවනැලි වෙනස් වන ආකාරය පිළිබඳ කතා බහ කරන්න. ස්වාභාවික පරිසරයේ දී හිරු නැගෙන විට, හිරු බැස යන විට, වළාකුළු පාවෙන විට, වැසි වලාකුළු වර්ධනය වන විට, වැස්සකින් පසු නැවත අව්ව වැටෙන විට ආදී වශයෙන් එළිය අඩු වැඩි වන අවස්ථා පිළිබඳ අත්දැකීම් ප්‍රකාශ කිරීමට යොමු කරන්න. මෙසේ නිර්මාණය වූ අවස්ථාවක් චිත්‍රයට නැගීමට අවස්ථාව සලස්වන්න.

  උදා :- හිරු වළාකුලුවලින් මුවාවීම, හිරු නැගෙන විට හා හිරු බැස යන විට අහසේ ස්වභාවය

ක්‍රියාකාරකම් 2

- පාඩමට දින ගණනකට පෙර, හොඳින් තණකොළ වැවී ඇති තැනක, තණ මත ලෑලි කැබැල්ලක් වැනි දෙයක් දමන්න. දින කිහිපයකට පසු වැසූ ස්ථානය සිසුන් සමග නිරීක්ෂණය කිරීම සඳහා ලෑලි කැබැල්ල ඉවත් කරන්න. තණකොළ හරිත (කොළ) පැහැයේ සිට සුදු පැහැය දක්වා වෙනස් වී ඇත්තේ හිරු එළිය අඩු වීම නිසා බව සාකච්ඡාවක් තුළින් අවධාරණය කරන්න. සිසුන්ට ද ගෙදර දී නැවත මෙසේ කර බැලීමට යොමු කරන්න. අත්දැකීම් කතා බහ කරන්න.
- හිමිදිරියක හිරු නැගී එළිය වැඩි වන අවස්ථාවේ සහ හිරු බසින අවස්ථාවේ පරිසරයේ සිදු වන වෙනස්කම් නිරීක්ෂණය කිරීමට යොමු කරන්න. විශේෂයෙන් සතුන්ගේ හැසිරීම්වල වෙනස්කම් ද සොයා බැලීමට උපදෙස් දෙන්න. නිරීක්ෂණය කළ දෑ පිළිබඳ ව සිසුන් සමහ කතා බහ කරන්න.
- ළමා ගී පොතෙහි මෙයට අදාළ සිදුවීම් අලලා රචිත කවි හෝ ගීයකට සවන් දීමට යොමු කරන්න.

  උදා : කුමාරතුංග මුනිදාස ශූරීන්ගේ උදය කවි පන්තිය

  ඇසෙන්නෙ කා කා හඬ සෑම    පැත්තෙන්
  නැගෙව් කියන්නා වැනි දැන් ම    තින්දෙන්
  දොරින් අඩක් මේ ඇරියාම    එන්නේ
  සිසිල් සුළං රැලි ආයුබෝවන්    කියාමෙන්

- කවි පන්තියට සවන් දීමෙන් පසු හිරු නැගෙන විට එළිය වැඩිවීම සමග පරිසරයේ සිදු වන වෙනස්කම් සහ හිරු බැසයන විට එළිය අඩුවීම සමග පරිසරයේ සිදු වන වෙනස්කම් සාකච්ඡාවක් තුළින් මතු කරගන්න.


  උදා :- හිරු නැගෙන විට කාක්කෝ අවදි වෙති.
  හිරු නැගෙන විට මල් පිපෙයි.
  හිරු බසින විට කුරුල්ලෝ කැදලි සොයා යති.
  හිරු බසින විට කතුරු මුරුංගා/නිදිකුම්බා ගස් හැකිලෙයි.

- මෙවැනි අවස්ථාවක් ක්‍රියාකාරී ලෙස චලන මගින් දැක්වීමට හා කණ්ඩායම් වශයෙන් රංගනය කිරීමට සිසුන් යොමු කරන්න. ඒ පිළිබඳ කවි ගීත ගායනාවලට සහභාගි වීමට යොමු කරන්න.
- ඉහත අවස්ථාවක් චිත්‍රයට නැගීමට යොමු කරන්න. අවසානයේ චිත්‍ර ප්‍රදර්ශනය කර අගය කරන්න.


Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

ක්‍රියාකාරකම් 3

- එළිය අඩුවැඩි කිරීම් පිළිබඳ අත්දැකීම් ලබා දීම සඳහා පහත ක්‍රියාකාරකම්වල නිරත වීමට සලස්වන්න.
- විදුලිපන්දමක හිස කොටස ගලවා බල්බය විවෘත වන සේ තබන්න. බල්බය දල්වා විහිදෙන එළිය නිරීක්ෂණය කිරීමට සිසුන් යොමු කරන්න.



- ගැල වූ හිස කොටස සවි කර, එළිය ඈතට විහිදෙන ආකාරය නිරීක්ෂණය කිරීමට සලස්වන්න.




- අවශ්‍ය ලෙස එළිය විහිදීම අඩු කිරීම සඳහා ආවරණ යොදා ගැනීම පිළිබඳ ව අවධානය යොමු කරන්න. ඒ සඳහා විදුලි පන්දමේ හිස කොටස ඉවත් කර සිරස් ව එල්ලා ගන්න. කාඩ්බෝඩ්වලින් ලාම්පු ආවරණයක් නිර්මාණය කර බල්බය දල්වා බල්බයේ එළිය විහිදීම අඩු කරගත් ආකාරය නිරීක්ෂණය කිරීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- එළිය විහිදීම අඩු කිරීම සඳහා ගෙවල්වල ලාම්පු ආවරණ යොදා ඇති ආකාරය නිරීක්ෂණයට යොමු කරන්න.
- එවැනි ලාම්පු ආවරණ ආකෘති අලංකාරවත් ලෙස නිර්මාණය කිරීමට අවස්ථා සලසන්න.

  උදා :- කඩදාසිවලින් ලාම්පු ආවරණ ආකෘති නිර්මාණය


  ටින් බඳුනක් සිදුරු විද ආවරණයක් නිර්මාණය කිරීම
- එළිය අඩු වැඩි කිරීමේ වෙනත් ක්‍රම ද අත්හදා බැලීමට සලස්වන්න.

ක්‍රියාකාරකම් 4



- මුහුණ බලන කන්නාඩියකට (තල දර්පණයකට) විදුලි පන්දම් එළිය එල්ල කර විදුලි පන්දම් එළිය ගමන් කරන දිශාව වෙනස් වන ආකාරය නිරීක්ෂණය කිරීමට යොමු කරන්න.
- සිසුන් සමග කණ්ණාඩි කැබලි ගෙන එළිමහනට ගොස් හිරු එළිය ඈත ගස්වලට/කණුවලට යොමු කරමින් හිරු එළියේ දිශාව වෙනස් කිරීම ගැන අත්දැකීම් ලැබීමට සලස්වන්න.
- ආරක්ෂාව පිළිබඳ ව අවධානය යොමු කරන්න.
- එක් දර්පණයකට හිරු එළිය යොමු කොට එය වෙනතකට යැවීම පිළිබඳ ව සිසුන්ගේ අවධානය යොමු කරන්න. සිසුන් ලද අත්දැකීම් පිළිබඳ ව කතා බහ කරන්න.

  (මෙවැනි අවස්ථාවල දී හිරු එළිය සිසුන්ගෙන් හෝ පුද්ගලයන්ගේ ඇස්වලට, මුහුණට හෝ සිරුරට යොමු කිරීමෙන් වැළකීම ගැන දැඩි අවධානයක් යොමු කරන්න)
- වීදුරු පටි තුනක් එකිනෙකට ආනතව බැඳ, කළු කඩදාසියකින් ආවරණය කරන්න. එක් කෙළවරකට පොලිතීන් ෙ





විවර වූ කෙළවරෙන් වර්ණවත් කඩදාසි කැබලි, කුඩා මල්පෙති ආදිය දමා ඇති වන රටා බලමින් වින්දනයක් ලැබීමට සිසුන්ට අවස්ථාව සලස්වන්න.



Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

ක්‍රියාකාරකම් 5

- විනිවිද පෙනෙන වර්ණ සෙලෝපේන් කඩදාසිවලින් වර්ණ රාමු කිහිපයක් සාදා ගන්න.



රතු කහ නිල් කොළ

- විදුලි පන්දමක් වර්ණ රාමු පිටුපසින් අල්ලා, ඒවාහි එළි දැකීමට අවස්ථා ලබා දෙන්න. ඒවායින් ලැබෙන වර්ණ එළි ගැන කතා බහ කිරීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- වර්ණ එළි දැක්වෙන පහන් කූඩුවලින් ලත් සිසු අත්දැකීම් පිළිබඳ ව කතා බහ කරන්න.
- වර්ණ කඩදාසි යොදා වර්ණ විහිදෙන සරල පහන් කූඩු නිර්මාණය කිරීමට යොමු කරන්න. එවැනි සරල පහන් කූඩු තැනූ පසු පන්තියේ ප්‍රදර්ශනය කිරීමට ඉඩ සලසන්න. එම පහන් කූඩු වඩාත් නිර්මාණාත්මක ව ඉදිරිපත් කිරීම කෙරෙහි අවධානය යොමු කරන්න.
- කන්නාඩිවලින් (දර්පණ) එල්ල කරන සූර්යාලෝකය වර්ණ රාමු වෙත යොමු කර, පන්තියේ බිත්ති මත පතිත වීමට සලස්වන්න. මෙවැනි වර්ණ රාමු දෙකක් එකමත තබා, ඇති වන වර්ණ ප්‍රභේද නිරීක්ෂණය කරන්න. ඒ පිළිබඳ කතා බහ කරන්න.
- ආගමික උත්සව හා වෙනත් උත්සවවල දී සිසු නිර්මාණ සඳහා වර්ණ එළිය ඇසුරෙන් පහන් කූඩු වැනි නිර්මාණ කිරීමට යොමු කරන්න.

ක්‍රියාකාරකම් 6

- පාසල් වත්තේ හිරු එළිය හොඳින් වැටෙන ස්ථානයකට සිසුන් රැගෙන යන්න.
- හිරු එළිය ඇති විට සෙවනැල්ල දක්නට ඇති ආකාරය හොඳින් නිරීක්ෂණය කිරීමට අවස්ථාව දෙන්න. මෙය දවසේ පාසල් කාලය තුළ දී එකම ස්ථානයක සිට අවස්ථා කිහිපයක දී නිරීක්ෂණයට අවස්ථා සපයන්න. එක් එක් අවස්ථාවල දී සෙවනැල්ල තිබූ ස්ථාන සලකුණු කරන්න. මේ අනුව නිරීක්ෂණ කළ අවස්ථාවල දී දුටු සෙවනැලි අතර වෙනසක් තිබේ ද යන්න පිළිබඳ ව කතා බහ කරන්න.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

නිපුණතා :-

- ආසන්න පරිසරයේ පුද්ගලයින් ජීවිකාව සඳහා වැඩ කරන ස්ථාන හා ඒ ආශ්‍රිත තොරතුරු ගවේෂණය කර තොරතුරු වාර්තා කරයි.
- තාක්ෂණික වෙනස්වීම් අනුව වැඩ කරන අයුරු වෙනස් වී ඇති ආකාරය විමර්ශනය කර වාර්තා කරයි.
- වැඩබිම්වල විවිධ අවස්ථා නිරූපණය කරන භූමිකා රංගන, ගැයෙන කවි, ගී .. .. වැනි සෞන්දර්යාත්මක අංගවල යෙදෙමින් වින්දනයක් ලබයි.
- ජීවිකාව සඳහා කෙරෙන විවිධ වැඩවලින් සිදුවන සේවය අගය කරයි.
- විවිධ වැඩබිම්වල භාවිත කෙරෙන මෙවලම් හා උපකරණවල ආකෘති නිර්මාණය කර ඒවා ඇසුරු කර ගනිමින් ජන ක්‍රීඩාවල යෙදෙයි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය

ක්‍රියාකාරකම 1

- පාසලට සමීප ව ඇති මිනිසුන් වැඩ කරන තැනක තොරතුරු පළමුවන ශ්‍රේණියේ දී සිසුන් විසින් සොයා බලා ඇත. මෙම වසරේ දී එම ස්ථානය තෝරා නොගෙන පාසල සමීපයේ පිහිටි ගමට සේවයක් සලසන ශ්‍රමය මූලික කර ගත් වෙනත් සේවා ස්ථානයක් (විශාල කර්මාන්තශාලාවක් නොවිය යුතු ය) තෝරා ගන්න. එය නැරඹීම සඳහා යාමට සුදුසු දිනයක් වෙන් කර ගන්න.
- වැඩ බිම නැරඹීමට යාමට පෙර, ඒ සඳහා සිසුන් සූදානම් කරවන්න. අවශ්‍ය උපදෙස් දෙන්න.

  උදා :- කණ්ඩායම් සාමාජිකයකු වශයෙන් ඇති වගකීම්<br>
  තම තමාගේ ආරක්ෂාව සඳහා ක්‍රියා කළ යුතු ආකාරය<br>
  එක් එක් කණ්ඩායමකට විශේෂයෙන් විමසා දැන ගත යුතු කරුණු<br>
  දැක බලා ගත හැකි තොරතුරු හා ඒවා රැස් කර ගන්නා ආකාරය
- මේ සඳහා ඔබ එම ස්ථානයට කලින් ගොස්, යොමු කළ යුතු ඉගෙනුම් කරුණු, ස්ථාන සහ සිසුන් මෙහෙය විය යුතු ආකාරය පිළිබඳ සැලසුම් සටහනක් සකස් කර ගන්න.
- වැඩ බිමේ තොරතුරු යටතේ පහත දැක්වෙන ආකාරයේ කරුණු කෙරෙහි අවධානය යොමු කොට, කුඩා කණ්ඩායම්වලට වැඩ පවරන්න.

  උදා :- වැඩ බිමේ ඒ ඒ ස්ථාන සකස් කර ඇති ආකාරය<br>
  නිෂ්පාදනයට අවශ්‍ය දෑ රැස් කර ඇති ආකාරය<br>
  වැඩ බිමෙන් කෙරෙන නිෂ්පාදනය හා තොරතුරු<br>
  අප ද්‍රව්‍ය ඉවත් කරන ආකාරය<br>
  සේවක තොරතුරු (විශේෂ නිල ඇඳුම්, වැඩ කරන ආකාරය, සංඛ්‍යාව)<br>
  භාවිත කරන උපකරණ යන්ත්‍ර සූත්‍ර පිළිබඳ තොරතුරු<br>
  වැඩ කරන වේලාවන් (ආරම්භන වේලාව/නිමා වන වේලාව/විවේක කාලය)

  ඉහත සඳහන් කරුණු පිළිබඳ සරල අවබෝධයක් සඳහා සිසුන් මෙහෙයවන්න.
- මෙහි දී වැඩ පොළේ නම, භාවිත කරන උපකරණවල නම්, නිෂ්පාදන ද්‍රව්‍ය, ආදිය ලියා ගැනීමට සලස්වන්න.
- එක් එක් අංශයක සේවකයකු හට පැවරී ඇති වැඩ ගැන දැන ගැනීමට ඔහු/ඇය සමග කතා බහ කිරීමට සලස්වන්න.
- යන්ත්‍රයක්/මැෂිමක් වැනි දෙයක සුවිශේෂ කොටසක් නිරීක්ෂණ කිරීමට සලස්වන්න.

  උදා :- කරකැවෙන රෝදයකින් තවත් රෝදයක් කැරකැවෙන බව<br>
  දැතිවලින්/පටිවලින් රෝද කරකැවෙන ආකාරය
- සේවා ස්ථානය නැරඹීමෙන් පසු පන්තියට පැමිණ ඒ පිළිබඳ තොරතුරු විවිධ ක්‍රමයට වාර්තා කිරීමට සලස්වන්න. පළමු ව සාමූහික සාකච්ඡාවකින් ආරම්භන්න.
- නැරඹූ වැඩ බිමේ සිත් ගත් අවස්ථාවක්/තැනක් චිත්‍රයට නැගීමට යොමු කරන්න.
- වැඩ බිමේ දක්නට ලැබුණු උපකරණවල ආකෘති නිර්මාණය කර (උදා :- දැකැති, උදලු, මිටි) වඩාත් ගැළපෙන ආකාරයට කණ්ඩායම් වැඩ සේ ඉදිරිපත් කිරීමට පවරන්න. එම උපකරණවල හැඩයන් බ්‍රිස්ටල් බෝඩ් හෝ වෙනත් ඝන කඩදාසි යොදා ගනිමින් නිර්මාණය කර ගැනීමට අවශ්‍ය මග පෙන්වීම් කරන්න. තවත් වර්ණ



Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

කඩදාසි (වාර්නිස් කඩදාසි) භාවිත කර සරල හැඩ (කැටයම්) කපා ගෙන, ඉහත සකස් කර ගන්නා ලද උපකරණවල අලවා අලංකාර කර ගැනීමට සිසුන්ට උපදෙස් දෙන්න.

- නැරඹූ වැඩ බිමේ කිසියම් ස්ථානයක/අවස්ථාවක කාර්යයන් නිරූපණය කරමින් රංගනයක යෙදීමට සිසු කණ්ඩායම් යොමු කරන්න.
- ගමෙන් පිට ප්‍රදේශවල මිනිසුන් කරන වැඩ හා විවිධ තැන් සොයා බැලීම සඳහා පුවත්පත්වල පළවන පින්තූර කිහිපයක් කපා සූදානම් කරගන්න.

මේ යටතේ දිනපතා පුවත් පත්වල වෙළෙඳ දැන්වීම් වශයෙන් පළ කරනු ලබන පින්තූර

උදා :

ගොවිතැන් වැඩට අදාළ පින්තූර
ජලනළ සවි කිරීම හා සම්බන්ධ පින්තූර
විසිතුරු ලී බඩු දැක්වෙන පින්තූර
දුරකථන සේවා පින්තූර
ධීවර කර්මාන්තයට අදාළ පින්තූර
විවිධ යන්ත්‍ර සූත්‍ර ඇතුළත් පින්තූර
රන් ආභරණ හා විසිතුරු ආභරණ පින්තූර
පාවහන් කර්මාන්තයට අදාළ පින්තූර

මෙම පින්තූර කණ්ඩායම්වලට ඉදිරිපත් කර ඒවා නිරීක්ෂණය කර විවිධ ස්ථානවල කෙරෙන වැඩ පිළිබඳ හඳුනා ගැනීමට සලස්වන්න. ඒ ගැන කතා බහ කරන්න.

- වැඩ බිමක තොරතුරු හෙළි වන කවි ගායනය කිරීමට සලස්වන්න. ඊට උචිත රංගන යොදා ගන්න.

උදා :-

1. දැල් ඇදීම

1. ඕඩි හෙලෙයි හෙලෙයියා
අදිමුකො දැල හෝයියා

2. පොකිරිස්සො ද හාල් මැස්සො
කුනිස්සො ද පියා මැස්සො
මේවා මුදු මාළු
අදිමුකො දැල යාළු

3. තෝරු බලයො අන්ජිලාවො
මෝරු පරව් කුම්බලාවො
මේවා මුදු මාළු
අදිමුකො දැල යාළු

4. කෙලවල්ලෝ කාරල්ලෝ
අන්ගුලුවෝ සහ දැල්ලෝ
මේවා මුදු මාළු
අදිමුකො දැල යාළු
ඕඩි හෙලෙයි හෙලෙයියා
අදිමුකො දැල හෝයියා

(ගී සීපද ) එච්. ඩී. ජයතිලක

2. වැඩ කරමු

1. ටා ං ටී ං කම්මලේ
යකඩ තලනවා
තලන යකඩ දමාලා
උදලු හදනවා

2. ගල්වලේ ගල් කඩා
පාර හදනවා
පාරෙ තාර දමාලා
ට්‍රැක්ටර් යනවා

3. වැව් කපා ඇල හදා
වතුර එවනවා
කුඹුරේ වතුර පිරීලා
ගොයම් හැදෙනවා

4. සේරම අපි එක්වෙලා
වැඩෙහි යෙදෙනවා
ඒ හින්දා අපේ රටට
කිරි ඉතිරෙනවා

(ගී සීපද)

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

ක්‍රියාකාරකම් 2

- සිසුන් නිරීක්ෂණය කරන ලද වැඩ කරන ස්ථානය අනුව පහත දැක්වෙන කරුණු යටතේ සොයා බැලීමට සිසුන් යොමු කරන්න. සිසු මට්ටමට ගැළපෙන සේ මෙහෙයවන්න.
  වැඩ පහසු කර ගැනීමට දැනට භාවිත කරන ක්‍රම/දේවල් හා සතුන්
  වැඩ පහසු කර ගැනීමට සතුන් වෙනුවට යොදා ගෙන ඇති තාක්ෂණික යන්ත්‍ර සූත්‍ර
  නව තාක්ෂණික උපකරණ /යන්ත්‍ර සූත්‍ර නිසා සිදු වී ඇති වාසි
  පැරණි අය මේ සඳහා යොදා ගත් දේවල් හා ක්‍රම
- සිසුන් රැස් කර ගත් තොරතුරු ඉදිරිපත් කිරීමට සලස්වන්න. සරල මට්ටමින් ඒ පිළිබඳ ව කතා බහ කරන්න.
- තෝරා ගත් ස්ථානයට අමතර ව තමන්ගේ අත්දැකීම් අනුව යම් යම් වැඩ කරන ස්ථානවල දක්නට ලැබුණු නව තාක්ෂණික යන්ත්‍ර සූත්‍ර හා උපකරණ පිළිබඳ කතා බහට ද අවස්ථාව සලසන්න.
  උදා :
  - ඇඳුම් මසන තැනක
  - නව ගොඩනැගිල්ලක් ඉදි කරන ස්ථානයක
  - කුඹුරු ආශ්‍රිතව වැඩ කරන තැනක
  - පාරවල් හදන තැනක
- තෝරා ගැනෙන ස්ථානයේ අතීතයේ ක්‍රියා කළ ආකාරය පිළිබඳ ව රූප/චිත්‍ර ඇසුරින් කතා බහ කරන්න.
- එදා වැඩ සහ අද වැඩ කරන ආකාරයන් දැක්වෙන භූමිකා රංගන ඉදිරිපත් කිරීමට සලස්වන්න. මේ සඳහා දෙවන ශ්‍රේණියේ සිසුන් සහ 6 /5 ශ්‍රේණිවල සිසුන් ද එකතු වී රංගන ඉදිරිපත් කිරීමට සලස්වන්න.
  උදාහරණ :

| දෙවන ශ්‍රේණියේ සිසුන් | 6 වන ශ්‍රේණියේ සිසුන් |
|---|---|
| වංගෙඩිය මෝල්ගස ඇසුරෙන් පිටි කෙටීම | ඇඹරුම්හලක පිටි කෙටීම |
| නූල් ඉඳිකටු භාවිතයෙන් ඇඳුම් මැසීම | මැෂිමකින් ඇඳුම් මැසීම |
| නගුලෙන් සීසෑම | ට්‍රැක්ටරයෙන් සීසෑම |

- එදා ගෙවල්වල භාවිත කළ ක්‍රමවලට වඩා අද වැඩ පහසු කිරීමට ඇති දේවල් පිළිබඳ ව සිසුන්ගේ අත්දැකීම් ප්‍රකාශ කිරීමට අවස්ථාව දෙන්න.

ක්‍රියාකාරකම් 3

- පැරැන්නන් ගොවිතැන් කටයුතුවල දී ගොයම් කැපීම/පැල් රැකීම වැනි අවස්ථාවල දී කවි ගී ගායනය කරමින් සතුටින් සහයෝගයෙන් වැඩවල නිරත වූ අයුරු සිහිපත් කරන්න. එම අවස්ථාවල භාවිත කළ කවි, ගී කිහිපයක් ඔබ හෝ ඉහළ ශ්‍රේණියක සිසුවකු ලවා හෝ ගායනය කරන්න. ගායනාවලට සවන් දීමට සිසුන් යොමු කරන්න.
  උදා :- ගොයම් කැපීම හා බැඳුණු කවියක්

  තෙල්ගාලා හිස පීරන් නැනෝ
  ඇටවැල අරගෙන බැඳගන් නැනෝ
  සේලය ඉනවට ඇඳගන් නැනෝ
  ගොයම් නෙලන්නට යමු අපි නැනෝ

- වැඩ කරන විට පාලුකම වෙහෙස නැති කර ගැනීමට එදා ගැමියන් කවි, ගී ගායනා කළ බව සිසුන් දැනුවත් කරන්න. එවැනි කවියක් හෝ දෙකක් ඉදිරිපත් කර සිසුන්ට සවන් දීමට සලස්වන්න.
  උදා :- කරත්ත කවි, පාරු කවි, පතල් කවි,
- ගැමියන් භාවිත කළ වැඩ හා බැඳුණු කවි, ගී කිහිපයක් තෝරා ගෙන සිසුන්ට ගායනය කිරීමට හා රංගනයෙහි යෙදීමට සලස්වන්න.
- වැඩ හා බැඳුණු පැරණි හා නූතන කවි ගී ඇසුරෙන් ගායනා හා රංගන යොදා ගෙන ඒවා පන්ති මට්ටමේ වේදිකාවකට ගෙන එන්න.
  උදා :- ගොවි බිම හා බැඳුණු චරිත අවස්ථා (ආදේශක භාණ්ඩ වාදනය ද එකතු කර ගන්න)
  ගොවියා /වඩුවා / වට්ටි අම්මා
  යන්ත්‍ර සූත්‍ර අභිරූපන ක්‍රියාකාරකම්

ළමා ගී කැසට් පටයේ අලුත් පාරක් අපේ ගමට ගීතය උදවු කර ගන්න.



Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

නිපුණතා :-

- තම ප්‍රයෝජනය පිණිස මිනිසා විසින් පරිසරයේ කර ඇති වෙනස්කම් විමර්ශනය කර වාර්තා කරයි.
- මිනිසාට ජීවත් වීම සඳහා මූලික වශයෙන් ආහාර නිපදවා ගන්නා ස්ථාන හඳුනාගෙන වාර්තා කරයි.
- පස රැක ගැනීමේ විවිධ උපාය මාර්ග අත්හදා බලයි.
- පරිසර විවිධත්වය තමන් කැමති මාධ්‍යය භාවිත කරමින් නිර්මාණ කරයි.
- මිනිසා විසින් සකස් කර ගත් ස්ථානයක් ලෙස සෙල්ලම් මිදුල හඳුනාගෙන ශරීර වර්ධනයට අදාළ ක්‍රියාකාරකම් කිහිපයක නියුක්ත වෙයි.
- වටාපිටාවේ සුන්දරත්වය අගයමින් කවි, ගී, ගායනා හා රංගනවල නිරත වෙයි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය

ක්‍රියාකාරකම් 1

- කුඹුරක/ගොවිපළක පින්තූර ඉදිරිපත් කරමින් එය මිනිසා විසින් සකස් කර ගත් පරිසරයක් බව කතා බහ කරන්න.
- සමීප පරිසරයේ ගොවිපළක්/කුඹුරක් වැනි ස්ථානයක් නැරඹීමට අවශ්‍ය කටයුතු සංවිධානය කරන්න. ඒ සඳහා වගාවට කෘමිනාශක, වල්පැළෑටි නාශක වැනි රසායන ද්‍රව්‍ය මෑතක දී භාවිත නොකළ දිනයක් තෝරා ගන්න. නිදහසේ ගොවිපළේ ඇති දේවල් නිරීක්ෂණය කිරීමට හැකි වන සේ දරුවන්ගේ ඇඳුම් සහ අවශ්‍ය ද්‍රව්‍ය සූදානම් කර ගැනීමට උපදෙස් දෙන්න. එම දිනයේ දී කුඹුර/ගොවිපළ පිළිබඳ ව සිසුන්ට තොරතුරු සැපයිය හැකි ගොවි මහතකු හෝ වෙනත් දැනුවත් කළ හැකි අයකු කැඳවා ගැනීමට සැලසුම් කරන්න.
- ගොවිපළේ දී/කුඹුරේ දී නිරීක්ෂණය කළ යුතු දේ
  - ගොවිපළේ/කුඹුරේ භූමියේ ලක්ෂණ
  - බෝග වගා කර තිබූ ආකාරය
  - බෝග වර්ග
  - මිනිසුන් වැඩෙහි නිරත වන ආකාරය හා වැඩ කරන වේලාවන්
  - බෝග සඳහා ජලය සපයා ඇති ආකාර
  - බෝග ආරක්ෂා කර තිබූ ආකාර
- ගොවිපළේ දී/කුඹුරේ දී ගොවි මහතෙක් හමු වී, ගොවි බිම පටන් ගත් ආකාරය පිළිබඳ කරුණු විමසා දැන ගැනීමට අවස්ථාව සලසන්න. ගොවිපළ සම්බන්ධව ගොවි මහතා සමග සුහද ව ප්‍රශ්න ඇසීමට සිසුන් යොමු කරන්න.
- තොරතුරු සොයා ගත් පසු, පන්ති කාමරයට පැමිණ, ඒවා විවිධ ක්‍රම මගින් වාර්තා කිරීමට සලස්වන්න.
  උදා :- රූප /චිත්‍ර, ආකෘති, රංගන

ක්‍රියාකාරකම් 2

- වැස්ස අහිත කර ලෙස ලැබීම හේතු කොට ගෙන පස සේදී යාම නිසා බෝගවලට හානි සිදුවීම, පසෙහි සාරවත් බව විනාශ වීම, බොරළු කැට මතු වීම ආදී ලක්ෂණ මතුකරමින් කතා බහ කරන්න.
- විශේෂයෙන් පස සේදී යාම, බිමේ පිහිටීම අනුව අඩු වැඩි වන බව සරල ක්‍රියාකාරකමකින් පෙන්වා දෙන්න.
  උදා :
  හැඩය වැඩි උස් බිමකට හා සමතලා බිමකට පස් දමා ජලය වත් කරන්න. සිදුවන්නේ කුමක් ද? ඒ පිළිබඳ ව කතා බහ කරන්න.
- නිරීක්ෂණය කළ ගොවිපළේ/ කුඹුරේ විවිධ ස්ථානවල දක්නට ලැබෙන පස ආරක්ෂා කිරීමට යොදා ඇති උපාය මාර්ග පිළිබඳ කතා බහ කරන්න.
  උදා :- කාණු කැපීම, ගල් වැටි ඇමීම, නියර බැඳීම, ආවරණ පැළෑටි වැවීම, බෝග අතරට ද්‍රව්‍ය ඇමීම (පිදුරු, ලී කුඩු, කොහු බත්, කොළ රොඩු වැනි)


Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

- පාසල් වත්තේ භූමිය ආරක්ෂා කර ගැනීමට ගෙන තිබෙන ක්‍රියාමාර්ග නිරීක්ෂණය සඳහා පාසල් වත්තේ නිරීක්ෂණ චාරිකාවකට යොමු කරන්න. යොදාගෙන ඇති ක්‍රියාමාර්ග හොඳින් නිරීක්ෂණයට සලස්වන්න. එසේ සිදු නොවූ ස්ථාන තිබේ නම් ඒ සඳහා කළ හැකි කාර්යයන් හඳුනා ගැනීමට සලස්වන්න. හැකිනම් වැඩිහිටියන්ගේ ද සහයෝගයෙන් එම ස්ථානවල පස සෝදා යාම වැළැක්වීමට සුදුසු පියවර ගැනීමට කටයුතු කරන්න.
- කැමති මාධ්‍යයක් භාවිත කරමින් පරිසර විවිධත්වය පිළිබඳ (ගස් වැල්, කඳු, තැනිතලා, මල්, සතුන් ... වැනි) නිර්මාණ කිරීමට අවස්ථාව සලස්වන්න. මෙය කණ්ඩායම් වශයෙන් වුව ද නිර්මාණය කිරීමට ඉඩ ලබා දෙන්න.
- වටපිටාවේ සුන්දරත්වය ගැන කියැවෙන කවි, ගී ගැයීමට හා ඒ අනුව රංගනවලට අවස්ථාව දෙන්න. ආදේශක භාණ්ඩ ද උපයෝගි කර ගන්න.

ක්‍රියාකාරකම් 3

- පාසල් භූමියේ සකස් කර ඇති සෙල්ලම් මිදුල මෙම සිසුන් සඳහා වූ ස්ථානයක් ලෙස මීට පෙර හඳුන්වා දුන් බව නැවත මතක් කරන්න. සෙල්ලම් මිදුලේ ඇති විවිධ උපකරණ භාවිත කරමින් ක්‍රීඩා කිරීමට අවස්ථාව ලබා දෙන්න. මේ සඳහා ගුරු අත්පොතෙහි සෙල්ලම් මිදුල යටතේ ඉදිරිපත් කර ඇති කොටසට අනුව ක්‍රීඩා නිර්මාණය කර සෑම ශිෂ්‍යයකුට ම අවස්ථාව ලැබෙන පරිදි ක්‍රීඩා සඳහා යොමු කරන්න.
- සෙල්ලම් මිදුලේ හෝ (ඉඩකඩ සහිත නම්) පිට්ටනියේ හෝ වෙනත් නිදහස් ස්ථානයකට සිසුන් රැගෙන යන්න.
- එහි සීමිත කොටසක අම්බිලි කිහිපයක් (කකුලෙන් අඳින ලද රවුම්) හෝ වෙනත් සලකුණු කිහිපයක් එක සමාන දුරකින් අඳින්න.
- එම අම්බිලි/සලකුණ කිහිපයක් පහත ආකාරයෙන් නම් කර ඒ සඳහා සලකුණක් යොදන්න.

  උදා :- වලක්<br>
  මඩ සහිත<br>
  කටු සහිත




ආරම්භක ස්ථානය　　　　ක්‍රීඩාව අවසන් කරන ස්ථානය

(මෙම සටහන වෙනත් ආකාරයකට වුව ද සකස් කර ගත හැකි ය)

- සුවිශේෂ ලෙස නම් කළ ස්ථාන මග හැර අනෙක් සලකුණු ස්ථාන මත පැන පැන යාමට සිසුන්ට උපදෙස් දෙන්න.
- නිවැරදි ලෙස ගමන් කිරීම අවශ්‍ය බව අවධාරණය කරන්න.
- තව ද දිය ගොඩ පැනීමේ ක්‍රීඩාව සඳහා ද සිසුන් යොමු කළ හැකි ය. මේ සඳහා ගුරුවරයාගේ විධානයට අනුව දිය ගොඩ පැනීමට උපදෙස් දෙන්න. මෙහි දී රේඛාවක් ඇඳ ක්‍රීඩා කිරීම වඩාත් යෝග්‍ය වේ.
- දිය ගොඩ පැනීමේ දී පාද දෙකම තබා පැනීමත් තනි කකුලෙන් පැනීමත් යන දෙආකාරයට ම සිසුන් යොමු කරන්න.
- මෙම ශාරීරික ක්‍රියාකාරකම් එකවර ඉදිරිපත් කිරීමට වඩා දින කිහිපයක දී එකිනෙක ඉදිරිපත් කිරීම වඩා යෝග්‍ය වේ.

ක්‍රියාකාරකම් 4

- මෙම තේමාව යටතේ නිරීක්ෂණය කරන ලද පරිසර විවිධත්වය තුළ තමන් සිත්ගත් අවස්ථාවක් රේඛාමය චිත්‍ර මගින් ඉදිරිපත් කිරීමට අවස්ථාව සලස්වන්න.
- මේ සඳහා ඝන කාඩ්බෝඩ් කැබැල්ලක්/බෙලෙක් තහඩුවක්/ලෑල්ලක් මත පාප්ප තට්ටුවක් හෝ මැටි තවරු පුවරුවක් සකස් කර ගැනීමට උපදෙස් දෙන්න. ඒ මත පදාස හා රේඛා මතු කරමින් චිත්‍ර නිර්මාණයට අවස්ථාව ලබා දෙන්න.



Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

නිපුණතා :

- උදව් අවශ්‍ය අය සඳහා උදව් කිරීමට ස්ව කැමැත්තෙන් ඉදිරිපත් වෙයි.
- උදව් කළ අවස්ථා හා සිද්ධි පිළිබඳ අත්දැකීම් අන් අය සමඟ හුවමාරු කර ගනියි.
- එදිනෙදා ජීවිත කාර්යයන්වල දී සෑම කෙනෙකුගේ ම උදව් අවශ්‍ය වන බව හා අවශ්‍ය අවස්ථාවල කෙනෙකුට උදව් දීම තම යුතුකමක් සේ පිළිගනිමින් ක්‍රියා කරයි.
- සාමූහික ව වැඩ කිරීමෙන් වැඩි ඵලයක් ලබා ගැනීමට හැකියාවක් ලැබෙන බව අවබෝධ කර ගනියි.
- කෙනෙකුගේ සහාය ලබා ගනිමින් ක්‍රියාත්මක වන ක්‍රීඩාවල නිරත වෙයි.
- වින්දනය සඳහා සාමූහික ව ගායන, රංගන සහ නිර්මාණවල යෙදෙයි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය

ක්‍රියාකාරකම් 1

- පසුගිය සතියේ එක් එක් සිසුවාට දක්නට ලැබුණු සිද්ධි ඇසුරෙන් ගමේ/පාසල වටාපිටාවේ උදවු අවශ්‍ය වූ අය පිළිබඳ ව තොරතුරු විමසන්න.

  උදා :

  කුසගින්නේ ආ අයෙක්
  ඇවිදීමට අපහසු ව සිටින කෙනෙක්
  පඩිපෙළක් නගින්නට බැරිව සිටි කෙනෙක්
  බෙහෙතක් සොයා ආ කෙනෙක් ආදී වශයෙන්

- ඒ ඒ අය එම උදවු ඉල්ලාගෙන පැමිණීමට හේතු විය හැකි වූ කරුණු පිළිබඳ ව කතා බහ කරන්න.
- ස්ව කැමැත්තෙන් කෙනෙකුට උදවු කළ අවස්ථා හා ඊට හේතු වූ කරුණු කතා බහ කරන්න.
- එවැනි අවස්ථාවක් චිත්‍රයට නැගීමට උපදෙස් දෙන්න.
- උදවුවක් ඉල්ලා ආ කෙනෙකුට උදවු කරන ආකාරය නිරූපණය කරන අවස්ථා චරිතාරෝපිත ව ඉදිරිපත් කිරීමට සිසුන් යොමු කරන්න.

ක්‍රියාකාරකම් 2

- සිසුන් කණ්ඩායම්වලට බෙදන්න. (පන්තියේ සිටින සංඛ්‍යාව අනුව කණ්ඩායමකට 5/6 ක් වන සේ)
- සතියක් තුළ එකිනෙකාට කරන උදවු කඩදාසියක සටහන් කිරීමට සලස්වන්න.
- ඩිමයි කඩදාසියක් බැගින් ගෙන එක් එක් කණ්ඩායමේ සිටින සිසුන්ගේ නම් වෙන වෙන ම පහත දැක්වෙන ආකාරයට ලියන්න. ඒවා බිත්තියේ සවිකරන්න.

  උදා :

  කණ්ඩායම - 1

| | | | |
|---|---|---|---|
| ලලිත් → | කමල් | රමණී | ප්‍රභාත් |
| කුමාරි | හර්ෂා | → පුබුදු | හංසා |

  කණ්ඩායම - 2

| | | | |
|---|---|---|---|
| පුෂ්පා | තිලක් | රෝහිත | පාලිත |
| අමර | බුද්ධික | ජයසිරි | ප්‍රීති |

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

- එක් එක් ශිෂ්‍යයකු තවත් ශිෂ්‍යයකුට පන්තියේ දී උපකාරයක් කරන සෑම අවස්ථාවක දී උදවු කළ අයගේ නමේ සිට උදවු ලැබූ අයගේ නම දක්වා ඊතලයක් ඇඳීමට යොමු කරන්න. (ඉහත සටහනේ දැක්වෙන ලලිත් පුබුදුට පොත කියවීමට උදවු කිරීම ... වැනි) දවසේ වේලාවක සටහන බලා උදවු කිරීම් පිළිබඳ ව කතා බහ කරන්න. අගයන්න.
- සතිය අවසානයේ ඊතල වැඩි ගණනක් ආරම්භ කර ඇති සිසුන්ගේ නම් ඇසුරෙන් වැඩියෙන් උදවු කළ සිසුන් හඳුනා ගැනීමට සලස්වන්න. සිසුන් අගය කරන්න. සෑම ශිෂ්‍යයෙක් ම කිනම් හෝ උදව්වක් ලබා දී ඇති බවට සටහනින් හඳුනා ගැනීමට පුලුවන් විය හැකි ය. එසේ උදවුවක් නොකළ කිහිපදෙනෙකු ද හඳුනා ගැනීමට පුලුවන් විය හැකි ය. ඒ අය ද අන් අයට උදවු කිරීමට උනන්දු කරවන්න. මේ වෙනුවෙන් පන්තියේ සෑම ශිෂ්‍යයකුට ම කුඩා සිහිවටනයක් ලබා දීමට කටයුතු සලස්වන්න. මෙම සිහිවටන පන්තියේ සිසුන් විසින් කරන ලද නිර්මාණ නම් වඩාත් හොඳයි.

ක්‍රියාකාරකම් 3

- අන්‍යයන්ට උදවු කළ හැකි අවස්ථා හඳුනා ගෙන ඒ අවස්ථාවලට ගැළපෙන සේ කළ හැකි උදවු ගැන සාකච්ඡා කරන්න.

  උදා :-

  (නිවසේ දී)
  තාත්තා වැඩට යන්නට සූදානම් වන විට
  අම්මා ආහාර පිසින අවස්ථාවේ දී
  අක්කා ගේ දොර පිරිසිදු කරන වේලාවේ දී

  (පාසලේ දී)
  සෙල්ලම් පිටියේ දී ක්‍රීඩා කරන විට මිතුරා බිම ඇද වැටුණු විට
  පන්තියේ සිසුවකු දිවා ආහාර ගෙනැවිත් නොතිබුණු අවස්ථාවක

  (අවට පරිසරයේ දී)
  බෙහෙත් පැළෑටියක් සොයා ගෙන ආ අමුත්තකු හමු වූ විට
  ඔබේ අසල්වැසියකුගේ ගෙදරට යාමට නොහැකි ව අතරමං වී සිටින පුද්ගලයකු හමු වූ විට
  වළකට වැටුණු සතෙකු ගොඩ ඒමට නොහැකි ව දඟලන විට

- මෙබඳු අවස්ථාවල සිසුවකුට උදවු කළ හැකි ආකාරය පන්තිය ඉදිරියේ විස්තර කිරීමට සලස්වන්න. එහි දී පහත දැක්වෙන කරුණු පිළිබඳ ව සැලකිලිමත් වීම වැදගත් බව අවධාරණය කරන්න.

  උදා :- උදවුවක් අවශ්‍ය බව ඉඟියෙන් මෙන් දැන ගැනීම.
  උදවුව කිරීමට කැමැත්තෙන් ඉදිරිපත් වීම.
  තමාට හැකි අයුරෙන් උදවුව කිරීම.
  තමාගේ ආරක්ෂාව පිළිබඳ සැලකිලිමත් වීම.

- උදවු ලබන්නාට උපරිම ආකාරයෙන් ප්‍රයෝජන ලැබෙන පරිදි උදවු කිරීමේ වැදගත්කම පැහැදිලි වන අයුරින් සාකච්ඡාව මෙහෙයවන්න.

  උදා : ලේන් පැටියකු කූඩුවෙන් වැටී බිම සිටිනු දුටු අජිත් ඌව අතට ගෙන පරීක්ෂා කරයි. තුවාල ආදිය නැති බව දැන ගෙන සතුටු වෙයි. ඇගේ තිබූ රොඩු කැබලි ආදිය ඉවත් කොට ආපසු එතනින් ම ප්‍රවේශමෙන් තබා ඉවත් වෙයි.

  මෙම උදවුව ලේන් පැටියාට ප්‍රමාණවත් ද?

  ඌට කපුටන්ගෙන් හා වෙනත් සතුන්ගෙන් හානි සිදු විය නොහැකි ද? ඌගේ ආරක්ෂාවට කළ හැකි දේ මොනවා ද?

- සිසුන් ඉදිරිපත් කළ සිද්ධි ආධාර කොට ගෙන උදවුව ලබන්නාට උපරිම ප්‍රයෝජනයක් ලැබෙන පරිදි එය කළ යුතු ආකාරය හඳුනා ගැනීමට සලස්වන්න.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

ක්‍රියාකාරකම් 4

- පන්තියේ සැම ශිෂ්‍යයකුගේ ම සහයෝගයෙන් කළ යුතු කාර්යයක් හඳුනා ගෙන එම කාර්යයට සිසුන් යොමු කරන්න.

  උදා :- පන්තිය අලංකාර කිරීමේ වැඩ සටහනක්, සෙල්ලම් මිදුල පවිත්‍ර කිරීම
- එකිනෙකා උදවු ලබමින් යම් කිසි වැඩක් සාර්ථක කර ගන්නා අවස්ථාවන් හෝ උදවු අවශ්‍ය කෙනෙකුට පිහිටවන ආකාරය නිරූපණය වන ආකාරය හෝ දැක්වෙන කෙටි නාට්‍යයක් නිර්මාණය කර සිසුනට රංගනයට අවස්ථාව ලබා දෙන්න.

ක්‍රියාකාරකම් 5

- කණ්ඩායම් වශයෙන් නිර්මාණ සකස් කිරීම සඳහා අවස්ථාව ලබා දීමට කල් තබා අපතේ යන විවිධ ද්‍රව්‍ය රැස් කරවන්න. (උදා :- ලී බඩුවලින් ඉවත ලන ලී කුට්ටි, ලී කුඩු, යාතු ගාන ලද ලී කැබලි, රෙදි කැබලි, රෙදි පටි, පොල් කුඩු, වියළා ගත් ශාක පත්‍ර, මල්, පොල් ගස්වල මටලු)
- කණ්ඩායමකට හතර දෙනෙක් හෝ පස් දෙනෙක් බැගින් වන සේ කණ්ඩායම් කිහිපයකට බෙදන්න. කැමැති ද්‍රව්‍ය භාවිත කර කණ්ඩායම් වශයෙන් නිර්මාණයක් කිරීමට අවශ්‍ය උපදෙස් දෙන්න.
- කරන ලද නිර්මාණ ප්‍රදර්ශනය කර ඒවා ඇගයීමට ලක් කරන්න.

ක්‍රියාකාරකම් 6

- කණ්ඩායම් වශයෙන් ක්‍රීඩා කිරීම සඳහා සිසුන් නිදහස් ස්ථානයකට කැටුව යන්න. සිසුන් කණ්ඩායම් දෙකකට වෙන් කරන්න.
- තරමක් විශාල රබර්/ප්ලාස්ටික් බෝල දෙකක් සපයන්න.
- සිසුන් පේළි දෙකක් ලෙසින් පෙළ ගස්වා පහසුවෙන් සිට ගැනීමට උපදෙස් දෙන්න. පේළි දෙකෙහි පළමු සිසුන් දෙදෙනාට පන්දු අතට දී පහත් වී එය පිටු පස සිටින සිසුවාට දෙපා අතරින් යැවීමට කියන්න. පන්දුව යැවූ පසු පේළියේ පිටුපසට දිවගොස් එතැන සිට ගැනීමට කියන්න. මේ ආකාරයෙන් පේළියේ මුල සිටි සිසුවාට නැවත පන්දුව ලැබෙන තෙක් ක්‍රීඩාවෙහි යෙදීමට උපදෙස් දෙන්න. පළමුවෙන් අවසන් කළ කණ්ඩායම ජයග්‍රහණය කරයි.
- මෙවැනි සාමූහික ක්‍රීඩා තවත් නිර්මාණය කර ක්‍රීඩාවල නිරත වීමට අවස්ථාව ලබා දෙන්න.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

# ක්‍රියාකාරකම් පාදක වාචික ඉංග්‍රීසි

## හැඳින්වීම

පළමුවන ශ්‍රේණියේ සිට ම සන්නිවේදනය හා අවබෝධය සඳහා ඉංග්‍රීසි භාවිත කිරීමට දිවයිනේ සියලු ම සිසුන්ට සම අවස්ථා ලබා දීම අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වැඩ සටහන යටතේ යෝජනා කර ඇති අලුත් අංගයකි. මෙම නව අංගය ක්‍රියාකාරකම් පාදක වාචික ඉංග්‍රීසි ලෙස හැඳින්වේ. මෙම නාමයෙන් පිළිබිඹු වන පරිදි ම මෙහි දී අවධානය යොමු වනුයේ සිසුන් ක්‍රියාකාරකම් හෝ සැලසුම්ගත සෙල්ලම්වල හෝ යෙදී සිටින අවස්ථාවල දී කතා බහ සඳහා ඉංග්‍රීසි භාවිතය යි. මෙම කාර්යය කළ යුත්තේ පන්ති භාර ගුරුවරයා විසින් ය. විශේෂඥ ගුරුවරයකු යොදා විධිමත් ආකාරයට ඉංග්‍රීසි ඉගැන්වීමක් මෙම අංගය යටතේ අපේක්ෂා නොකෙරේ. විධිමත් ව ඉංග්‍රීසි ඉගැන්වීම තුන්වන ශ්‍රේණියේ දී ආරම්භ කෙරෙනු ඇත. පළමුවන ශ්‍රේණියේ දී හඳුන්වා දුන් මෙම නව අංගය දෙවන ශ්‍රේණියේ සිට තව දුරටත් ඉදිරියට ගෙන යෑම අපේක්ෂා කෙරේ. පළමුවන ශ්‍රේණියේ දී වැඩි අවධානයක් යොමු කරනු ලැබුවේ තනි ඉංග්‍රීසි වචන සහ සරල වාක්‍ය ඛණ්ඩ තේරුම් ගැනීමටත්, උච්චාරණය කිරීමටත් සිසුන් උනන්දු කරවීම සඳහා ය. ඒවාට අමතර ව, දෙවන ශ්‍රේණියේ දී කෙටි සරල ඉංග්‍රීසි වාක්‍ය භාවිතය කෙරෙහි සිසුන් දිරිගැන්වීමට ද අපේක්ෂා කරනු ලැබේ.

පහත සඳහන් ප්‍රධාන අරමුණු මෙම වැඩ සටහන තුළින් සාක්ෂාත් කර ගැනීමට අපේක්ෂා කෙරේ.

- එදිනෙදා ජීවිතයේ දී අවශ්‍ය වන සරල ඉංග්‍රීසි වචන කිහිපයක් නිතර නිතර අසන්නට හා කියන්නට සලස්වා කුඩා වයසේ සිට ම සිසුන් ඉංග්‍රීසි වචනවලට හුරු කිරීම.
- සන්නිවේදනය හා අවබෝධය සඳහා සරල ඉංග්‍රීසි භාවිත වන ඉගෙනුම් පරිසරයක් පන්ති කාමරය හා ඉන් පිටත ඇති කිරීම.
- ඉංග්‍රීසි භාවිතයට සිසුන් තුළ ඇති පසුබටතාව මග හැරවීම.
- තුන්වන ශ්‍රේණියේ සිට විධිමත් ලෙස ඉංග්‍රීසි ඉගෙනීමට ආශාවක් සිසුන් තුළ ඇති වන පරිදි පසුබිම සකස් කිරීම.

## ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය

- පළමුවන ශ්‍රේණියේ දී මෙන් ම දෙවන ශ්‍රේණියේ සිසුන්ට ද කතා බහ සඳහා සරල ඉංග්‍රීසි භාවිතය හඳුන්වා දිය යුත්තේ පන්ති භාර ගුරුවරයා විසිනි.

- මේ සඳහා විෂය නිර්දේශයක් සපයනු නොලැබේ. එමෙන් ම, විශේෂ කාල පරිච්ඡේද වෙන් කිරීම ද අවශ්‍ය නොවේ.

- ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ දී ක්‍රියාකාරකම් පාදක වාචික ඉංග්‍රීසි සඳහා අවස්ථා මතු කර ගත යුත්තේ සිසුන් පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂයය හා ගණිතය විෂයයට සම්බන්ධ ක්‍රියාකාරකම් හා විනෝදජනක වැඩවල යෙදී සිටින අවස්ථාවල දී පමණි.

- ක්‍රියාකාරකම්වල යෙදෙමින්, තම මව්බසෙන් ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සිදු වන අවස්ථාවන්හි දී සන්නිවේදනය සඳහා සරල ඉංග්‍රීසි භාවිත කළ හැකි අවස්ථා ආයාසයකින් තොරව මතු කර ගැනීමට උත්සාහ කළ යුතු ය.

- සිසුන් ජීවත් වන වටාපිටාවට සමීප නිතර දක්නට ලැබෙන ද්‍රව්‍ය සඳහා යෙදෙන ඉංග්‍රීසි වචන අවස්ථානුකූල ව හඳුන්වා දීම වැදගත් වේ. මීට අමතර ව සරල ඉංග්‍රීසි ක්‍රියාපද, ආමන්ත්‍රණ, විධාන, ආශීර්වාද කෙටි වාක්‍ය යනාදිය නිතර නිතර සිසුන් ඇසෙන්නට සහ කතා කිරීමට සැලැස්වීමත්, ගුරුවරයාගෙන් විශේෂයෙන් බලාපොරොත්තු වේ.

- සිසුන් සමඟ නිදහසේ හැසිරෙන විට දී ඔවුනට ඉංග්‍රීසියෙන් ආමන්ත්‍රණය කිරීම, සුබ පැතීම, ආශීර්වාද කිරීම වැනි දේ සිදු කිරීමට අවස්ථා ද මතු වේ. මෙවැනි අවස්ථා ද සරල වාචික ඉංග්‍රීසි හඳුන්වා දීම සඳහා උපයෝගී කර ගත හැකි ය.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

- ගුරුවරයාටත් සිසුන්ටත් අමතර බරක් නොවන පරිදි, ප්‍රිය ජනක ලෙස ගුරුවරයා සහ සිසුන් අතරත් සිසුන් සහ සිසුන් අතරත් සන්නිවේදන අවස්ථා ගොඩ නැගීමට සිසුන් උනන්දු කරවීමත් වැදගත් ය.

- එදිනෙදා ජීවිතයේ දී සිසුන්ට නිතර හමු වන ද්‍රව්‍යවල ඉංග්‍රීසි යෙදුම් ඇතුළත් සරල ඉංග්‍රීසි වාග්මාලාවක් ද සරල ක්‍රියාපද, ආමන්ත්‍රණ, විධාන, ආශීර්වාද කිහිපයක් ද වාක්‍ය ඛණ්ඩ සහ සරල වාක්‍ය කිහිපයක් ද මෙහි අවසානයේ ඇතුළත් ය. සිසුන්ට සමීප පරිසරය අනුව මෙම වාග්මාලාවට වචන අලුතෙන් එකතු කිරීමට හෝ අඩු කිරීමට හෝ සුදුසු පරිදි වෙනස් කර ගැනීමට ගුරුවරයාට නිදහස ඇත.

- මෙහි ඉදිරිපත් කර ඇති පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් සහ ගණිත විෂයයන්ට අදාළ ව හඳුන්වා දී ඇති වචන සියල්ලම භාවිත කිරීම අනිවාර්ය නොවේ.

- මීට අමතර ව 2007 වර්ෂයේ සිට ගණිත විෂයයට අදාළ ව ක්‍රියාකාරකම් පාදක වාචික ඉංග්‍රීසි සඳහා වන වාග්මාලාවක් ද පිටු අංක 114 හි ඉදිරිපත් කර ඇත. පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂය මෙන් ම ගණිතය විෂය ඉගැන්වීමේ දී ද උචිත අවස්ථාවල දී ක්‍රියාකාරකම් පාදක වාචික ඉංග්‍රීසි භාවිත කිරීමට අවස්ථාව සැලැස්වීම ගුරුවරයාගේ වගකීමයි.

- ක්‍රියාකාරකම් පාදක වාචික ඉංග්‍රීසි සඳහා විශේෂයෙන් සකසන ලද මොඩියුලයක් ඇත. පරිසර ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂයයේ තේමාවන්ට අනුව කාණ්ඩ කර ඇති වාග්මාලාවක් ද යෝජිත ක්‍රියාකාරකම් තවත් උපදෙස් හා උදවු ද එහි ඇතුළත් කර ඇත. ඉංග්‍රීසි භාෂාවෙන් සකසා ඇති මෙම මොඩියුල ගුරුවරයාගේ කාර්ය භාරය පහසු කර ලීමට සමත් වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

- නිවැරදි ව ඉංග්‍රීසි වචන උච්චාරණය කිරීම පිළිබඳ ව සැලකිලිමත් වන්න. අවශ්‍ය වේ නම් මේ සඳහා පාසලේ ඉංග්‍රීසි උගන්වන ගුරුවරයාගේ සහ ඉංග්‍රීසි ගුරු උපදේශකවරුන්ගේ උපදෙස් ලබා ගත හැකි ය. එමෙන් ම, ප්‍රාදේශීය ඉංග්‍රීසි උපකාරක මධ්‍යස්ථානවල (Regional Education Support Centres) සේවය ද ලබා ගෙන ගුරුවරයාගේ ඉංග්‍රීසි දැනුම වර්ධනයට ද මේ තුළින් අවස්ථා සලසා ගැනීම අපේක්ෂා කෙරේ.

විශේෂයෙන් සැලකිය යුතු කරුණු කිහිපයක්

- ක්‍රියාකාරකම් පාදක වාචික ඉංග්‍රීසි හඳුන්වා දීමේ ක්‍රියාවලිය යටතේ
  * විධිමත් ඉංග්‍රීසි ඉගැන්වීමේ ක්‍රම භාවිතය අපේක්ෂා නොකෙරේ.
  * ඉංග්‍රීසි හෝඩියේ අකුරු ඉගැන්වීම, ඉංග්‍රීසි වචන ලිවීමට හෝ කියවීම ඉගැන්වීම අපේක්ෂා නොකෙරේ.
  * විශේෂ පොත්පත් භාවිතය අවශ්‍ය නොවේ.

- ක්‍රියාකාරකම් පාදක වාචික ඉංග්‍රීසි හඳුන්වා දීමේ ක්‍රියාවලියෙන් මව්බස හා ගණිතය විෂයයන්ට අදාළ මූලික සංකල්ප වර්ධනයට කිසිදු බාධාවක් සිදු නොවිය යුතු ය.

- පාසල් සංස්කෘතියට හෝ ජාතික සංස්කෘතියට කිසිදු අනිසි බලපෑමක් මෙම ක්‍රියාවලිය තුළින් සිදු නොවීමට ගුරුවරුන් විශේෂයෙන් වග බලා ගත යුතු ය.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

**ACTIVITY BASED ORAL ENGLISH**
**SYLLABUS OUTLINE**

| Grade / Theme | Objectives | Vocabulary | Structures | Activities |
|---|---|---|---|---|
| Grade 2<br><br>Theme1<br><br>**We and the School** | -Use the vocabulary relevant to the theme.<br><br>-Greet someone<br><br>-Follow instructions. | Principal<br>Mr. / Mrs. / Miss<br>Grade one / two / three/ four / five<br>Mango tree, Jak tree, Coconut tree, Post office, Police-station, Temple, Hospital, Elders' home, Trunk, Branches, Root, Leaves, Flowers, Fruits | Good Morning!<br>Children / sir / madam /<br><br>Hello!<br><br>I'm ……………….<br><br>I'm from ……………<br><br>Excuse me.<br><br>Here are ……………….. | <u>Song</u><br>a. "Here we go round the mango tree'<br><br><u>Game</u><br>a."Swapping places" Game.<br><br><u>Activity</u><br>a. Listen and Draw |
| Grade 2<br><br>Theme 2<br><br>**Our Home** | -Identify vocabulary relevant to the theme.<br>- Ask questions using 'Who" | House, Roof, Flower, Wall, Window, Door Room, Kitchen<br>Father / Mother<br>Brother / Sister<br>Grandmother / Grandfather<br>Water, well<br>Toilet,<br>Garden<br>Clean | Who is this?<br><br>This is my ....... | <u>Song</u><br><br>a. " Bits of paper "<br><br><u>Game</u><br><br>True / False<br><br><u>Activity</u><br><br>a. Draw and say |

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved 

## ACTIVITY BASED ORAL ENGLISH
## SYLLABUS OUTLINE

| Grade / Theme | Objectives | Vocabulary | Structures | Activities |
|---|---|---|---|---|
| Grade 2<br><br>Theme3<br><br><br>**Animals around us** | Identify vocabulary relevant to the theme | Horse, Bee, Rabbit, Monkey, Fish, Elephant, Bull, Goat, Butterfly, Parrot, Ant, Cat | Horses run<br>Bees fly<br>Rabbits hop<br>Monkeys jump<br>Fish swim<br>We are horses, we run | <u>Song</u><br><br>"I see a big dog...."<br><br><br><br><u>Game</u><br><br>a. A Memory Game |
| Grade 2<br><br>Theme 4<br><br>**Play with water** | - Identify vocabulary relevant to the theme.<br><br>- Follow instructions | Boats, Seeds, Flowers<br>Balls, Feathers, Erasers, Soap, Leaves | This is .....<br><br>These are ....... | <u>Song</u><br><br>1. " Row, row, row your boat "<br><br><u>Activity</u><br><br>Jump up |

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved 

ACTIVITY BASED ORAL ENGLISH
SYLLABUS OUTLINE

| Grade / Theme | Objectives | Vocabulary | Structures | Activities |
|---|---|---|---|---|
| Grade 2<br><br>Theme 5<br><br>**Sinhala and Hindu New Year period** | -Use relevant vocabulary items relevant to the theme<br><br>- Express what they have got | Crackers, Betel, Mat,<br>New Year fair, Pot seller, Fish seller, Balloon seller, Fruit seller,<br>Vegetable seller, | What do you have?<br><br>I have ........<br><br>There is .............<br>There are ........... | <u>Song.</u><br><br>"This is the way we ..."<br><br><u>Game.</u><br><br>"A Pass the bag game" |
| Grade 2<br><br>Theme 6<br><br>**The sky we see** | - Identify vocabulary relevant to the theme.<br><br>-Express one's ability | Sky, Sun, Stars, Rain, Bright, Wind, Day, Thunder, Sunlight, Aeroplane, Moonlight, Balloons, Clear, Umbrella, Cold, Hat, Kite, Hot, Dry, Birds, Clouds, Moon, Dark, Night, Clear | What can you see…….?<br><br>Can you see……..?<br><br>I can see.....………….. | <u>Song</u><br>" I hear thunder"<br><br><u>Game</u><br><br>a. " A Swapping Places Game" |

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved 

| Grade / Theme | Objectives | Vocabulary | Structures | Activities |
|---|---|---|---|---|
| Grade 2<br><br>Theme 7<br><br>**Things we eat and drink** | -Identify vocabulary items relevant to the theme.<br><br>-Ask about likes and dislikes<br><br>-Express likes and dislikes | Mangoes, Apples, Bananas, Pears, Guavas, Avocadoes, Grapes, Oranges, Wood apples Plates, Cups Glasses, Pots, Pans, Wash, Brush, Clean, Salad, Cordial Pickle, Green leaves Bread, Jak Salmon, Fish Curd, Meat Treacle, Eggs Milk | Do you like ..............?<br><br>I like ..........<br>I don't like ........<br><br>We like ...........<br><br>We don't like ......<br><br>Would you like ………. ? | <u>Song.</u><br><br>a. " Rice and Curry"<br><br>b. " Found a mango "<br><br>"Curd and Treacle"<br><br><u>Game</u>.<br><br>"Yes / No " |
| Grade 2<br><br>Theme 8<br><br>**How Information is received** | i Identify vocabulary relevant to the theme.<br><br>- Follow instructions. | Happy, Sad, Angry Afraid<br><br>Yoghurt cups Thread Radio Television News items Policeman Sorry Please | Good morning sir/ madam<br><br>If you're…………<br><br>Clap your hands Wipe your eyes Stamp your feet Close your eyes | <u>Song</u><br><br>" If you're happy …."<br><br><u>Game</u><br><br>a. Simon says |

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved 

ACTIVITY BASED ORAL ENGLISH
SYLLABUS OUTLINE

| Grade / Theme | Objectives | Vocabulary | Structures | Activities |
|---|---|---|---|---|
| Grade 2<br><br>Theme 9<br><br>**Changes in the environment** | - Talk about the changes in the environment using simple words and phrases. | Day Ugly<br>Wet<br>Dust Fresh<br>Flowers<br>Tidy Dead<br>Flowers<br>Untidy Dry<br>Leaves<br>Dusty Notice<br>Board<br>Nice Note<br>Books<br>Arrange Rain<br>Drought Cold/hot<br>Sweep Wet<br>Clean Umbrella<br>Fly Wind<br>Bend | I can …………<br>Let's……<br>………<br>I will……<br>……… | Activity<br><br>a. Miming |
| Grade 2<br><br>Theme 10<br><br>Likes and dislikes | - Express likes and dislikes | Dogs, Flies, Bugs,<br>Cows Mynahs,<br>Hens, Squirrels<br>Parrots, Sparrows,<br>Goats Worms,<br>Crows, Pigeons<br>Fish, Eagles,<br>Mosquitoes<br>Snakes, Cobras,<br>Pythons<br><br>Vipers<br>Playground<br>Cockroaches<br>Playing<br>Lizards<br>Dancing<br>Frogs<br>Singing<br>Ants<br>Peacocks<br>Leeches | I like …………<br>I don't like ……….. | Song<br>(I like dogs and…….<br>I like cows……..<br><br>Game<br><br>a. Pass the ball |

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved 

ACTIVITY BASED ORAL ENGLISH
SYLLABUS OUTLINE

| Grade / Theme | Objectives | Vocabulary | Structures | Activities |
|---|---|---|---|---|
| Grade 2<br><br>Theme 11<br><br>**How we get our needs.** | - Use the names of objects in the Class Room<br><br>- Make polite requests to get things done. | Book, Ruler, Pencil Cutter, Duster, Blackboard Building, Playground Tap, Chalk, White, Black, Chair, Desk, Door, Table, Window | Is it a ……………….?<br><br>It is ………………….<br><br>Please bring me ……..<br><br>Please clean…………..<br><br>Please keep me……………<br><br>Please give me …………..<br><br>Please open /close ………… | Song<br><br>b. " Please open ……….  ."<br><br>c. " The blackboard helps ………. ."<br><br>Activity<br><br>a. Point and say. |
| Grade 2<br><br>Theme 12<br><br>**Transport** | (a) Use the words related to the theme. | Market, Office Fair<br>Hospital<br>Dispensary<br>Bus<br>Bicycle<br>Train<br>Car<br>Boat<br>Road<br>Wheel barrow | Let's ……………… | Song<br><br>a. " Wheels on the bus go…"<br><br>Activity<br><br>a. A swapping Places Game |

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved 

ACTIVITY BASED ORAL ENGLISH
SYLLABUS OUTLINE

| Grade / Theme | Objectives | Vocabulary | Structures | Activities |
|---|---|---|---|---|
| Grade 2<br><br>Theme 13<br><br>**Play with light** | - Use words and phrases related to the theme.<br><br>Torch<br>Red light<br>Bulb<br>Green light<br>Light<br>Yellow light<br>Cover<br>Blue light<br>Lamp shade<br>Mirror | Birds fly<br>Birds sleep<br>Go to sleep<br>Sun shines<br>Flowers dance<br><br>Sun light<br>In the morning<br>In the evening<br><br>Torch<br>Bulb<br>Light<br>Lamp | It's dark<br><br>It's night<br><br>It's day<br><br>It's ……………….. | <u>Song</u><br><br>" This is the way the sun shines<br><br><u>Game</u><br><br>a. Slap the board |
| Grade 2<br><br>Theme 14<br><br>**Places where people work.** | Use the words related to the theme | Paddy field<br>Paddy<br>Seed<br>Workplace<br>Grain<br>Team<br>Mammoty<br>Carpenter<br>Sickle<br>Farmer<br>Knife<br>Tailor<br>Hammer<br>Saw<br>Bucket<br>Drill<br>Building | He can …………….<br><br>In the ……… | <u>Song</u><br><br>a. "Can you see the farmer work this way and that way …….."<br><br><u>Game</u><br><br>a. Roll the ball. |

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved 

ACTIVITY BASED ORAL ENGLISH
SYLLABUS OUTLINE

| **Grade / Theme** | **Objectives** | **Vocabulary** | **Structures** | **Activities** |
|---|---|---|---|---|
| Grade 2<br><br>Theme 15<br><br>**Different places in the environment** | - Identify words and phrases related to the theme. | Farm<br>Insect<br>Farmer<br>Fish<br>Paddy field<br>Rats<br>Ground<br>Weeds<br>Birds<br>Plants<br>Worms<br>Water | I can see ……… | <u>Song</u><br><br>“ What can you see in the farmer’s field”<br><br><u>Story</u><br><br>a. The farmer. |
| Grade 2<br><br>Theme 16<br><br>**People who help us** | - Use polite requests | Carrots<br>Rabbits<br>Potatoes<br>Rats<br><br>Hungry<br>Thirsty<br>Medicine<br>Staircase | May I help you<br>Can I help you<br>Please bring me ………<br>I ‘m hungry /thirsty<br>Please sweep ………<br>Please clean………… | <u>Song</u><br><br>a. “ I am thirsty …….”<br><br><u>Activity</u><br><br>a. Listen and do (Simon says) |

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved 

**CLOSSROOM LANGUAGE**

| Content | Materials needed |
|---|---|
| **Greeting and wishes**<br>Good morning<br>Good afternoon<br>Good evening<br>Good bye<br>Good luck<br>All the best<br>Happy birthday<br>Happy new year<br>Merry christmas<br><br>**Requests**<br>May I come in/go out<br>Silence please<br>Listen to me please<br>Hurry up please<br>Be quiet<br>Be careful<br><br>**Polite forms**<br>Thank you<br>Please excuse me<br>I am sorry<br>Can I help you<br>Could you please/bring me the duster.<br>Some chalk<br>… The register | **Simple commands**<br>Hands up/down,<br>Run, jump, start, stop,<br>clap your hands<br>look at me<br>form a line/circle<br>don't go out<br>get ready<br><br>**Praising**<br>good<br>very good<br>well done<br>That's right<br>I like it<br><br>**Simple guestion forms**<br>Who is shouting?<br>What's this?<br>What's that?<br>What's it?<br>Are you ready?<br>Is this your?<br>Is it a ………..? |

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved 

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

| | |
|---|---|
| Big | Nine |
| Clook | Number |
| Coin | One |
| Compare | Order |
| Count | Red |
| Eight | Ruler |
| Equal | Seven |
| Finish | Short |
| Five | Six |
| Four | Size |
| Game | Small |
| High | Tall |
| Little | Ten |
| Mathematics | Three |
| | Two |

හැඳින්වීම

ශ්‍රී ලාංකිකයකු වශයෙන්, තමා සමඟ ජීවත් වන සහෝදර ජනතාවගේ භාෂාව ඉගෙනීම තුළින් එකිනෙකා කෙරෙහි අවබෝධයෙන් ක්‍රියා කිරීමේ හැකියාවන් සිසුන් තුළ වර්ධනය කිරීම මෙමඟින් බලාපොරොත්තු වේ.

මෙම අරමුණ ඇතිව දෙවන ජාතික භාෂාවක් ඉගැන්වීම තුළින් භාෂාව පිළිබඳ ප්‍රවීණත්වයක් බලාපොරොත්තු නොවන අතර, යම් ප්‍රමාණයක සන්නිවේදන හැකියාවක් වර්ධනය කර ගැනීමටත්, එකිනෙකා කෙරෙහි සංවේදී බවක් ඇති කර ගැනීමටත් අපේක්ෂා කෙරේ.

ක්‍රියාශීලී ජාතික ඒකාබද්ධතාවක් ඇති කර ගැනීමට මෙන් ම ජාතික සමගිය ඇති කිරීමේ මූලික අඩිතාලමක් දැමීමටද දෙවන ජාතික භාෂාවක් ඉගෙනීම රුකුලක් වෙතැයි අපේක්ෂා කරනු ලැබේ.

ඒ අනුව පළමුවන ප්‍රධාන අවධියේ දී දෙවන ජාතික භාෂාව යටතේ පහත සඳහන් නිපුණතා ඉටු කර ගැනීම මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයක් සකසා ඇත.

මෙහි දී භාෂා ක්ෂේත්‍ර යටතේ සවන් දීම හා කතා කිරීම සම්බන්ධ ක්‍රියාකාරකම් පමණක් ඇතුළත් කර ඇති අතර දෙවන හා තෙවන ප්‍රධාන අවධිවල දී චතුර්විධ භාෂා ක්‍රියාකාරකම් උපයෝගී කර ගැනීමට සැලසුම් කර ඇත. ඒ අනුව මෙම නිපුණතා සකසා ඇත්තේ සිසුන්ගේ වයස, පරිණතිය හා ඔවුන්ගේ අත්දැකීම් සැලකිල්ලට ගනිමින් දෙමළ බසින් තෝරා ගන්නා ලද වචන සහ වගන්ති කිහිපයක් භාවිතයට ගෙන ඇත.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

ප්‍රාථමික අධ්‍යාපන අවධිය සඳහා නිපුණතා
- එදිනෙදා අවශ්‍යතා සපුරා ගැනීමේ දී අදාළ වචන හා වගන්ති යොදා කතා කරයි.
- භාෂාවකට සවන් දී අර්ථාන්විත ව ප්‍රතිචාර දක්වයි.
- භාෂාවක් හැසිරවීමේ යහපුරුදු ප්‍රදර්ශනය කරයි.
- අන් අය ඉදිරියේ තම අදහස් ද ප්‍රකාශ කිරීමට ඉදිරිපත් වෙයි.
- කියවීමේ හැකියා ප්‍රදර්ශනය කරමින් එය අර්ථාන්විත ව භාවිත කරයි.
- කවි ගී අසමින් ගයමින් රස විඳියි.
- තවත් භාෂාවක් හැසිරවීම තුළින් වින්දනයක් ලබයි.
- තවත් භාෂාවක් හැසිරවීමට ඇති හැකියා අගයයි.

පළමුවන ප්‍රධාන අවධිය සඳහා නිපුණතා
- එදිනෙදා ජීවිතයේ විවිධ අවස්ථාවන්හි දී ආචාරශීලී ව හා සුහද ව සුබ පතයි.
- තමා පිළිබඳ තොරතුරු පැහැදිලි ව නිවැරදි ව හා සුහදශීලී ව ප්‍රකාශ කරයි.
- පාසලේ දී තම අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා සුහද ව හා ආචාරශීලී ව ඉල්ලීම් කරයි.
- පාසලේ දී ලැබෙන විධානවලට අවනතව කටයුතු කරයි.
- තමාට සමීපතමයන්ගේ තොරතුරු සුහද ව විමසයි.
- අංක හඳුනාගෙන පැහැදිලි ව හා නිවැරදි උච්චාරණය සහිත ව කියයි.
- පාට හඳුනාගෙන එම පාට යෙදුණු සරල වැකි නිවැරදි උච්චාරණයෙන් යුතු ව කියයි.
- සරල කවි, ගී අංග චලන සහිත ව ගායනා කරයි.

දෙවන ශ්‍රේණිය සඳහා නිපුණතා
- උපන් දින හා ජයග්‍රහණ සඳහා සතුටින් සුබ පතයි.
- තමාගේ නම හා ගම නිවැරදි ව කියයි.
- තම පන්ති මිතුරන්ගෙන් ආචාරශීලී ව හා සුහද ව සරල වැකි භාවිත කරමින් ඉල්ලීම් කරයි.
- ක්‍රීඩා හා ක්‍රියාකාරකම්වල දී ලැබෙන විධානවලට අවනත ව ක්‍රියා කරයි.
- තම කණ්ඩායමේ සාමාජිකයන්ගේ තොරතුරු සුහද ව විමසයි.
- 1 - 10 තෙක් අංක නිවැරදි උච්චාරණය සහිත ව කියයි.
- පාට නම් කරමින් සරල වැකි කියයි.
- සරල කවි, ගී අංගචලන සහිත ව ගායනා කරයි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය

මෙම නිපුණතා ඉටු වන සේ අන්තර්ගත විෂය කරුණු සිසුන්ට ප්‍රියජනක ලෙස ඉදිරිපත් කිරීම සඳහා ක්‍රියාකාරකම් සැලසුම් කර ගැනීම ගුරුවරයාගේ කාර්යයක් වේ. එක් එක් නිපුණතාවය යටතේ ඉදිරිපත් කෙරෙන ක්‍රියාකාරකමක අන්තර්ගත දෙමළ භාෂා වචන/වාක්‍ය ඛණ්ඩ/සරල වැකි වර්ෂය පුරා විවිධ අවස්ථාවන්හි දී හඳුන්වා දීමට කටයුතු සැලසුම් කිරීම වැදගත් ය.

2007 වසරේ දී හඳුන්වා දීමට නියමිත අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට අනුව සිංහල සිසුන් සඳහා දෙමළ භාෂාවත්, දෙමළ සිසුන් සඳහා සිංහල භාෂාවත් දෙවන ජාතික භාෂාව වශයෙන් පළමුවන ශ්‍රේණියේ සිට ඉගැන්වීමට සැලසුම් කර ඇත. මෙය ක්‍රියාත්මක කළ යුතු ආකාරය සවිස්තරාත්මක ව ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ දෙවන ජාතික භාෂා කොටසට ඇතුළත් කර ඇත.

දෙවන ශ්‍රේණියට අදාළ සැලසුම් ගත සෙල්ලම් හා විනෝදජනක වැඩ සහ ක්‍රියාකාරකම් සකස් කළ යුතු ආකාරය සවිස්තරාත්මක ව ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ දෙවන ජාතික භාෂාව කොටසට ඇතුළත් කර ඇත.

නිපුණතාව

- උපන් දින හා ජයග්‍රහණ සඳහා සතුටින් සුබ පතයි.

  பிறந்த நாள் வாழ்த்துக்கள் පිරන්ද නාල් වාළ්ත්තුක්කළ්

  நல் வாழ்த்துக்கள் නල් වාළ්ත්තුක්කළ්

- තමාගේ නම හා ගම නිවැරදි ව කියයි.

  எனது பெயர் சமன் එනදු පෙයර් සමන්

  எனது ஊர் மகரகம. එනදු ඌර් මහරගම

- තම පන්ති මිතුරන්ගෙන් ආචාරශීලී ව හා සුහද ව සරල වැකි භාවිත කරමින් ඉල්ලීම් කරයි.

  பென்சிலை எடுங்கள் පෙන්සිලෛ එඩුංගළ්

  புத்தகத்தைத் தாருங்கள் පුත්තහත්තෛත් තාරුංගළ්

  பாட்டுக் கேளுங்கள் පාට්ටුක් කේලුංකළ්

  பெயரைக் கூறுங்கள் පෙයරෛක් කූරුංගළ්

  கதை சொல்லுங்கள் කදෛ සොල්ලුංගළ්

  பாட்டுப் பாடுங்கள் පාට්ටුප් පාඩුංගළ්

- ක්‍රීඩා හා ක්‍රියාකාරකම්වල දී ලැබෙන විධානවලට අවනත ව ක්‍රියා කරයි.

  வட்டமாக ஓடுங்கள் වට්ටමාහ ඕඩුංගළ්

  கை தட்டுங்கள் කෛ තට්ටුංගළ්/කයිතට්ටුංගළ්

  பந்தை வீசுங்கள் පන්දෛ වීසුංගළ්

  வரிசையாக நில்லுங்கள் වරිසෛයාහ නිල්ලුංගළ්



Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

- තම කණ්ඩායමේ සාමාජිකයන්ගේ තොරතුරු සුහද ව විමසයි.

| | |
|---|---|
| உங்கள் பெயர் என்ன? | උංගළ් පෙයර් එන්න ? |
| உங்களது பெயர் என்ன? | උංගළදු පෙයර් එන්න ? |
| உங்களது ஊர் எது? | උංගළදු ඌර් එදු ? |
| உங்கள் ஊர் எது? | උංගළ් ඌර් එදු ? |
| உங்களது அம்மாவின் பெயர் என்ன? | උංගළදු අම්මාවින් පෙයර් එන්න? |
| உங்கள் அம்மாவின் பெயர் என்ன? | උංගළ් අම්මාවින් පෙයර් එන්න ? |
| உங்களது அப்பாவின் பெயர் என்ன? | උංගළදු අප්පාවින් පෙයර් එන්න? |
| உங்கள் அப்பாவின் பெயர் என்ன? | උංගළ් අප්පාවින් පෙයර් එන්න? |

- 1 - 10 තෙක් අංක නිවැරදි උච්චාරණය සහිත ව කියයි.

| | |
|---|---|
| ஒன்று | ඔන්රු |
| இரண்டு | ඉරණ්ඩු |
| மூன்று | මූන්රු |
| நான்கு | නාන්ගු |
| ஐந்து | අයින්දු |
| ஆறு | ආරු |
| ஏழு | ඒළු |
| எட்டு | එට්ටු |
| ஒன்பது | ඔන්පදු |
| பத்து | පත්තු |

- පාට නම් කරමින් සරල වැකි කියයි.

| | |
|---|---|
| நீல நிறம் | නීල නිරම් |
| மஞ்சள் நிறம் | මඤ්ජළ් නිරම් |
| சிவப்பு நிறம் | සිවප්පු නිරම් |
| பச்சை நிறம் | පච්චෙ නිරම් |
| நாவல் நிறம் | නාවල් නිරම් |
| கபில நிறம் | කපිල නිරම් |
| வானம் நீல நிறம். | වානම් නීල නිරම් |
| காகம் கறுப்பு நிறம். | කාහම් කරුප්පු නිරම් |
| பால் வெள்ளை நிறம். | පාල් වෙළ්ළෙ නිරම් |

- සරල කවි, ගී අංගචලන සහිත ව ගායනා කරයි.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

නිපුණතාව

- උපන් දින හා ජයග්‍රහණ සඳහා සතුටින් සුබ පතයි.

ක්‍රියාකාරකම් 1

- පන්ති කාමරයේ දී සුබ පැතීම සඳහා ක්‍රියාකාරකම් ඉදිරිපත් කිරීමට සුදුසු අවස්ථා සහ හේතු තෝරා ගන්න.
- විවිධ සෙල්ලම් හා විනෝදජනක ක්‍රියාකාරකම් අවස්ථාවල දී ලබා ගන්නා ජයග්‍රහණ සඳහා සුබ පැතීමට උපදෙස් දෙන්න. සුබ පැතුම් යන්න දෙමළ භාෂාවෙන් නල් වාල්තුක්කල් - நல் வாழ்த்துக்கள் හඳුන්වා දෙන්න.

ක්‍රියාකාරකම් 2

පිරන්ද නාල් වාල්තුක්කල් பிறந்த நாள் வாழ்த்துக்கள் සුබ උපන්දිනයක් වේවා යන්න

- පන්තියේ සිසුන් සුදුසු ස්ථානයකට කැඳවා ගන්න.
- පේළියක් හෝ රවුමක් ලෙස සිසුන් පෙළ ගස්වන්න.
- ගුරුවරයා මැද සිට එම මාසය තුළ උපන් දින ලබන සිසුන් කවුදැ යි විමසන්න. එම සිසුන් තමා පිළිබඳ ව කෙටියෙන්, තම භාෂාවෙන් ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දෙන්න. එම සිසුන්ට අනෙක් සිසුන් ලවා දෙමළ භාෂාවෙන් සුබ පැතීමට සලස්වන්න.


නිපුණතාව

- තමාගේ නම හා ගම නිවැරදි ව ප්‍රකාශ කරයි.

ක්‍රියාකාරකම් 1

- සිසුන් දෙදෙනා බැගින් මුහුණට මුහුණලා සිටින සේ පහත දැක්වෙන පරිදි රවුම් දෙකකට සිට ගැනීමට සලස්වන්න. තමාගේ නම සහ ගම එකිනෙකා වෙත ප්‍රකාශ කිරීමට යොමු කරන්න. දෙදෙනාට ම අවස්ථාව දෙන්න. අවශ්‍ය නම් දෙතුන් වරක් ම මේ ක්‍රියාකාරකවෙහි යොදවන්න.

  උදා :-



- සිසුන් සුදුසු ස්ථානයකට රැගෙන යන්න. රූප සටහනේ දැක්වෙන පරිදි රවුම් දෙකක් සෑදීමට උපදෙස් දෙන්න. සිසුන් එකිනෙකාට මුහුණලා සිට ගැනීමෙන් අනතුරුව ඇතුළත සිටින සිසුන්ට

  එනදු පෙයර් හිරුණි - எனது பெயர் கிருணி. - මගේ නම හිරුණි
  එනදු ඌර් මහරගම - எனது ஊர் மகரகம. - මගේ ගම මහරගම යනුවෙන් කීමට යොමු කරන්න.
  මේ ආකාරයට තමාගේ නම සහ තමාගේ ගමේ නම කීමට අවස්ථාව ලබා දෙන්න.

- නැවත බාහිර රවුමේ සිටින සිසුන් පමණක් පියවරක් වමට/දකුණට ගමන් කර නවතින ලෙස උපදෙස් දෙන්න. දැන් අලුතින් ශිෂ්‍යයකු තමාට මුහුණට මුහුණලා සිටිනු ඇත. මෙහි දී ද තමාට අලුතින් ලැබුණු යහළුවා සමඟ තමාගේ නම සහ ගම මාරුවෙන් මාරුව කීමට අවස්ථාව සලසා දෙන්න.



Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

නිපුණතාව

- තම පන්ති මිතුරන්ගෙන් ආචාරශීලී ව හා සුහද ව සරල වැකි භාවිත කරමින් ඉල්ලීම් කරයි.

ක්‍රියාකාරකම්

ශිෂ්‍යයකු ඔබ වෙතට කැඳවා, අනෙක් සිසුන්ට පෙනෙන හා ඇසෙන පරිදි පැන්සලක්/පොතක් අතට ගෙන ශිෂ්‍යයාට දෙමින් පහත ආකාරයට දෙමළ බසින් කියන්න.

| | | |
|---|---|---|
| පෙන්සිලෙ තාරුංගළ් | பென்சிலை தாருங்கள் | පැන්සල දෙන්න |
| පුත්තහත්තෛ එඩුංගළ් | புத்தகத்தைத் டுங்கள் | පොත ගන්න |
| පාට්ටුක් කේළුංගළ් | பாட்டுக் கேளுங்கள் | සින්දු අහන්න |
| පෙයරෛක් කූරුංගළ් | பெயரைக் கூறுங்கள் | නම කියන්න |
| කදෛ සොල්ලුංගළ් | கதை சொல்லுங்கள் | කතන්දර කියන්න |
| පාට්ටුප් පාඩුංගළ් | பாட்டுப் பாடுங்கள் | ගීත ගයන්න |

යොදා ගන්නා වචනවලට අනුව ක්‍රියාකාරකම් වෙනස් කරමින් ඉදිරිපත් කළ වචන උච්චාරණයේ හා තේරුම් ගැනීමේ හැකියාව ලබා දෙන්න.

නිපුණතාව

- ක්‍රීඩා හා ක්‍රියාකාරකම්වල දී ලැබෙන විධානවලට අවනත ව ක්‍රියා කරයි.

ක්‍රියාකාරකම්

- සෙල්ලම් මිදුලේ/ක්‍රීඩා පිටියේ ක්‍රියාකාරකම් කරන අවස්ථාවල දී පහත සඳහන් ආකාරයේ විධාන යොදා ගනිමින් එම වචන උච්චාරණයේ හැකියාව ලබා දෙන්න.

| | | |
|---|---|---|
| වට්ටමාහ ඕඩුංගළ් | வட்டமாக ஓடுங்கள் | රවුමට දුවන්න |
| කෛ තට්ටුංගළ් | கை தட்டுங்கள் | අත්පොඩි ගසන්න |
| පන්දෛ වීසුංගල් | பந்தை வீசுங்கள் | බෝලය විසිකරන්න |
| වරිසෛයාහ නිල්ලුංගළ් | வரிசையாக நில்லுங்கள் | පේළියට හිටගන්න |

යන විධානය දෙමළ භාෂාවෙන් හඳුන්වා දෙන්න. මෙම විධාන හඳුන්වා දීම සඳහා ක්‍රීඩාවක් සැලසුම් කර ගන්න.

උදා :- සිසුන්ට රවුමක් සේ සිටීමට උපදෙස් දෙන්න. ගුරුවරයා එහි මැද සිට වට්ටමාහ ඕඩුංගළ් வட்டமாக ஓடுங்கள் යනුවෙන් පවසන්න. සිසුන් එක් අයකු බැගින් රවුම මැදට කැඳවා එම වචන ප්‍රකාශ කිරීමට අවස්ථා ලබා දෙන්න. සෑම සිසුවකුට ම මෙම වචන තහවුරු වන තුරු ක්‍රීඩාවෙහි නිරත වීමට අවස්ථා ලබා දෙන්න.

මේ අයුරින් අනෙක් විධාන ද සුදුසු ක්‍රීඩා/ක්‍රියාකාරකම් යොදා ගනිමින් හඳුන්වා දෙන්න.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

නිපුණතාව
- තම සමීපතම යහළුවන්ගේ තොරතුරු විමසයි.

ක්‍රියාකාරකම්
- සිසුන් දෙදෙනා බැගින් කැඳවා, එක් සිසුවකුට පහත සඳහන් දේ විමසීමටත් අනෙක් සිසුවාට පිළිතුරු දීමටත් යොමු කරන්න. මේ ආකාරයට හැම සිසුවකුට ම අවස්ථාව ලබා දෙන්න.

| | | |
|---|---|---|
| උංගල් පේයර් එන්න ? | உங்கள் பெயர் என்ன? | ඔයාගේ නම මොකක් ද? |
| උංගළදු පෙයර් එන්න? | உங்களது பெயர் என்ன? | |
| උංගළදු ඌර් එදු ? | உங்களது ஊர் எது? | ඔයාගේ ගම කොහේද? |
| උංගල් ඌර් එදු ? | உங்கள் ஊர் எது? | |
| උංගළදු අම්මාවින් පෙයර් එන්න? | உங்களது அம்மாவின் பெயர் என்ன? | ඔයාගේ අම්මාගේ නම මොකක්ද? |
| උංගල් අම්මාවින් පෙයර් එන්න ? | உங்கள் அம்மாவின் பெயர் என்ன? | |
| උංගළදු අප්පාවින් පෙයර් එන්න? | உங்களது அப்பாவின் பெயர் என்ன? | ඔයාගේ තාත්තාගේ නම මොකක්ද? |
| උංගල් අප්පාවින් පෙයර් එන්න? | உங்கள் அப்பாவின் பெயர் என்ன? | |

- සිසුනට එළිමහනට කැඳවා මෙම වචන/වැකි තව දුරටත් තහවුරු වීම සඳහා නිදහසේ එකිනෙකා හමුවී තොරතුරු විමසීමට අවස්ථා ලබා දෙන්න.

නිපුණතාව
- 1 - 10 තෙක් අංක නිවැරදි උච්චාරණය සහිත ව කියයි.


ක්‍රියාකාකරම්

| | | |
|---|---|---|
| ඔන්රු | ஒன்று | එක |
| ඉරණ්ඩු | இரண்டு | දෙක |
| මූන්රු | மூன்று | තුන |
| නාන්ගු | நான்கு | හතර |
| අයින්දු | ஐந்து | පහ |
| ආරු | ஆறு | හය |
| ඒළු | ஏழு | හත |
| එට්ටු | எட்டு | අට |
| ඔන්පදු | ஒன்பது | නවය |
| පත්තු | பத்து | දහය |

- ඉහත අංක ලියූ කාඩ් පත්‍රිකා සකස් කර ගන්න. එම අංක ලියූ කාඩ්පත් එකින් එක සිසුන්ට පෙන්වමින් එම අංකය දෙමළ භාෂාවෙන් උච්චාරණය කරන ආකාරය සිසුන්ට පහදා දෙන්න.
- මෙම අංක දෙමළ භාෂාවෙන් ප්‍රකාශ කරන ආකාරය තහවුරු වීම සඳහා ක්‍රීඩා සැලසුම් කර ගත හැකි ය.

උදා :- (1) අංක 1 - 10 තෙක් කස් කර ගන්නා ලද කාඩ්පත් මාරු කර පෙන්වමින් ඒවා නිවැරදි ව උච්චාරණය වන්නේ දැයි විමසිලිමත් වන්න. නිවැරදි ව වචන උච්චාරණය කරන සිසුන් ඇගයීමට ලක් කරන්න.

(2) එක් පේළියකට සිසුන් දහදෙනකු අයත්වන සේ පන්තියේ සිසුන් පෙළ ගස්වන්න.





Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

- පේළි හතරේ මුල් හතර දෙනා ඔන්රු යනුයෙන් ප්‍රකාශ කර බිම වාඩි වීමට පහසන්න. ඊළඟට දෙවන පේළිය ඉරන්ඩු ලෙස ප්‍රකාශ කර වාඩි වීම. මේ ආදී වශයෙන් ... දහවෙනියාට සිටගෙන සිටින සිසුන් පත්තු ලෙස ප්‍රකාශ කළ පසු නැවතත් එම ස්ථානයේ සිට මුලට 1 - 10 තෙක් අංක දෙමළ භාෂාවෙන් ප්‍රකාශ කිරීමට අවස්ථාව දෙන්න.
- මේවා තරග ආකාරයෙන් ද ඉදිරිපත් කළ හැකි ය.

නිපුණතාව

- පාට නම් කරමින් සරල වැකි කියයි.

ක්‍රියාකාරකම්

- ශිෂ්‍යයාට පෙන්විය හැකි ද්‍රව්‍ය/වස්තූන් ස්ථාන ආදිය දක්වමින් එයට අදාළ පාට හඳුන්වන දෙමළ වචන උච්චාරණ හා අවබෝධ හැකියාව ලබා දෙන්න. මේ සඳහා පින්තූර ද යොදා ගත හැකි ය.

| | | |
|---|---|---|
| වානම් නීල නිරම් | வானம் நீல நிறம். | අහස නිල් පාටයි |
| කාහම් කරුප්පු නිරම් | காகம் கறுப்பு நிறம். | කපුටා කළු පාටයි |
| පාල් වෙල්ළෙ නිරම් | பால் வெள்ளை நிறம். | කිරි සුදු පාටයි |
| පූ සිවප්පු නිරම් | பூ சிவப்பு நிறம் | මල රතු පාටයි |

නිපුණතාව

- සරල කවි, ගී අංග චලන සහිත ව ගායනා කරයි.

ක්‍රියාකාරකම්

- පහත සඳහන් ආකාරයේ සරල කවි තෝරා ගන්න.
  උදා :-

1. சின்னப் பிள்ளை வருகுது
சிங்காரமாகச் சிரிக்குது
அன்னம் போல நடக்குது
அம்மா வரத் துள்ளுது.

සින්න පිල්ලෙ වරුකුදු
සිංගාරමාහම් සිරකිදු
අන්නම් පෝල නඩක්කුදු
අම්මා වරත්තුල්ලුදු

පොඩි ළමයා හුරතලේට හිනාවෙමින් හංසයා වගේ ගමන් කරනවා. අම්මව දැකලා උඩ පනිමින් සතුටු වෙනවා

2. வண்ணத்துப்பூச்சி வண்ணத்துப்பூச்சி
பறக்குது பார் பறக்குது பார்
அழகான செட்டை அழகான செட்டை
அடிக்குது பார் அடிக்குது பார்

பூக்களின் மேலே பூக்களின் மேலே
பறந்து போய் பறந்து போய்
தேனைக் குடித்து தேனைக் குடித்து
களிக்குது பார் களிக்குது பார்

වණ්ණත්තුප්පූච්චි//
පරක්කුදු පාර්//
අළහාන සෙට්ටෛ//
අඩික්කිදු පාර්//

පූක්කලින් මේලේ//
පරන්දු පෝය්//
තේනෛක් කුඩිත්තු//
කලික්කුදු පාර්//

සමනලයින් ලස්සන පිහාටු ගහමින් මල් උඩට පියඹා ගිහින් පැණි බී සතුටු වෙනවා බලන්න.

3. சின்னச் சின்னப் பூனை
சிறந்த நல்ல பூனை
என்னைப் பார்த்துத் துள்ளும்
எங்கள் வீட்டுப் பூனை

චින්නම් සින්නප් පූනෛ
සිරන්ද නල්ල පූනෛ
එන්නෛප් පාර්ත්තුත් තුල්ලුම්
එංගල් වීට්ටුප් පූනෛ

| | | |
|---|---|---|
| வட்டமான கண்கள்<br>வட்டமான செவிகள்<br>சின்னச் சின்னப் பூனை<br>சிறந்த நல்ல பூனை | වට්ටමාන කණ්ගල්<br>වට්ටමාන සෙවිගල්<br>චින්නච් සින්නප් පූනෛ<br>සිරන්ද නල්ල පූනෛ | |
| 4. காக்கா காக்கா பறந்து வா<br>காலையில் எழுந்து பறந்து வா | කාක්කා කාක්කා පරන්දු වා<br>කාලෛයිල් එළුන්දු පරන්දු වා | කපුටෝ කපුටෝ උදේම නැගිට පියඹා එන්න. |
| கோழி கோழி ஓடி வா<br>குஞ்சைக் கூட்டி ஓடி வா | කෝලි කෝලි ඕඩි වා<br>කුඤ්ජෛ කූට්ටි ඕඩි වා | කිකිළි කිකිළි පැටව් එක්ක දුවලා එන්න. |
| வெள்ளைப் பசுவே விரைந்து வா<br>பிள்ளைக்குப் பால் கொண்டு வா | වෙල්ලෛප් පසුවේ විරෛන්දු වා<br>පිල්ලෛක්කු පාල් කොණ්ඩු වා | සුදු එළදෙනක් දරුවාට කිරි රැගෙන ඉක්මනට එන්න. |
| பப்பி பப்பி பாய்ந்து வா<br>பந்தை வாயில் கௌவி வா | පප්පි පප්පි පායින්දු වා<br>පන්දෛ වායිල් කෞවි වා | බලු පැටියෝ බෝලය කටින් අරගෙන පැනලා එන්න. |
| 5. அப்பம் பிட்டு தோசை<br>அம்மா தருவார் ஆசை<br>இட்லி உடனே சட்னி<br>இனிதே உண்ண வாரீர் | අප්පම් පිට්ටු තෝසෛ<br>අම්මා තරුවාර් ආසෛ<br>ඉට්ලි උඩනේ සට්නි<br>ඉනිදේ උණ්ණ වාරීර් | අම්මා ආසාවෙන් දෙන ආප්ප, පිට්ටු, තෝසේ, ඉදි ආප්ප, ඉට්ලි සමඟ චට්නි ද සතුටින් කන්න එන්න. කිරි ද බොන්න එන්න. වැඩෙන ළමයිනේ ඔබත් එන්න |
| இடியப்பம் பிட்டு<br>இணையில்லாத பாலும்<br>வடிவாய் உண்ண வாரீர்<br>வளரும் பிள்ளை வாரீர் | ඉඩියප්පම් පිට්ටු<br>ඉනෛඉල්ලාද පාලුම්<br>වඩිවායි උණ්ණ වාරීර්<br>වලරුම් පිල්ලෛ වාරීර් | |

- පළමුව ගුරුවරයා ගායනා කරන විට සිසුන්ට ඇසීමට සලස්වන්න.
- කිහිප අවස්ථාවක් ගායනා කළ පසු සිසුන්ට ද ගායනා කිරීමට අවස්ථාව ලබා දෙන්න. පසුව එම කවි අංග චලනයෙන් යුතු ව ද ගායනා කිරීමට සලස්වන්න.
- එම කවි ගායනයේ දී නිවැරදි ව වචන උච්චාරණය වන්නේ ද යන් විමසිලිමත් වන්න.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

පළමුවන ශ්‍රේණියට පිවිසෙන දරුවන්ගේ සමබර වර්ධනයක් සඳහා බුද්ධිමය මෙන් ම ශාරීරික, චිත්තවේගී හා සාමාජික වර්ධනය ද අත්‍යවශ්‍ය යි. ඒ සඳහා පන්ති කාමරයෙන් බැහැර වින්දනාත්මක සැලසුම් ගත පරිසරයක ක්‍රියාශීලී ලෙස හැසිරීමට අවස්ථා දරුවනට තිබිය යුතු ය. පන්තියේ සියලු ම දරුවන්ට වින්දනාත්මක ක්‍රියාශීලී අවස්ථා ලබා දෙන තැනක් ලෙස සෙල්ලම් මිදුල හඳුන්වා දිය හැකි ය.

“සෙල්ලම් මිදුලේ ”බොහෝ ප්‍රයෝජන තිබේ. බුද්ධි වර්ධනයෙන් ඉදිරියෙන් සිටින සමහර දරුවෝ පන්ති කාමරයේ වැඩ ඉක්මනින් නිම කරති. එයින් පසු ඔවුන්ගේ හැසිරීම් අන් දරුවන්ට කරදර සහිත ය යි බොහෝ විට මැසිවිලි නැගේ. එවැනි දරුවන් ද ගුරුවරයාට පෙනෙන තෙක් මානයේ තිබෙන ආරක්ෂාකාරී ව සැකසුණු සෙල්ලම් මිදුල වෙත යොමු කළ හැකි ය. එවිට සෙල්ලම් මිදුලට යාම පන්ති කාමරයේ කටයුතු හොඳින් හා ඉක්මනින් ඉටු කිරීමට අවස්ථාව සලසා ගත හැකි ය. ඕනෑ එපාකම්, කැමති අකමැතිකම්, හැකි නොහැකි කම් අනුව සෙල්ලම් තෝරා ගැනීමට මෙහි අංගෝපාංග පමණක් ප්‍රමාණවත් නැත. මෙවැනි සෙල්ලම් මිදුලකට පහත සඳහන් වැනි දේ ඇතුළත් වීම සඳහා අවස්ථා යෝග්‍ය ය.

- රිංගීමට
- පැද්දීම ට
- නැගීමට
- එල්ලීමට

- මේ අනුව සෙල්ලම් මිදුලේ දි සිසුන් නිරත වන ක්‍රියාකාරකම් තුළින් රිංගීම, පෙරලීම, දිවීම, පැනීම, එල්ලීම වැනි මූලික චලන හැකියාව දියුණු කෙරේ.
- එමගින් සමායෝජන හැකියාව, සමබරතාව, රිද්මය, නම්‍යතාව, හා නිවැරදි ඉරියව් පවත්වා ගැනීම දියුණු කළ හැකි ය.
- සිසුන්ගේ හසුරු කුසලතා දියුණුවට මග පෑදේ.
- භාෂා සංකල්ප (ශ්‍රවණ විභේදනය, දෘෂ්ටි විභේදනය පෙර ලිවීමේ කුසලතා, මනෝචාලක කුසලතා වැනි පූර්ව භාෂා සංකල්ප) ගණිත සංකල්ප සංවර්ධනය සඳහා මෙය ඉතා වැදගත් ස්ථානයකි.
  උදාහරණ :- නැගුම් රාමුවේ නැගීමට සැලැස්වීම ඔවුන්ට නිදහසේ අභිමත පරිදි නැගීමට යොමු කරන්න.
- උඩින්ම සිටින්නේ කවුද? ඊට පහළින් සිටින්නේ කවුද? පහළින් ම සිටින්නේ කවුද? වැනි ප්‍රශ්න අසමින් සංකල්පය සාධනය කළ හැකි ය.
- සීසෝව භාවිතයෙන් සිසුන්ගේ බර පිළිබඳ සංකල්පය (උඩ යට, දුර ළඟ, ඉහළ පහළ සෙමෙන් වේගයෙන් ලොකු කුඩා, වැනි සංකල්ප......) සාධනය කළ හැකි ය.
- පටිපාටිගත කිරීම පිළිබඳ ගණිත පාඩමට පෙර ටයර් මං පෙතෙහි සිසුන් ක්‍රියාකාරීව යෙද විය හැකි ය.
- සහයෝගය, සාමූහික ව කටයුතු කිරීම බෙදා හදා ගැනීම ඉවසීම, එකිනෙකාට උපකාර කිරීම වැනි යහපත් ගුණාංගවලට මග පෑදේ.
- මානසික තෘප්තිය නිදහස ලබා දීමට සුදුසු ම ස්ථානයකි .

එබැවින් දරුවන්ගේ වර්ධනයට තුඩු දෙන නවත් අංගෝපාංග එකතු කරමින් සෙල්ලම් මිදුල සංවර්ධනය කිරීම, නිර්මාණශීලී ගුරුවරයාට පැවරෙන අභියෝගයකි.


සෙල්ලම් මිදුල ප්‍රාථමික අධ්‍යාපන විෂය ක්ෂේත්‍රවල සංකල්ප වර්ධනය සඳහා ඉවහල් වන ආකාරයට භාවිත කිරීම වැදගත් ය. ඒ සඳහා සෙල්ලම් මිදුලේ උපකරණ භාවිත කරන විට ගුරුවරයාගේ මැදිහත් වීම අත්‍යවශ්‍ය වෙයි.

විශාල මාංශ පේශී වර්ධනය ස්නායු පේශී සමායෝජනය ආදී ශාරීරික වර්ධනයට යොමු වන ක්‍රියාකාරකම්වල විවිධ උපකරණ ඇසුරෙන් යෙදෙන අතර ම සංකල්ප වර්ධනය කළ හැකි ය. පහත දැක්වෙන උදාහරණ ඇසුරෙන් විමසා බලමු.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

උදා :-   පළමුවන ශ්‍රේණිය

මව්බස ලිවීම සඳහා කුඩා ඉරි දෙකක් (අවකාශයක්) අතර අනෙහි සියුම් මාංශ පේශී හසුරුවමින් අකුරු ලිවීමට සිදු වේ. මෙහි දී අවශ්‍ය අවකාශ සංජානනය සඳහා අක්ෂර ලිවීමට පෙර හා එයට සමගාමී ව විශාල පේශී හසුරුවමින් වැඩි ඉඩකඩක් තුළ සිය ශරීරය මැනවින් හැසිරවීමට සිසුන්ට හුරුවිය හැකි ය.



ගුරුවරයාට මැදිහත් විය හැකි ආකාරය
කාටද පුළුවන් උමග තුළින් උමගේ නොගැටී යන්න.
කාටද පුළුවන් ටයර්වල නොගැටී රිංගන්න.
උදා :-   මව්බස - පිල්ලම් භාවිතය

පිල්ලම් ලිවීමේ දී අකුරේ උඩින් යටින් හා පැත්තෙන් ලිවීමට සිදුවේ. එබැවින් රවුමේ දරුවන් සිටින තැන් පිළිබඳව ගුරුවරයා මැදිහත් ව හුරු කිරීමෙන් සංකල්ප වර්ධනයට යොමු වේ.

සමන් දැන් ඉන්නේ සුනිල්ට ඉහළින් ද? පහළින්



Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved


ගණිත සංකල්ප - පටිපාටිගත කිරීම
ළමයාට පිටුපසින් තිබෙන ටයරය ලොකුම එක ද? පොඩිම එක ද?



2 වන ශ්‍රේණියේ දී මෙම තත්ත්වය තව දුරටත් දියුණු කළ යුතු වේ. එක් එක් උපකරණය භාවිත කිරීමට යොමු වන පත්‍රිකා භාවිත කළ හැකි ය.
උදා :- සිසුවා තබන පියවරට අනුව, අනෙකුත් සිසුන් වාරයක් බැගින් අත් පොලසන් දෙන අතර එකට එක අනුරූපතාවය ඇති කිරීම.



ගණිත ස ංකල්ප අභිමත ඒකකවලින් දිග මැනීම
උදා :- අනෙක් කෙළවරට තව පියවර කීය ද?



Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

ගණිත සංකල්ප :- සාපේක්ෂ පිහිටීම
උදා :- පළවෙනි පොත් කට්ටට වඩා තුන්වෙනි පොල් කට්ටට නැග්ග විට කොපමණ උසක් නැග ඇත් ද?





ගෙදර වැඩ පැවරීම

පාසල් කාලය වෙන් කිරීම පවා සිදු කරන්නේ සිසුන්ගේ පරිණතිය පිළිබඳ මනෝවිද්‍යාත්මක හා අධ්‍යාපනික මූල ධර්ම පදනම් කර ගනිමිනි. පළමුවන ප්‍රධාන අවධියේ සීමිත පැය ගණනකට පාසල් කාලය සීමා වන්නේ ඒ අනුවය.

ගෙදර වැඩ පැවරීමේ දී මේ පිළිබඳ දැඩි වගකීමකින් කටයුතු කළ යුතු ය. මව්බස, ගණිතය, පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් හා ආගම යන විෂයයන් හතරක ගෙදර වැඩ එකවර පැවරූ විට, මේ සියල්ලට ම බඳුන් වන එකම සිසුවකු හා සිසුවියක දැඩි පීඩාවකට පත් වේ. එබැවින් ගෙදර වැඩ පවරන විට ශිෂ්‍යයාගේ පරිණතියට ඔරොත්තු දෙන අත්‍යවශ්‍යම වැඩ සුළු ප්‍රමාණයක් පමණක් පැවරීමේ වගකීම ගුරුවරයාට පැවරෙයි. දිනපතා සිය දරුවන්ගේ ගෙදර වැඩ සඳහා කාලයක් වෙන් කළ හැක්කේ ඉතාමත් සීමිත දෙමාපිය පිරිසකට පමණකි.

සීමිත කාලයක් තුළ පාසල් පරිසරයෙන් පමණක් ලබා දිය නොහැකි ඉගෙනුම් අත්දැකීම් සඳහා අවශ්‍යම අවස්ථාවල දී ගෙදර වැඩ පැවරීම සිදු වේ. එහෙත් ඒවා පැහැදිලි ව හා නිවැරදි ව යොමු කිරීම ද ඒ සඳහා ප්‍රමාණවත් කාලයක් ලබා දීම කෙරෙහි ද අවධානය යොමු විය යුතු ය.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

## 1.0 හැඳින්වීම

ප්‍රාථමික ශ්‍රේණිවල ඉගෙන ගන්නා සිසුන් සඳහා ඵලදායී වූ ඉගෙනුම් අත්දැකීම් සංවිධානය කිරීමේ දී ගුරු මහත්ම මහත්මීන්ට සිසුන් ඉගෙනීමේ දී පෙන්නුම් කරන දුෂ්කරතාවයන් හා දක්ෂතා පිළිබඳ ව සුවිශේෂී අවබෝධයක් තිබීම අත්‍යවශ්‍ය ය. ඒ අනුව පන්තියේ සිටින සියලු ම ශිෂ්‍යයන්ට ගැළපෙන ආකාරයට ඉගෙනුම් ක්‍රම සංවිධානය කළ හැකි ය. මේ පුළුල් අරමුණෙන් පන්ති කාමරය තුළ සිසුන්ගේ ප්‍රගතිය පිළිබඳ ව නිරන්තරයෙන් තොරතුරු රැස් කිරීමේ ක්‍රියාවලිය තක්සේරු කිරීම වශයෙන් හඳුන්වා දිය හැකි ය. ප්‍රාථමික ශ්‍රේණිවල සිසුන් තක්සේරු කිරීමේ විවිධ පරමාර්ථ තිබේ. ස්ථාපන කාර්යයන්, අනාවරණ කාර්යයන්, උපදේශන කාර්යයන්, සහතික පත් ප්‍රදානය කිරීම හා පර්යේෂණ කාර්යයන් මෙහි දී ප්‍රධාන වේ. එහෙත් ප්‍රාථමික ශ්‍රේණිවල දී තක්සේරු කිරීම ප්‍රධාන වශයෙන් ම අනාවරණය හා උපදේශනය යන කරුණු මුල් කරගෙන ක්‍රියාත්මක වේ. ප්‍රාථමික ශ්‍රේණිවල ඉගෙන ගන්නා සිසුන් ඉගෙනීමේ දී බොහෝ ගැටලු පෙන්නුම් කරයි. ගුරු මහත්ම මහත්මීන් උගන්වන අතරතුරට ඒවා හොඳින් හඳුනාගෙන ඒවාට විසඳුම් ලබාදීම අවශ්‍ය ය. තමා පන්තියේ සිටින එක් එක් ශිෂ්‍යයා සුවිශේෂි ලෙස මුහුණපාන ගැටලු හඳුනාගෙන ඒ එක් එක් ශිෂ්‍යයාට ගැළපෙන ආකාරයට ඉගෙනුම් කටයුතු සංවිධානය කිරීම අවශ්‍ය ය. ඒ මගින් සැම සිසුවකුම විෂයමාලාවෙන් අපේක්ෂිත නිපුණතා කරා කැටුව යාමට ගුරුවරුනට පුලුවන. සිසුන් පළමුවැනියා දෙවැනියා වශයෙන් තරා කිරීම හෝ දක්ෂ සිසුන් හා දුර්වල සිසුන් වශයෙන් වර්ග කිරීම වැනි කරුණු ප්‍රාථමික ශ්‍රේණිවල තක්සේරු කිරීමේ පරමාර්ථ නොවේ.

## 2.0 සිසුන් තක්සේරු කිරීම සඳහා භාවිත කළ හැකි ක්‍රමෝපායයන්

සිසුන් තක්සේරු කිරීම සඳහා භාවිත කළ හැකි ක්‍රමෝපායයන් ප්‍රධාන කරුණු දෙකක් යටතේ හඳුන්වා දිය හැකි ය.

### 2.1 සිසු ප්‍රගතිය විධිමත් ලෙස තක්සේරු කිරීම

ඉගැන්වීමේ ක්‍රියාවලිය තාවකාලික ව නතර කොට පූර්ව සූදානමකින් හා සැලසුමකින් යුතු ව මුළු අවධානයම ඒ කෙරෙහි යොමු කොට කරනු ලබන තක්සේරු කිරීම විධිමත් තක්සේරු කිරීම වශයෙන් හැඳින්විය හැකිය. ඒ යටතේ විධිමත් පරීක්ෂණ හා ක්‍රියාකාරකම් භාවිත කෙරේ.

### 2.2 සිසු ප්‍රගතිය අවිධිමත් ක්‍රමෝපායයන් භාවිත කර තක්සේරු කිරීම.

සිසුන් ඉගෙනීමේ යෙදී සිටින අතරතුරම ඊට බාධා නොවන ආකාරයෙන් තොරතුරු රැස් කිරීම මෙහි දී සිදු කෙරේ. මේ සඳහා ප්‍රධාන වශයෙන් ප්‍රශ්න කිරීම, සිසුන් සමග තනි තනිව හෝ කාණ්ඩ වශයෙන් හෝ සාකච්ඡා කිරීම, සිසුන් වැඩවල නිරත ව සිටින අතරතුර ඔවුන්ගේ වැඩ නිරීක්ෂණ කර තොරතුරු ලබාගැනීම, සිසුන්ගේ ගෙදර වැඩ ඇගයීමට ලක් කිරීම වැනි ක්‍රමෝපායයන් භාවිත කරනු ලැබේ. මෙහි දී ගුරුවරයාගේ වෘත්තියභාවය අතිශයෙන් වැදගත් වේ. ගුරුවරයා ගනු ලබන විනිශ්චයන් වඩාත් නිවැරදි ව ගැනීම සඳහා සැලකිල්ලෙන් යුතු ව කටයුතු කිරීම අවශ්‍ය ය. අවිධිමත් ක්‍රමෝපායයන් මගින් සිසුන් පිළිබඳ ව විස්තරාත්මක වූත් ගුණාත්මක වූත් තොරතුරු ලැබෙන හෙයින් ඒවා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා වඩාත් ඵලදායී වනු ඇත. සිසුන් පිළිබඳ ව ගුරුවරුන් අවිධිමත් ලෙස ගන්නා තීරණවල වලංගුතාවය ද ඉතා ඉහළ බව බොහෝ පර්යේෂණ මගින් අනාවරණය වී ඇත.

## 3.0 තක්සේරු කිරීමේ විවිධ ස්වරූපයන්

ප්‍රාථමික ශ්‍රේණිවල ක්‍රියාත්මක වනුයේ නිර්ණායක මූලික තක්සේරු කිරීම් වේ. මෙහි දී ගුරුවරයා මුල් කර ගත් අවිධිමත් ක්‍රමවේදයන් කෙරෙහි වැඩි අවධානයක් යොමු කරනු ලැබේ.

තක්සේරු කිරීම ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ විවිධ අවස්ථාවල දී සිදු කළ හැකි ය. ඒ අනුව තක්සේරු කිරීමේ ක්‍රියාවලිය සම්පිණ්ඩිත තක්සේරු කිරීම හා සම්භවන තක්සේරු කිරීම යනුවෙන් වර්ග කළ හැකි ය.

සම්පිණ්ඩිත තක්සේරු කිරීම :-

ඉගෙනුම් අදියරක් අවසානයේ යම් ඉගෙනුම් කොටසක් කොතෙක් දුරට සාධනය කරගෙන ඇත් ද යන්න පරීක්ෂා කිරීම සම්භවන තක්සේරු කිරීම යනුවෙන් අදහස් කෙරේ. ඒ අනුව අවුරුද්දක් අවසානයේ එම අවුරුද්ද තුළ උගන්වන ලද විෂය කරුණු අලලා සකස් කළ ප්‍රශ්න පත්‍රයක් මගින් සිසුන් ලබා ගත් ප්‍රගතිය තක්සේරු කළ හැකි ය. නමුත් මෙවැනි තක්සේරු කිරීමක් ප්‍රාථමික ශ්‍රේණි සඳහා වඩාත් යෝග්‍ය යැයි නිර්දේශ කිරීම අපහසු ය.

සම්භවන තක්සේරු කිරීම :-

යම් ඉගෙනුම් අදියරක් අතරතුර දී නිරන්තරයෙන් සිසුන්ගේ ප්‍රගතිය හා ඉගෙනුම් දුෂ්කරතා පිළිබඳ ව සොයා බැලීම. සමහර අවස්ථාවල දී අඛණ්ඩ තක්සේරු කිරීම යනුවෙන් ද මෙය හඳුන්වනු ලබයි. ප්‍රාථමික ශ්‍රේණිවල සිසුන්, ඉගෙනීමේ දී මුහුණ දෙන ගැටලුවලට ඉතාමත් ප්‍රායෝගික විසඳුම් ලබා දීම අත්‍යවශ්‍ය ය. එසේ නැතහොත් සිසුන් ලබන අසාර්ථකත්වයන් ඔවුන් තව දුරටත් පසුබට සිසුන් බවට පත් කිරීමට හේතු වේ. එහෙයින් සිසුන් පිළිබඳ නිරන්තරයෙන් සොයා බැලීම ප්‍රාථමික ශ්‍රේණිවල තක්සේරු කිරීමේ ප්‍රධාන අරමුණක් වශයෙන් සැලකිය යුතු ය.

විෂයමාලාවේ අන්තර්ගතය හා නිපුණතා අනුව සකස් කරගත් නිර්ණායක කරා සිසුන් ළඟා වී තිබේ ද යන්න පරීක්ෂා කිරීම නිර්ණායක මූලික තක්සේරු කිරීමයි. ප්‍රාථමික ශ්‍රේණි සඳහා පිළියෙල කර ඇති ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය අවසානයේ මව්බස, ගණිතය, පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂයයන් සඳහා පොදු තක්සේරු කිරීමේ පත්‍රිකා ඉදිරිපත් කර ඇති අතර එක් එක් පත්‍රිකාවක් සඳහා සකස් කළ තක්සේරු කිරීමේ නිර්ණායක ද ඉදිරිපත් කර ඇත.

පහත දක්වා ඇත්තේ ගණිතය, මව්බස හා පරිසර ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂයයන් සඳහා සකස් කළ තක්සේරු කිරීමේ නිර්ණායක තුනකි.

ගණිතය - රටාවකට අනුව පෙළ ගස්වන ලද රූප කිහිපයක ඊළඟට ආයුතු රූපය දක්වයි.
මව්බස - ළමා කවියකට ළමා කතන්දරයකට සවන් දී අසන ප්‍රශ්නවලට පිළිතුරු දෙයි.
පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් - නිවසේ පිහිටීම නිවැරදි ව ප්‍රකාශ කරයි.

## 4.0 කාර්ය සාධන ගොනුව :-

සිසුන් තක්සේරු කිරීම සඳහා භාවිත කළ හැකි ඉතාම ඵලදායී ක්‍රමයක් ලෙස කාර්ය සාධන ගොනු සලකනු ලැබේ. සිසුන් ඉගෙනීමේ දී මුහුණු දෙන ගැටලු ඔවුන් තුළ තිබෙන දක්ෂතා අඛණ්ඩව ඇගයීමේ ක්‍රමයක් වශයෙන් මෙය වැදගත් වේ. ප්‍රාථමික ශ්‍රේණිවල බොහෝ ගුරුවරු එක් එක් ළමයාගේ වැඩ වෙන වෙන ම ගොනුවල එකතු කිරීම පුරුද්දක් වශයෙන් කරනු ලැබේ. නමුත් කාර්ය සාධන ගොනුව මෙයට වඩා ඉදිරියට ගිය ක්‍රියාවලියක් සේ සලකනු ලැබේ. ඒ අනුව කාර්ය සාධන ගොනුව ළමයාගේ දක්ෂතා මෙන් ම ඔහු ඉගෙනීමේ මුහුණපාන ගැටලු නිරූපණය වන ආකාරයට ඉතා අර්ථාන්විත ලෙස සකස් කළ ළමයාගේ වැඩ එකතුවක් ලෙස සලකනු ලැබේ. එය සිසුවා පිළිබඳ ව පැහැදිලි අදහසක් දක්වන සුළු දෙයක් විය යුතු ය. කාර්ය සාධන ගොනු පිළියෙල කිරීම ගුරුවරයාගෙන් ගුරුවරයාට වෙනස් විය හැකි ය. නිශ්චිත ක්‍රමයක් දැක්වීම අසීරුය. නිර්මාණාත්මක ගුරුවරයකුට තමාගේම ක්‍රමයක් අනුගමනය කරමින් ඉතා උසස් මට්ටමේ කාර්ය සාධන ගොනුවක් සකස් කළ හැකි ය. කාර්ය සාධන ගොනුවකට ඇතුළත් කළ හැකි දේ මොනවා ද? බොහෝ දුරට ඒවා සිසුන්ගේ වැඩවල නියැදි ලියු ලේඛන, සාදන ලද ගණන් අඳින ලද චිත්‍ර, කරන ලද නිර්මාණ විය හැකි ය. එසේ ම ගුරුවරයා විසින් ලියන ලද කෙටි සටහන් ද එයට ඇතුළත් කළ හැකි ය.

## 5.0 කෙටි සටහන් ලිවීම හා පිරික්සුම් පත් භාවිත කිරීම :-

සිසුන්ගේ ප්‍රගතිය හා ඉගෙනීමේ ගැටලු හඳුනා ගැනීමේ දී එක් එක් ශිෂ්‍යයා පිළිබඳ ව ගුරුවරයාට ප්‍රයෝජනවත් වන තොරතුරු කෙටි සටහන් වශයෙන් තබා ගැනීම ද බොහෝ ප්‍රයෝජනවත් වේ. පන්තියේ උගන්වන අතරතුර දී සිසුන් පිළිබඳ ව තොරතුරු සමුදායක් ගුරුවරුන්ට ලැබේ. නමුත් මෙම තොරතුරු අර්ථාන්විත ලෙස ප්‍රයෝජනයට ගැනීමත් බොහෝ විට සිදු නොකෙරේ. එම නිසා සිසුන් පිළිබඳ ව අනාවරණය කරගන්නා තොරතුරු පොතක කෙටි සටහන් වශයෙන් තබාගෙන ඒවා අවශ්‍ය පරිදි ප්‍රයෝජනයට ගත හැකි ය.

පිරික්සුම් ලැයිස්තු ද එසේ ම ප්‍රයෝජනවත් වන තවත් ක්‍රමයකි. ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය අවසානයේ ඉදිරිපත් කර ඇති නිර්ණායක කරා සිසුන් ළඟා වී තිබේ දැයි තීරණය කිරීම සඳහා එවැනි පිරික්සුම් ලැයිස්තු ද උපයෝගී කර ගත හැකි ය.



Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

## 6.0 තක්සේරු කිරීමේ පත්‍රිකා හා ඒවා ප්‍රයෝජනයට ගැනීම

රැස් කරනු ලබන තොරතුරු සටහන් කර වාර්තා කිරීම සඳහා යොදා ගත හැකි පත්‍රිකාවල ආකෘති හතරක් ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ ඇතුලත් කර ඇත. ඒවා මව්බස, ගණිතය, පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් සහ පොදු තක්සේරු පත්‍රිකා ලෙස නම් කර ඇත.

ඒවායේ එක් එක් සිසුවාගේ නම ඉදිරියෙන් එක් එක් ඉගෙනුම් ඵලය සඳහා එක් කොටුව බැගින් වෙන් කර ඇත. සිසුන් ඒ ඒ ඉගෙනුම් ඵලය කරා ළඟා වී තිබේ ද නැති ද යන්න, පරීක්ෂා කිරීමෙන් අනතුරු ව සටහන් කළ යුතු ය. පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂයයේ දී තක්සේරු කිරීමට භාජනය කළ යුතු බොහෝ "ඉගෙනුම් ඵල" වසර පුරාම සොයා බැලිය යුතු අයුරින් විහි දී ඇත. මෙහි දී එක් වාරයකට එක් සිසුවකුට එක් කොටුවක් බැගින් යොදා ගැනීමට හැකි වන පරිදි ඉගෙනුම් ඵලයකට කොටු තුන බැගින් වෙන් කර තිබේ.

එක් එක් සිසුවා සම්බන්ධයෙන් එක් එක් ඉගෙනුම් ඵලය යටතේ ඔබ රැස් කළ තොරතුරු ඇසුරෙන් පහතසඳහන් ආකාරයට සංකේත යෙදීමෙන් වාර්තා කළ හැකි ය.

| තීරණය | සංකේතය |
|---|---|
| සාර්ථක ව කරයි | √ |
| දුෂ්කරතා පෙනුම් කරයි/තව දුරටත් උදවු අවශ්‍යයි | · |

යම් ඉගෙනුම් ඵලයක් සම්බන්ධයෙන් ශිෂ්‍යයෙක් සාර්ථකත්වය පෙන්නුම් කරන්නේ ද යන්න ගුරුවරයකු විසින් තීරණය කරනු ලැබීම සඳහා අදාළ ඉගෙනුම් ඵලයට ගැළපෙන පරිදි තමා ම සකස් කර ගත නිර්ණායක උපයෝගී කර ගැනීමට හැකි ය.
පන්තියේ සියලු ම සිසුන්ගේ සාධන මට්ටම පිළිබඳ ව ගනු ලබන තීරණ එක ම නිර්ණායක කට්ටලයක් මත පදනම් කර ගනු ලැබූ විට ඒවායේ ඒකාකාර බවක් ඇති වන හෙයින් අපේක්ෂිත ප්‍රතිඵල කරා ළඟා වීමට අපහසු විය හැකි ය.

## 7.0 අනාවරණය හා ප්‍රතිකාර්ය

අවිධිමත්-සම්භවන තක්සේරු කිරීමේ ප්‍රධාන අරමුණක් වන්නේ අනාවරණයයි.

යම් සිසුවකු සඳහා තක්සේරු පත්‍රයේ " · " සලකුණ යොදා ඇති සෑම අවස්ථාවක් කෙරෙහි ම ගුරුවරයාගේ විශේෂ අවධානය යොමු විය යුතු ය. සිසුවා මුහුණ දෙන දුෂ්කරතා හඳුනා ගෙන ඒවාට පිළියම් යොදා නැවත තක්සේරු කිරීමට භාජන කළ යුතු ය. එම " · " සංකේතය, අනතුරු ව " √" සංකේතයක් බවට වෙනස් කිරීමට හැකි වන තෙක් මෙම ක්‍රියාවලිය දිගට ම සිදු කිරීම ගුරුවරුන්ගේ වගකීමයි.

හඳුනා ගනු ලබන ඉගෙනුම් දුෂ්කරතා මග හැර වීම පිණිස එක් එක් අවස්ථාවට ගැළපෙන පරිදි සුවිශේෂ ප්‍රතිකාර්ය ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රම සම්පාදනය කිරීම ද වැදගත් ය. මෙවා එක් එක් සිසුවා පෙන්නුම් කරන ඉගෙනුම් දුෂ්කරතා අනුව තීරණය විය හැකි ය.

එමෙන් ම යම් ඉගෙනුම් අභිමතාර්ථයක් කෙරෙහි පන්තියේ සිසුන් වැඩි දෙනකු "·" සංකේත ලබා ඇත්නම් එසේ වීමට බලපෑ හේතු රාශියක් තිබිය හැකි ය. ඒවා හඳුනා ගෙන සුදුසු ක්‍රියා මාර්ග ගෙන සිසුන් අවශ්‍ය ඉගෙනුම් ඵල කරා ගෙන ඒම ගුරුවරයාගේ වගකීමකි.

## 8.0 වෙනත් කරුණු

- එක් සිසුවකුගේ ඉගෙනුම් ප්‍රගතිය තවත් සිසුවකුගේ ඉගෙනුම් ප්‍රගතිය සමඟ සැසඳීමෙන් අධ්‍යාපනික වශයෙන් වැදගත් වූ තීරණ ලබා ගැනීම අසීරුය. එම නිසා සිසු-සිසු සාධන සැසඳීමෙන් වලකින්න.
- එක් සිසුවකුගේ වර්තමාන සාධන මට්ටම එම සිසුවාගේ ම පූර්ව සාධන මට්ටම් සමඟ සැසඳීමෙන් සිසු ප්‍රගතිය පිළිබඳ තොරතුරු ලබා ගත හැකි හෙයින් ඒ පිළිබඳ ව අවධානය යොමු කළ යුතු ය. එසේ ම විෂයමාලාවේ අපේක්ෂණ කරා කොතරම් ළඟා වී ඇත්දැයි සොයා බැලිය යුතු ය.
- තමාගේ පන්තියේ සිටින සිසුන්ට ගැළපෙන ආකාරයට තක්සේරු කරණ සකස් කිරීමට පන්තිය භාර ගුරුවරයා ම සමත් විය යුතු ය.



Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

# මව්බස තක්සේරු කිරීම - තොරතුරු වාර්තා කිරීමේ පත්‍රිකාව

තක්සේරු කිරීමේ පරිමාණය

සාර්ථක ව කරයි - √

දුෂ්කරතා පෙන්නුම් කරයි/තව දුරටත් උදවු අවශ්‍යය - ●

| සිසුන්ගේ නම | සවන් දීම | | | | කථනය | | | | | | කියවීම | | | ලිවීම | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | පන්ති කාමරය තුළ ගුරුවරයා විසින් දෙනු ලබන සරල වාචික (කරුණු දෙකකට නොවැඩි) උපදෙසක් අනුව ක්‍රියා කරයි. | ළමා කවියකට ළමා කතන්දරයකට සවන් දී අසන ප්‍රශ්නවලට පිළිතුරු දෙයි. | සරල පණිවුඩයක් අදාළ තැනැත්තාට පවසා ලැබෙන පිළිතුර වාචික ව ඉදිරිපත් කරයි. | ගී, කවි හා කතන්දරවලට සවන් දී වින්දනයක් ලබයි. | ළමා කවියක් හෝ ගීයක් හෝ මතකයෙන් ගයයි. | එදිනෙදා අවශ්‍යතා සඳහා සුහද ව කතා බහේ යෙදෙයි. | අවශ්‍ය තොරතුරු ලබා ගැනීම සඳහා ආචාරශීලී ව ප්‍රශ්න කරයි. | තමා දුටු සිද්ධියක් පැහැදිලි ව විස්තර කරයි. | සිද්ධි එකක් හෝ දෙකක් හෝ ඇතුළත් කතන්දරයක් අනුපිළිවෙළින් පැහැදිලි ව කියයි. | කතන්දර නිර්මාණය කර ප්‍රකාශ කරයි. | පෙළ පොතෙන් උපුටා ගත් වැකි තුනකට නොඅඩු කොටසක් නිවැරදි උච්චාරණය සහිත ව ශබ්ද නගා කියවයි. | සරල වැකියක් කියවා අසනු ලබන ප්‍රශ්නයකට පිළිතුරු දෙයි. | පෙළ පොතේ නොමැති කෙටි ජේද නිවැරදි උච්චාරණයක් සහිත ව ශබ්ද නගා කියවයි. | ලිවීමේ දී අකුරු හඳුනා ගත හැකි පරිදි වචන පැහැදිලි ව ලියයි. | තමාගේ නම ලියයි. | සරල වැකියක් නිවැරදි ව පිටපත් කරයි. | පින්තූරයක් බලා ඒ පිළිබඳ ව සරල වැකියක් ලියයි. | සරල වචන අසා ලියයි. | මාතෘකාවකට අනුව වැකි කීපයක් ලියයි. |
| | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | |



Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

# ගණිතය තක්සේරු කිරීම - තොරතුරු වාර්තා කිරීමේ පත්‍රිකාව

තක්සේරු කිරීමේ පරිමාණය

සාර්ථක ව කරයි - √

දුෂ්කරතා පෙන්නුම් කරයි/තව දුරටත් උදවු අවශ්‍යයි - •

| | සිසුන්ගේ නම | | | | | |
|---|---|---|---|---|---|---|
| පූර්ව සංඛ්‍යා සංකල්ප | ද්‍රව්‍ය කට්ටලයක් වරකට එක් උප ලක්ෂණයක් (හැඩ, තරම, වයනය) අනුව ගොඩවලට වෙන් කරයි. හේතු දක්වයි. ගොඩවල් නම් කරයි. | | | | | |
| | රූප කට්ටලයක් වරකට එක් උප ලක්ෂණයක් (හැඩය, තරම, වයනය) අනුව ගොඩවලට වෙන් කරයි. හේතු දක්වයි. ගොඩවල් නම් කරයි. | | | | | |
| | එකම වර්ගයෙන් පාටින් හා හැඩයෙන් යුත් ද්‍රව්‍ය (උදා : බෝල, බෝතල්) 3ක් තරම අනුව (ලොකු කුඩා වශයෙන්) පටිපාටියට තබයි. | | | | | |
| | පාට වයනය අනුව ද්‍රව්‍ය හෝ රූප පටිපාටියට සකස් කරයි. | | | | | |
| | කිහිපයක් එකකට හෝ එකක් කිහිපයකට අනුරූපවන ආකාරයේ සම්බන්ධතා හඳුනා ගනියි. | | | | | |
| | රටාවකට අනුව පෙළගස්වන ලද රූප කිහිපයක ඊළඟට ආයුතු රූපය දක්වයි. | | | | | |
| | සරල රටා හඳුනා ගනියි. රූප ඇසුරින් රටා ගොඩනගයි. | | | | | |
| ගණන් කිරීම | 10 - 100 තෙක් සංඛ්‍යා නාම දහයෙන් දහය අනුපිළිවෙළින් මතකයෙන් කියයි. | | | | | |
| | ද්‍රව්‍ය/රූප 100 තෙක් ගණන් කරයි. | | | | | |
| | 100 තෙක් සංඛ්‍යා නාම අනුපිළිවෙළින් කියයි. | | | | | |
| | 100 තෙක් සංඛ්‍යා කාණ්ඩයක් දෙකේ ඒවායින් පහේ ඒවායින් හා දහයේ ඒවායින් ගණන් කරයි. | | | | | |
| සංඛ්‍යා සංකල්ප | 0 හඳුනයි. භාවිත කරයි. | | | | | |
| | 100 තෙක් වූ සංඛ්‍යාවකට අදාළ ද්‍රව්‍ය/රූප ප්‍රමාණ දක්වයි. | | | | | |
| | 1 - 100 තෙක් සංඛ්‍යාංකයක් කියවයි. | | | | | |
| | 1 - 20 තෙක් ඕනෑ ම සංඛ්‍යාංකයක් අසා ලියයි. | | | | | |
| | 1 - 100 තෙක් සංඛ්‍යාංක ලියයි. | | | | | |
| | 1 - 99 තෙක් ඕනෑ ම සංඛ්‍යාවක අගය දහයේ ඒවා සහ එකේ ඒවා ඇසුරින් ප්‍රකාශ කරයි. | | | | | |
| | 100ට අඩු සංඛ්‍යා තුනක් පටිපාටිගත කරයි. | | | | | |
| එකතු කිරීම | එකම වර්ගයේ ද්‍රව්‍ය කට්ටල දෙකක එකතුව ප්‍රකාශ කරයි. (එකතුව 20ට නොවැඩි) | | | | | |
| | තනි ඉලක්කමේ සංඛ්‍යා දෙකක එකතුව ලියා දක්වයි. | | | | | |
| | 99ට නොවැඩි සංඛ්‍යා දෙකක එකතුව ලියා දක්වයි. (ගෙනයාම් රහිත ව) | | | | | |
| | එකතුව දහය වන සංඛ්‍යා බන්ධන මතකයෙන් ප්‍රකාශ කරයි. | | | | | |
| අඩු කිරීම | 9ට නොවැඩි සංඛ්‍යාවකින් ඊට අඩු සංඛ්‍යාවක් අඩු කර ලියා දක්වයි. | | | | | |
| | 20ට නොවැඩි ද්‍රව්‍ය සංඛ්‍යාවකින් ඊට අඩු ද්‍රව්‍ය සංඛ්‍යාවක් අඩු කර පිළිතුරු ප්‍රකාශ කරයි. | | | | | |
| | 99ට නොවැඩි සංඛ්‍යාවකින් තවත් සංඛ්‍යාවක් ලියා අඩු කරයි. (ගෙනඒම් රහිත ව) | | | | | |
| දිග | නම් කරන ලද දිගක් දෙන ලද අභිමත ඒකකයකින් මැන ආසන්න අගය අභිමත ඒකකවලින් ප්‍රකාශ කරයි. | | | | | |
| | ද්‍රව්‍ය කීපයක දිග අභිමත ඒකකයකින් මැන දිග අනුව ද්‍රව්‍ය පටිපාටියට තබයි. | | | | | |
| බර | ද්‍රව්‍ය දෙකක් දෑතින් ගෙන සසඳා බර අඩු වැඩි/සමාන බව ප්‍රකාශ කරයි. | | | | | |
| | වස්තුවක බර තැටි තරාදියක් ඇසුරෙන් දෙන ලද අභිමත ඒකක වර්ගයකින් මැන ආසන්න අගය අභිමත ඒකකවලින් ප්‍රකාශ කරයි. | | | | | |
| | ද්‍රව්‍ය කීපයක බර අභිමත ඒකකයකින් මැන සසඳයි. | | | | | |
| ධාරිතාව | භාජනයකට අල්ලන දියර ප්‍රමාණය දෙන ලද අභිමත ඒකකයකින් මැන ආසන්න අගය අභිමත ඒකකවලින් ප්‍රකාශ කරයි. | | | | | |
| | භාජන දෙකක ඇති ද්‍රව අභිමත ඒකකවලින් මැන (භාජන දෙකේ ධාරිතාව) අඩු වැඩි/සමාන බව ප්‍රකාශ කරයි. | | | | | |
| කාලය | පාසලේ දෛනික කටයුතු හා සම්බන්ධ වේලාවන් මතකයෙන් ආසන්න පැයට ප්‍රකාශ කරයි. | | | | | |
| | දවසේ සිදුවීම් ඇසුරෙන් මතකයෙන් ආසන්න පැයට වේලාව කියයි. | | | | | |
| මුදල් | රුපියල් දහය, රුපියල් පහ, රුපියල් දෙක, රුපියල, සත පනහ හා සත විසිපහ යන කාසි හඳුනයි. | | | | | |
| | රුපියල් දහයට නොවැඩි (සත නොමැති) භාණ්ඩයක මිල රුපියල් කාසිවලින් දෙයි. | | | | | |
| හැඩ හා අවකාශය | වෘත්තය, ත්‍රිකෝණය, සෘජුකෝණාස්‍රය හා සමචතුරස්‍රය යන ජ්‍යාමිතික හැඩතල හඳුනයි. | | | | | |
| | හැඩ ඇසුරෙන් නිර්මාණ කරයි. | | | | | |

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

# පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් තක්සේරු කිරීම - තොරතුරු වාර්තා කිරීමේ පත්‍රිකාව

තක්සේරු කිරීමේ පරිමාණය

සාර්ථක ව කරයි - √

දුෂ්කරතා පෙන්නුම් කරයි/තව දුරටත් උදවු අවශ්‍යය - •

| සිසුන්ගේ නම් | | | | | |
|---|---|---|---|---|---|
| අන් අය කෙරෙහි ආචාරශීලී හැසිරීම් ප්‍රදර්ශනය කරයි. | | | | | |
| පාසල් වත්තේ ඇති සුවිශේෂී ස්ථාන සහ ගස්වැල් සුරක්ෂිතව පවත්වාගෙන යාම සඳහා දායක වෙයි. | | | | | |
| නිවසේ පිහිටීම නිවැරදි ව ප්‍රකාශ කරයි. | | | | | |
| නිවසේ මූලික අවශ්‍යතා ඉටුකර ගැනීමට සහාය දක්වන්නන්ගේ චරිත භූමිකා රංගන ඇසුරින් ඉදිරිපත් කරයි. | | | | | |
| විවිධ ද්‍රව්‍ය භාවිත කරමින් සත්ත්ව ආකෘති නිර්මාණය කරයි. | | | | | |
| නිරීක්ෂණයේ දී ලත් තොරතුරුවලට අනුව සතුන් කාණ්ඩ කරයි. | | | | | |
| ජලයෙන් අපට ඇති ප්‍රයෝජන ප්‍රකාශ කරයි. | | | | | |
| අලුත් අවුරුදු චාරිත්‍රයක් කෙටියෙන් විස්තර කරයි. | | | | | |
| අහස නිරීක්ෂණයෙන් ලත් තොරතුරක් කැමති ආකාරයකින් විස්තර කරයි. | | | | | |
| හිරු එළියෙන් ලබා ගන්නා ප්‍රයෝජන පිළිබඳ ව අත්දැකීමක් ප්‍රකාශ කරයි. | | | | | |
| ආහාර ගැනීමේ යහපුරුදු ප්‍රදර්ශනය කරයි. | | | | | |
| ආහාර පාන ගැනීමෙන් අපට ලැබෙන ප්‍රයෝජන දෙකක් ප්‍රකාශ කරයි. | | | | | |
| නිවැරදි ව අදහස් සන්නිවේදනය කරයි. | | | | | |
| දෛනික ක්‍රියාකාරීත්වය නිසා ආසන්න පරිසරයේ සිදුවන වෙනස්කම්වලට සංවේදී ව ප්‍රතිචාර දක්වයි. | | | | | |
| නිර්මාණයක් තම අභිමතය පරිදි සිදු කරමින් හැකියා ප්‍රදර්ශනය කරයි. | | | | | |
| ඉගෙනීම සඳහා පාසලෙන් හා නිවසින් ලැබෙන උදවු අගය කරයි. | | | | | |
| පාසලේ විවිධ කටයුතුවල දී නිවැරදි ඉරියව් ප්‍රදර්ශනය කරයි. | | | | | |
| ස්වභාවික ව එළිය අඩු වැඩි වීම අනුව පරිසරයේ සිදුවන වෙනස්කම් ප්‍රකාශ කරයි. | | | | | |
| එළිය විහිදීම අඩු වැඩි කිරීමේ දී සහ එළියේ දිශාව වෙනස් කිරීමේ දී ලැබූ අත්දැකීමක් විස්තර කරයි. | | | | | |
| ජීවිකාව සඳහා කෙරෙන විවිධ වැඩවලින් සිදුවන සේවය අගය කරයි. | | | | | |
| වටපිටාවේ සුන්දරත්වය අගය කෙරෙන කවි, ගී, ගායනා සහ රංගනවල යෙදෙයි. | | | | | |
| තමා විසින් අන් අයකුට කරන ලද උදව්වක් සතුටින් විස්තර කරයි. | | | | | |

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

## පොදු තක්සේරු කිරීම - තොරතුරු වාර්තා කිරීමේ පත්‍රිකාව

තක්සේරු කිරීමේ පරිමාණය

සාර්ථක ව කරයි - √

දුෂ්කරතා පෙන්නුම් කරයි/නව දුරටත් උදවු අවශ්‍යය - •

| සිසුන්ගේ නම් | | | | | |
|---|---|---|---|---|---|
| 1. ඉවසීමෙන් යුතු ව අන් අයට සවන් දෙයි. | | | | | |
| 2. කණ්ඩායමක් තුළ සහයෝගයෙන් කටයුතු කරයි. | | | | | |
| 3. පන්ති කාමරය තුළ පරිහරණය කරන ලද උපකරණ හා ද්‍රව්‍ය නිසි තැන තබයි. | | | | | |
| 4. පන්තියේ සම්පත් සැලකිල්ලෙන් පරිහරණ කරයි. ආරක්ෂා කරයි. | | | | | |
| 5. ආහාර ගැනීමට පෙර අත් පිරිසිදු කර ගනියි. | | | | | |
| 6. හිස, දත්, නිය පිරිසිදු ව තබා ගනියි. | | | | | |
| 7. ඇවිදීමේ දී හා සිට ගැනීමේ දී නිවැරදි ඉරියව් පිළිබඳ සැලකිලිමත් වෙයි. | | | | | |
| 8. කතා බහේ දී ප්‍රිය වචන භාවිත කරයි. | | | | | |
| 9. පාසලට පැමිණෙන විට ඇඳුම් පිළිවෙළකට ඇඳ ගෙන එයි. | | | | | |
| 10. පන්තියට පැමිණෙන අමුත්තන් කෙරෙහි ආචාරශීලී ව හැසිරෙයි. | | | | | |
| 11. තමන්ගේ පොත පත ගුරු සරු ඇති ව භාවිත කරයි. | | | | | |
| 12. පෞද්ගලික ආරක්ෂාව ගැන සැලකිලිමත් වෙයි. | | | | | |
| 13. පාසල් ධජය කෙරෙහි ගෞරවාන්විත ව හැසිරෙයි. | | | | | |
| 14. කරුණු දැන ගැනීම සඳහා ප්‍රශ්න කරයි. | | | | | |
| 15. පාසලේ දී කරන ආගමික වතාවත්වලට සහභාගි වෙයි. | | | | | |
| 16. යොමු කරන කරුණකට අදාළ ව තොරතුරු රැස් කරයි. | | | | | |
| 17. උචිත අවස්ථාවන්හි දී සරල දෙමළ වචන භාවිත කරයි. | | | | | |
| 18. අවස්ථානුකූල ව දෙමළ බසින් සුබ පැතුම් වදන් භාවිත කරයි. | | | | | |



Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

# අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා

1.0 හැඳින්වීම

නිපුණතාවක් යනුවෙන් මෙහි අදහස් කෙරෙනුයේ දැනුම, කුසලතා, ආකල්ප හා හරවල සංකීර්ණ සංකලනයකටය. විවිධ ආකාරයේ නිපුණතා තිබිය හැකි ය. සමහර නිපුණතා කුසලතා දිශාවට වැඩියෙන් බර වූ ඒවා වන අතර තවත් සමහරක් දැනුම හෝ ආකල්ප දිශාවන්ට වැඩියෙන් බර වූ ඒවා වීමට ඉඩ ඇත.

1 වන ප්‍රධාන අවධිය අවසන් කරනු ලබන සිසුන් අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතාවල ප්‍රවීණත්වය ලබා ගෙන ඇතැයි තහවුරු කිරීමක් කළ යුතු බව නව ප්‍රාථමික අධ්‍යාපන විෂයමාලා සැලැස්මෙහි සඳහන් කර ඇත. පැහැදිලි ව අවබෝධ කර ගත යුතු කරුණු කිහිපයක් මෙම ප්‍රකාශයේ ඇතුළත් ව ඇත.

එනම්

- අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා යනු කවරේ ද?
- 1 වන ප්‍රධාන අවධිය සඳහා අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා මොනාවා ද?
- ප්‍රවීණත්වය යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද?
- නිපුණතාවක ප්‍රවීණත්වය තහවුරු කරන්නේ කෙසේ ද?

මේ එක එකක් පිළිබඳ ව විස්තර වශයෙන් විමසා බලමු.

2.0 අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා යනු කවරේ ද?

විෂයමාලාවක් සංවර්ධනය කිරීමේ දී එහි අන්තර්ගතය තේරීමට වැදගත් ස්ථානයක් හිමි වේ. විවිධ හැකියා මට්ටම්වල සිටින සිසුන්ට ගැළපෙන පරිදි සරල මෙන් ම සංකීර්ණ නිපුණතා, විෂයමාලාවක් තුළ සාමාන්‍යයෙන් ඇතුළත් කරනු ලැබේ.

1 වන ප්‍රධාන අවධිය අවසන් කිරීමට ප්‍රථම 2 වන ශ්‍රේණියේ සෑම සිසුවකු ම පාහේ අනිවාර්යයෙන් ම ඉහළ මට්ටමක දක්ෂතා ප්‍රදර්ශනය කළ යුතු නිපුණතා සමූහයක් විෂයමාලා අන්තර්ගත තුළ අඩංගුව ඇත. සෑම සිසුවකුම විසින් ප්‍රගුණ කළ යුතු යැයි අපේක්ෂා කරන මෙම නිපුණතා අප අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා ලෙස හඳුන්වනු ලැබේ.

මේ අනුව අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා ගණයට අයත් වනුයේ

- ඉගෙනුම තව දුරටත් ගොඩ නැඟීමට හා පවත්වා ගෙන යෑමටත්,
- යහපත් පුරවැසියකු ලෙස සාර්ථක ව ජීවත් වීමටත් අනිවාර්යයෙන් ම අවශ්‍ය නිපුණතා වේ.

සැමට අධ්‍යාපනය ලබා දීමේ සම්මුතිය යටතේ සියලු ම සිසුන් තුළ අඩුව වශයෙන් අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා වර්ධනය කරවීමට අප බැඳී ඇත.

පන්තියේ සියලු ම සිසුන් ගෙන ආ යුතු ඉහළතම ප්‍රාප්ති මට්ටම ලෙස අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා කිසි විටෙකත් සැලකිය යුතු නොවේ. වඩා දක්ෂ සිසුන් විසින් වර්ධනය කරනු ඇතැයි අපේක්ෂා කරන එහෙත්, සියලු ම සිසුන් සඳහා අත්‍යවශ්‍ය යැයි නොසැලකෙන ඉහළ මට්ටමේ නිපුණතා සමූහයක් ද විෂයමාලා අන්තර්ගතයන් තුළ ඇත. ඒවා අභිමත ඉගෙනුම් නිපුණතා ලෙස හැඳින්වේ.

ගුරුවරයාගේ අරමුණ විය යුත්තේ පන්තියේ සෑම සිසුවකු තුළ ම අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා ඉහළ මට්ටමකට වර්ධනය කරන අතර, සිසුන් වැඩිදෙනකු තුළ අභිමත ඉගෙනුම් නිපුණතා වර්ධනය කිරීමට පියවර ගැනීම ය.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

3.0 පළමුවන ප්‍රධාන අවධිය සඳහා අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා මොනවා ද?

පළමුවන ප්‍රධාන අවධිය අවසන් කරන සිසුන් විසින් ඉහළ මට්ටමක හැකියාවන් ප්‍රදර්ශනය කළ යුතු යැ යි අපේක්ෂා කරන අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා සමූහයක් හඳුනා ගෙන ඇත. මේ හඳුනා ගැනීමේ දී පළමුවන හා දෙවන ශ්‍රේණියේ විෂය නිර්දේශ සහ අනිකුත් විෂයමාලා ද්‍රව්‍ය ගැඹුරින් අධ්‍යයනය කරන ලද අතර, ගුරුවරුන්, ගුරු උපදේශකවරුන්, කථිකාචාර්යවරුන්, විෂයමාලා සංවර්ධකයන් සහ ප්‍රවීණ අධ්‍යාපනඥයින් රැසකගේ අදහස් සැලකිල්ලට භාජන කරන ලදී. එමෙන් ම, වෙනත් රටවල ප්‍රකාශයට පත් කර ඇති මෙවැනි අත්‍යවශ්‍ය ප්‍රාප්ති මට්ටම් ද අධ්‍යයනය කරන ලදී.

හඳුනා ගෙන ඇති අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා සමූහය විෂයයන් වශයෙන් වෙන් වෙන් ව නොව, පොදු ලැයිස්තුවක් වශයෙන් සකස් කර ඇත. එම ලැයිස්තුව තුළ සන්නිවේදනයට, පෞරුෂත්වයට, පරිසරයට, වැඩ ලෝකයට සූදානම්වීමට, ආචාරධර්ම හා ආගමට, ක්‍රීඩා විවේකයට සහ ඉගෙනුමට ඉගෙනීමට අදාළ නිපුණතා අන්තර්ගත ය.

4.0 ප්‍රවීණත්වය යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද?

යම් නිපුණතාවකට අදාළ දැනුම, කුසලතා හා ආකල්ප පිළිබඳ ව උසස් මට්ටමේ හැකියාවන් ප්‍රදර්ශනය කරනු ලබන සිසුවකු එම නිපුණතාවයේ ප්‍රවීණයකු ලෙස මෙහි දී පිළිගැනෙනු ඇත. උසස් මට්ටමක හැකියාවක් ලබා තිබේ දැ යි තීරණය කිරීමට තක්සේරු කිරීම් තුළින් රැස් කළ විවිධ ආකාරයේ තොරතුරු සහ අදාළ නිර්ණායක එක් එක් නිපුණතාවට අදාළ ව සලකා බැලීමට සිදු වෙනු ඇත.

යම් නිපුණතාවක් සම්බන්ධව ප්‍රවීණ මට්ටමට පැමිණි සිසුවකු තුළ දක්නට ලැබිය හැකි ප්‍රධාන ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ.

- එම නිපුණතාවට අදාළ ඊළඟ ඉහළ මට්ටමට යොමු වීමට සූදානම් බව පෙන්නුම් කරයි.
- එම නිපුණතාව තව දුරටත් ඉගෙනීමට පෙළඹීමක් ප්‍රදර්ශනය කරයි.
- එම නිපුණතාව පිළිබඳ ව තමා තුළ ආත්ම විශ්වාසයක් ඇති බව ප්‍රදර්ශනය කරයි.
- එම නිපුණතාවට සම්බන්ධ දැනුම හෝ කුසලතා හෝ තවත් අයකුට පැහැදිලි කර දීමට හෝ ඉගැන්වීමට හැකියාවක් පෙන්නුම් කරයි.
- එම නිපුණතාව පිළිබඳ ව විශේෂ උන්නදුවක් හෝ ආශාවක් දක්වන බව පෙන්නුම් කරයි.
- එම නිපුණතාව සම්බන්ධ ගැටලුවකට මුහුණ පෑ විට එය ස්වාධීන ව විසඳා ගැනීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි.
- එම නිපුණතාවට අදාළ කාර්යයන් බොහෝ දුරට නිවැරදි ව කරයි.
- ආකල්පවලට අදාළ නිපුණතාවන් සම්බන්ධ චර්යා නිරන්තරයෙන් ප්‍රදර්ශනය කරයි.

5.0 නිපුණතාවක ප්‍රවීණත්වය තහවුරු කරන්නේ කෙසේ ද?

නිපුණතාවක ප්‍රවීණත්වය තහවුරු කිරීම ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ දීම සිදු කළ යුත්තකි. ඒ සඳහා යොදා ගත හැකි ප්‍රධාන ක්‍රම දෙකක් හඳුනාගෙන ඇත.

(අ) අවිධිමත් තක්සේරු ක්‍රම මගින් අඛණ්ඩව රැස් කර වාර්තා කර ඇති තොරතුරු පමණක් ඇසුරෙන් තීරණයන් ගැනීම. (සම්භවන තක්සේරු තොරතුරු පමණි)

(ආ) ඉහත (අ) හි සඳහන් තොරතුරුවලට අමතර ව සම්පිණ්ඩිත තක්සේරු කිරීමක් හෝ වැඩි ගණනක් හෝ ඇසුරෙන් තීරණයන් ගැනීම.

ඉහත සඳහන් ක්‍රම භාවිත කර සිසුන් අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතාවල ළඟා වී තිබේ ද යන්න පිළිබඳ තීරණ ගැනීමට අවශ්‍ය මග පෙන්වීම අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපණුතා සම්බන්ධයෙන් පිළියෙල කර ඇති ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයෙහි අන්තර්ගතව ඇත.



Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved